**314 වන කාණ්ඩය - 06 වන කලාපය**
**தொகுதி 314 - இல. 06**
**Volume 314 - No. 06**

**2024 සැප්තැම්බර් 03වන අඟහරුවාදා**
**2024 செப்ரெம்பர் 03, செவ்வாய்க்கிழமை**
**Tuesday, 03rd September, 2024**

# පාර්ලිමේන්තු විවාද

## (හැන්සාඩ්)

# பாராளுமன்ற விவாதங்கள்

## (ஹன்சாட்)

# PARLIAMENTARY DEBATES

(HANSARD)

## නිල වාර්තාව

அதிகார அறிக்கை

OFFICIAL REPORT

(අශෝධිත පිටපත /பிழை திருத்தப்படாதது /Uncorrected)

# අන්තර්ගත ප්‍රධාන කරුණු


**ප්‍රතිඥාව:**

ගරු කරුණාරත්න පරණවිතානගේ මහතා [තීරුව 579]

**ජනාධිපතිතුමාගෙන් ලත් සන්දේශය:**

මහජන ආරක්ෂක ප්‍රකාශනය [තීරුව 579]

**නිවේදන:**

පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු තලතා අතුකෝරල මහත්මියගේ ඉල්ලා අස්වීම [තීරුව 580]

මාර්ගගත ක්‍රමවල සුරක්ෂිත භාවය පිළිබඳ (සංශෝධන) පනත් කෙටුම්පත: ශ්‍රේෂ්ඨාධිකරණයට පෙත්සම් [තීරුව 581]

ශ්‍රී ලංකා මහ බැංකුවේ කර්තව්‍යය සම්බන්ධයෙන් පාර්ලිමේන්තුව දැනුවත් කිරීම සඳහා වන විශේෂ රැස්වීම [තීරුව 582]

**විගණකාධිපතිවරයාගේ වාර්තාව** [තීරුව 583]

**රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේ වාර්තාව** [තීරුව 591]

**ආංශික අධීක්ෂණ කාරක සභා වාර්තා** [තීරුව 592]

**ප්‍රශ්නවලට වාචික පිළිතුරු** [තීරු 598-649]

**පෞද්ගලිකව දැනුම් දීමෙන් ඇසූ ප්‍රශ්නය:**

IMF වැඩසටහනෙහි බලපෑම [තීරුව 660]

**ශ්‍රී ලංකාවේ සත්‍යය, සමගිය සහ ප්‍රතිසන්ධානය සඳහා වන කොමිෂන් සභාව පනත් කෙටුම්පත:**

පළමුවන වර කියවන ලදී [තීරුව 665]

**ජාතික ඉඩම් කොමිෂන් සභාව පනත් කෙටුම්පත:**

පළමුවන වර කියවන ලදී [තීරුව 666]

**සමාගම් (සංශෝධන) පනත් කෙටුම්පත:**

පළමුවන වර කියවන ලදී [තීරුව 667]

**විදේශ නඩු තීන්දු අන්‍යෝන්‍යව පිළිගැනීම, ලියාපදිංචි කිරීම සහ බලාත්මක කිරීම පිළිබඳ පනත් කෙටුම්පත:**

දෙවන වර සහ තුන්වන වර කියවා සංශෝධිතාකාරයෙන් සම්මත කරන ලදී [තීරු 669-751]

**අපරාධ නඩු විධාන සංග්‍රහය (සංශෝධන) පනත් කෙටුම්පත:**

දෙවන වර සහ තුන්වන වර කියවා සංශෝධිතාකාරයෙන් සම්මත කරන ලදී [තීරු 751-754]

**සේවකයන්ගේ ජාතික අවම වේතනය (සංශෝධන) පනත් කෙටුම්පත:**

දෙවන වර සහ තුන්වන වර කියවා සම්මත කරන ලදී [තීරු 754-756]


---

# பிரதான உள்ளடக்கம்


**உறுதிப்பிரமாணம்:**

மாண்புமிகு கருணாரத்ன பரணவிதானகே [ப:579]

**சனாதிபதியிடமிருந்து வந்த செய்தி:**

பொதுசனப் பாதுகாப்புப் பிரகடனம் [ப: 579]

**அறிவிப்புகள்:**

பாராளுமன்ற உறுப்பினர் மாண்புமிகு (திருமதி) தலதா அத்துகோரலவினது இராஜினாமா [ப: 580]

நிகழ்நிலைக் காப்பு (திருத்தம்) சட்டமூலம்: உயர்நீதிமன்றுக்கு மனுக்கள் [ப: 581]

இலங்கை மத்திய வங்கியின் கடமைகள் தொடர்பில் பாராளுமன்றுக்கு விளக்கமளிக்கும் விசேட கூட்டம் [ப: 582]

**கணக்காய்வாளர் அதிபதியினது அறிக்கை** [ப: 583]

**அரசாங்க நிதி பற்றிய குழுவின் அறிக்கை** [ப: 591]

**துறைசார் மேற்பார்வைக் குழு அறிக்கைகள்** [ப: 592]

**வினாக்களுக்கு வாய்மூல விடைகள்** [ப: 598 - 649]

**தனி அறிவித்தல் மூல வினா:**

IMF நிகழ்ச்சித் திட்டத்தின் தாக்கம் [ப: 660]

**இலங்கையில் உண்மை, ஒற்றுமை மற்றும் நல்லிணக்கத்துக்கான ஆணைக்குழு சட்டமூலம்:**

முதன்முறை மதிப்பிடப்பட்டது [ப: 665]

**தேசிய காணி ஆணைக்குழு சட்டமூலம்:**

முதன்முறை மதிப்பிடப்பட்டது [ப: 666]

**கம்பெனிகள் (திருத்தம்) சட்டமூலம்:**

முதன்முறை மதிப்பிடப்பட்டது [ப: 667]

**வெளிநாட்டு தீர்ப்புக்களைப் பரஸ்பரம் ஏற்றங்கீகரித்தல், பதிவுசெய்தல் மற்றும் வலுவுறுத்தல் சட்டமூலம்:**

இரண்டாம், மூன்றாம் முறைகள் மதிப்பிடப்பட்டு திருத்தப்பட்டவாறு நிறைவேற்றப்பட்டது [ப: 669-751]

**குற்றவியல் நடவடிக்கைமுறைச் சட்டக்கோவை (திருத்தம்) சட்டமூலம்:**

இரண்டாம், மூன்றாம் முறைகள் மதிப்பிடப்பட்டு திருத்தப்பட்டவாறு நிறைவேற்றப்பட்டது [ப: 751-754]

**வேலையாளர்களின் தேசிய குறைந்தபட்ச வேதனம் (திருத்தம்) சட்டமூலம்:**

இரண்டாம், மூன்றாம் முறைகள் மதிப்பிடப்பட்டு நிறைவேற்றப்பட்டது [ப:754-756]

# PRINCIPAL CONTENTS

AFFIRMATION:
Hon. Karunarathna Paranawithanage [Col. 579]

MESSAGE FROM THE PRESIDENT:
Public Security Proclamation [Col. 579]

ANNOUNCEMENTS:
Resignation of Hon. (Mrs.) Thalatha Athukorala, Member of Parliament [Col. 580]
Online Safety (Amendment) Bill: Petitions to the Supreme Court [Col. 581]
Special Meeting to Brief Parliament on Functions of Central Bank of Sri Lanka [Col. 582]

AUDITOR-GENERAL'S REPORT [Col. 583]

PUBLIC FINANCE COMMITTEE REPORT [Col. 591]

SECTORAL OVERSIGHT COMMITTEE REPORT [Col. 592]

ORAL ANSWERS TO QUESTIONS [Cols. 598-649]

QUESTION BY PRIVATE NOTICE:
Impact of IMF Programme [Col. 660]

COMMISSION FOR TRUTH, UNITY AND RECONCILIATION IN SRI LANKA BILL:
Read the First time [Col. 665]

NATIONAL LAND COMMISSION BILL:
Read the First time [Col. 666]

COMPANIES (AMENDMENT) BILL:
Read the First time [Col. 667]

RECIPROCAL RECOGNITION, REGISTRATION AND ENFORCEMENT OF FOREIGN JUDGMENTS BILL:
Read a Second, and the Third time, and passed as amended [Col. 669-751]

CODE OF CRIMINAL PROCEDURE (AMENDMENT) BILL:
Read a Second, and the Third time, and passed as amended [Col. 751-754]

NATIONAL MINIMUM WAGE OF WORKERS (AMENDMENT) BILL:
Read a Second, and the Third time, and passed [Col. 754-756]

# පාර්ලිමේන්තුව
## பாராளுமன்றம்
## PARLIAMENT

***2024 සැප්තැම්බර් 03වන අඟහරුවාදා***
*2024 செப்ரெம்பர் 03, செவ்வாய்க்கிழமை*
*Tuesday, 03rd September, 2024*

**පූ.භා. 9.30ට පාර්ලිමේන්තුව රැස් විය.**
**කථානායකතුමා [ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා] මූලාසනාරූඪ විය.**
பாராளுமன்றம் மு.ப. 9.30 மணிக்குக் கூடியது.
சபாநாயகர் அவர்கள் [மாண்புமிகு மஹிந்த யாப்பா அபேவர்தன] தலைமை வகித்தார்கள்.
The Parliament met at 9.30 a.m.,
MR. SPEAKER [THE HON. MAHINDA YAPA ABEYWARDANA] in the Chair.

## ප්‍රතිඥාව: ගරු කරුණාරත්න පරණවිතානගේ මහතා
### உறுதிப்பிரமாணம்: மாண்புமிகு கருணாரத்ன பரணவிதானகே
### AFFIRMATION: HON. KARUNARATHNA PARANAWITHANAGE

***ගරු කරුණාරත්න පරණවිතානගේ මහතා නීති ප්‍රකාර ප්‍රතිඥාව දී මේසය මත තිබූ පොතෙහි අත්සන් කළේය.***

*மாண்புமிகு கருணாரத்ன பரணவிதானகே சட்டத்தினால் வேண்டப்பட்டவாறு உறுதிப்பிரமாணம் செய்து, சபாபீடத்திலுள்ள புத்தகத்தில் கையொப்பமிட்டார்.*

*The Hon. Karunarathna Paranawithanage made and subscribed the Affirmation required by Law; and signed the Book at the Table.*

## ජනාධිපතිතුමාගෙන් ලත් සන්දේශය
### சனாதிபதியிடமிருந்து வந்த செய்தி
### MESSAGE FROM THE PRESIDENT

### මහජන ආරක්ෂක ප්‍රකාශනය
#### பொதுசனப் பாதுகாப்புப் பிரகடனம்
#### PUBLIC SECURITY PROCLAMATION

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

පහත සඳහන් සන්දේශය ගරු ජනාධිපතිතුමාගෙන් මා වෙත ලැබී තිබෙනවා.



ශ්‍රී ලංකා ජනාධිපති
இலங்கை சனாதிபதி
President of Sri Lanka

මගේ අංකය : පීඑස්/සීඑස්ඒ/00/4/5/1

2024 අගෝස්තු මස 27 වන දින

ගරු මහින්ද යාපා අබේවර්ධන මැතිතුමා
කථානායක
ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව

ගරු කථානායකතුමනි,

(40 වැනි අධිකාරය වූ) මහජන ආරක්ෂක ආඥා පනත

(40 වැනි අධිකාරය වූ) මහජන ආරක්ෂක ආඥා පනතේ 12 වැනි වගන්තියෙන් මා වෙත පැවරුණු බලතල ප්‍රකාරව, මහජන සාමය පවත්වාගෙන යාම සඳහා වන අවශ්‍යතාවය සැලකිල්ලට ගනිමින්, පළමුවැනි උපලේඛනයේ නිශ්චය කොට දැක්වෙන සන්නද්ධ හමුදාවල සියළුම සාමාජිකයින් එහි දෙවැනි උපලේඛනයේ නිශ්චය කොට දැක්වෙන ප්‍රදේශවල මහජන සාමය පවත්වාගෙන යාම සඳහා කැඳවන බවට ආඥාවක් නිකුත් කොට ඇත.

ඒ අනුව, උක්ත ආඥා පනතේ 21(2) වගන්තිය සමග කියවිය යුතු 2(3) වගන්තිය ප්‍රකාරව ඒ බව පාර්ලිමේන්තුව වෙත මෙයින් දැනුම් දෙමි.

මෙයට - හිතවත්

රනිල් වික්‍රමසිංහ
ජනාධිපති

## නිවේදන
### அறிவிப்புகள்
### ANNOUNCEMENTS

### පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු තලතා අතුකෝරල මහත්මියගේ ඉල්ලා අස්වීම
#### பாராளுமன்ற உறுப்பினர் மாண்புமிகு (திருமதி) தலதா அத்துகோரலவினது இராஜினாமா
#### RESIGNATION OF HON. (MRS.) THALATHA ATHUKORALA, MEMBER OF PARLIAMENT

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු නීතිඥ තලතා අතුකෝරල මහත්මිය සිය පාර්ලිමේන්තු මන්ත්‍රී ධුරයෙන් ඉල්ලා අස්වීමේ ලිපිය පාර්ලිමේන්තුවේ මහ ලේකම්වරිය වෙත භාර දී ඇති බවත්, ඒ අනුව නවවැනි පාර්ලිමේන්තුවේ මන්ත්‍රී ධුරයක පුරප්පාඩුවක් ඇතිවූ බවත් පාර්ලිමේන්තුවට දැනුම් දීමට කැමැත්තෙමි.

එම ලිපිය දැන් පාර්ලිමේන්තුවේ මහ ලේකම්වරිය විසින් කියවනු ලැබේ.

*අනතුරුව පහත සඳහන් ලිපිය මහ ලේකම් විසින් කියවන ලදී:*
*அதன்பிறகு, செயலாளர் நாயகம் பின்வரும் கடிதத்தை வாசித்தார்:*
*Whereupon the Secretary-General read the following letter:*

පාර්ලිමේන්තුව
பாராளுமன்றம்
**PARLIAMENT**

තලතා අතුකෝරළ
පනාවැන්න වත්ත
කහවත්ත

2024.08.21

පාර්ලිමේන්තු මහ ලේකම්තුමිය
පාර්ලිමේන්තුව

මහ ලේකම්තුමියනි,

පාර්ලිමේන්තු මන්ත්‍රී ධූරයෙන් ඉල්ලා අස්වීම

අද දින පාර්ලිමේන්තුවේ දී සිදුකළ ප්‍රකාශය අනුව, ම විසින් දරන ලද පාර්ලිමේන්තු මන්ත්‍රී ධූරයෙන් අද දින සිට ඉල්ලා අස්වන බව මෙයින් කාරුණිකව දැනුම් දෙමි.

තලතා අතුකෝරළ (පා.ම)
රත්නපුර දිස්ත්‍රික්කය

## II

## මාර්ගගත ක්‍රමවල සුරක්ෂිත භාවය පිළිබඳ (සංශෝධන) පනත් කෙටුම්පත: ශ්‍රේෂ්ඨාධිකරණයට පෙත්සම්
## நிகழ்நிலைக் காப்பு (திருத்தம்) சட்டமூலம்: உயர் நீதிமன்றுக்கு மனுக்கள்
ONLINE SAFETY (AMENDMENT) BILL: PETITIONS TO THE SUPREME COURT

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 121(1) ව්‍යවස්ථාව ප්‍රකාරව, "මාර්ගගත ක්‍රමවල සුරක්ෂිත භාවය පිළිබඳ (සංශෝධන)" නමැති පනත් කෙටුම්පත සම්බන්ධයෙන් ශ්‍රේෂ්ඨාධිකරණය වෙත ඉදිරිපත් කරන ලද පෙත්සම් දෙකක පිටපත් මා වෙත ලැබී ඇති බව පාර්ලිමේන්තුවට දැන්වීමට කැමැත්තෙමි.

## III

## ශ්‍රී ලංකා මහ බැංකුවේ කර්තව්‍යය සම්බන්ධයෙන් පාර්ලිමේන්තුව දැනුවත් කිරීම සඳහා වන විශේෂ රැස්වීම
## இலங்கை மத்திய வங்கியின் கடமைகள் தொடர்பில் பாராளுமன்றத்துக்கு விளக்கமளிக்கும் விசேட கூட்டம்
SPECIAL MEETING TO BRIEF PARLIAMENT ON FUNCTIONS OF CENTRAL BANK OF SRI LANKA

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

2023 අංක 16 දරන ශ්‍රී ලංකා මහ බැංකු පනතේ 80(2)(අ) වගන්තියෙහි විධිවිධාන ප්‍රකාරව, මහ බැංකුවේ අධිපතිවරයා, පාලක මණ්ඩලයේ සහ මුදල් ප්‍රතිපත්ති මණ්ඩලයේ සාමාජිකයන් සහ මහ බැංකුවේ සෑම නියෝජ්‍ය අධිපතිවරයෙකුම, පාර්ලිමේන්තුවේ ඉල්ලීම මත, පාර්ලිමේන්තුව විසින් හෝ එහි යම් කමිටුවක් විසින් මහ බැංකුවේ කර්තව්‍ය සම්බන්ධයෙන් සෑම මාස හතරකටම වරක් විමසීමට ලක් කරනු ලැබිය යුතු බවට වන නීතිමය අවශ්‍යතාව සම්පූර්ණ කරමින්, ශ්‍රී ලංකා මහ බැංකු අධිපතිවරයා හා අදාළ අනෙකුත් නිලධාරීන් විසින් මහ බැංකුවේ කර්තව්‍ය සම්බන්ධයෙන් පාර්ලිමේන්තුව දැනුවත් කිරීම සඳහා වන විශේෂ රැස්වීමක් මාගේ ප්‍රධානත්වයෙන් 2024 සැප්තැම්බර් 03වන අඟහරුවාදා, එනම් අද දින පූ.භා. 11.00ට පාර්ලිමේන්තුවේ කාරක සභා කාමර අංක 1 හි දී පැවැත්වීමට කටයුතු සූදානම් කර ඇති බව සියලු ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන් වෙත දැනුම්දීමට කැමැත්තෙමි.

ඒ අනුව, මෙම විශේෂ රැස්වීම සඳහා පැමිණ සහභාගි වන මෙන් සියලු ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන් වෙත කාරුණිකව දැනුම් දෙමි.

**ගරු නීතිඥ ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு சட்டத்தரணி லக்ஷ்மன் கிரியெல்ல)
(The Hon. Lakshman Kiriella, Attorney-at-Law)

ගරු කථානායකතුමනි, මට පැහැදිලි කිරීමක් කරන්න තිබෙනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ඔව්, ගරු විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා.

**ගරු නීතිඥ ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு சட்டத்தரணி லக்ஷ்மன் கிரியெல்ல)
(The Hon. Lakshman Kiriella, Attorney-at-Law)

ගරු කථානායකතුමනි, පසුගිය අවුරුදු හතරහමාර තුළ මහ බැංකුවේ අධිපතිතුමා පාර්ලිමේන්තුවට ඇවිල්ලා ඔය කියන විධියට පැහැදිලි කිරීමක් කෙරුවේ නැහැ නේ. දැන් මේ කරන්නේ, අශ්වයා පැනලා ගියාට පස්සේ ඉස්තාලය වහනවා වාගේ වැඩක්. විශේෂයෙන්ම අරගළය පැවැති කාලයේ මහ බැංකුවේ මුදල් නැහැ කියලා, පාර්ලිමේන්තුවට ඇවිල්ලා පැහැදිලි කිරීමක් කරන්න එතුමාට වගකීමක් තිබුණා. නමුත්, එතුමා එහෙම කළේ නැහැ. පසුව පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් එතුමාගෙන් ඉල්ලීමක් කළාට පසුවයි එහෙම කළේ. ගරු කථානායකතුමනි, ඔබතුමාත් ඒ අවස්ථාවට සහභාගි වුණා. එදා තමයි ඒ සියල්ල හෙළි වුණේ. මට

හිතෙන විධියට, එතුමාගේ රාජකාරිය එතුමා පැහැර හැර තිබෙනවා. මොකද, ඔබතුමා කියපු විධියට එතුමා මාස හතරකට වරක් පාර්ලිමේන්තුව දැනුවත් කළ යුතු වුවත්, පසුගිය අවුරුදු හතරහමාර තුළ පාර්ලිමේන්තුවට කිසිම දෙයක් දැනුම් දුන්නේ නැහැ. මා මෙය කියන්නේ ඔබතුමාගේ දැන ගැනීම සඳහායි, ගරු කථානායකතුමනි.

## විගණකාධිපතිවරයාගේ වාර්තාව
## கணக்காய்வாளர் அதிபதியினது அறிக்கை
## AUDITOR-GENERAL'S REPORT

### A

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව -

- 2022 මුදල් වර්ෂය සඳහා විගණකාධිපතිවරයාගේ වාර්තාවේ නවවැනි කාණ්ඩයේ XXXVIII කොටස; සහ
- 2023 මුදල් වර්ෂය සඳහා විගණකාධිපතිවරයාගේ වාර්තාවේ දෙවැනි කාණ්ඩයේ VI කොටස සහ තෙවැනි කාණ්ඩයේ II කොටස

මම ඉදිරිපත් කරමි.

**ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා (අධ්‍යාපන අමාත්‍ය සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා)**
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த - கல்வி அமைச்சரும் பாராளுமன்றச் சபை முதல்வரும்)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law - Minister of Education and the Leader of the House of Parliament)

ගරු කථානායකතුමනි, "එකී වාර්තා මුද්‍රණය කළ යුතුය" යි මම යෝජනා කරමි.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

*වාර්තා මුද්‍රණය කළ යුතුයයි නියෝග කරන ලදී.*
*அறிக்கைகள் அச்சிடப்படக் கட்டளையிடப்பட்டது.*
*Ordered that the Reports be printed.*

### B

### I

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව 2023 මුදල් වර්ෂය සඳහා විගණකාධිපතිවරයාගේ වාර්තාවේ පළමුවැනි කාණ්ඩයේ VIII කොටස, සිව්වැනි කාණ්ඩයේ II කොටස, සහ පස්වැනි කාණ්ඩයේ II, III හා IV කොටස් මම ඉදිරිපත් කරමි.

**ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)

ගරු කථානායකතුමනි, "එකී වාර්තාව මුද්‍රණය කළ යුතුය" යි මම යෝජනා කරමි.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

*වාර්තාව මුද්‍රණය කළ යුතුයයි නියෝග කරන ලදී.*
*அறிக்கை அச்சிடப்படக் கட்டளையிடப்பட்டது.*
*Ordered that the Report be printed.*

### II

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව විගණකාධිපතිවරයාගේ වාර්තාවේ අටවැනි කාණ්ඩය - අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුවේ කාර්යභාරය පිළිබඳ ඇගයීම සම්බන්ධ කාර්ය සාධන විගණන වාර්තාව මම ඉදිරිපත් කරමි.

**ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)

ගරු කථානායකතුමනි, "එකී වාර්තාව මුද්‍රණය කළ යුතුය" යි මම යෝජනා කරමි.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

*වාර්තාව මුද්‍රණය කළ යුතුයයි නියෝග කරන ලදී.*
*அறிக்கை அச்சிடப்படக் கட்டளையிடப்பட்டது.*
*Ordered that the Report be printed.*

## ලිපි ලේඛනාදිය පිළිගැන්වීම
## சமர்ப்பிக்கப்பட்ட பத்திரங்கள்
## PAPERS PRESENTED

**ගරු ප්‍රසන්න රණතුංග මහතා (නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍ය සහ ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා)**
(மாண்புமிகு பிரசன்ன ரணதுங்க - நகர அபிவிருத்தி மற்றும் வீடமைப்பு அமைச்சரும் அரசாங்கக் கட்சியின் முதற்கோலாசானும்)
(The Hon. Prasanna Ranatunga - Minister of Urban Development and Housing and Chief Government Whip)

ගරු කථානායකතුමනි, අග්‍රාමාත්‍ය සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමා වෙනුවෙන් මම පහත සඳහන් වාර්තා ඉදිරිපත් කරමි.

(i) 2020 සහ 2021 වර්ෂ සඳහා සීමාසහිත ලංකා සීනි (පුද්ගලික) සමාගමේ වාර්ෂික වාර්තා;

(ii) 2023 වර්ෂය සඳහා ශ්‍රී ලංකා රේගුවේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව; සහ

[ගරු ප්‍රසන්න රණතුංග මහතා]

(iii) 2022/2023 වර්ෂය සඳහා සී/ස ශ්‍රී ලංකා රජයේ වාණිජ (විවිධ) නීතිගත සංස්ථාවේ වාර්ෂික වාර්තාව.

මෙම වාර්තා ජාතික ආර්ථික හා භෞතික සැලසුම් පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු ප්‍රසන්න රණතුංග මහතා**
(மாண்புமிகு பிரசன்ன ரணதுங்க)
(The Hon. Prasanna Ranatunga)

ගරු කථානායකතුමනි, අග්‍රාමාත්‍ය සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමා වෙනුවෙන් මම පහත සඳහන් වාර්තා ඉදිරිපත් කරමි.

(i) රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලද වාර්තාවේ ජනාධිපති කාර්යාලය සම්බන්ධ කරුණු පිළිබඳව පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 119(4) ප්‍රකාරව, නිරීක්ෂණ සහ ගනු ලැබූ ක්‍රියාමාර්ග පිළිබඳ වාර්තාව;

(ii) රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලද වාර්තාවේ අමාත්‍ය මණ්ඩල කාර්යාලය සම්බන්ධ කරුණු පිළිබඳව පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 119(4) ප්‍රකාරව, නිරීක්ෂණ සහ ගනු ලැබූ ක්‍රියා මාර්ග පිළිබඳ වාර්තාව;

(iii) රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලද වාර්තාවේ මුදල් කොමිෂන් සභාව සම්බන්ධ කරුණු පිළිබඳව පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 119(4) ප්‍රකාරව, නිරීක්ෂණ සහ ගනු ලැබූ ක්‍රියා මාර්ග පිළිබඳ වාර්තාව;

(iv) රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලද වාර්තාවේ රාජ්‍ය සේවා කොමිෂන් සභාව සම්බන්ධ කරුණු පිළිබඳව පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 119(4) ප්‍රකාරව, නිරීක්ෂණ සහ ගනු ලැබූ ක්‍රියා මාර්ග පිළිබඳ වාර්තාව; සහ

(v) රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලද වාර්තාවේ තාක්ෂණ අමාත්‍යාංශය සම්බන්ධ කරුණු පිළිබඳව පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 119(4) ප්‍රකාරව, නිරීක්ෂණ සහ ගනු ලැබූ ක්‍රියා මාර්ග පිළිබඳ වාර්තාව.

මෙම වාර්තා රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු ප්‍රසන්න රණතුංග මහතා**
(மாண்புமிகு பிரசன்ன ரணதுங்க)
(The Hon. Prasanna Ranatunga)

ගරු කථානායකතුමනි, අග්‍රාමාත්‍ය සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමා වෙනුවෙන් මම ක්‍රම සහ විධි පිළිබඳ කාරක සභාව විසින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලද වාර්තාවේ ආරක්ෂක අමාත්‍යාංශය සම්බන්ධ කරුණු පිළිබඳව පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 124(6) ප්‍රකාරව නිරීක්ෂණ සහ ගනු ලැබූ ක්‍රියා මාර්ග පිළිබඳ වාර්තාව ඉදිරිපත් කරමි.

මෙම වාර්තාව ක්‍රම සහ විධි පිළිබඳ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු ප්‍රසන්න රණතුංග මහතා**
(மாண்புமிகு பிரசன்ன ரணதுங்க)
(The Hon. Prasanna Ranatunga)

ගරු කථානායකතුමනි, අග්‍රාමාත්‍ය සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමා වෙනුවෙන් මම පහත සඳහන් පරිපූරක ඇස්තමේන්තුව, නියෝග, නියමය සහ රීති ඉදිරිපත් කරමි.

(i) 2024 අංක 02 දරන පරිපූරක ඇස්තමේන්තුව;

(ii) 2008 අංක 14 දරන ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනතේ 3(4) වගන්තිය යටතේ වෙක් පෝට් සිටි කළම්බු (ප්‍රයිවට්) ලිමිටඩ් ආයතනය සම්බන්ධයෙන් ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යවරයා විසින් පනවන ලදුව 2024 අගෝස්තු 09 දිනැති අංක 2396/60 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියමය;

(iii) 2010 අංක 17 දරන කැසිනෝ ව්‍යාපාර (නියාමනය කිරීමේ) පනතේ 3 වගන්තිය සමඟ කියවිය යුතු 4 වගන්තිය යටතේ කැසිනෝ ව්‍යාපාර සඳහා බලපත්‍ර ලබා දීමේ නියෝග සම්බන්ධයෙන් මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2024 මැයි 29 දිනැති අංක 2386/09 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියෝගය;

(iv) 2011 අංක 18 දරන වරාය සහ ගුවන් තොටුපළ සංවර්ධන බදු පනතේ 3(3) වගන්තිය යටතේ වරාය සහ ගුවන් තොටුපළ සංවර්ධන බද්ද සම්බන්ධයෙන් මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2024 මාර්තු 28 දිනැති අංක 2377/39 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියෝගය;

(v) 2021 අංක 11 දරන කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභාව පනතේ 54 වගන්තිය සමඟ කියවිය යුතු 71(2) වගන්තියේ (ට) ඡේදය යටතේ කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභාව සහ ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 10 දරන සහාධිපත්‍ය දේපළ කළමනාකරණ අධිකාරිය පනතේ 2 වගන්තිය යටතේ පිහිටුවන ලද සහාධිපත්‍ය දේපළ කළමනාකරණ අධිකාරිය විමසා, කොළඹ වරාය නගරයේ සහාධිපත්‍ය දේපළ කළමනාකරණය සම්බන්ධයෙන් ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2024 ජූලි 26 දිනැති අංක 2394/68 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියෝග; සහ

(vi) 2023 අංක 16 දරන ශ්‍රී ලංකා මහ බැංකු පනතේ 7(1)(ඇ) සහ VI කොටස සමඟ කියවිය යුතු 105 වගන්තිය යටතේ අපනයන ඉපැයීම් ශ්‍රී ලංකාවට ගෙන්වා ගැනීම සම්බන්ධයෙන් පාලක මණ්ඩලයේ සභාපති සහ ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපති විසින් සාදන ලදුව, 2024 ජූලි 01 දිනැති අංක 2391/02 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද රීති.

මෙම පරිපූරක ඇස්තමේන්තුව, නියෝග, නියමය සහ රීති රජයේ මුදල් පිළිබඳ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු ප්‍රසන්න රණතුංග මහතා**
(மாண்புமிகு பிரசன்ன ரணதுங்க)
(The Hon. Prasanna Ranatunga)

ගරු කථානායකතුමනි, අග්‍රාමාත්‍ය සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමා වෙනුවෙන් මම 1973 අංක 25 දරන ක්‍රීඩා පනතේ 31 වගන්තිය සමඟ කියවිය යුතු 41 වගන්තිය යටතේ ජාතික ක්‍රීඩා සංගම් නියෝග සම්බන්ධයෙන් ක්‍රීඩා හා යෞවන කටයුතු අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2024 මැයි 03 දිනැති අංක 2382/32 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියෝග ඉදිරිපත් කරමි.

මෙම නියෝග ක්‍රීඩා හා යෞවන කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)

ගරු කථානායකතුමනි, මම පහත සඳහන් වාර්තා ඉදිරිපත් කරමි.

(i) 2021 වර්ෂය සඳහා ශ්‍රී ලංකා ජාතික ඉංජිනේරු පර්යේෂණ සහ සංවර්ධන මධ්‍යස්ථානයේ වාර්ෂික වාර්තාව; සහ

(ii) 2022 වර්ෂය සඳහා කොළඹ විශ්වවිද්‍යාලයේ දේශීය වෛද්‍ය විද්‍යා ආයතනයේ වාර්ෂික වාර්තාව.

මෙම වාර්තා අධ්‍යාපනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)

ගරු කථානායකතුමනි, මම පහත සඳහන් වාර්තා ඉදිරිපත් කරමි.

(i) රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලද වාර්තාවේ ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව සම්බන්ධ කරුණු පිළිබඳව පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 119(4) ප්‍රකාරව, නිරීක්ෂණ සහ ගනු ලැබූ ක්‍රියාමාර්ග පිළිබඳ වාර්තාව; සහ

(ii) රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලද වාර්තාවේ පාර්ලිමේන්තුවේ සභානායක කාර්යාලය සම්බන්ධ කරුණු පිළිබඳව පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 119(4) ප්‍රකාරව නිරීක්ෂණ සහ ගනු ලැබූ ක්‍රියාමාර්ග පිළිබඳ වාර්තාව.

මෙම වාර්තා රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු ප්‍රසන්න රණතුංග මහතා**
(மாண்புமிகு பிரசன்ன ரணதுங்க)
(The Hon. Prasanna Ranatunga)

ගරු කථානායකතුමනි, රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලද වාර්තාවේ පාර්ලිමේන්තුවේ ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක කාර්යාලය සම්බන්ධ කරුණු පිළිබඳව පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 119(4) ප්‍රකාරව නිරීක්ෂණ සහ ගනු ලැබූ ක්‍රියාමාර්ග පිළිබඳ වාර්තාව මම ඉදිරිපත් කරමි.

මෙම වාර්තාව රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු ප්‍රසන්න රණතුංග මහතා**
(மாண்புமிகு பிரசன்ன ரணதுங்க)
(The Hon. Prasanna Ranatunga)

ගරු කථානායකතුමනි, 2020 වර්ෂය සඳහා නාගරික සංවර්ධන අධිකාරියේ වාර්ෂික වාර්තාව මම ඉදිරිපත් කරමි.

මෙම වාර්තාව පරිසරය, ස්වාභාවික සම්පත් හා තිරසර සංවර්ධනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු ප්‍රසන්න රණතුංග මහතා**
(மாண்புமிகு பிரசன்ன ரணதுங்க)
(The Hon. Prasanna Ranatunga)

ගරු කථානායකතුමනි, කර්මාන්ත අමාත්‍ය සහ සෞඛ්‍ය අමාත්‍යතුමා වෙනුවෙන් මම රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලද වාර්තාවල කර්මාන්ත අමාත්‍යාංශය සහ ඒ යටතේ පවතින ආයතන සම්බන්ධ කරුණු පිළිබඳව පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 119(4) ප්‍රකාරව නිරීක්ෂණ සහ ගනු ලැබූ ක්‍රියාමාර්ග පිළිබඳ වාර්තා ඉදිරිපත් කරමි.

මෙම වාර්තා රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු ප්‍රසන්න රණතුංග මහතා**
(மாண்புமிகு பிரசன்ன ரணதுங்க)
(The Hon. Prasanna Ranatunga)

ගරු කථානායකතුමනි, විදේශ කටයුතු අමාත්‍ය සහ අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමා වෙනුවෙන් මම පහත සඳහන් වාර්තා ඉදිරිපත් කරමි.

(i) 2023 වර්ෂය සඳහා බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ සිරකරු සුබසාධක අරමුදලේ කාර්ය සාධන වාර්තාව; සහ

(ii) 2023 වර්ෂය සඳහා ණය සහනදායක මණ්ඩල දෙපාර්තමේන්තුවේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව.

මෙම වාර්තා යුක්තිගරුක සහ නීතිගරුක සමාජයක් පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු ප්‍රසන්න රණතුංග මහතා**
(மாண்புமிகு பிரசன்ன ரணதுங்க)
(The Hon. Prasanna Ranatunga)

ගරු කථානායකතුමනි, විදේශ කටයුතු අමාත්‍ය සහ අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමා වෙනුවෙන් මම රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලද වාර්තාවේ අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය සහ ඒ යටතේ පවතින ආයතන සම්බන්ධ කරුණු පිළිබඳව පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 119(4) ප්‍රකාරව නිරීක්ෂණ සහ ගනු ලැබූ ක්‍රියාමාර්ග පිළිබඳ වාර්තාව ඉදිරිපත් කරමි.

මෙම වාර්තාව රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු ප්‍රසන්න රණතුංග මහතා**
(மாண்புமிகு பிரசன்ன ரணதுங்க)
(The Hon. Prasanna Ranatunga)

ගරු කථානායකතුමනි, බුද්ධශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මම පහත සඳහන් වාර්තා ඉදිරිපත් කරමි.

(i) 2023 වර්ෂය සඳහා බුද්ධශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු අමාත්‍යාංශයේ කාර්ය සාධන වාර්තාව; සහ

(ii) 2023 වර්ෂය සඳහා ක්‍රිස්තියානි ආගමික කටයුතු දෙපාර්තමේන්තුවේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව.

මෙම වාර්තා ආගමික කටයුතු හා සහජීවනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු ප්‍රසන්න රණතුංග මහතා**
(மாண்புமிகு பிரசன்ன ரணதுங்க)
(The Hon. Prasanna Ranatunga)

ගරු කථානායකතුමනි, විදුලිබල හා බලශක්ති අමාත්‍යතුමා වෙනුවෙන් මම පහත සඳහන් නියමය සහ නියෝග ඉදිරිපත් කරමි.

(i) 2007 අංක 35 දරන ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය පනතේ 36(2) වගන්තියේ (ඇ) සහ (ඉ) ඡේද සමඟ කියවිය යුතු 67 වගන්තිය යටතේ උපකරණවල බලශක්ති කාර්ය සාධන ප්‍රමිති (ශීතකරණ) සම්බන්ධයෙන් විදුලිබල හා බලශක්ති අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2023 අප්‍රේල් 11 දිනැති අංක2327/33 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියෝග සහ එම ගැසට් පත්‍රයේ සිංහල භාෂා පිටපතෙහි නීති කෙටුම්පත් සම්පාදකගේ අංකය නිවැරදි කිරීම සඳහා 2007 අංක 35 දරන ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය පනත යටතේ විදුලිබල හා බලශක්ති අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2024 අගෝස්තු 14 දිනැති අංක2397/28 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියමය; සහ

(ii) 2007 අංක 35 දරන ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය පනතේ 36 සහ 38 වගන්ති සමඟ කියවිය යුතු 67 වගන්තිය යටතේ බලශක්ති පරිභෝජන පිල් ලකුණු පිළිබඳ නියෝග සම්බන්ධයෙන් විදුලිබල හා බලශක්ති අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2023 ජූලි 04 දිනැති අංක 2339/09 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියෝග.

මෙම නියෝග සහ නියමය විදුලිබල හා බලශක්ති කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු ප්‍රසන්න රණතුංග මහතා**
(மாண்புமிகு பிரசன்ன ரணதுங்க)
(The Hon. Prasanna Ranatunga)

ගරු කථානායකතුමනි, වෙළඳ, වාණිජ හා ආහාර සුරක්ෂිතතා අමාත්‍යතුමා වෙනුවෙන් මම රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලද වාර්තාවේ වෙළඳ, වාණිජ හා ආහාර සුරක්ෂිතතා අමාත්‍යාංශය සහ ඒ යටතේ පවතින ආයතන සම්බන්ධ කරුණු පිළිබඳව පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 119(4) ප්‍රකාරව නිරීක්ෂණ සහ ගනු ලැබූ ක්‍රියාමාර්ග පිළිබඳ වාර්තාව ඉදිරිපත් කරමි.

මෙම වාර්තාව රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු ප්‍රසන්න රණතුංග මහතා**
(மாண்புமிகு பிரசன்ன ரணதுங்க)
(The Hon. Prasanna Ranatunga)

ගරු කථානායකතුමනි, වෙළඳ, වාණිජ හා ආහාර සුරක්ෂිතතා අමාත්‍යතුමා වෙනුවෙන් මම ක්‍රම සහ විධි පිළිබඳ කාරක සභාව විසින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලද වාර්තාවේ වෙළඳ, වාණිජ හා ආහාර සුරක්ෂිතතා අමාත්‍යාංශය සම්බන්ධ කරුණු පිළිබඳව පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 124(6) ප්‍රකාරව නිරීක්ෂණ සහ ගනු ලැබූ ක්‍රියාමාර්ග පිළිබඳ වාර්තාව ඉදිරිපත් කරමි.

මෙම වාර්තාව ක්‍රම සහ විධි පිළිබඳ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු ප්‍රසන්න රණතුංග මහතා**
(மாண்புமிகு பிரசன்ன ரணதுங்க)
(The Hon. Prasanna Ranatunga)

ගරු කථානායකතුමනි, අමාත්‍ය මණ්ඩලයේ සාමාජික නොවන රාජ්‍ය වැවිලි ව්‍යවසාය ප්‍රතිසංස්කරණ අමාත්‍ය සහ මුදල් රාජ්‍ය අමාත්‍යතුමා වෙනුවෙන් මම පහත සඳහන් වාර්ෂික වාර්තා ඉදිරිපත් කරමි.

(i) 2021 වර්ෂය සඳහා සීමාසහිත කුරුණෑගල වැවිලි සමාගමේ වාර්ෂික වාර්තාව; සහ

(ii) 2022 වර්ෂය සඳහා ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාවේ වාර්ෂික වාර්තාව.

මෙම වාර්තා භාණ්ඩ හා සේවා අපනයන ඉහළ නැංවීම පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේ වාර්තාව
## அரசாங்க நிதி பற்றிய குழுவின் அறிக்கை
## PUBLIC FINANCE COMMITTEE REPORT

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)

ගරු කථානායකතුමනි, රජයේ මුදල් පිළිබඳ කාරක සභාව වෙත යොමු කරන ලද -

(i) 1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනත යටතේ රෙගුලාසි; සහ

(ii) 2021 අංක 11 දරන කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභාව පනත යටතේ නියෝග

සම්බන්ධයෙන් එකී කාරක සභාවේ වාර්තාව මම ඉදිරිපත් කරමි.

*සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.*
*சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.*
*Ordered to lie upon the Table.*

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)

ගරු කථානායකතුමනි, මෙහි එක ගැටලුවක් තිබෙනවා. අපි නිර්දේශයක් ලබා දුන්නා, 1985 අංක 48 සහ 1987 අංක 28 දරන පනත් මඟින් සංශෝධිත 1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනතේ 41(1) සහ 14 වගන්තිය සමඟ කියවිය යුතු 20 වගන්තිය යටතේ ඉදිරිපත් කරන ලද රෙගුලාසි අනුමත කළ යුතුයි කියලා. මෙහිදී තෙල් නිස්සාරක - oleoresins - සහ අවශේෂ ස්වරූපයන් ලෙස ප්‍රතිඅපනයනය සඳහා තෝරාගත් කුළු බඩු සැකසීම සම්බන්ධයෙන් තමයි මෙම ප්‍රශ්නය පැන නැඟිලා තිබෙන්නේ. ගම්මිරිස්, එනසාල්, සාදික්කා, ඉඟුරු වැනි කුළු බඩු ඇතුළු තෙල් නිස්සාරක - oleoresins - ලෙස ICL යටතේ ආනයනය කිරීමට සුදුසුකම් ඇති කුළු බඩු පිළිබඳ විස්තර ලැයිස්තුවක් රෙගුලාසි මඟින් දන්වා ඇති බව කාරක සභාව නිරීක්ෂණය කළා. විශේෂිත ව්‍යවසායකයන් 4ක් රෙගුලාසි මඟින් බලපෑමට ලක්වීමට හේතුව, ඒවා තෝරාගත් ආකාරය සහ ඒවා සතුව බන්ධිත ගබඩා තිබේද යන්න පිළිබඳව කාරක සභාව ආයෝජන මණ්ඩලයේ නිලධාරින්ගෙන් විමසා සිටියා. ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය විසින් රෙගුලාසි මඟින් පාලනය වන කලාපය තුළ අනුකූලතාව නිරීක්ෂණය කරන බවත්, කලාපයෙන් පිටත බලධාරින් සමඟ සම්බන්ධීකරණයක් පවත්වාගෙන යමින් සියලු අවශ්‍යතා සපුරාලන බවට සහතික වන බවත් කාරක සභාව නිරීක්ෂණය කළා. මොවුන් දැනට සිටින ආනයනකරුවන් බවත්, කලාපය තුළ දෙදෙනෙකුද, ඉන් පිටත තවත් දෙදෙනෙකුද සිටින බවටත් කාරක සභාවට දැනගන්න ලැබුණා. එවැනි ව්‍යවසායකයන් සඳහා ස්ථාවර යන්ත්‍රණයක් අවශ්‍ය බව කාරක සභාව නිරීක්ෂණය කළ අතර, මෙම රෙගුලාසි මෙම නොගැළපීම විසඳීමට දරන උත්සාහයක් බව ආයෝජන මණ්ඩලයේ නිලධාරින් විසින් පෙන්වා දුන්නා.

ඒ අනුව, නිෂ්පාදන ප්‍රතිඅපනයන ක්‍රියාවලිය විධිමත් කිරීම සහ ව්‍යවසායකයන් විසින් ප්‍රතිඅපනයනය කළමනාකරණය කිරීමට නිසි ක්‍රමවේදයක් සකස් කරන ලෙස කාරක සභාව විසින් ආයෝජන මණ්ඩලයට නිර්දේශ කළා.

ගරු කථානායකතුමනි, මෙතැන procedure එක තිබෙනවා. මේ procedure එකේ මෙහෙම සඳහන් වෙලා තිබෙනවා and it is in English: "Procedure for Importation and Processing of Selected Spices and Re-export Purposes in the forms of Oil extracts, Oleoresins and Spent." "In this context, procedure for importation of spices for processing and re-export purposes in the forms of oil extracts, oleoresins and spent has been developed to regulate and streamline the importation of spices in raw forms for processing and re-exports as made in Sri Lanka products where this procedure shall be applicable for four existing BOI approved enterprises…" අනික් එකේ තිබුණේ දෙකයි කියලා; මේ procedure එකේ තිබෙනවා, four කියලා. එහි තවදුරටත් සඳහන් වෙනවා, "...operating under the BOI - two within BOI zones and two outside BOI zones - and any new enterprise to be approved under BOI is encouraged to be located only within the BOI zones". හරි, හතර තමයි. ඒ විධියට කියාගෙන යනවා. ඒක තිබෙන්නේ, "k" අකුර යටතේ.

ඊළඟට, approved enterprise යටතේ මෙහෙම තිබෙනවා, "Manufacturing facility of approved enterprises operating under the BOI within BOI zones and any new enterprises to be approved under the BOI to be located only within the BOI zones" කියලා. මේවා එකිනෙකට පටහැනියි. සාකච්ඡා කරනකොට අපි කිව්වේ, මේ zone එකේ එළියේ හෝ ඇතුළේ ඉන්න අයට හරියට මේක නිර්දේශ කරලා, - හොරෙන් එළියේ විකුණනවා වෙනුවට - හරියට ප්‍රතිඅපනයනය කරන්න පුළුවන් වෙන විධියට වැඩ කරන්න කියලායි.

ගරු කථානායකතුමනි, මෙතැන ගැටලුවක් තිබෙනවා. මේ procedure එක අපි දැක්කේ පස්සේ. ඒ නිසා මම ඒක ගරු ඇමතිතුමාගේ අවධානයට යොමු කරනවා. මේක මෙහෙම වෙන්න බැහැ. "Encourage" නම් encourage, "only" නම් only. ඒ නිසා මේ වැරැද්ද නිවැරදි කරලා අවශ්‍ය හැමෝටම මේ නීතිය ඒ විධියටම බලපවත්වන්න කියන නිර්දේශයත් මම එකතු කරනවා, කමිටුවේ සභාපති හැටියට. බොහොම ස්තුතියි.

## ආංශික අධීක්ෂණ කාරක සභා වාර්තා
## துறைசார் மேற்பார்வைக் குழு அறிக்கைகள்
## SECTORAL OVERSIGHT COMMITTEE REPORTS

**ගරු එස්.එම්. මරික්කාර් මහතා**
(மாண்புமிகு எஸ்.எம். மரிக்கார்)
(The Hon. S.M. Marikkar)

ගරු කථානායකතුමනි, විදේශ රැකියා හා ශ්‍රමය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවේ සභාපතිතුමා වෙනුවෙන් මම එම කාරක සභාව වෙත යොමු කරන ලද සේවකයන්ගේ ජාතික අවම වේතනය (සංශෝධන) පනත් කෙටුම්පත (එල්.ඩී.-ඕ. 29/2024) සම්බන්ධයෙන් එකී කාරක සභාවේ වාර්තාව ඉදිරිපත් කරමි.

*සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.*
*சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.*
*Ordered to lie upon the Table.*

**ගරු මයන්ත දිසානායක මහතා**
(மாண்புமிகு மயந்த திசாநாயக்க)
(The Hon. Mayantha Dissanayake)

ගරු කථානායකතුමනි, සෞඛ්‍ය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කරන ලද "රෝගීන්ගේ ආරක්ෂාව සහ යහපැවැත්ම තහවුරු කිරීම සඳහා වන ප්‍රඥප්තිය" සම්බන්ධයෙන් එකී කාරක සභාවේ වාර්තාව මම ඉදිරිපත් කරමි.

[ගරු මයන්ත දිසානායක මහතා]

ගරු කථානායකතුමනි, ඒ එක්කම මේ අවස්ථාව ප්‍රයෝජනයට ගන්න මා කැමැතියි, අපේ සියලුම සාමාජික මන්ත්‍රීවරුන්ටත්, ඒ වාගේම අනුකමිටුවේ සභාපති ගරු වෛද්‍ය උපුල් ගලප්පත්ති මැතිතුමාටත්, සියලුම සාමාජිකයන්ටත්, අපේ ආංශික අධීක්ෂණ කාරක සභාවේ ලේකම්වරිය වන නිරංජලා ලක්ෂානි මැතිනිය ඇතුළු සියලුම නිලධාරින්ටත්, අපේ අමාත්‍යාංශයේ සුනිල් ද අල්විස් මැතිතුමා, රශ්නි හෙට්ටිගේ මැතිනිය ඇතුළු අනෙකුත් නිලධාරින්ටත් ස්තුති කරන්න.

ඒ වාගේම දොස්තර ආනන්ද විජේවික්‍රම මැතිතුමා, විනාය ආරියරත්න මැතිතුමා, වජිර දිසානායක මැතිතුමා, දොස්තර පාලිත අබේකෝන් මැතිතුමා, ලංකා ජයසූරිය මැතිනිය ඇතුළු අනෙකුත් සියලු නිලධාරින්ටත්, ලෝක සෞඛ්‍ය සංවිධානයේ අලකා සිං මැතිනිය ඇතුළු අනෙකුත් සියලු නිලධාරින්ටත් මා ස්තුතිවන්ත වෙනවා. සෞඛ්‍ය අමාත්‍යාංශය, National Medicines Regulatory Authority, Ayurveda Medical Council, Sri Lanka Medical Council, Ceylon Medical College Council වාගේම Sri Lanka Nursing Council, අනෙකුත් unions සහ සංවිධාන මෙහිදී අපට උදවු කරලා තිබෙනවා. කාරක සභාවේ සභාපතිවරයා හැටියට මම ඒ පිළිබඳව මේ අවස්ථාවේදී මගේ විශේෂ ස්තුතිය පළ කරනවා. ඒ වාගේම හිටපු කථානායක ගරු කරු ජයසූරිය මැතිතුමා ප්‍රමුඛ අපට උදවු කළ දේශපාලන අධිකාරියේ සියලුදෙනාටත්, ගරු ඇමතිතුමාටත්, අමාත්‍යාංශයේ අනෙකුත් නිලධාරින් සියලුදෙනාටත් මම මේ අවස්ථාවේදී ස්තුතිවන්ත වෙනවා.

ගරු කථානායකතුමනි, මේ ප්‍රඥප්තිය ගැන අවුරුදු 23කට වැඩි කාලයක් තිස්සේ සාකච්ඡා කරලා තිබෙනවා. අද අපි ඒ සම්පූර්ණ වාර්තාව ඉදිරිපත් කළා. අදාළ සියලු නිලධාරින්ට, දේශපාලන අධිකාරියට, කාරක සභාවේ සියලු සාමාජිකයන්ට මා නැවත වරක් ස්තුති කරන අතර, ගරු ඇමතිතුමා අනාගතයේදී මේ පිළිබඳව කැබිනට් පත්‍රිකාවක් ඉදිරිපත් කරලා, කැබිනට් මණ්ඩලයේදීත් සාකච්ඡා කරලා, මේක නීතියක් බවට පත් කරයි කියාත් මම බලාපොරොත්තු වෙනවා.

ගරු කථානායකතුමනි, අපේ notes කිහිපයක් තිබෙනවා. ඔබතුමාගේ අවසරය පරිදි මම ඒවා **සභාගත*** කරනවා.

ඒ වාගේම මම ඔබතුමාටත් විශේෂ ස්තුතිය පුද කර සිටිනවා ආංශික අධීක්ෂණ කාරක සභාවේ වැඩ කටයුතුවලට උදව් කිරීම පිළිබඳව. ස්තුතියි.

***සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.***
*சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.*
*Ordered to lie upon the Table.*

**ගරු නීතිඥ උදයන කිරිඳිගොඩ මහතා**
(மாண்புமிகு சட்டத்தரணி உதயன கிரிந்திகொட)
(The Hon. Udayana Kirindigoda, Attorney-at-Law)

ගරු කථානායකතුමනි, විවෘත සහ වගකිවයුතු රජයක් පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවේ සභාපතිතුමා වෙනුවෙන් මම එම කාරක සභාව වෙත යොමු කරන ලද 2019 වර්ෂය සඳහා පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනයේ වාර්ෂික වාර්තාව සම්බන්ධයෙන් එකී කාරක සභාවේ වාර්තාව ඉදිරිපත් කරමි.

***සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.***
*சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.*
*Ordered to lie upon the Table.*

---

**** පුස්තකාලයේ තබා ඇත.***
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

**ගරු නීතිඥ උදයන කිරිඳිගොඩ මහතා**
(மாண்புமிகு சட்டத்தரணி உதயன கிரிந்திகொட)
(The Hon. Udayana Kirindigoda, Attorney-at-Law)

ගරු කථානායකතුමනි, විවෘත සහ වගකිවයුතු රජයක් පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවේ සභාපතිතුමා වෙනුවෙන් මම එම කාරක සභාව වෙත යොමු කරන ලද -

(i) 2022 වර්ෂය සඳහා රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ කාර්ය සාධන වාර්තාව හා ගිණුම්;

(ii) 2022 වර්ෂය සඳහා සීමා නිර්ණය කොමිෂන් සභාවේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව; සහ

(iii) 2021 වර්ෂය සඳහා ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ වාර්ෂික වාර්තාව

සම්බන්ධයෙන් එකී කාරක සභාවේ වාර්තාව ඉදිරිපත් කරමි.

***සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.***
*சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.*
*Ordered to lie upon the Table.*

**ගරු නීතිඥ උදයන කිරිඳිගොඩ මහතා**
(மாண்புமிகு சட்டத்தரணி உதயன கிரிந்திகொட)
(The Hon. Udayana Kirindigoda, Attorney-at-Law)

ගරු කථානායකතුමනි, විවෘත සහ වගකිවයුතු රජයක් පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවේ සභාපතිතුමා වෙනුවෙන් මම එම කාරක සභාව වෙත යොමු කරන ලද -

(i) 2021 වර්ෂය සඳහා ජාතික භාෂා අධ්‍යාපන සහ පුහුණු ආයතනයේ වාර්ෂික වාර්තාව;

(ii) 2022 වර්ෂය සඳහා හිමිකම් රක්ෂණ අරමුදලේ කාර්ය සාධන වාර්තාව හා ගිණුම්; සහ

(iii) 2021 වර්ෂය සඳහා ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ වාර්ෂික වාර්තාව

සම්බන්ධයෙන් එකී කාරක සභාවේ වාර්තාව ඉදිරිපත් කරමි.

***සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.***
*சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.*
*Ordered to lie upon the Table.*

**ගරු නීතිඥ උදයන කිරිඳිගොඩ මහතා**
(மாண்புமிகு சட்டத்தரணி உதயன கிரிந்திகொட)
(The Hon. Udayana Kirindigoda, Attorney-at-Law)

ගරු කථානායකතුමනි, විවෘත සහ වගකිවයුතු රජයක් පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවේ සභාපතිතුමා වෙනුවෙන් මම එම කාරක සභාව වෙත යොමු කරන ලද -

(i) 2022 වර්ෂය සඳහා දෘශ්‍යාබාධිත පුනරුත්ථාපන භාර අරමුදලේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව; සහ

(ii) 2022 වර්ෂය සඳහා අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලයේ වාර්ෂික වාර්තාව

සම්බන්ධයෙන් එකී කාරක සභාවේ වාර්තාව ඉදිරිපත් කරමි.

***සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.***
*சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.*
*Ordered to lie upon the Table.*

**ගරු නීතිඥ උදයන කිරිඳිගොඩ මහතා**
(மாண்புமிகு சட்டத்தரணி உதயன கிரிந்திகொட)
(The Hon. Udayana Kirindigoda, Attorney-at-Law)

ගරු කථානායකතුමනි, විවෘත සහ වගකිවයුතු රජයක් පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවේ සභාපතිතුමා වෙනුවෙන් මම එම කාරක සභාව වෙත යොමු කරන ලද -

(i) 2022 වර්ෂය සඳහා මානව සම්පත් සංවර්ධනය කිරීමේ ශ්‍රී ලංකා ජාතික සභාවේ වාර්ෂික වාර්තාව; සහ

(ii) 2020 සහ 2021 වර්ෂ සඳහා අධිකරණ සේවා කොමිෂන් සභා ලේකම් කාර්යාලයේ වාර්ෂික කාර්ය සාධන වාර්තා

සම්බන්ධයෙන් එකී කාරක සභාවේ වාර්තාව ඉදිරිපත් කරමි.

***සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.***
*சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.*
*Ordered to lie upon the Table.*

**ගරු නීතිඥ උදයන කිරිඳිගොඩ මහතා**
(மாண்புமிகு சட்டத்தரணி உதயன கிரிந்திகொட)
(The Hon. Udayana Kirindigoda, Attorney-at-Law)

ගරු කථානායකතුමනි, විවෘත සහ වගකිවයුතු රජයක් පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවේ සභාපතිතුමා වෙනුවෙන් මම එම කාරක සභාව වෙත යොමු කරන ලද -

(i) 2022 වර්ෂය සඳහා ජාතික පොලිස් කොමිෂන් සභාවේ කාර්ය සාධන වාර්තාව; සහ

(ii) 2022 වර්ෂය සඳහා පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරයේ කාර්ය සාධන වාර්තාව

සම්බන්ධයෙන් එකී කාරක සභාවේ වාර්තාව ඉදිරිපත් කරමි.

***සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.***
*சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.*
*Ordered to lie upon the Table.*

**ගරු නීතිඥ උදයන කිරිඳිගොඩ මහතා**
(மாண்புமிகு சட்டத்தரணி உதயன கிரிந்திகொட)
(The Hon. Udayana Kirindigoda, Attorney-at-Law)

ගරු කථානායකතුමනි, විවෘත සහ වගකිවයුතු රජයක් පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවේ සභාපතිතුමා වෙනුවෙන් මම එම කාරක සභාව වෙත යොමු කරන ලද 2023 වර්ෂය සඳහා මැතිවරණ කොමිෂන් සභාවේ කාර්ය සාධන වාර්තාව සම්බන්ධයෙන් එකී කාරක සභාවේ වාර්තාව ඉදිරිපත් කරමි.

***සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.***
*சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.*
*Ordered to lie upon the Table.*

**ගරු නීතිඥ උදයන කිරිඳිගොඩ මහතා**
(மாண்புமிகு சட்டத்தரணி உதயன கிரிந்திகொட)
(The Hon. Udayana Kirindigoda, Attorney-at-Law)

ගරු කථානායකතුමනි, විවෘත සහ වගකිවයුතු රජයක් පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවේ සභාපතිතුමා වෙනුවෙන් මම එම කාරක සභාව වෙත යොමු කරන ලද -

(i) 2023 වර්ෂය සඳහා කොළඹ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ කාර්ය සාධන වාර්තාව; සහ

(ii) 2023 වර්ෂය සඳහා කළුතර සහ ගම්පහ දිස්ත්‍රික් ලේකම් කාර්යාලවල වාර්ෂික කාර්ය සාධන වාර්තා

සම්බන්ධයෙන් එකී කාරක සභාවේ වාර්තාව ඉදිරිපත් කරමි.

***සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.***
*சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.*
*Ordered to lie upon the Table.*

**ගරු සුදත් මංජුල මහතා**
(மாண்புமிகு சுதத் மஞ்சுல)
(The Hon. Sudath Manjula)

ගරු කථානායකතුමනි, ආහාර සුරක්ෂිතතාව හා කෘෂිකර්මය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවේ සභාපතිතුමා වෙනුවෙන් මම එම කාරක සභාව වෙත යොමු කරන ලද -

(i) 2022 වර්ෂය සඳහා ඉඩම් පරිහරණ ප්‍රතිපත්ති සැලසුම් දෙපාර්තමේන්තුවේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව;

(ii) 2022 වර්ෂය සඳහා ඉඩම් හිමිකම් නිරවුල් කිරීමේ දෙපාර්තමේන්තුවේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව;

(iii) 2022 වර්ෂය සඳහා ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව; සහ

(iv) 2022 වර්ෂය සඳහා ශ්‍රී ලංකා මිනින්දෝරු දෙපාර්තමේන්තුවේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව

සම්බන්ධයෙන් එකී කාරක සභාවේ වාර්තාව ඉදිරිපත් කරමි.

***සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.***
*சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.*
*Ordered to lie upon the Table.*

**ගරු සුදත් මංජුල මහතා**
(மாண்புமிகு சுதத் மஞ்சுல)
(The Hon. Sudath Manjula)

ගරු කථානායකතුමනි, ආහාර සුරක්ෂිතතාව හා කෘෂිකර්මය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවේ සභාපතිතුමා වෙනුවෙන් මම එම කාරක සභාව වෙත යොමු කරන ලද -

(i) 2022 වර්ෂය සඳහා සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ කාර්ය සාධන වාර්තාව;

(ii) 2018 වර්ෂය සඳහා මිල්කෝ (පුද්ගලික) සමාගමේ වාර්ෂික වාර්තාව;

(iii) 2019 වර්ෂය සඳහා මිල්කෝ (පුද්ගලික) සමාගමේ වාර්ෂික වාර්තාව;

(iv) 2019 වර්ෂය සඳහා ජාතික ආහාර ප්‍රවර්ධන මණ්ඩලයේ වාර්ෂික වාර්තාව;

(v) 2020 වර්ෂය සඳහා ජාතික ආහාර ප්‍රවර්ධන මණ්ඩලයේ වාර්ෂික වාර්තාව; සහ

(vi) 2021 වර්ෂය සඳහා ජාතික පසු අස්වනු කළමනාකරණ ආයතනයේ වාර්ෂික වාර්තාව

සම්බන්ධයෙන් එකී කාරක සභාවේ වාර්තාව ඉදිරිපත් කරමි.

***සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.***
*சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.*
*Ordered to lie upon the Table.*

**ගරු සුදත් මංජුල මහතා**
(மாண்புமிகு சுதத் மஞ்சுல)
(The Hon. Sudath Manjula)

ගරු කථානායකතුමනි, ආහාර සුරක්ෂිතතාව හා කෘෂිකර්මය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවේ සභාපතිතුමා වෙනුවෙන් මම එම කාරක සභාව වෙත යොමු කරන ලද -

(i) 2022 වර්ෂය සඳහා වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව;

(ii) 2022 වර්ෂය සඳහා ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යාංශයේ වාර්ෂික වාර්තාව;

(iii) 2021 වර්ෂය සඳහා ශ්‍රී ලංකා ඉංජිනේරුවරුන්ගේ සභාවේ වාර්ෂික වාර්තාව;

[ගරු සුදත් මංජුල මහතා]

(iv) 2022 වර්ෂය සඳහා ශ්‍රී ලංකා ඉංජිනේරුවරුන්ගේ සභාවේ වාර්ෂික වාර්තාව;

(v) 2022 වර්ෂය සඳහා සෙන්ට්‍රල් ඉංජිනියරින් සර්විසස් ප්‍රයිවට් ලිමිටඩ් ආයතනයේ වාර්ෂික වාර්තාව;

(vi) 2019/2020 වර්ෂය සඳහා සීමාසහිත ලංකා පොහොර සමාගමේ වාර්ෂික වාර්තාව; සහ

(vii) 2020 වර්ෂය සඳහා කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලයේ වාර්ෂික වාර්තාව

සම්බන්ධයෙන් එකී කාරක සභාවේ වාර්තාව ඉදිරිපත් කරමි.

*සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.*
*சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.*
*Ordered to lie upon the Table.*

**ගරු සුදත් මංජුල මහතා**
(மாண்புமிகு சுதத் மஞ்சுல)
(The Hon. Sudath Manjula)

ගරු කථානායකතුමනි, ආහාර සුරක්ෂිතතාව හා කෘෂිකර්මය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවේ සභාපතිතුමා වෙනුවෙන් මම එම කාරක සභාව වෙත යොමු කරන ලද -

(i) 2022 වර්ෂය සඳහා ශ්‍රී ලංකා හඳබිම අධිකාරියේ වාර්ෂික වාර්තාව;

(ii) 2022 වර්ෂය සඳහා ශ්‍රී ලංකා කෘෂිකාර්මික පර්යේෂණ ප්‍රතිපත්ති සභාවේ වාර්ෂික වාර්තාව;

(iii) 2023 වර්ෂය සඳහා ධීවර අමාත්‍යාංශයේ කාර්ය සාධන වාර්තාව;

(iv) 2019 වර්ෂය සඳහා සීමාසහිත සීනෝර් පදනමේ වාර්ෂික වාර්තාව;

(v) 2021 වර්ෂය සඳහා ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරියේ වාර්ෂික වාර්තාව; සහ

(vi) 2020 වර්ෂය සඳහා ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාවේ වාර්ෂික වාර්තාව

සම්බන්ධයෙන් එකී කාරක සභාවේ වාර්තාව ඉදිරිපත් කරමි.

*සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.*
*சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.*
*Ordered to lie upon the Table.*

**ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය මෙනෙවිය**
(மாண்புமிகு (கலாநிதி) (செல்வி) ஹரினி அமரசூரிய)
(The Hon. (Dr.) (Ms.) Harini Amarasuriya)

Sir, on behalf of the Chairman of the Sectoral Oversight Committee on Children, Women and Gender, I present the Report of the Sectoral Oversight Committee on Children, Women and Gender on -

(i) Performance Report of the Ministry of Women, Child Affairs and Social Empowerment for the year 2023; and

(ii) Annual Report of the National Child Protection Authority for the year 2021,

which were referred to the said Committee.

*සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.*
*சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.*
*Ordered to lie upon the Table.*

**ගරු ඩලස් අලහප්පෙරුම මහතා**
(மாண்புமிகு டலஸ் அழஹப்பெரும)
(The Hon. Dullas Alahapperuma)

ගරු කථානායකතුමනි, මාධ්‍ය, තාරුණ්‍ය, උරුමය හා නූතන පුරවැසියා පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවේ සභාපතිතුමා වෙනුවෙන් මම එම කාරක සභාව වෙත යොමු කරන ලද -

(i) 2022 වර්ෂය සඳහා ක්‍රීඩා හා යෞවන කටයුතු අමාත්‍යාංශයේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව;

(ii) 2021 වර්ෂය සඳහා ජාතික තරුණ සේවා සභාවේ වාර්ෂික වාර්තාව; සහ

(iii) 2021 වර්ෂය සඳහා ගාලු උරුමය පදනමේ වාර්ෂික වාර්තාව

සම්බන්ධයෙන් එකී කාරක සභාවේ වාර්තාව ඉදිරිපත් කරමි.

*සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.*
*சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.*
*Ordered to lie upon the Table.*

## පෙත්සම්
## மனுக்கள்
## PETITIONS

**ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)

ගරු කථානායකතුමනි, රාජගිරිය, මාදින්නාගොඩ පාර, අංක 47/1 දරන ස්ථානයෙහි පදිංචි එම්.ජී. සුගත් විජේසිරි මහතාගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

*ඉදිරිපත් කරන ලද පෙත්සම මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවට පැවරිය යුතු යයි නියෝග කරන ලදී.*
*சமர்ப்பிக்கப்பட்ட மனுவைப் பொதுமனுக் குழுவுக்குச் சாட்டக் கட்டளையிடப்பட்டது.*
*Petition ordered to be referred to the Committee on Public Petitions.*

## ප්‍රශ්නවලට වාචික පිළිතුරු
## வினாக்களுக்கு வாய்மூல விடைகள்
## ORAL ANSWERS TO QUESTIONS

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ප්‍රශ්න අංක 1 -1157/2024- (1), ගරු නීතිඥ මධුර විතානගේ මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

ප්‍රශ්න අංක 2 -1249/2024- (1), ගරු ඉරාන් වික්‍රමරත්න මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

### කොළඹ වරායේ මෙහෙයුම් කටයුතු සිදු කරන පර්යන්ත: විස්තර
### கொழும்புத் துறைமுகத்தில் தொழிற்பாட்டு நடவடிக்கைகள் மேற்கொள்ளப்படும் முனையங்கள்: விபரம்
### TERMINALS OPERATING IN COLOMBO PORT: DETAILS

1255/2024

**3. ගරු (වෛද්‍ය) කවින්ද හේෂාන් ජයවර්ධන මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) கவிந்த ஹேஷான் ஜயவர்தன)
(The Hon. (Dr.) Kavinda Heshan Jayawardhana)

වරාය, නාවික හා ගුවන් සේවා අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) බහලුම් හැසිරවීම ඇතුළු කොළඹ වරායේ මෙහෙයුම් කටයුතු සිදු කරනු ලබන පර්යන්ත සංඛ්‍යාව කොපමණද;

(ii) ඒවායේ නම් කවරේද;

(iii) එම එක් එක් පර්යන්තයේ හිමිකාරිත්වය දරන ආයතන වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) (i) 2015 වර්ෂයේ සිට මේ දක්වා එම එක් එක් පර්යන්තය මඟින් මෙහෙයවන ලද බහලුම් සංඛ්‍යාව සහ උපයන ලද ආදායම;

(ii) එම ආදායමෙන් ශ්‍රී ලංකා වරාය අධිකාරියට හිමි වූ ආදායම;

එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

துறைமுகங்கள், கப்பற்றுறை மற்றும் விமான சேவைகள் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) கொள்கலன்களின் கையாளுகை உட்பட கொழும்புத் துறைமுகத்தில் தொழிற்பாட்டு நடவடிக்கைகள் மேற்கொள்ளப்படும் முனையங்களின் எண்ணிக்கை எத்தனையென்பதையும்;

(ii) அவற்றின் பெயர்கள் யாவையென்பதையும்;

(iii) மேற்படி ஒவ்வொரு முனையத்தின் உரித்து மற்றும் நிறுவனங்கள் தனித்தனியாக யாதென் பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ)(i) 2015ஆம் ஆண்டு தொடக்கம் இதுவரை மேற்படி ஒவ்வொரு முனையத்தினால் கையாளப்பட்ட கொள்கலன்களின் எண்ணிக்கை மற்றும் ஈட்டப் பட்ட வருமானம் ஒவ்வோர் ஆண்டின் அடிப் படையில் தனித்தனியாக எவ்வளவு என்பதையும்;

(ii) மேற்படி வருமானத்தில் இலங்கை துறைமுக அதிகாரசபைக்குக் கிடைத்த வருமானம் ஒவ்வோர் ஆண்டின் அடிப்படையில் தனித் தனியாக எவ்வளவு என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Ports, Shipping and Aviation:

(a) Will he inform this House -

(i) the number of terminals operating in the Colombo Port, including for container handling;

(ii) the names of those; and

(iii) the companies which hold the ownership of each of the said terminal, separately?

(b) Will he also inform this House, separately in each year -

(i) the number of containers handled by each of the above-mentioned terminals and the income earned from the year 2015 up to now; and

(ii) the revenue received by the Sri Lanka Ports Authority from the aforesaid income?

(c) If not, why?

**ගරු නීතිඥ නිමල් සිරිපාල ද සිල්වා මහතා (වරාය, නාවික හා ගුවන් සේවා අමාත්‍යතුමා)**
(மாண்புமிகு சட்டத்தரணி நிமல் சிறிபால த சில்வா - துறைமுகங்கள், கப்பற்றுறை மற்றும் விமான சேவைகள் அமைச்சர்)
(The Hon. Nimal Siripala de Silva, Attorney-at-Law - Minister of Ports, Shipping and Aviation)

ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) 05යි. (බහලු පර්යන්ත පහකි.)

(ii) ශ්‍රී ලංකා වරාය අධිකාරිය සතු පර්යන්ත - 03

1. ජය බහලු පර්යන්තය - Jaya Container Terminal (JCT)
2. නැගෙනහිර බහලු පර්යන්තය - East Container Terminal (ECT)
3. සමගි බහලු පර්යන්තය - Unity Container Terminal (UCT) සහ
4. සවුත් ඒෂියා ගේට්වේ ටර්මිනල් - South Asia Gateway Terminal (SAGT)
5. කලම්බු ඉන්ටර්නැෂනල් කන්ටේනර් ටර්මිනල් - Colombo International Container Terminal (CICT)

(iii)

| පර්යන්තයේ නම | සමාගමේ නම | හිමිකාර -ත්වය | සටහන |
|---|---|---|---|
| ශ්‍රී ලංකා වරාය අධිකාරිය සතු පර්යන්ත - 03 01. ජය බහලු පර්යන්තය (JCT) 02. නැගෙනහිර බහලු පර්යන්තය (ECT) 03. සමගි බහලු පර්යන්තය (UCT) | ශ්‍රී ලංකා වරාය අධිකාරිය | 100% | ECT යටිතල පහසුකම් සංවර්ධනය කෙරෙමින් පවතී. UCT දැනට බහලුම් පර්යන්තයක් ලෙස ක්‍රියාත්මක නොවන අතර, එය සාම්ප්‍රදායික නැංගුරම් පොළක් ලෙස ක්‍රියාත්මක වේ. |
| 04. සවුත් ඒෂියා ගේට්වේ ටර්මිනල් (SAGT) පුද්ගලික සමාගම - South Asia Gateway Terminals (Pvt.) Ltd. | 01. John Keells Holdings PLC 02. Maersk BV 03. APM Terminals BV 04. Peony Investments (Subsidiary of Evergreen Marine Corporation) 05. Sri Lanka Ports Authority (SLPA) | 42.19% 26.25% 6.56% 10% 15% | |
| 05. කලම්බු ඉන්ටර්නැෂනල් කන්ටේනර් ටර්මිනල්ස් සමාගම (CICT) - Colombo International Container Terminals Ltd. | 01. Merit Bravo Enterprises Limited 02. Sri Lanka Ports Authority (SLPA) | 85% 15% | |

[ගරු නීතිඥ නිමල් සිරිපාල ද සිල්වා මහතා ]

(ආ) (i)

**මෙහෙයවන ලද බහාළුම් සංඛ්‍යාව (විස්සේ සම ඒකක) 2015 – 2024 ජූනි දක්වා**

| වර්ෂය | පර්යන්තයේ නම | මෙහෙයවන ලද බහාළුම් (විස්සේ සම ඒකක) | මෙහෙයුම් ආදායම් | |
|---|---|---|---|---|
| | | | රු. | ඇ.ඒ.ජා.ඩො. |
| 2015 | SLPA | 2,252,323 | 31,722,659,480.34 | |
| | SAGT | 1,371,245 | | 82,390,420.00 |
| | CICT | 1,561.899 | | 80,767,039.97 |
| 2016 | SLPA | 2,100,117 | 32,915,119,288.12 | |
| | SAGT | 1,632,207 | | 73,844,398.00 |
| | CICT | 2,002,599 | | 108,114,662.53 |
| 2017 | SLPA | 2,010,702 | 33,235,601,732.63 | |
| | SAGT | 1,809,835 | | 79,379,034.00 |
| | CICT | 2,388,531 | | 133,930,333.97 |
| 2018 | SLPA | 2,304,534 | 36,367,340,234.62 | |
| | SAGT | 2,066,758 | | 91,085,768.00 |
| | CICT | 2,676,194 | | 143,827,212.19 |
| 2019 | SLPA | 2,282,618 | 38,569,921,309.95 | |
| | SAGT | 2,052,153 | | 94,060,334.00 |
| | CICT | 2,893,566 | | 147,893,834.00 |
| 2020 | SLPA | 2,097,804 | 37,156,695,418.79 | |
| | SAGT | 1,872,052 | | 92,040,871.00 |
| | CICT | 2,884,906 | | 152,072,053.68 |
| 2021 | SLPA | 2,198,334 | 44,075,922,684.69 | |
| | SAGT | 1,838,693 | | 83,177,392.00 |
| | CICT | 3,212,331 | | 164,590,922.12 |
| 2022 | SLPA | 1,925,895 | 65,610,209,862.16 | |
| | SAGT | 1,752,236 | | 92,008,908.00 |
| | CICT | 3,184,053 | | 164,246,476.30 |
| 2023 | SLPA | 1,965,131 | 61,183,211,772.00 | |
| | SAGT | 1,763,863 | | 94,163,578.00 |
| | CICT | 3,220,918 | | 167,613,117.12 |
| 2024 ජූනි මස දක්වා | SLPA | 1,207,675 | 35,587,128,412.71 | |
| | SAGT | 978,754 | | 50,521,000.00 |
| | CICT | 1,704,045 | | 90,694,466.46 |

- ❖ ශ්‍රී ලංකා වරාය අධිකාරිය (SLPA) මූල්‍ය වර්ෂය ජනවාරි 01 දින සිට දෙසැම්බර් 31 දින දක්වා.
- ❖ සවුත් ඒෂියා ගේට්වේ ටර්මිනල්ස් (SAGT) ආයතනයේ මූල්‍ය වර්ෂය අප්‍රේල් 01 දින සිට මාර්තු 31 දින දක්වා.
- ❖ කොළඹ ජාත්‍යන්තර බහලු පර්යන්ත (CICT) ආයතනයේ මූල්‍ය වර්ෂය ජනවාරි 01 දින සිට දෙසැම්බර් 31 දින දක්වා.

(ii)

| වර්ෂය | පර්යන්තයේ නම | ශ්‍රී .ලං.ව.අ.හිමි වූ ආදායම (රු.මි.) |
|---|---|---|
| 2015 | SAGT | 1,863.82 |
| | CICT | 1,968.95 |
| 2016 | SAGT | 2,093.46 |
| | CICT | 2,376.61 |
| 2017 | SAGT | 2,226.70 |
| | CICT | 2,815.62 |
| 2018 | SAGT | 2,513.17 |
| | CICT | 4,841.52 |
| 2019 | SAGT | 3,003.18 |
| | CICT | 3,877.52 |
| 2020 | SAGT | 2,758.93 |
| | CICT | 4,650.66 |
| 2021 | SAGT | 2,733.41 |
| | CICT | 5,437.31 |
| 2022 | SAGT | 5,350.90 |
| | CICT | 12,070.95 |
| 2023 | SAGT | 4,817.86 |
| | CICT | 8,214.47 |
| 2024 ජූනි මස දක්වා | SAGT | 2,212.38 |
| | CICT | 1,717.23 |

(ඇ) පැන නොනඟී.

**ගරු (වෛද්‍ය) කවින්ද හේෂාන් ජයවර්ධන මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) கவிந்த ஹேஷான் ஜயவர்தன)
(The Hon. (Dr.) Kavinda Heshan Jayawardhana)
ගරු කථානායකතුමනි, මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

ගරු ඇමතිතුමනි, අපි එදා විශේෂයෙන් හම්බන්තොට වරාය චීන සමාගමකට ලබා දුන්නා. මට මතක විධියට එයින් ඇමෙරිකානු ඩොලර් බිලියන 1.2කට ආසන්න මුදල් ප්‍රමාණයක් අපේ රජයට ලැබුණා. එතැනින් පසුව ශ්‍රී ලංකා රජයට චීන-හම්බන්තොට වරායෙන් යම්කිසි ආදායමක් ලැබෙනවාද කියලා මම දැන ගන්න කැමැතියි.

**ගරු නීතිඥ නිමල් සිරිපාල ද සිල්වා මහතා**
(மாண்புமிகு சட்டத்தரணி நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva, Attorney-at-Law)
ගරු කථානායකතුමනි, එතුමාගේ මුල් ප්‍රශ්නය තුළ ඔය ප්‍රශ්නය අහලා නැහැ. ඒක අහලා තිබුණා නම් අවශ්‍ය තොරතුරු ලබාගෙන ඒ පිළිබඳව දන්වන්න මට පුළුවන්කම තිබුණා. ගරු මන්ත්‍රීතුමනි, ඉදිරියේදී ඔබතුමා එය වෙනත් ප්‍රශ්නයක් හැටියට ඇහුවොත්, නියමිත තොරතුරු ලබාගෙන ඒ සඳහා පිළිතුරක් ඉදිරිපත් කරන්නම්.

**ගරු (වෛද්‍ය) කවින්ද හේෂාන් ජයවර්ධන මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) கவிந்த ஹேஷான் ஜயவர்தன)
(The Hon. (Dr.) Kavinda Heshan Jayawardhana)
ගරු ඇමතිතුමනි, ඔබතුමාට බෙහෙවින් ස්තුතියි. ඇත්තටම ඔබතුමාගේ අමාත්‍යාංශයට අදාළ කරුණක් නිසා ඒ පිළිබඳව ඔබතුමා දන්නවා ඇති කියලා මම හිතුවා. ඒකට කමක් නැහැ, ඉදිරි දවසක එය මේ ගරු සභාවට ඉදිරිපත් කරන්න.

ගරු ඇමතිතුමනි, අද ප්‍රවෘත්ති බලන කොට මම ඇත්තටම විස්මයට පත් වුණා, "ඩේලි මිරර්" පුවත් පතේ පළ වී තිබුණු ප්‍රවෘත්තියක් සම්බන්ධයෙන්. ඔබතුමාගේ අමාත්‍යාංශයටත් අදාළ වන නිසා මම එය මේ ගරු සභාවට ඉදිරිපත් කරන්නම්.

ගරු ඇමතිතුමනි, අපේ රට විදේශ ආදායම් ලබන ප්‍රධාන ක්ෂේත්‍රයක් තමයි සංචාරක ක්ෂේත්‍රය. අද ලක්ෂ ගණනක් සංචාරකයෝ අපේ රටට එනවා. ඒ අය ශ්‍රී ලංකාවේ ගුවන් තොටුපළේ පැය ගණනක් රැඳී සිටිනවා, ලංකාවට ඒමට අවශ්‍ය වීසා ලබා ගැනීම සඳහා. දැන් on-arrival visa විතරයි ඒ අයට issue කරන්නේ. ගරු කථානායකතුමනි, දැන් ඒ අය වීඩියෝ එකක් හදලා Facebook එකේ දමලා තිබෙනවා. අපි දැක්කා, ඒ සංචාරකයන් කොයි තරම් අපහසුතාවට ලක් වෙලා තිබෙනවාද කියලා. Immigration and Emigration Department එකේ නිලධාරීන් 110ක පමණ හිඟයක් තිබෙනවා. අද එවැනි තත්ත්වයක් තිබෙන විටත් රජය මැදිහත් වෙලා, විශේෂයෙන් මේ රටට විදේශ විනිමය ගෙන එන සංචාරක ක්ෂේත්‍රය කෙරෙහි අවධානය යොමු කරලා සංචාරකයන්ට වීසා ලබා දීම සම්බන්ධයෙන් සංවේදී වෙලා ඒ වෙනුවෙන් යම්කිසි ක්‍රියා මාර්ගයක් ගන්නේ නැත්තේ ඇයි? අපි දන්නවා, මේ වන විට ගරු අධිකරණයේ නඩුවක් තිබෙන බව. ඒ නිසා සමහර විට රජයට මැදිහත් වෙන්න බැරිව ඇති. හැබැයි රජයට පුළුවන්, අවම වශයෙන් on-arrival visa දෙන procedure එකට අවශ්‍ය නිලධාරීන් ප්‍රමාණයවත් වැඩි කරලා අවශ්‍ය පහසුකම් ටික ලබා දෙන්න. ගරු කථානායකතුමනි, මේ පවතින තත්ත්වය නිසා අපේ රටට අපකීර්තියක් අත් වෙනවා වාගේම රටට ලැබෙන ආදායමත් අඩු වෙනවා.

මේ රටට එන සංචාරකයකුගෙන් ඩොලර් 50ක් අය කරනවා. අපි දන්නවා, 2012 වනකල්ම, ලංකාවට පැමිණි සංචාරකයන්ට නොමිලේ වීසා ලබා දුන් බව. අපි 2012 සිට 2024 අප්‍රේල් වනකල්ම සිංගප්පූරුව, සීෂෙල්ස්, මාලදිවයින කියන රටවලට free visa ලබා දුන්නා. හැබැයි, SAARC රටවල සංචාරකයන්ගෙන් ඩොලර් 35ක් අය කළා. අනෙක් රටවල සංචාරකයන්ගෙන් ඩොලර් 50ක් අය කළා. ගරු කථානායකතුමනි, මේ පිළිබඳව රජයේ අවධානය යොමු කරලා මේ රටට එන සංචාරකයන්ට අවශ්‍ය පහසුකම් ටික ලබා දෙන්න කියා මා ඉල්ලා සිටිනවා.

**ගරු ප්‍රසන්න රණතුංග මහතා**
(மாண்புமிகு பிரசன்ன ரணதுங்க)
(The Hon. Prasanna Ranatunga)
ගරු කථානායකතුමනි, ගරු මන්ත්‍රීතුමා ඉදිරිපත් කරපු කාරණාව සම්බන්ධව මා පැහැදිලි කරන්නම්. විශේෂයෙන් ඊයේ කැබිනට් මණ්ඩලය දීර්ඝ වශයෙන් සාකච්ඡා කරපු දෙයක් තිබෙනවා. පසුගිය කාලයේ ලංකාවට වුණා හා සමානම දෙයක් මේ වන විට මාලදිවයිනේත් සිදු වෙලා තිබෙනවා. දැන් මාලදිවයිනත් තෙල් නැව් ටික මුහුදේ තියාගෙන ඉන්නවා, ඒවා ඒ රටට ඇතුළු කර ගන්න අවශ්‍ය විදේශ සංචිත නැතිව. විදේශිකයන්ගෙන් පිරුණු මාලදිවයිනටත් එහෙම තත්ත්වයක් උදා වෙලා තිබෙනවා. අපට සිදු වුණා වාගේම දෙයක් ඒ රටටත් වෙලා තිබෙනවා. ඒ සංචාරකයන් දැන් ලංකාවට එමින් සිටිනවා. ඒ නිසා ඊයේ කැබිනට් මණ්ඩලයේදී තීන්දුවක් ගත්තා, free visa නිකුත් කරන වැඩ පිළිවෙළක් සම්බන්ධයෙන්. ඒ වාගේම, ලංකාවට ඇතුළු වීම සඳහා මේ වන විට රටවල් 38කට free visa ලබා දී තිබෙනවා.

ගරු කථානායකතුමනි, online visa සඳහා ගුවන් තොටුපළේ ඇති වෙලා තිබෙන තදබදය පිළිබඳ ප්‍රශ්නය අදාළ වන්නේ ගරු නිමල් සිරිපාල ද සිල්වා ඇමතිතුමාගේ අමාත්‍යාංශයට නොවෙයි. Immigration and Emigration Department එකට තමයි ඒක බලපාන්නේ. ඊයේ ඒ ගැනත් කථා කරමින් කිව්වා, on-arrival visa ලබා දීම සඳහාත් මීට වඩා පහසු ක්‍රමයක් ඇති කරන්න කියලා. ඒ සම්බන්ධවත් ඊයේ සාකච්ඡා කළා. මා හිතන විධියට ඒක සංචාරකයන්ට හොඳ පණිවුඩයක් වෙයි, ගරු කථානායකතුමනි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රශ්න අංක 4 -1288/2024- (1), ගරු කිංස් නෙල්සන් මහතා. *[සභා ගර්භය තුළ නැත.]*
ප්‍රශ්න අංක 5 -1706/2024- (1), ගරු කේ.පී.එස්. කුමාරසිරි මහතා. *[සභා ගර්භය තුළ නැත.]*
ප්‍රශ්න අංක 6 -1732/2024- (1), ගරු ජගත් ප්‍රියංකර මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

## මඩකලපුව දිස්ත්‍රික්කයේ රජයේ වී ගබඩා: විස්තර
### மட்டக்களப்பு மாவட்டத்திலுள்ள அரச நெற்களஞ்சியசாலைகள்: விவரம்
### STATE-OWNED PADDY WAREHOUSES IN BATTICALOA DISTRICT: DETAILS

1746/2024

7. **ගරු ඉම්රාන් මහරූෆ් මහතා**
(மாண்புமிகு இம்ரான் மஹ்ரூப்)
(The Hon. Imran Maharoof)
කෘෂිකර්ම සහ වැවිලි කර්මාන්ත අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) මඩකලපුව දිස්ත්‍රික්කයේ ඇති රජයේ වී ගබඩා සංඛ්‍යාව කොපමණද;
(ii) ඒවා පිහිටුවා ඇති ස්ථාන කවරේද;
(iii) එම එක් එක් වී ගබඩාවේ ධාරිතාව වෙන් වෙන් වශයෙන් කොපමණද;
(iv) 2015 සිට මේ දක්වා එම එක් එක් ගබඩාවේ ගබඩා කරන ලද වී ප්‍රමාණය වාර්ෂිකව වෙන් වෙන් වශයෙන් කොපමණද;

[ගරු ඉම්රාන් මහරූෆ් මහතා]

(v) ඉහත වී ගබඩාවලින් උපරිම ප්‍රයෝජනය ලබා ගැනීම සඳහා ක්‍රියාත්මක කිරීමට නියමිත වැඩසටහන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) (i) ඉහත (අ)(i)හි සඳහන් වී ගබඩා අතරින් මේ වනවිට භාවිතයට නොගන්නා වී ගබඩා තිබේද;

(ii) එසේ නම්, එම වී ගබඩා සංඛ්‍යාව කොපමණද;

(iii) ඒවා පිහිටි ස්ථාන කවරේද;

(iv) එම වී ගබඩා නැවත සක්‍රිය කිරීම සඳහා ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

கமத்தொழில் மற்றும் பெருந்தோட்டக் கைத்தொழில் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) மட்டக்களப்பு மாவட்டத்திலுள்ள அரச நெற் களஞ்சியசாலைகளின் எண்ணிக்கை யாதென் பதையும்;

(ii) அவை அமைந்துள்ள இடங்கள் யாவையென் பதையும்;

(iii) மேற்படி ஒவ்வொரு நெற்களஞ்சியசாலை யினதும் கொள்ளளவு தனித்தனியாக எவ்வள வென்பதையும்;

(iv) 2015ஆம் ஆண்டிலிருந்து இன்றுவரை மேற்படி ஒவ்வொரு களஞ்சியசாலையிலும் களஞ்சியப் படுத்தப்பட்ட நெல்லின் அளவு வருடாந்த ரீதியில் தனித்தனியாக எவ்வளவென்பதையும்;

(v) மேற்படி நெற்களஞ்சியசாலைகளிலிருந்து உச்ச மட்ட பயனைப் பெறுவதற்காக நடைமுறைப் படுத்தப்படவுள்ள வேலைத்திட்டங்கள் யாவை யென்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) (i) மேற்படி (அ)(i)இல் குறிப்பிடப்பட்டுள்ள நெற் களஞ்சியசாலைகளில் இன்றளவில் பயன்படுத் தப்படாத நெற் களஞ்சியசாலைகள் உள்ளனவா என்பதையும்;

(ii) ஆமெனில், அந்த நெற்களஞ்சியசாலைகளின் எண்ணிக்கை யாதென்பதையும்;

(iii) அவை அமைந்துள்ள இடங்கள் யாவை யென்பதையும்;

(iv) மேற்படி நெற்களஞ்சியசாலைகளை மீண்டும் செயற்படுத்துவதற்காக எடுக்கப்பட்டுள்ள நடவடிக்கைகள் யாவையென்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Agriculture and Plantation Industries:

(a) Will he inform this House -

(i) the number of State-owned paddy warehouses available in the Batticaloa District;

(ii) the places where the said warehouses are located;

(iii) separately, the capacity of each of those warehouses;

(iv) separately, the amounts of paddy that were stored in each of those warehouses in each year from 2015 to date; and

(v) the nature of the programmes that are expected to be implemented in order to get the maximum utilization of the said warehouses?

(b) Will he also inform this House -

(i) whether there are any paddy warehouses that are not utilized at present, out of the warehouses referred to in (a)(i) above;

(ii) if so, the number of such paddy warehouses;

(iii) the places where those warehouses are located; and

(iv) the measures that have been taken to bring those paddy warehouses back to operation?

(c) If not, why?

**ගරු මහින්ද අමරවීර මහතා (කෘෂිකර්ම සහ වැවිලි කර්මාන්ත අමාත්‍යතුමා)**

(மாண்புமிகு மஹிந்த அமரவீர - கமத்தொழில் மற்றும் பெருந்தோட்டக் கைத்தொழில் அமைச்சர்)

(The Hon. Mahinda Amaraweera- Minister of Agriculture and Plantation Industries)

ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) රජයේ වී ගබඩා 12කි.

(ii)

| අනු අංකය | ගබඩාව | පිහිටි ස්ථානය/ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය |
|---|---|---|
| 01 | මුල්ලාමනේ | මන්මුනේ බටහිර |
| 02 | පුලිපංචිකල් | කිරාන් |
| 03 | මනල්පෙඩ්ඩි | පට්ටිපොළ |
| 04 | කජුවත්ත | වාකරේ |
| 05 | කරදියනාරු | වෙන්කලඩි |
| 06 | තුම්පන්කරණි | පෝරතිව්පත්තු |
| 07 | වාලච්චේන | කෝරලෙයිපත්තු |
| 08 | සතොස | මන්මුනේ උතුර |
| 09 | අර්සඩතිව් | මන්මුනේ දකුණ |
| 10 | කලවංචිකුඩි | එරුවිල්පත්තු |
| 11 | කල්ලියන්කාඩු | පෝරතිව් |
| 12 | පෝරතිව් | පෝරතිව්පත්තු |

වගුව 01 - ගබඩාව අනුව පිහිටි ස්ථානය

(iii)

| අනු අංකය | ගබඩාව | ධාරිතාව (මෙ.ටො.) |
|---|---|---|
| 01 | මුල්ලාමනේ | 500 |
| 02 | පුලිපංචිකල් | 500 |
| 03 | මනල්පෙඩ්ඩි | 500 |
| 04 | කජුවත්ත | 500 |
| 05 | කරදියනාරු | 300 |
| 06 | තුම්පන්කරණි | 500 |
| 07 | වාලච්චේන | 1,000 |
| 08 | සතොස | 400 |
| 09 | අර්සඩතිව් | 300 |
| 10 | කලවංචිකුඩි | 275 |
| 11 | කල්ලියන්කාඩු | 1,000 |
| 12 | පෝරතිව් | 300 |

වගුව 02 - ගබඩාව අනුව ධාරිතාව

(iv)

| | ගබඩාව | කන්නය අනුව වී ප්‍රමාණය - කිලෝ ග්‍රෑම් | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | 2015/16 මහ | 2017/18 මහ | 2018 යල | 2018/19 මහ | 2019/20 මහ | 2020/21 මහ | 2021 යල | 2021/22 මහ | 2022 යල | 2023 යල |
| 1 | මුල්ලාමනේ | 436,400 | 6,900 | - | 236,200 | 452,500 | 242,050 | - | 63,150 | 77,013 | - |
| 2 | පුලිපංචිකල් | 778,550 | 53,000 | 24,000 | 396,250 | 414,850 | 127,500 | 16,550 | - | - | - |
| 3 | මනල්පෙඩ්ඩි | 489,850 | - | 17,650 | 243,650 | 350,250 | 280,900 | 18,172 | 349,820 | 110,312 | 27,017 |
| 4 | කරදියනාරු | 388,250 | - | - | 382,600 | 461,950 | 345,850 | 28,650 | 356,350 | 31,750 | - |
| 5 | පෝරතිව් | 549,850 | - | - | 304,500 | 330,100 | 152,650 | 29,420 | 14,960 | - | - |
| 6 | තුම්පන්කරණී | 591,850 | 48,700 | 189,150 | 331,000 | 369,750 | 238,550 | 87,340 | 235,664 | 201,963 | 59,343 |
| 7 | වාලච්චේන | - | - | - | - | - | 102,450 | 302,050 | 220,550 | 25,400 | - |
| 8 | කජුවත්ත | 529,450 | - | - | 99,150 | 23,000 | - | - | 483,095 | - | - |
| 9 | කලවංචිකුඩි | - | - | | 157,400 | - | - | - | - | 143,605 | - |
| 10 | අර්සඩතිව් | - | - | | 160,600 | - | - | - | - | - | - |
| 11 | සතොස | - | - | - | - | 44,950 | - | - | - | - | - |
| 12 | කල්ලියන්කාඩු | - | | | | 205,400 | 81,750 | - | | | |
| | එකතුව | 3,764,200 | 108,600 | 230,800 | 2,311,350 | 2,652,750 | 1,571,700 | 482,182 | 1,723,589 | 590,043 | 86,360 |

- 2023/24 මහ කන්නය සඳහා වී අලෙවි මණ්ඩලය විසින් වී මිලදී ගැනීමක් සිදු කර නොමැත.

(v)

- ඉහත වී ගබඩා ඉදිරි කන්නයේ වී මිලදී ගැනීම සඳහා යොදා ගැනීමට අපේක්ෂිතය.
- වී අලෙවි මණ්ඩලය විසින් මෙම ගබඩා භාවිතයට නොගන්නා කාලවලදී රජයේ ඇස්තමේන්තු කරන ලද බදු පදනම මත, කෙටි කාලීනව රජයට අයත් වෙනත් ආයතනවල අවශ්‍යතා පරිදි ගබඩා කටයුතු සිදු කිරීම සඳහා ලබා දීමට අපේක්ෂා කරයි.

(ආ) (i) නැත.

(ii) අදාළ නොවේ.

(iii) අදාළ නොවේ.

(iv) අදාළ නොවේ.

(ඇ) අදාළ නොවේ.

**ගරු ඉම්රාන් මහරූෆ් මහතා**
(மாண்புமிகு இம்ரான் மஹ்ரூப்)
(The Hon. Imran Maharoof)

நன்றி, கௌரவ சபாநாயகர் அவர்களே! இந்தக் கேள்வியானது, பல வருடங்களுக்கு முன்னர் என்னால் சமர்ப் பிக்கப்பட்டதாகும். இன்று இதற்குப் பதில் அளித்தமைக்கு கௌரவ அமைச்சர் அவர்களுக்கு நன்றி கூறுகின்றேன்.

கௌரவ அமைச்சர் அவர்களே, இன்று விவசாயிகள் மிகவும் கஷ்டத்துக்கு மத்தியிலேயே தங்களுடைய விவசாயச் செயற்பாடுகளை முன்னெடுத்து வருகின்றார்கள். எனினும், அவர்களுடைய நெல்லுக்கு நிர்ணய விலை இல்லாத காரணத்தால் அவர்கள் பல வழிகளிலும் பாதிக்கப் பட்டுக்கொண்டு இருக்கின்றார்கள். எனவே, உங்களுடைய அமைச்சின் மூலமாக நெல்லுக்கான நிர்ணய விலையைத் தீர்மானிப்பதற்குரிய ஏதாவதொரு வேலைத்திட்டம் முன்னெடுக்கப்படுகின்றதா? எனக் கேட்கின்றேன். குறிப்பாக, நெல் உற்பத்தி கூடுதலாக மேற்கொள்ளப்படுகின்ற மாவட்டங் களிலாவது உடனடியாக அமுல்படுத்தக்கூடிய வகையில் ஏதாவது ஒரு வேலைத்திட்டம் உங்களுடைய அமைச்சிடம் இருக்கின்றதா? என்பதுதான் என்னுடைய முதலாவது மேலதிகக் கேள்வியாகும்.

**ගරු මහින්ද අමරවීර මහතා**
(மாண்புமிகு மஹிந்த அமரவீர)
(The Hon. Mahinda Amaraweera)

ගරු කථානායකතුමනි, වී මිලදී ගැනීම සඳහා දැන් අපට මූල්‍ය ප්‍රතිපාදන ලැබී තිබෙනවා. අපි වී ගබඩා විවෘත කර තිබෙනවා. ඒ අනුව, දැනටමත් කීරි සම්බා විශාල ප්‍රමාණයක් අපට ලැබී තිබෙනවා. අඛණ්ඩව වී මිලදී ගැනීම අපි සිදු කරනවා. නමුත්, අද තිබෙන තත්ත්වය තමයි, රජයේ මිලට වඩා ඉහළ මිලකට පෞද්ගලික අංශය වී මිලදී ගැනීම. ගොවීන්ට හොඳ සාධාරණ මිලක් ලැබීම පිළිබඳව අපි සතුටු වනවා. වීවලට ස්ථාවර මිලක් නියම කර තිබෙනවා. ගොඩක් කට්ටිය විශේෂයෙන්ම ජනතා විමුක්ති පෙරමුණ නිරන්තරයෙන්ම ගොවියාට වී මිල සම්බන්ධ ගණන් කියනවා. මම හිතන විධියට ඒ කිසිම කණ්ඩායමක් වී මිලයි, හාල් මිලයි හරියට ගළපලා කථා කරන්නේ නැහැ. මම දැක්කා, නාඩු වී කිලෝවක් රුපියල් 150කට මිලදී ගන්න ඕනෑය කියලා එතුමන්ලාගේ ගොවි සංවිධාන එකමුතුව ද මොකක්ද කියන එකකින් ප්‍රකාශයක් කළා. වී කිලෝවක් රුපියල් 150ට මිලදී ගන්නවා නම් හාල් කිලෝවක් රුපියල් 300ක් වෙනවා. ඒ නිසා මම කියන්නේ, කවුරුන් හෝ වී මිලදී ගැනීම ගැන කථා කරනවා නම්, ගොවියා ගැන කථා කරනවා නම්, වී මිල ගැනත් කථා කරන්න, ඒ වාගේම පාරිභෝගිකයන්ට හාල් ලබා දෙන මිල ගැනත් කථා කරන්න කියලායි. මේක මම හැම දාම කියනවා. නිකම් බොරුවට ගොවීන්ගේ පැත්තට ගිහිල්ලා වී මිල ගැන කථා කරන්නත්, පාරිභෝගිකයාගේ පැත්තට ආවාම අඩුවට හාල් දෙන එක ගැන කථා කරන්නත් නොවෙයි, හරියට කෙළින් ඉඳගෙන කථා කරන්න කියලා ඒ සියලු පාර්ශ්වයන්ගෙන් මම ඉල්ලීමක් කරනවා.

ඒ වාගේම මම ඔබතුමාට කියන්න කැමැතියි, පොහොර සඳහා ලබා දෙන සහනාධාර මුදල් වැඩි කර දෙන්න අපි -රජය- තීන්දු කළ බව. ඒ අනුව, ලබන මාසයේ ඉඳලාම පොහොර නිකුත් කරන්න කටයුතු කරනවා. ඒ සඳහා කැබිනට් අනුමැතිය ලැබී තිබෙනවා. එතකොට රුපියල් 4,000ක වාගේ මිලක් තමයි පොහොර හොණ්ඩරයක් වෙනුවෙන් ගොවීන්ට වැය කරන්න වෙන්නේ. ඒ සහනය ගොවි ජනතාව වෙනුවෙන් ලබා දෙන්න අපි කටයුතු කරලා තිබෙනවා. මොකද, පොහොර සහනාධාරය සහ අනෙකුත් සහනාධාර ලබා දීම තුළින් රජය බලාපොරොත්තු වෙන්නේ මුළු රටේම පුරවැසියන්ට ඒ සහනය ලබා දෙන්නයි. මොකද, ගොවියාට වී නිෂ්පාදනය සඳහා වැය වන මුදල අඩු වෙනවා නම් සහල් අඩු මිලට ලබා දෙන්න පුළුවන්. ඒ වෙනුවෙන් තමයි රජය මේ මූල්‍ය ප්‍රදාන ලබා දෙන්න කටයුතු කරන්නේ.

**ගරු ඉම්රාන් මහරුෆ් මහතා**
(மாண்புமிகு இம்ரான் மஹ்ரூப்)
(The Hon. Imran Maharoof)
ගරු කථානායකතුමනි, මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

நன்றி, கௌரவ அமைச்சர் அவர்களே! எனது இரண்டாவது மேலதிகக் கேள்வியைக் கேட்கின்றேன்.

எங்களுடைய திருகோணமலை மாவட்டத்திலுள்ள விவசாயிகள் எதிர்நோக்குகின்ற பாரியதொரு பிரச்சினைதான், நெல்லைக் காய வைப்பதற்கான இட வசதிகள் இல்லாமை. திருகோணமலையிலுள்ள குறிப்பாக, கிண்ணியா, மூதூர், தோப்பூர், தம்பலகாமம், குச்சவெளி போன்ற பிரதேசங் களிலுள்ள விவசாயிகளுக்குத் தங்களுடைய நெல்லைக் காய வைப்பதற்கான இட வசதிகளை ஏற்படுத்திக் கொடுப்பதற்கு உங்களுடைய அமைச்சின்மூலம் ஏதாவது திட்டங்கள் முன்னெடுக்கப்படுகின்றதா? எனவும் அந்தப் பிரதேசத்தில் இருக்கின்ற விவசாயிகளுடைய நெல்லைக் களஞ்சியப் படுத்துவதற்கான இலகுவான வழிமுறைகளைச் செய்து கொடுப்பதற்கான நடவடிக்கைகள் ஏதாவது உங்களுடைய அமைச்சின்மூலம் முன்னெடுக்கப்படுகின்றதா? எனவும் நான் கௌரவ அமைச்சரிடம் கேட்க விரும்புகின்றேன்.

**ගරු මහින්ද අමරවීර මහතා**
(மாண்புமிகு மஹிந்த அமரவீர)
(The Hon. Mahinda Amaraweera)
ගරු කථානායකතුමනි, වී වේළීම සම්බන්ධ ප්‍රශ්නයක් තිබෙනවා. ඒ නිසා තමයි වී අලෙවි මණ්ඩලයට අයත් සෑම ගබඩාවක් වෙනුවෙන්ම වී වේලන මැෂින් එකක් - dryer එකක් - ලබා දෙන්න දැනට සැලසුම් කරලා තිබෙන්නේ. ඒ වාගේම ගොවි සංවිධාන වෙත අවශ්‍ය සහයෝගය ලබා දෙන්නත් අපි කටයුතු කරනවා. දැනටමත් ගොවි සංවිධාන හෝ පෞද්ගලික අයතන ඒ සඳහා අවම පොලියක් යටතේ සහ පොලී රහිතව ලබා දෙන ණය මුදල් පිළිබඳවත් අවධානය යොමු කරලා තිබෙනවා. මම හිතන්නේ ඉදිරියේදී ඒ ප්‍රශ්නය විසඳෙයි.

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා ඇහුවේ ඉතා වැදගත් ප්‍රශ්නයක්; ගොවීන්ට තිබෙන ප්‍රශ්නයක්. ඒක ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ ගොවීන්ට විතරක් නොවෙයි, ලංකාවේම ගොවීන්ට තිබෙන ප්‍රශ්නයක්. එයට විසඳුම් ලබා දෙන්න අපි මේ වන විටත් අවශ්‍ය පියවර ගනිමින් තිබෙනවා.

ගරු කථානායකතුමනි, මම විනාඩියක් පමණක් අරගෙන ඔබතුමාට තවත් කාරණයක් කියන්න කැමැතියි. මේ දිනවල දිගින් දිගටම ප්‍රචාරය වනවා, මාතර දිස්ත්‍රික්කයේ නිල්වලා ගඟ හරහා ඉදි කර තිබෙන ලවණ බාධකය හේතුවෙන් හානි වුණු කුඹුරු ඉඩම් ටික ආණ්ඩුවට පවරා ගන්නවා කියලා. ඒක සම්පූර්ණයෙන් අසත්‍යයක්. එහෙම එකක් නැහැ. ඉදිරිපත් කරපු කැබිනට් පත්‍රිකාවකට ලැබුණු නිර්දේශයක් මත තමයි ඒ කටයුත්ත පිළිබඳ යම් අදහසක් ඉදිරිපත් කරලා තිබෙන්නේ. ආණ්ඩුව ඒ ඉඩම් පවරා ගන්නේ නැහැ. ආණ්ඩුව ඉඩම් ලක්ෂ 20කට ඔප්පු ලබා දෙමින්, රජය සතු ඉඩම් ජනතාවට දෙන මේ වෙලාවේ ඉඩම් පවරා ගැනීමේ අවශ්‍යතාවක් කිසිසේත්ම නැහැ. ඒ වෙලාවේ යෝජනා කරලා තිබුණේ, දිගින් දිගටම කුඹුරු යට වනවා නම් වන්දියක් දීලා එම ඉඩම ගොවියාටම දීලා වෙනත් වගාවක් කරන්න ආධාරයකුත් දෙන්න කියලායි. නමුත්, ඒක වැරදි විධියට ප්‍රචාරය වුණා. දැන් ඒ කටයුත්ත සම්පූර්ණයෙන්ම නතර කර තිබෙනවා. මම ඉතා වගකීමෙන් කියනවා, මාතර දිස්ත්‍රික්කයේ ජනතාවගේ ඉඩම් කිසිදු ආකාරයකින් රජයට ගැනීමක් කරන්නේත් නැහැ, බලහත්කාරයෙන් යම් කටයුත්තක් කරන්නේත් නැහැ කියලා. ඒ අයට වෙච්ච අසාධාරණය වෙනුවෙන් ලොකු වන්දියක් දීලා, ඒ අයට තවත් ආධාර උපකාර කරලා, ඒ අයගේ ජීවිතය නඟා සිටුවන්න කරපු යෝජනාවක් තමයි තිබෙන්නේ. ඒ වාගේම ඒ පිළිබඳව සොයා බලන්න පාර්ලිමේන්තු විශේෂ කාරක සභාවක් පත් කරලාත් තිබෙනවා. කැබිනට් මණ්ඩලයේදී ඒ පිළිබඳව සාකච්ඡා කරලාත් තිබෙනවා. ඒ අනුව අපි අවසාන වශයෙන් තීන්දු කරලා තිබෙනවා, එම විශේෂ කාරක සභාවෙන් දෙන්නේ කුමන නිර්දේශයක් ද එම නිර්දේශ ක්‍රියාත්මක කිරීම සඳහා අනිවාර්යයෙන්ම කටයුතු කරනවා කියලා. ඒක තමයි දැනට තිබෙන එකඟතාව. එසේ නැතුව රජයට ඉඩම් පවරා ගැනීමක් කරන්නේ නැහැ, ආණ්ඩුවට ඒ ඉඩම්වල අවශ්‍යතාවකුත් නැහැ කියන කාරණය මම ඉතා වගකීමෙන් කියනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඊළඟ ප්‍රශ්නය. *[බාධා කිරීමක්]* ගරු ඩලස් අලහප්පෙරුම මන්ත්‍රීතුමා.

**ගරු ඩලස් අලහප්පෙරුම මහතා**
(மாண்புமிகு டலஸ் அழஹப்பெரும)
(The Hon. Dullas Alahapperuma)
ගරු කථානායකතුමනි, ගරු කෘෂිකර්ම සහ වැවිලි කර්මාන්ත අමාත්‍යතුමා සඳහන් කළා, මාතර නිල්වලා ගඟ ආශ්‍රිත ඉඩම් අක්කර 10,000ක් -හෙක්ටෙයාර 4,000ක්- පවරා ගැනීම පිළිබඳව වූ යෝජනාවක් ක්‍රියාත්මක වීමක් සිදු වන්නේ නැහැ කියලා.

ගරු ඇමතිතුමනි, මේක සිද්ධ වෙන්නේ මෙහෙමයි. ඔබතුමා මේ අවුරුද්දේ අප්‍රේල් මාසයේ කැබිනට් පත්‍රිකාව ඉදිරිපත් කරන්නේ කන්න 12ක් වගා හානි වෙච්ච ගොවීන්ට, කොරටු ගොවීන්ට වන්දි ගෙවන්නයි. ඔබතුමා ඒ යෝජනාව තමයි ඉදිරිපත් කරන්නේ. ඔබතුමාගේ යෝජනාවට ගරු ජනාධිපතිතුමා මුදල් ඇමතිවරයා විධියට එතුමාගේ observations ඉදිරිපත් කරලා කරන යෝජනාව තමයි, මේක හැමදාම සිද්ධ වෙන දෙයක්, ඒ නිසා මේ විධියට වන්දි ගෙවන එක නොවෙයි කළ යුත්තේ, මේ ඉඩම් රජයට පවරා ගැනීමයි කළ යුත්තේ කියන එක. වන්දි ගෙවලා පවරා ගැනීමයි. එහෙම නැතුව ගරු ඇමතිතුමා, මේක දේශපාලන වාසියක් ගන්න කවුරුවත් කෘත්‍රිමව නිර්මාණය කරපු media bubble එකක් නොවෙයි. ඒක අපි තේරුම් ගන්නට ඕනෑ. ඔබතුමා ඒක නිවැරදි කළා. හැබැයි, ජනාධිපතිතුමා මුදල් ඇමතිතුමා විධියට මේ මොහොත දක්වා ඒක නිවැරදි කරලා නැහැ. ඒ නිසායි මේ සැකය හැම වෙලාවේම කාන්දු වෙන්නේ. මේ සැකය වර්ධනය වෙන්නේ.

බොහොම ස්තුතියි.

**ගරු මහින්ද අමරවීර මහතා**
(மாண்புமிகு மஹிந்த அமரவீர)
(The Hon. Mahinda Amaraweera)
ගරු කථානායකතුමනි, මේ සඳහා කමිටුවක් පත් කරලා තිබෙනවා. ඒ කමිටුවේදීත් සාකච්ඡා කරලා දැනට යම් නිර්දේශ ලබා දීලා තිබෙනවා. කිසිසේත්ම ආණ්ඩුවට මේ ඉඩම්වල අවශ්‍යතාවක් නැහැ කියන එක පැහැදිලිව කියලා තිබෙනවා. ඒ වාගේම ජනාධිපතිතුමාත් කැබිනට් මණ්ඩලයේදී නැවතත් දැනුම් දීමක් කළා, ආණ්ඩුවට මේ ඉඩම් ගැනීමේ අවශ්‍යතාවක් නැහැ කියන එක. හැබැයි, ඒ ඉඩම්වලට එක් වතාවක් වන්දි දීලා තිබෙනවා නම් සහ පසුව ඒ ඉඩම් වී වගාවට නුසුදුසු ඒවා විධියට හඳුනාගෙන තිබෙනවා නම් වෙනත් වගාවකට හෝ රජයේ ආධාර

යටතේ ආර්ථික වශයෙන් වැඩි වටිනාකමක් ගන්න පුළුවන් ආදායම් මාර්ගවලට යොමු වෙන්නට ගොවි ජනතාව කැමැති නම් ඒ අනුව කටයුතු කරන්න කියන නිර්දේශ තමයි අපට ඒ කමිටු වාර්තාවෙනුත් ලැබෙමින් පවතින්නේ. නමුත් අපි ඒ සියල්ල පැත්තකට තියලයි තිබෙන්නේ. මම ඒක ඉතාම වගකීමෙන් කියනවා. දැන් ඒ පත්‍රිකා සියල්ල අපි පැත්තකින් තියලා තිබෙන්නේ.

අවසාන වශයෙන් මම මේ කාරණයත් කියන්න කැමැතියි. මේ සඳහා විශේෂ කාරක සභාවක් පත් කර තිබෙනවා. ගරු බුද්ධික පතිරණ මන්ත්‍රීතුමාත් එහි සාමාජිකයෙක් වශයෙන් ඉන්නවා. ගරු කථානායකතුමා තමයි ඒ විශේෂ කාරක සභාව පත් කළේ. එහි ඔබතුමන්ලා ඉන්නවා. මමත් ඒකට සම්බන්ධ වුණා. මේ විශේෂ කාරක සභාවෙන් දෙන්නේ කුමන නිර්දේශයද, ඒ නිර්දේශය මිසක් වෙනත් කිසිම නිර්දේශයක් අපි ක්‍රියාත්මක කරන්නේ නැහැ. මොකද, රජයට වුවමනාවක් නැහැ, ඉඩම් පවරා ගන්න. මම හිතන විධියට, මොනම රජයකටවත් වුවමනාවක් නැහැ. ගරු ජනාධිපතිතුමා ඉඩම් ලක්ෂ 20කට ඔප්පු ලබාදීලා අයිතිය ලබා දෙන මොහොතක තවත් ඉඩම් ආණ්ඩුවට ගැනීමේ අවශ්‍යතාවක් නැහැ.

## කුලී නිවාසවල පදිංචිකරුවන්: පදිංචිය තහවුරු කිරීමේ නොහැකියාව

## வாடகை வீடுகளில் வசிக்கும் குடியிருப்பாளர்கள்: வதிவிடத்தை நிரூபிக்க இயலாமை

## RESIDENTS LIVING IN RENTED HOUSES: INABILITY TO PROVE RESIDENCY

1755/2024

**8. ගරු ඉෂාක් රහුමාන් මහතා**
(மாண்புமிகு இஷாக் ரஹுமான்)
(The Hon. Ishak Rahuman)

අග්‍රාමාත්‍ය සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) කුලී නිවාසවල පදිංචි වී සිටින පදිංචිකරුවන්ට ඉඩමේ අයිතිය තහවුරු කිරීමට නොහැකි වීම සහ සිය නමට ලබා ගන්නා ලද ජල බිල්පත්/විදුලි බිල්පත් ඉදිරිපත් කිරීමට නොහැකි වීම හේතුවෙන් ඔවුන්ගේ දරුවන් රජයේ පාසල්වලට ඇතුළත් කිරීමේදී සහ ජාතික හැඳුනුම්පත් ලබා ගැනීමේදී විවිධ දුෂ්කරතාවලට මුහුණ දෙන බව පිළිගන්නේද;

(ii) එසේ නම්, එම ගැටලු විසඳීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

பிரதம அமைச்சரும் பொது நிருவாக, உள்நாட்டலுவல்கள், மாகாண சபைகள் மற்றும் உள்ளூராட்சி அமைச்சருமானவரைக் கேட்ட வினா:

(அ) (i) வாடகை வீடுகளில் வசித்துவரும் குடியிருப்பாளர்களுக்கு காணியின் உரித்தை உறுதிப்படுத்த முடியாமை மற்றும் தமது பெயரில் பெற்றுக்கொண்ட நீர்க் கட்டண/ மின்சாரக் கட்டணப் பட்டியல்களைச் சமர்ப்பிக்க முடியாமை போன்ற காரணங்களால் அவர்களது பிள்ளைகளை அரசாங்கப் பாடசாலைகளில் சேர்க்கின்றபோதும் தேசிய அடையாள அட்டைக்கு விண்ணப்பிக்கின்றபோதும் அவர்கள் பல்வேறு நெருக்கடிகளுக்கு முகம் கொடுக்கின்றனர் என்பதை ஏற்றுக்கொள்வாரா என்பதையும்;

(ii) ஆமெனில், மேற்படி பிரச்சினைகளைத் தீர்ப்பதற்காக மேற்கொள்ளும் நடவடிக்கைகள் யாவை என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Prime Minister and the Minister of Public Administration, Home Affairs, Provincial Councils and Local Government:

(a) Will he inform this House -

(i) whether he accepts that the residents living in rented houses face various difficulties in enrolling their children in government schools and obtaining National Identity Cards due to the inability of establishing the ownership of their lands and producing water bills/electricity bills obtained in their names ?

(ii) if so, the measures that are being taken to address aforesaid issues?

(b) If not, why?

**ගරු අශෝක ප්‍රියන්ත මහතා (ස්වදේශ කටයුතු රාජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு அசோக்க பிரியந்த - உள்நாட்டலுவல்கள் இராஜாங்க அமைச்சர்)
(The Hon. Ashoka Priyantha - State Minister of Home Affairs)

ගරු කථානායකතුමනි, අග්‍රාමාත්‍ය සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුරු ලබා දෙනවා.

(අ) (i) පිළිගනිමි.

(ii) කෙසේ වුවද, ඉඩමේ අයිතිය තහවුරු කිරීමට නොහැකි කුලී නිවාසවල පදිංචි වී සිටින පදිංචිකරුවන්ට ජල බිල්පත්/ විදුලි බිල්පත් ලබා ගැනීම සඳහා පදිංචි සහතික ලබා ගැනීමට බාධාවක් නොමැත.

පුරවැසියෙකුගේ යම් අවශ්‍යතාවක් සඳහා පදිංචිය තහවුරු කිරීමට ඉල්ලුම් කිරීමේදී, පහත සඳහන් ලේඛන/පරීක්ෂා කටයුතු ආශ්‍රයෙන් එම පුරවැසියාගේ පදිංචිය සනාථ කිරීමට ග්‍රාම නිලධාරින්හට රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය විසින් උපදෙස් ලබා දී ඇත.

අපගේ අමාත්‍යාංශයෙන් ඒ අයට ඒ ලියවිලි ඉදිරිපත් කරන්න උපදෙස් ලබා දී තිබෙනවා, ගරු මන්ත්‍රීතුමා.

ඡන්ද හිමි නාම ලේඛනය

ඡන්ද හිමි නාම ලේඛනයේ නම ඇතුළත්ව තිබීම අනිවාර්ය හා එකම සාධකය ලෙස නොසලකා පුරවැසියාගේ පදිංචිය සම්බන්ධයෙන් ක්ෂේත්‍ර පරීක්ෂණ හා වෙනත් සුදුසුකම් සොයා බැලීම් ආශ්‍රයෙන් කරුණු තහවුරු කරගෙන පදිංචිය

[ගරු අශෝක ප්‍රියන්ත මහතා ]

සනාථ කිරීම. (රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශ ලේකම්ගේ අංක HAF-3-MISCL-04-001 හා 2011.06.05 දිනැති ලිපිය හා අංක HAF-3-MISCL -04-001-II හා 2019.01.26 දිනැති ලිපිය අනුව)

ඒ කියන්නේ 2011.06.05 දිනැති සහ 2019.01.26 දිනැති ලිපි මඟින් අදාළ නිලධාරින්ට ඉතා පැහැදිලිව උපදෙස් ලබා දී තිබෙනවා.

මේ අනුව, කුලී නිවාසවල පදිංචිව සිටින පදිංචිකරුවන්ට ද ඔවුන්ගේ පරිපාලනමය අවශ්‍යතා වෙනුවෙන් ග්‍රාම නිලධාරින් මඟින් පදිංචිය සනාථ කිරීම සඳහා ඉඩමේ අයිතිය තහවුරු කිරීම අනිවාර්ය අවශ්‍යතාවක් නොවේ.

ජල, විදුලි බිල්පත් ලබා ගැනීමට අදාළව පදිංචිය සහතික කිරීම හැර වෙනත් අවශ්‍යතා සඳහා එම ආයතන මඟින් නිකුත් කර ඇති උපදෙස් හා රෙගුලාසි අදාළ වේ.

ජාතික හැඳුනුම්පත් නිකුත් කිරීමේදී සහ ඔවුන්ගේ දරුවන් රජයේ පාසල්වලට ඇතුළත් කිරීමේදී එම අදාළ ආයතන මඟින් නිකුත් කර ඇති චක්‍රලේඛ, උපදෙස් හා රෙගුලාසි අදාළ වේ.

(ආ) අදාළ නොවේ.

**ගරු ඉෂාක් රහුමාන් මහතා**
(மாண்புமிகு இஷாக் ரஹுமான்)
(The Hon. Ishak Rahuman)
ගරු කථානායකතුමනි, මගේ පළමුවන අතුරු ප්‍රශ්නය මෙයයි.

අවුරුදු දෙකකට පෙර මේ රටේ ආර්ථික ප්‍රශ්නයක් තිබුණා. දැන් එය යම්කිසි මට්ටමකට හොඳ පැත්තකට හැරිලා තිබෙනවා. මේ රටේ ජනතාව වෙනුවෙන් ඉදිරියේදී යම්කිසි පියවරක් ගන්න රජය සූදානම් වෙලා ඉන්නවා ද කියලා අදාළ විෂය භාර ඇමතිතුමාගෙන්ම මම අහනවා.

**ගරු අශෝක ප්‍රියන්ත මහතා**
(மாண்புமிகு அசோக்க பிரியந்த)
(The Hon. Ashoka Priyantha)
ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට අපේ අමාත්‍යාංශයෙන් සම්පූර්ණ පිළිතුරක් දෙන්න බැහැ. නමුත් රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන විෂය ඇතුළේ ජනාධිපතිතුමාගේ උපදෙස් ඇතුව ගරු අග්‍රාමාත්‍යතුමා ඇතුළු අපේ අමාත්‍යාංශය රාජ්‍ය නිලධාරින් වෙනුවෙන් දැනටමත් මේ පිළිබඳව වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරලා ඉවරයි. ගරු මන්ත්‍රීතුමනි, අපි 2024 අය වැය ලේඛනය මඟින් රුපියල් 10,000ක පඩි වැඩි කිරීමක් කරපු බව ඔබතුමාත් දන්නවා. ඩලස් අලහප්පෙරුම මන්ත්‍රීතුමාත් අවස්ථා කිහිපයක දී අපට කථා කරලා මේ පිළිබඳව විශේෂ අවධානය යොමු කළා. මේ අසීරු -අමාරු- ආර්ථිකයක් පවතින අවස්ථාවේදීත් අපි පරිපාලනයට විශේෂ අවශ්‍යතාවක්ව තිබුණු ග්‍රාම නිලධාරි පුරප්පාඩු පුරවන්න ග්‍රාම නිලධාරිවරු 1,942කට පත්වීම් ලබා දුන්නා. මේ වෙද්දි ඔවුන් ක්ෂේත්‍රයේ වැඩවල නියැළිලා ඉන්නවා. වැටුප් ගෙවීම, විශ්‍රාම වැටුප් ගෙවීමේ අපහසුතා ආදී වශයෙන් විශ්‍රාමිකයන්ගේ ගැටලු ගණනාවක් තිබුණා. ගරු අග්‍රාමාත්‍යතුමා ඒ පිළිබඳව පාර්ලිමේන්තුවේ අවධානය යොමු කරවලා, නිතර නිතර සාකච්ඡා පවත්වා තිබෙනවා. ඒ අනුව මේ වෙද්දි විශ්‍රාමිකයන්ගේ විශ්‍රාම වැටුප් ගෙවීම් යථා තත්ත්වයට පත් කර, විශ්‍රාම වැටුප් ගැටලු නැති තත්ත්වයට පත් කරලා තිබෙනවා.

ගරු කථානායකතුමනි, ඒ වාගේම රාජ්‍ය සේවයේ අත්‍යවශ්‍ය සේවා සඳහා නිලධාරින්ගේ අවශ්‍යතාව තිබෙනවා. ඒ අත්‍යවශ්‍ය සේවාවල සහ නිලධාරින්ගේ ගැටලු විසඳන්න රජයක් විධියට, අමාත්‍යාංශයක් විධියට අපි කටයුතු කර තිබෙනවා. ගරු අගමැතිතුමාගේ උපදෙස් සහ එතුමාගේ මැදිහත් වීම මත අවශ්‍ය තනතුරු පුරවන්න කටයුතු කර තිබෙනවා. අග්‍රාමාත්‍ය ලේකම්තුමාගේ ප්‍රධානත්වයෙන් කමිටුවක් පත් කරලා ඒ කටයුතු දැන් අවසන් කරලා තිබෙනවා.

ගරු මන්ත්‍රීතුමනි, බහුකාර්ය සංවර්ධන සහායකයන් හැටියට දරුවන් විශාල පිරිසක් බඳවාගෙන කිසිම විෂයක් නැතුව තැන් තැන්වලට දමලා තිබුණු බව ඔබතුමාත් දන්නවා ඇති. මේ අමාරු - අසීරු- අවස්ථාවේ ඒ අයත් රාජ්‍ය සේවයට ඇතුළත් කරලා, රාජ්‍ය සේවයේ පුරප්පාඩු තිබෙන තැන්වල රැකියාවලට ස්ථානගත කරලා තිබෙනවා. ඉදිරියේ දී අමුතුවෙන් කරන්න දෙයක් නැහැ. ගරු අග්‍රාමාත්‍යතුමා ජනාධිපතිතුමාගේ උපදෙස් මත අපේ අමාත්‍යාංශය යටතේ අපේ නිලධාරින් එක්ක එකතු වෙලා රාජ්‍ය සේවය ශක්තිමත් කරන්න, රාජ්‍ය නිලධාරින්ට පහසුකම් සපයන්න, ඔවුන්ගේ වැටුප් වැඩි කරන්න දැවැන්ත කාර්යභාරයක් ඉෂ්ට කරලා තිබෙනවා.

ගරු කථානායකතුමනි, වර්තමානයේ දී නම් බොහෝ අය ජනාධිපතිවරණය ඉලක්ක කරලා අරවා දෙනවා, මේවා දෙනවා කියලා කියනවා.

ගරු මන්ත්‍රීතුමා පුළුල්ව අහන කාරණාවට මට උත්තරයක් සපයන්න බැහැ. නමුත් අපි අමාත්‍යාංශයක් විධියට රාජ්‍ය සේවය ශක්තිමත් කරලා, ඔවුන්ට ජීවත් වෙන්න පුළුවන් වේතනයක් නිර්මාණය කිරීමටත්, ඔවුන්ගේ ගෞරවය ආරක්ෂා කරන්නත් කටයුතු කර තිබෙනවා. 2025 වර්ෂය සඳහා ඔවුන්ගේ වැටුප් වැඩි කිරීම සඳහා වූ යෝජනාවලිය අපේ අමාත්‍යාංශය විසින් ඉදිරිපත් කරලා, ජනාධිපතිතුමා ඒක පිළිගෙන තිබෙනවා. ඒ ගැන කියන්න ගියොත් ලොකු වෙලාවක් යන නිසා මම ඒ ගැන කියන්නේ නැහැ. මේ වෙද්දි ඒක ගැන මාධ්‍යයෙන්, එහෙන්, මෙහෙන් දැනගන්න පුළුවන්කම ලැබෙනවා.

**ගරු ඉෂාක් රහුමාන් මහතා**
(மாண்புமிகு இஷாக் ரஹுமான்)
(The Hon. Ishak Rahuman)
ගරු කථානායකතුමනි, මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

ගරු රාජ්‍ය ඇමතිතුමනි, මේ කාලයේ හැම වේදිකාවකම පොරොන්දු දෙනවා, රජයේ සේවකයන්ගේ පඩි වැඩි කරනවා කියලා. ගරු අගමැතිතුමාත් මේ අවස්ථාවේ සභාවේ සිටින නිසා මම මේ කාරණය අහන්න කැමැතියි. ගරු අගමැතිතුමනි, රජයේ සේවකයන්ට රුපියල් 25,000කින් පඩි වැඩි කිරීමට කැබිනට් මණ්ඩල අනුමැතියක් අරගෙන තිබෙනවා කියලා කියනවා. රනිල් වික්‍රමසිංහ මැතිතුමා මේ ජනාධිපතිවරණය ජයග්‍රහණය කරලා නැවතත් ජනාධිපතිවරයා විධියට පත් වුණොත් 2025දී එම රුපියල් 25,000ක වැටුප් වැඩිවීම අනිවාර්යයෙන්ම ලබා දෙනවාද, එහෙම නැත්නම් ඒක පොරොන්දුවක් පමණද කියලායි මම අහන්නේ. *[බාධා කිරීම්]*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Order, please!

**ගරු අශෝක ප්‍රියන්ත මහතා**
(மாண்புமிகு அசோக்க பிரியந்த)
(The Hon. Ashoka Priyantha)

ගරු කථානායකතුමනි, රජයේ නිලධාරින්ට කාගෙන් හරි පඩි වැඩිවීමක් වෙනවා නම්, ස්වදේශ කටයුතු රාජ්‍ය අමාත්‍යවරයා විධියට මම ගොඩක් සතුටු වෙනවා. මේ තිබෙන දරිද්‍රතාව මත ජීවත් වෙන්න සුදුසු වැටුපක් -වේතනයක්- ලැබෙනවා නම්, කවුරු හරි පඩි වැඩි කරනවා නම්, මේ කාල සීමාව තුළ ඔවුන්ට ලබා දුන් පොරොන්දු ඉටු වෙනවා නම්, රාජ්‍ය අමාත්‍යවරයා විධියට මම ඉතාම සතුටු වෙනවා. හැබැයි මම ඔබතුමාටත්, මේ සභාවටත් කිව්වා, අමාත්‍යාංශයක් විධියට අපි බොරු පොරොන්දු දෙන්නේ නැහැ කියලා. මේ වෙද්දී අපට කරන්න පුළුවන් කාර්යභාරය අපි කර තිබෙනවා. ඒ ගැන නැවත කියන්න ඕනෑ නැහැ. 2024 අවුරුද්දේත් අපි රුපියල් 10,000ක පඩි වැඩිවීමක් කර තිබෙනවා. 2025දීත් ඒ වැඩි කිරීම අපි අමාත්‍යාංශයක් විධියට කරන්න බලාපොරොත්තු වෙනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

Order, please! Will an Hon. Member propose the Hon. (Major) Sudarshana Denipitiya to the Chair?

**ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)

Sir, I propose that the Hon. (Major) Sudarshana Denipitiya do now take the Chair.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***අනතුරුව ගරු කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු (මේජර්) සුදර්ශන දෙනිපිටිය මහතා මූලාසනාරූඪ විය.***
*அதன்பிறகு, மாண்புமிகு சபாநாயகர் அவர்கள் அக்கிராசனத்திலின்று அகலவே, மாண்புமிகு (மேஜர்) சுதர்ஷன தெனிபிடிய அவர்கள் தலைமை வகித்தார்கள்.*
*Whereupon THE HON. SPEAKER left the Chair, and THE HON. (MAJOR) SUDARSHANA DENIPITIYA took the Chair.*

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)

Sir, I rise to a point of Order.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

Yes, Hon. (Dr.) Harsha de Silva?

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පාර්ලිමේන්තුවේ Secretary-General අපට WhatsApp පණිවුඩයක් එවා තිබෙනවා, "You are kindly invited to be present at the Special Meeting with the Hon. Speaker, Governor of the Central Bank and the officials on the accountability of the Central Bank of Sri Lanka to Parliament under Section 80(2) of the CBSL Act, No. 16 of 2023 to be held today at 11 a.m. at CR No.1 of Parliament" කියලා. ශ්‍රී ලංකා මහ බැංකු පනත යටතේ තීරණය කර තිබෙන්නේ, මහ බැංකුවෙන් මාස 6කට සැරයක් ඉදිරිපත් කරන වාර්තාව රජයේ මුදල් පිළිබඳ කාරක සභාව හරහා පාර්ලිමේන්තුවට ලැබෙන්න ඕනෑ කියලායි.

ඒක තමයි තීරණය. එම තීරණය අරගෙන තිබුණේ මහ බැංකුව සහ රජයේ මුදල් පිළිබඳ කාරක සභාව. ඊට පස්සේ ඒක පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරලා තිබෙනවා. එතකොට මොන කමිටුවක් යටතේ ද මේ සාකච්ඡාව කරන්නේ? මෙහෙම *ad hoc* විධියට කරන්න පුළුවන්ද? තීරණයක් අරගෙන තිබියදීත් ඒ තීරණය වෙනස් කර තිබෙන්නේ ඇයි? රජයේ මුදල් පිළිබඳ කාරක සභාවට ඒ ගැන දන්වලාත් නැහැ.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

මට හිතෙන විධියට ගරු මන්ත්‍රීතුමන්ලා දැනුවත් කරන්න තමයි කැඳවලා තිබෙන්නේ.

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)

නැහැ. අද පෙරවරු 11.30ට රජයේ මුදල් පිළිබඳ කාරක සභාව රැස්වෙනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

දැනුවත් කිරීම සඳහා තමයි සියලු මන්ත්‍රීවරුන් කැඳවලා තිබෙන්නේ.

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)

එහෙම නොවෙයි නේ. ඒක ඉදිරිපත් කරන්න ඕනෑ රජයේ මුදල් පිළිබඳ කාරක සභාවට නම්, ඒක රජයේ මුදල් පිළිබඳ කාරක සභාවට ඉදිරිපත් කරලා අනෙක් මන්ත්‍රීවරුන් දැනුවත් කරන්න පුළුවන්, ඒකට සහභාගි වෙන්න කියලා. ඒකේ කිසිම ගැටලුවක් නැහැ. සියලු මන්ත්‍රීවරුන්ට ඒකට සහභාගි වෙන්න පුළුවන්. ඒක නිසා මේක *ad hoc* විධියට කරන එක නොවෙයි නේ කරන්න ඕනෑ. මහ බැංකුවේ වාර්තාව රජයේ මුදල් පිළිබඳ කාරක සභාවට ඉදිරිපත් කිරීම සම්බන්ධව තීරණයක් ගෙන තිබෙනවා. ඒ තීරණය ගත්තේ අද ඊයේ නොවෙයි, මාස 6කට කලින්. ගරු සභානායකතුමනි, ඒ තීරණය ගත්තේ ශ්‍රී ලංකා මහ බැංකු පනත සම්මත වෙනකොට. ඒ නිසා ඒක වෙනස් කරන්න එපා. මේ රැස්වීම රජයේ මුදල් පිළිබඳ කාරක සභාව යටතේ තියලා, සියලු මන්ත්‍රීවරුන්ට රජයේ මුදල් පිළිබඳ කාරක සභාවට එන්න කියන්න. You cannot do it this way; you cannot be *ad hoc* about these things.

**ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේක අද උදේ කථානායකතුමා නිවේදනයක් හැටියට කියෙව්වා. කථානායකතුමා නිවේදනයක් කළාට පස්සේ ඒක නැවත වෙනස් කරන්න බැහැ.

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)

අපට ලැබුණේ WhatsApp පණිවුඩයක්.

**ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)

ඒක හරි. ඔබතුමන්ලාට WhatsApp පණිවුඩයක් ලැබුණාට, අද උදේ සභාව ආරම්භයේ දීම න්‍යාය පත්‍රයේ තිබුණු අංගයක් හැටියට ගරු කථානායකතුමා ඒක නිවේදනය කළා.

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)
ඒ ගැන කථානායකතුමාගෙන් අහන්න තමයි මම නැඟිට්ටේ. එතකොට කථානායකතුමා මූලාසනයෙන් ගිහිල්ලා මෙතුමා, -

**ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)
අද පෙරවරු 11.00ට ඒක රැස් වෙනවා නම්, එතැනදී ඔය ප්‍රශ්නය මතු කරන්න ඔබතුමාට අවස්ථාවක් තිබෙනවා.

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)
එතැනදී මේ ප්‍රශ්නය මතු කරන එක ගැන නොවෙයි මම කියන්නේ, ගරු සභානායකතුමනි. මේකට ක්‍රමයක් තිබෙනවා නේ. *Ad hoc* විධියට එක එක අය කථා කරනවා වෙනුවට, අපි ඒ තිබෙන ක්‍රමය අනුව යමු. ඒකේ කවුරු හිටියත් මට ප්‍රශ්නයක් නැහැ. නමුත් රජයේ මුදල් පිළිබඳ කාරක සභාවට තමයි මහ බැංකුවේ වාර්තාව ගැන සාකච්ඡා කිරීමේ වගකීම තිබෙන්නේ.

**ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)
හරි, හරි.

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)
එතකොට මේකට මොකද කරන්නේ? රජයේ මුදල් පිළිබඳ කාරක සභාව අද පෙරවරු 11.30ට රැස් වෙනවා. මේ කමිටුව කැඳවලා තිබෙනවා, පෙරවරු 11.00ට. අනෙක් අතට, මේක කමිටුවකුත් නොවෙයි.

**ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)
මේක කමිටුවක් නොවෙයි. මන්ත්‍රීවරුන් දැනුවත් කිරීමක් කරන්නේ. මන්ත්‍රීවරුන් දැනුවත් කිරීමේ වරදක් තිබෙනවාද?

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)
ඒක වරදක් නොවෙයි. නමුත් අපේ නීතිය අනුව තිබෙන්නේ පාර්ලිමේන්තුවට, -

**ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)
ඔබතුමා කියන කාරණය හරි. මේක අනිවාර්යයෙන්ම ඔබතුමාගේ කාරක සභාවට ඉදිරිපත් කරනවා. එහෙම වුණත් මන්ත්‍රීවරු දැනුවත් කරන එකේ කිසිම වරදක් තිබෙනවා කියලා මට නම් පෙනෙන්නේ නැහැ.

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)
නමුත් මේකේ තිබෙන්නේ එහෙම නොවෙයි නේ. මේකේ තිබෙන්නේ, ශ්‍රී ලංකා මහ බැංකු පනතේ 80(2)(අ) වගන්තිය යටතේ කියලා.

**ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)
ඔව්, ඉතින්. පනතේ වගන්තියක් කියලා එපායැ ඒක කියන්න. නැතුව නිකම් කියන්න බැහැ නේ.

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)
මෙහෙමයි, ගරු සභානායකතුමනි. අපේ පාර්ලිමේන්තුවේ සාමාන්‍ය ක්‍රමයක් තිබෙනවා නේ; there is an accepted practice.

So, all what I am saying is, the accepted practice is for the Central Bank to present its reports to the Committee on Public Finance, not to some *ad hoc* group who would meet on and off.

**ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)
Definitely, this Report will be submitted to your Committee according to the law that we passed here. There is no question about that. But, I do not see any issue in presenting the facts and figures to the entire Members of Parliament.

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)
That could be done, Sir. All what I am saying is, that should be done according to the accepted principles.

**ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)
Yes. Definitely, the Report will be submitted to your Committee.

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)
We - our Committee - have not been consulted.

**ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)
The Committee on Public Finance is there to look into certain issues in the Report. That is true.

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)
But, they are supposed to submit the Report to the Committee on Public Finance.

**ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)
But, I do not see any fault in presenting it to the entire Members of Parliament because your Committee also comprises Members of Parliament.

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)

That is not what I am saying. What I am saying is, there is an understanding, a written understanding that they will present their six-monthly Report to the Committee on Public Finance, not to some other *ad hoc* group.

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)

I understand that; I agree with that. So, we need not debate it here. We will refer it to the Hon. Speaker.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

Thank you. Let us move back again to Questions.

## ශ්‍රී ලංකා විදුහල්පති සේවය, ශ්‍රී ලංකා ගුරු සේවය සහ ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවය: ස්ථාන මාරු ප්‍රතිපත්ති

## இலங்கை அதிபர் சேவை, இலங்கை ஆசிரியர் சேவை மற்றும் இலங்கை கல்வி நிருவாக சேவை: இடமாற்றக் கொள்கை

## SRI LANKA PRINCIPALS' SERVICE, SRI LANKA TEACHERS' SERVICE AND SRI LANKA EDUCATION ADMINISTRATIVE SERVICE: TRANSFER POLICIES

1880/2024

**9.** ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය
(மாண்புமிகு (திருமதி) ரோஹினி குமாரி விஜேரத்ன)
(The Hon. (Mrs.) Rohini Kumari Wijerathna)
අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ සහ ශ්‍රී ලංකා ගුරු සේවයේ නිලධාරින් සඳහා නිශ්චිත ස්ථාන මාරු ප්‍රතිපත්තියක් තිබේද;

(ii) එසේ නම්, එම ස්ථාන මාරු ප්‍රතිපත්තියේ අඩංගු ප්‍රධාන කරුණු හා නිර්ණායක කවරේද;

(iii) ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ නිලධාරින් සඳහා නිශ්චිත ස්ථාන මාරු ප්‍රතිපත්තියක් ක්‍රියාත්මක නොවන බව දන්නේද;

(iv) එසේ නම්, ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ නිලධාරින් සඳහා නිශ්චිත ස්ථාන මාරු ප්‍රතිපත්තියක් ක්‍රියාත්මක කිරීමට ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

கல்வி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) இலங்கை அதிபர் சேவையிலும் இலங்கை ஆசிரியர் சேவையிலுமுள்ள அலுவலர்களுக் கென திட்டவட்டமான இடமாற்றக் கொள்கை யொன்று உள்ளதா என்பதையும்;

(ii) ஆமெனில், மேற்படி இடமாற்றக் கொள்கையில் உள்ளடங்கியுள்ள பிரதானமான விடயங்களும் அளவுகோல்களும் யாவையென்பதையும்;

(iii) இலங்கை கல்வி நிருவாக சேவையிலுள்ள அலு வலர்களுக்கென திட்டவட்டமான இடமாற்றக் கொள்கையொன்று நடைமுறையிலில்லை என் பதை அறிவாரா என்பதையும்;

(iv) ஆமெனில், இலங்கை கல்வி நிருவாக சேவை யிலுள்ள அலுவலர்களுக்காக திட்டவட்டமான இடமாற்றக் கொள்கையொன்றை நடைமுறைப் படுத்துவதற்கு எடுக்கப்படும் நடவடிக்கைகள் யாவையென்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Education:

(a) Will he inform this House -

(i) whether there is a specific transfer policy for officers of the Sri Lanka Principals' Service and Sri Lanka Teachers' Service;

(ii) the main components and criteria contained in the said transfer policy;

(iii) whether it is known that no specific transfer policy is in place for officers of the Sri Lanka Education Administration Service; and

(iv) if so, the steps that will be taken to implement a specific transfer policy for the officers of the Sri Lanka Education Administration Service?

(b) If not, why?

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ සහ ශ්‍රී ලංකා ගුරු සේවයේ නිලධාරින් සඳහා නිශ්චිත ස්ථාන මාරු ප්‍රතිපත්තියක් තිබේ.

(ii) ශ්‍රී ලංකා විදුහල්පති සේවය

- අධ්‍යාපන අමාත්‍යාංශ චක්‍රලේඛ 43/2023 - ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ -ජාතික පාසල්- නිලධාරින්ගේ වාර්ෂික ස්ථාන මාරු පටිපාටිය - 2024 (ඇමුණුම 01)
- කාර්ය පටිපාටික රීති සංග්‍රහයේ ස්ථාන මාරු සඳහා අදාළ කොටස (ඇමුණුම 02) ශ්‍රී ලංකා ගුරු සේවය
- 2007/20 ජාතික ගුරු මාරු ප්‍රතිපත්තිය (ඇමුණුම 03)
- 2024 වර්ෂයට අදාළව සකස් කළ ගුරු ස්ථාන මාරු නිර්ණායක හා පාසල් වර්ගීකරණ ලේඛනය (ඇමුණුම 04)
- ස්ථාන මාරු අයදුම් කිරීමේදී වෛද්‍ය කරුණු සනාථ කිරීමේ ආකෘතිය (ඇමුණුම 05)

[ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා]

(iii) ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවය සඳහා රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද ස්ථාන මාරු පටිපාටියක් පවතින අතර, ඇමුණුම 06 මඟින් එය ඉදිරිපත් කර ඇත. ඒ අනුව ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ ස්ථාන මාරු පටිපාටිය -I, II හා III ශ්‍රේණි සඳහා- අමාත්‍යාංශ චක්‍රලේඛ අංක 32/2022 යටතේ 2022.09.07 දිනැතිව අධ්‍යාපන අමාත්‍යාංශ වෙබ් අඩවියේ ප්‍රසිද්ධියට පත් කර ඇත.

ඇමුණුම් 01, 02, 03, 04, 05 සහ 06 **සභාගත*** කරමි.

(iv) ඉහත (iii)හි සඳහන් චක්‍රලේඛය අනුව, 2022/2023 වර්ෂය සඳහා අධ්‍යාපන පරිපාලන සේවයේ නිලධාරින්ගේ වාර්ෂික ස්ථාන මාරු අයදුම් කරමින් අයදුම්පත් 243ක් යොමු වූ අතර, ඒ අනුව අදාළ ස්ථාන මාරු නියෝග 2023.03.27 දින අමාත්‍යාංශ වෙබ් අඩවියේ පළ කර ඇත. වාර්ෂික ස්ථාන මාරු සමාලෝචන කමිටු තීරණ හා රාජ්‍ය සේවා කොමිෂන් සභාවට ඉදිරිපත් කරන ලද අභියාචනා තීරණවලින් පසුව නිලධාරින් 59 දෙනෙකුට ස්ථාන මාරුවීම් ලබා දී ඇත.

මෙම ස්ථාන මාරු 2024.01.01 දින සිට ක්‍රියාත්මක කර ඇති අතර, 2024/2025 වර්ෂය සඳහා අදාළ වාර්ෂික ස්ථාන මාරු චක්‍රලේඛය 2024 ජනාධිපතිවරණ ඡන්ද විමසීමෙන් පසුව නිකුත් කිරීමට නියමිතය.

(ආ) අදාළ නොවේ.

**ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය**
(மாண்புமிகு (திருமதி) ரோஹினி குமாரி விஜேரத்ன)
(The Hon. (Mrs.) Rohini Kumari Wijerathna)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය අහන්න කලින් මේ කාරණය කියන්න ඕනෑ. ගරු ඇමතිතුමනි, ඔබතුමාත් මමත් හොඳාකාරවම දන්නවා, ගුරුවරුන් මාරු කරන ක්‍රමයක් තිබුණා වුණත්, ඒ ක්‍රමයේ යම් යම් තැන්වල ගැටලු තිබෙන බව. දුෂ්කර පළාතකට ගිය කෙනෙකුට එතැනින් එන්න තිබෙන අපහසුතාව කොච්චරද කියලා අපි දන්නවා. හරි ප්‍රතිපත්තියක් තිබෙනවා නම් ඒක එහෙම වෙන්නේ නැහැ. ඒ, පළමුවැනි කාරණය.

දෙවැනි කාරණය මෙයයි. පළාත් පාසලක ඉඳලා ජාතික පාසලකට එන්න ගුරුවරයෙකු කොච්චර දුකක් විඳින්න ඕනෑද කියලා මම දන්නවා. මොකද, මම ඒක පෞද්ගලිකව අත්විඳපු කෙනෙක් නිසා. ඒ වාගේ ගැටලු ගණනාවක් ඒ ක්‍රමය තුළ තිබෙනවා. ඊළඟට, පාසලේදී පරිපාලනයත් එක්ක යම් කිසි ගැටලුවක් ඇති වුණොත්, එතැනදීත් එම ගුරුවරයාට ගැටලුවක් මතු වෙනවා. ඒ වාගේම ගුරු මාරු මණ්ඩලවල යම් යම් පුද්ගලයන් වාඩි වුණත්, ගුරුවරුන් මාරුවීමක් හදා ගන්න යනකොට මුහුණ දෙන ගැටලු පිළිබඳවත් මම දන්නවා. මේ සම්බන්ධ චක්‍රලේඛ හෝ මොන මොනවා හරි වගන්ති හෝ තිබෙන්න පුළුවන්. පසුගිය කාලයේ අධ්‍යාපනය පිළිබඳ ආංශික අධීක්ෂණ කමිටුවේදී අපි ජාතික ගුරු මාරු ප්‍රතිපත්තියක්, ඒ කියන්නේ ගුරු වෘත්තියට එන කෙනෙක් තමන්ගේ සේවා කාලය ඇතුළත යන්නේ මොන මොන පාසල්වලටද කියන එක සම්බන්ධව යම් ක්‍රමයක් - system එකක් - හැදුවා. ඔබතුමාගේ අමාත්‍යාංශයේ දත්ත පද්ධතිය යාවත්කාලීන කර ගත්ත දවසට හෝ -දැනට අමාත්‍යාංශයේ දත්ත පද්ධතිය පිළිබඳව ගැටලුවක් තිබෙනවා- ඒ හදපු ජාතික ගුරු මාරු ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කරන්න. උදාහරණයක් විධියට ගත්තොත්, වෛද්‍යවරුන්ගේ ස්ථාන මාරු ප්‍රතිපත්තියට කාටවත් ඇඟිලි ගහන්න බැහැ. හැබැයි මොන ප්‍රතිපත්තිය තිබෙනවාය කිව්වත්, අධ්‍යාපන ක්ෂේත්‍රයේ එහෙම නැහැ. ඒ නිසා කිසි කෙනෙකුගේ බලපෑමක් නැතුව, හැමදාම දුෂ්කර පාසල්වල ඉන්නේ නැතුව, හැමදාම ජාතික පාසලක ඉඳලා පෙන්ෂන් යන ක්‍රමය වෙනුවට හැමෝම අතරේ සාධාරණත්වය බෙදී යන හැටියට, විධිමත් ලෙස ගුරු මාරු ප්‍රතිපත්තියක් සකස් කරලා දෙන්න. එහෙම නැත්නම් තිබෙන ප්‍රතිපත්තියේ අඩුපාඩු සකස් කරලා ක්‍රියාත්මක කරන්න කියලා මම ඔබතුමාට යෝජනා කරනවා.

මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය මෙයයි. ගරු ඇමතිතුමනි, මේ වෙනකොට වැඩබලන විදුහල්පතිවරු 1,800ක් ලංකාවේ ඉන්නවා. ස්ථාන මාරු ප්‍රතිපත්තියත් එක්ක ආයෙත් මට මේ කාරණය ගළපන්න වෙනවා. උදාහරණයක් හැටියට විල්ගමුව කලාපය ගත්තොත්, ඉස්කෝල 45ක් තිබෙනවා. එයින් 29කම ඉන්නේ වැඩබලන විදුහල්පතිවරු.

හැබැයි, පසුගිය දවස්වල එකම විභාගයකින් විදුහල්පතිවරුන් විශාල සංඛ්‍යාවක් අරගෙන තිබෙනවා. ඒ අය හරියට ස්ථානගත කිරීමේ ක්‍රමයක් තිබුණා නම් මේ ප්‍රශ්නය එන්නේ නැහැ කියලා මම හිතනවා. එම වැඩබලන විදුහල්පතිවරුන් 1,800 සම්බන්ධව ගන්නා ක්‍රියාමාර්ගය මොකක්ද? ඒ අය විදුහල්පතිවරුන් හැටියටම අන්තර්ග්‍රහණය කරනවාද, එහෙම නම් ඒක සිද්ධ වෙන්නේ කොහොමද කියලා ඔබතුමා පැහැදිලි කරන්න. එහෙම කරන්නේ නැත්නම් ඒ අයට මොකක්ද කරන්නේ?

**ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගරු මන්ත්‍රීතුමියගේ පළමුවෙනි අතුරු ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

වැඩ ආවරණය කරන විදුහල්පතිවරුන් 1,800ක් ඉන්නවා. මීට වඩා වැඩියෙන් හිටියා. විශ්‍රාම යෑම් සහ විවිධ හේතු නිසා දැන් මේ පිරිස අඩු වෙලා. මේ පිරිස තමයි දුෂ්කර යැයි කියන්නා වූ පාසල්වල වැඩ ආවරණය කරමින් විදුහල්පති තනතුර දැරුවේ. මම ඒ අය වෙනුවෙන් අමාත්‍ය මණ්ඩල සංදේශයක් ඉදිරිපත් කළා. ඒක රාජ්‍ය සේවා කොමිෂන් සභාවට යොමු වුණා. රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ප්‍රතිපත්තිය අනුව ඒ කටයුතු කර ගැනීම ඉතා දුෂ්කර කාර්යයක් වුණා. කෙසේ වෙතත්, මේ වෙනකොට ඒ අය ශ්‍රේෂ්ඨාධිකරණයේ නඩුවක් පවරා තිබෙනවා. එම නඩුව සමථයට පත් කර ගැනීම සඳහා අපි තවදුරටත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නිර්දේශය අපේක්ෂාවෙන් ඉන්නවා.

ඔබතුමිය මුලින් අහපු කාරණයටත් මම පිළිතුරක් ලබා දෙන්නම්. ඇත්ත වශයෙන්ම ගුරු මාරු ප්‍රතිපත්තිය තිබෙනවා. ගුරු සේවා ව්‍යවස්ථාවට අනුව වෘත්තීය සමිතිවල එකඟතා මත විවිධ අවස්ථාවල යම් යම් සංශෝධනත් කරනවා. උදාහරණයක් වශයෙන්, අවුරුදු 57 කියන වයස් සීමාව ගන්නේ නැහැයි කියන එකට අපි දැන් අනුමැතිය අරගෙන තිබෙනවා. ඒ වාගේම මාරු මණ්ඩලත් ක්‍රියාත්මක වෙනවා. හැබැයි ඔබතුමියත්, මමත් දන්නා කාරණයක් තිබෙනවා. මම බස්නාහිර පළාතේ මහ ඇමති හැටියට අවුරුදු 5ක් හිටියා, 1995 සිට 2000 වර්ෂය වෙනකම්. ඒ කාලයේ කිසි ප්‍රශ්නයක් තිබුණේ නැහැ, ගුරුවරුන්ට පළාත් පාසලක් සහ ජාතික පාසලක් අතර මාරුවීමට. නමුත්, දැන් තිබෙන රාජ්‍ය සේවා

---

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

කොමිෂන් සභාව අලුත් නීතියක් දාලා නියෝගයක් එව්වා, ගුරුවරුන්ට පළාත් සහ පාසල් සහ ජාතික පාසල් අතර මාරු වෙන්න බැහැයි කියලා. එතැනදි තර්කය හැටියට ගන්නේ ජාතික පාසල්වලට පත්වීම් දෙන්නේ රාජ්‍ය සේවා කොමිෂන් සභාව වීමත්, පළාත් පාසල්වලට පත්වීම් දෙන්නේ පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වීමත්. එතැන ආයතන දෙකක්. පළාත් පාසල්වලට වෙනම බඳවා ගැනීමේ හැකියාවක් තිබෙනවා, උපාධිධාරින් සහ ඩිප්ලෝමාධාරින්. ඒ යටතේත් ඒ අය පත්වීම් දෙනවා. ඒ අය කිව්වේ ජාතික පාසල් සහ පළාත් පාසල් අතර විද්‍යාපීඨ ගුරුවරුන්ට මාරු වෙන්න පුළුවන්, හැබැයි අනෙක් ගුරුවරුන්ට මාරු වෙන්න බැහැ කියලා. මම කිව්වා, ඒක පුදුම ප්‍රතිපත්තියක් නේ කියලා. මොකද, මේ ඔක්කෝම ගුරුවරු නේ. අවසාන වශයෙන් මම කිව්වා, "එහෙම නම් අපි Governorsලාගේ concurrence එක අරගෙන දෙන්නම්, ඒ අනුව ඔබතුමන්ලාගේ අනුමැතිය දෙන්න" කියලා. දැන් අපි ඒ සඳහා කටයුතු කරගෙන යනවා. ඒ ටික තමයි මට ඒ ගැන කියන්න තිබෙන්නේ.

ඔබතුමිය කියපු ආකාරයට, ආංශික අධීක්ෂණ කාරක සභාවේ නිර්දේශ අනුව දැන් අපි system එක - NEMIS එක - හදාගෙන යනවා. අපි ඒක මොරටුව විශ්වවිද්‍යාලයට භාර දීලා තිබෙන්නේ. ඒක අවසන් වුණාම ගැටලුවක් නැති වෙයි. මේ වෙනකොට ගුරුවරුන් 240,000ක් විතර ඉන්නවා.

ඔබතුමිය කිව්වා වාගේම මාරුවීම් සම්බන්ධයෙන් ගුරුවරු කොයි තරම් රස්තියාදු වෙනවාද කියලා මම දන්නවා. සමහර මාරුවීම්වලට මානුෂික හේතු බලපා තිබෙනවා; වෛද්‍ය හේතු බලපා තිබෙනවා. ඒවා පිළිබඳව සලකා බැලීම සිද්ධ වෙන්නේ බොහොම අඩුවෙන්. අපි ඉරක් ගහලා වෙන් කළොත්, අවුරුදු පහක් දුෂ්කර පළාතක ඔවුන් සේවය කරන්න ඕනෑ. නිර්ණායකත් එක්ක අනෙකුත් කරුණු ගත්තාම එතැනදී යම් ගැටලු මතු වෙනවා. ගුරු මාරු ප්‍රතිපත්තිය හරියට තිබෙනවා. හැබැයි, ඒක digitalize කරලා ගත්තාම කවදාද මාරුවීම ලැබෙන්නේ කියලා හැමෝටම දැනගන්න පුළුවන්. හුදෙක් මාරුවීම නොවෙයි, විෂයයන් අනුව ගළපා ස්ථානගත කිරීමයි වැදගත් වෙන්නේ.

**ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය**
(மாண்புமிகு (திருமதி) ரோஹினி குமாரி விஜேரத்ன)
(The Hon. (Mrs.) Rohini Kumari Wijerathna)
මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

ගරු ඇමතිතුමනි, සංවර්ධන නිලධාරින් 22,000කගෙන්, 16,000ක් නේද දැන් ඉන්නේ? ඒ 16,000 හැර ගුරු පුරප්පාඩු කොච්චර තිබෙනවාද කියන එක මට ඔබතුමාගෙන් දැනගන්න පුළුවන්ද? මොකද, මම දැක්කා, ගුරු වෘත්තියට උපාධිධාරින් 20,000ක් බඳවා ගන්නවා කියලා ජනතා විමුක්ති පෙරමුණේ ප්‍රතිපත්ති ප්‍රකාශනයේ තිබෙනවා. මම අධ්‍යාපන අමාත්‍යාංශයෙන් අහලා බැලුවාම දැනට පුරප්පාඩු තිබෙන්නේ 16,000යි. මේ අවුරුද්ද අවසානයේදී 4,000ක් විද්‍යා පීඨවලින් පිට වෙනවා. එතකොට පුරප්පාඩු තිබෙන්නේ 12,000යි. ඉතින්, මේ කාරණා දෙකේ ගැළපීමක් නැහැ. මේ තුළින් උපාධිධාරින් නොමඟ යැවීමක් සිද්ධ වෙනවා. ඒ නිසා ඔබතුමා මට පැහැදිලි කිරීමක් කරන්න, ගුරු වෘත්තියේ පුරප්පාඩු කීයක් තිබෙනවාද කියලා.

**ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ ප්‍රශ්නය ඇසීම ගැන මම එතුමියට ස්තුතිවන්ත වෙනවා. මේ කාරණය නිවැරදි කරන්න කවුරු හරි මේ ප්‍රශ්නය අහනතුරු තමයි මම හිටියේ. පසුගිය කාලය පුරාවටම කිව්වා, ගුරු පුරප්පාඩු 40,000ක් තිබෙනවා කියලා. 2019දී සංවර්ධන නිලධාරින් 23,000ක් පුහුණුව සඳහා පාසල්වලට අනුයුක්ත කළා. ඒ අනුයුක්ත කරපු පිරිස වෙනුවෙන් වරින් වර කැබිනට් පත්‍රිකා නිකුත් කළා. අවසාන වශයෙන් කැබිනට් පත්‍රිකාව නිකුත් කළේ මේ අය ගුරු සේවා ව්‍යවස්ථාව අනුව බඳවා ගන්න කියායි. නමුත් එවේලාවේ ඒකට විරුද්ධව ශ්‍රේෂ්ඨාධිකරණයට පෙත්සම් හතරක් ඉදිරිපත් කළා. ඒ නිසා විභාගය නැවැත්වූවා. මේ වනකොට අවුරුදු එකහමාරක් ගත වෙලා තිබෙනවා. හැබැයි, හැමදාම මෙහෙම ඉන්න බැහැ. තහනම් නියෝගයත් එහෙමම තිබෙන නිසා තවමත් විසඳුමක් ලැබී නැහැ.

ගරු මන්ත්‍රීතුමියනි, ඒ නිසා අපි සමථ කොන්දේසි අනුව යම් එකඟතාවක් ඇති කරගත්තා. ඒ අනුව දැනට සංවර්ධන නිලධාරින් 23,000න්, 7,000ක් පළාත් රාජ්‍ය සේවයේ තරග විභාගවලින් සමත් වෙලා ගුරු පත්වීම් ලබාගෙන තිබෙනවා. එතකොට 7,000ක් එතැනට ගිහිල්ලා තිබෙනවා. ඊට අමතරව, අපි අධ්‍යාපන අමාත්‍යාංශය හැටියට දෙවතාවකදී පීඨ ගුරුවරුන්ට පත්වීම් ලබා දුන්නා. ඊළඟට, අපි රසායන විද්‍යාව, භෞතික විද්‍යාව, ජීව විද්‍යාව, තාක්ෂණවේදය වාගේම විදේශ භාෂා ගුරුවරුන් හැටියට උපාධිධාරින් බඳවා ගත්තා.

ඊළඟට, ඉංග්‍රීසි භාෂාව පිළිබඳව Higher National Diploma එක තිබෙන තවත් 453කට පත්වීම් දුන්නා. ගරු මන්ත්‍රීතුමියනි, මේ ආදී වශයෙන් 25,800කට මේ අවුරුදු දෙක තුළදී අපි පත්වීම් ලබා දීලා තිබෙනවා. තව සංවර්ධන නිලධාරින් 16,000ක් ඉතුරුයි. ඒ 16,000 පිළිබඳව රාජ්‍ය සේවා කොමිෂන් සභාව ඒගොල්ලන්ගේ මතය අපට එවලා තිබුණා. ඒකට අමාත්‍ය මණ්ඩලය එකඟ වුණේ නැහැ. ඊයේ අපි රාජ්‍ය සේවා කොමිෂන් සභාවට දැනුම් දෙන්න තීන්දුවක් ගත්තා, එය ප්‍රායෝගිකව විසඳන ක්‍රමය පිළිබඳව සතියක් තුළ අපට දැනුම් දෙන්න කියලා. ඒ වාගේම ජනාධිපතිතුමා එකඟ වුණා, ඒ සංවර්ධන නිලධාරින් 16,000දෙනාගේ ප්‍රශ්නයට විසඳුමක් ලෙස ඔවුන් අභ්‍යාසලාභින් හැටියට අරගෙන ගුරු සේවයට අන්තර්ග්‍රහණය කිරීම පිළිගන්නවා කියලා. මොකද, ඒ පිරිස අවුරුදු පහක් පාසල්වල පුහුණු වුණා. ඒ අය නැවත කාර්යාලවලට දාන්න බැහැ. අපට කරන්න තිබෙන්නේ, ඒ පිරිස එතැනට අරගෙන PGD එක දීලා, පුහුණු කරලා පාසල් තුළ තියා ගන්න එකයි. ඒ ටික සම්පූර්ණ වනකොට ගුරු වර්ග අනුව පුරප්පාඩු 4,000ක, 5,000ක විතර සංඛ්‍යාවක් තිබෙනවා හැර, පුරප්පාඩු 25,000ක් නැහැ. අපි උපාධිධාරින් බඳවා ගන්නවා නම්, ඔවුන් බඳවා ගන්න වෙන්නේ විෂය වර්ග අනුව.

උදාහරණයක් හැටියට මම මේ කාරණය කියන්නම්. භෞතික විද්‍යාව, රසායන විද්‍යාව, ජීව විද්‍යාව, ගණිතය සහ විදේශ භාෂා සඳහා තරග විභාග තියලා ව්‍යවස්ථාව අනුව 1,753කට පත්වීම් දුන්නා. එයින් 462ක් පත්වීම් භාර අරගෙන තිබුණේ නැහැ. ඒ 462න්, 200ක් පමණ පළාත් සභා පත්වීම් අරගෙන තිබෙනවා. අපි නැවත විභාග කොමසාරිස්ට දැනුම් දීලා තිබෙනවා, විෂයය වර්ගය අනුව සමස්ත ලකුණු ප්‍රමාණය එවන්න කියලා. මැතිවරණයෙන් පසුව ඊළඟ පිරිසට පත්වීම් දෙන්න අපට පුළුවන්. මැතිවරණ කොමසාරිස්ගේ තිබෙන ඒ රීති අනුව අලුත් පත්වීම් දෙන්න බැරි නිසා ඒ process එක කරගෙන ඉන්න කියලා අපි කියලා තිබෙනවා. දැන් අපි ඒ මාර්ගයේ ඉන්නේ. ඒක නිසා මම ඔබතුමියට කියනවා, දැනට අපේ අමාත්‍යාංශයේ තක්සේරුව අනුව සංවර්ධන නිලධාරින් 16,000 බඳවා ගත්තාම ගුරුවරුන් 5,000කට, 6,000කට වඩා පුරප්පාඩු ඉතුරු වෙන්නේ නැහැ කියන එක. ඉතුරු වුණත් ඉතුරු වෙන්නේ විෂය වර්ග අනුව පමණයි.

**ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය**
(மாண்புமிகு (திருமதி) ரோஹினி குமாரி விஜேரத்ன)
(The Hon. (Mrs.) Rohini Kumari Wijerathna)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට පැහැදිලි කර ගැනීමක් කර ගන්න පොඩි වෙලාවක් ලබා දෙන්න.

[ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය]

ගරු ඇමතිතුමනි, මධ්‍යම පළාත ගත්තාම ගුරු පුරප්පාඩු 6,338ක් තිබෙනවා. ඒකෙන් සංවර්ධන නිලධාරින් 2,098කට පත්වීම් දෙනවා. තව 4,240ක් ඉතුරුයි. උපාධිධාරින් 3,500කට ආසන්න ප්‍රමාණයක් විභාගය සමත් වෙලා ඉන්නවා. මධ්‍යම පළාතේ ගුරු පුරප්පාඩු තිබෙනවා. ඔබතුමා කියපු සංඛ්‍යාලේඛන නොවෙයි, මම අමාත්‍යාංශයේ අතිරේක ලේකම්තුමාට කථා කරලා ලබාගත් සංඛ්‍යාලේඛනවලට අනුව පුරප්පාඩු 12,000ක් තිබෙනවා. ඒ පුරප්පාඩු 12,000 ඇතුළේ ඒ උපාධිධාරින්ට පත්වීම් ලබා දීමේ හැකියාවක් තිබෙනවාද?

**ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)
පළාත් මට්ටමින් පත්වීම් ලබා දෙන්න පුළුවන්, විෂය වර්ගය ගළපා ගැනීම මත.

**ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය**
(மாண்புமிகு (திருமதி) ரோஹினி குமாரி விஜேரத்ன)
(The Hon. (Mrs.) Rohini Kumari Wijerathna)
ඒ කියන්නේ, විරෝධතාවක් නැහැ?

**ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)
නැහැ. උසාවියේදී මම හරස් ප්‍රශ්න ඇහුවා වාගෙයි ඔබතුමිය ඒ ප්‍රශ්නය ඇහුවේ.

**ගරු ඩලස් අලහප්පෙරුම මහතා**
(மாண்புமிகு டலஸ் அழஹப்பெரும)
(The Hon. Dullas Alahapperuma)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගරු ඇමතිතුමාගේ එකඟත්වය මත මම පැහැදිලි කර ගැනීමක් කරගන්න කැමතියි. ගරු ඇමතිතුමනි, අපේ සහෝදර මන්ත්‍රීතුමියක් වන ගරු රෝහිණී කවිරත්න මැතිනිය මතු කරපු ඉතා වැදගත් ප්‍රශ්නයට ඔබතුමා තර්කානුකූල සහ පිළිගත හැකි පිළිතුරක් තමයි ලබා දුන්නේ. ඒ පිළිබඳව මම ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා. ගරු ඇමතිතුමනි, ඊට අදාළ කරුණු හතරක් තිබෙනවා. පළමුවැන්න, ආබාධ සහිත ප්‍රජාව. ඒ කියන්නේ, සංවර්ධන නිලධාරින් විධියට කටයුතු කරනු ලැබූ දෘශ්‍යාබාධ, ශ්‍රවණාබාධ, චලනාබාධ සහිත අය සම්බන්ධයෙන් හැම පළාත් සභාවම පොදු ප්‍රතිපත්තියක් අනුගමනය කළේ නැහැ. උදාහරණයක් තමයි බස්නාහිර පළාත් සභාව. දකුණේත් එය කළා. රාජ්‍ය ප්‍රතිපත්තියක් තිබෙනවා, රැකියා ලබා දීමේදී අනිවාර්යයෙන්ම ආබාධ සහිත තරුණ-තරුණියන්ට සියයට තුනක ප්‍රතිශතයක් ලබා දිය යුතුයි කියලා. නමුත්, ඒක කිසිසේත්ම සෑම පළාත් සභාවක් තුළම සිදු වෙලා නැහැ. එම නිසා ඒ පිළිබඳව ඉතා කාරුණිකව අවධානය යොමු කරන්න. පාසල් දූ දරුවෝ රාශියක් මේ අවස්ථාවේදී මහජන ගැලරියේ ඉන්නවා.

ගරු සභානායකතුමනි, මේක රටක ශීලාචාරකම මනින මිම්මක්. මම එදා පාර්ලිමේන්තුවේදීත් කථානායකතුමාට කිව්වේ ඒකයි. පාර්ලිමේන්තු staff එකෙත් 820දෙනෙක් ඉන්නවා. මෙයින් දෙදෙනායි ආබාධ සහිතව ඉන්නේ. ඒ සියයට 3 ප්‍රතිපත්තිය පාර්ලිමේන්තුවේවත් ක්‍රියාත්මක කරලා නැහැ. ඒ අනුව බැලුවොත්, අඩු ගණනේ පාර්ලිමේන්තුවේ එහෙම අය 26දෙනෙක් ඉන්න ඕනෑ. මේ ගැන ලජ්ජා වෙන්න ඕනෑ. හැබැයි මම හිතනවා, අධ්‍යාපන ක්ෂේත්‍රය තුළදී ඔබතුමා මේ වෙනුවෙන් මැදිහත් වෙයි කියලා.

ගරු සභානායකතුමනි, දෙවැනි කාරණය මෙයයි. උපාධිධාරින් 800 ගණනක් අනධ්‍යයන සේවකයන් විධියට ඉන්නවා. සමහර වෙලාවට ඔවුන් බාහිර උපාධිධාරින් වෙන්න පුළුවන්. ඔවුන් උපාධිධාරින් වුණත්, පාසල අතුගාන එක, කානු සුද්ද කරන එක, වැසිකිළි සෝදන එක තමයි කරන්නේ. මම හිතන විධියට, මේක අතිශය සංවේදී කාරණාවක්. ඒ නිසා මේ වෙනුවෙන් විශේෂ ප්‍රතිපත්තියක් සකස් කරන්න කියලා මම ඉල්ලීමක් කරනවා. සංවර්ධන නිලධාරින් absorb කර ගත්තා වාගේම මේ අනධ්‍යයන සේවකයන් විධියට ඉන්නා උපාධිධාරින් 800 ගණන සම්බන්ධයෙනුත් කිසියම් වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරන්න. ඒ වාගේම අනධ්‍යයන සේවකයන්ට මෙන්ම අනික් අයගේ උසස්වීම්වලටත් අදාළව නිශ්චිත ක්‍රමවේදයක් ක්‍රියාත්මක කරන්න කියාත් මම ඉල්ලා සිටිනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, තුන්වැනි කාරණය මම මතු කරන්නේ සංවර්ධන නිලධාරින් සම්බන්ධයෙන් අපේ ගරු රෝහිණී මන්ත්‍රීතුමිය මතු කරපු ප්‍රශ්නයට අදාළවයි. ගරු ඇමතිතුමනි, ඔබතුමා දන්නවා, එතැන අවුරුදු 35-37 අතර වයස් කාණ්ඩයේ සංවර්ධන නිලධාරින් රාශියක් සිටින බව. ගුරු සේවා ව්‍යවස්ථාවට අනුව ගත්තොත්, මේ අයගේ වයස් සීමාව අවුරුදු 35 ඉක්මවා ගිහිල්ලා තිබෙන නිසා ඔවුන්ට ගුරු සේවයට ඇතුළත් වෙන්නට බැරි තත්ත්වයක් මතු වෙලා තිබෙනවා. හැබැයි, කොවිඩ් තත්ත්වයත්, ආර්ථික අවපාතයත් එක්ක මතු වූ ප්‍රශ්න නිසා අවුරුදු දෙකක, තුනක යම් ක්ෂමා කාලයක් -සහන කාලයක්- ඔවුන්ට දිය යුතු වෙනවා. මම ඒකෙන් අදහස් කරන්නේ නැහැ, අවුරුදු 45ක් වයස්ගත වූ කෙනෙක් සම්බන්ධයෙන් මේක ක්‍රියාත්මක කරන්න කියලා. මම කියන්නේ ඒක නොවෙයි. මම කියන්නේ කොවිඩ් තත්ත්වයත්, ආර්ථික අවපාතය නිසාත් මතු වෙච්ච තත්ත්වයත් සැලකිල්ලට ගෙන ඔවුන් පිළිබඳව සංවේදීව, සානුකම්පිත පියවරක් ගන්න කියන එකයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට මතක විධියට ගුරුවරුන් බඳවා ගැනීම සම්බන්ධව 2020 අප්‍රේල් මාසයේ 18වැනි දා තමයි මම අධ්‍යාපන ඇමතිවරයා විධියට කැබිනට් පත්‍රිකාවක් ඉදිරිපත් කළේ, අපේ විද්‍යාපීඨ 19 -දඹදෙණිය විද්‍යාපීඨය ඇතුළුව- විශ්වවිද්‍යාල පීඨ බවට පත් කර ගන්න කියලා. ඔබතුමා ඒ සම්බන්ධව පියවර රාශියක් ඉදිරියට ගිහිල්ලා තිබෙනවා. මෙන්න මේ බඳවා ගැනීමේදී නිරන්තරයෙන් ගුරු පුරප්පාඩු ඇති වෙන ක්ෂේත්‍ර කිහිපයක් තිබෙනවා. විශේෂයෙන්ම දරුවන්ගේ ඉල්ලීම වැඩියි. ලොකුම අර්බුදය තිබෙන්නේ තාක්ෂණවේදය සම්බන්ධයෙන්. දරුවෝ විශාල පිරිසක් උනන්දුයි, තාක්ෂණවේදය හදාරන්න. හැබැයි, ගුරුවරු නැතිකම නිසාවෙන් ඒ උත්සාහය අසාර්ථක වෙලා තිබෙනවා. මගේ ගමේ තිබෙන ජාතික පාසලක් වන ශ්‍රී සුමංගල මධ්‍ය මහා විද්‍යාලයේ වුණත් ගණිතය, ඉංග්‍රීසි, ආගම, භාෂාව උගන්වන්න ගුරුවරු නැතිකම නිසා ඒ පන්ති නවත්වන්නට සිද්ධ වෙලා තිබෙනවා.

දැන් මාතර දිස්ත්‍රික්කයේ ඉතා ශෝචනීය තත්ත්වයක් තිබෙනවා. මාවරල විද්‍යාලයේ දමිළ දූ පුතුන්ට ගුරුවරයෙක් නැතිකම නිසා තමන්ගේ ආගම වන හින්දු ආගම වෙනුවට බුද්ධාගම ඉගෙන ගන්න සිදු වෙලා තිබෙනවා, ගරු ඇමතිතුමනි. මේක පැහැදිලිවම discrimination එකක්. මම හිතනවා, අනෙක් තැන්වලත් මේ විධියට සිදු වෙනවා වෙනවා ඇති කියලා. එම නිසා ඒ පිළිබඳවත් ඔබතුමාගේ අවධානය යොමු කර යම් නිශ්චිත ප්‍රතිපත්තියකට අනුව කටයුතු කරන්න ඕනෑ. ඒ වෙනුවෙන් එකතු වෙලා ඕනෑම මැදිහත්වීමක්, ඕනෑම කැප කිරීමක් කරන්න අපි සියලුදෙනා සූදානමින් ඉන්නවා. මේ පිළිබඳව සාවධානව, සංවේදීව, ප්‍රායෝගිකව මැදිහත් වෙන්න කියන එක තමයි මගේ ඉල්ලීම.

**ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, හිටපු අධ්‍යාපන අමාත්‍ය ගරු ඩලස් අලහප්පෙරුම මැතිතුමා අතුරු ප්‍රශ්න හතරක් යොමු කළා. පළමුවැනි අතුරු ප්‍රශ්නය තමයි, ආබාධිත කාණ්ඩයට රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය අනුව තිබෙන සියයට තුනේ ප්‍රතිශතය. ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා කියන එක හරි. ඒ සඳහා මටත් මැදිහත් වෙන්න වුණා සහ අපි පොදුවේ පළාත් නවයටම දැනුම් දුන්නා, ඒ බඳවා ගැනීම්වලදී ඒ සියයට තුනේ ප්‍රතිශතය පවත්වා ගන්න කියලා. අපි ඒ පිළිබඳව වෙනම ලිපියක් යැව්වා. එය තවදුරටත් සිදුවෙලා නැත්නම් මම ඒ පිළිබඳව සොයා බලන්නම්.

ඊළඟට, ඔබතුමා කියන උපාධිධාරින්, අනධ්‍යයන සේවා කාණ්ඩවලයි හිටියේ. හැබැයි, ඒ ගොල්ලෝ එහෙම ඉන්න ගමන් බාහිර උපාධි හෝ වෙනත් උපාධි ලබා ගත්තා. ඒ අයට කියන්නේ ඌන සේවා උපාධිධාරින් කියලා. එම ඌන සේවා උපාධිධාරින්ටත් පිළියමක් ලබා දිය යුතුයි. ඒ ගොල්ලන්ට පිළියමක් ලබා දීමේදීත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවෙන් අර ප්‍රශ්නය එනවා. ඒ තමයි, උපාධිධාරි ගුරුවරු බඳවා ගැනීමේදී තිබෙන්නා වූ වයස් කාණ්ඩය සහ තරග විභාගයකට පෙනී සිටීම කියන කාරණය. නමුත් ඔබතුමාට මතක ඇති, මම මීට කලින් අධ්‍යාපන ඇමතිවරයා වශයෙන් කටයුතු කරපු කාලයේ කැබිනට් පත්‍රිකාවක් මඟින් ඒ ප්‍රශ්නය විසඳුවා. නමුත්, දැන් අලුතින් පත් වූ රාජ්‍ය සේවා කොමිෂන් සභාව පරණ රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ තීන්දු නොවෙයි ක්‍රියාත්මක කරන්නේ. ඒක නිසා දැන් අපි ඒ ගොල්ලන් එක්ක ඒ පිළිබඳ සංවාදයක ඉන්නේ. ඌන සේවා උපාධිධාරින් පිළිබඳව ඔබතුමා කිව්ව ගණන හරි. පළාත් මට්ටමින් තමයි ඒ ප්‍රමාණය තිබෙන්නේ. ඒ ගැටලුව විසඳීම සඳහාත් අපි වෘත්තීය සමිති සමඟ සාකච්ඡා කරලා තිබෙනවා. ඒ ගොල්ලන්ගේ ප්‍රශ්නයට විසඳුමක් ලබා දීම සඳහා අපි දැන් රාජ්‍ය සේවා කොමිෂන් සභාවෙන් ලැබෙන පිළිතුර අපේක්ෂාවෙන් ඉන්නවා.

ඊළඟට, 2019 වර්ෂයේ බඳවා ගත් කාණ්ඩයට දැන් අවුරුදු පහක් ගතවෙලා තිබෙනවා. ඔබතුමා කියන එක හරි. බඳවා ගන්නකොට වයස අවුරුදු 35ට මාසයක්, දෙකක් අඩුවෙන් හිටපු අයට දැන් අවුරුදු 40ක් වෙලා තිබෙනවා. ඒක නිසා අපේ නඩුව සමථයකට පත්වෙන්න කැඳවනවා. ඒ සමථ කොන්දේසිවල එක කාරණයක් තමයි, අවුරුදු 45 කියන මට්ටම අරගෙන පළාත් මට්ටමින් එම පත්වීම් දෙන්න එකඟ වීම. ඊටත් එහා ගිය තවත් 48දෙනෙක් ඉන්නවා. ඒ අයගේ වයස අවුරුදු 45 ඉක්මවා ගිහිල්ලා තිබෙනවා. හැබැයි, මම මේ පිළිබඳව පළාත් ආණ්ඩුකාරවරුන්ට දුරකථනයෙන් කථා කළා. ලිඛිතවත් දැනුම් දෙනවා. මේ ප්‍රශ්නය සමථයකට පත්වෙලා ඒ ලිපිය ගියාට පස්සේ පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවලට පුළුවන්, ඒ ගොල්ලෝ කලින් හිටපු සේවා කාලය ගණනය කරලා, ඒකත් එකතු කරලා, වයස අවුරුදු 45 කියන කාරණය අරගෙන -ඊට අවුරුදු 5කට කලින් නේ පුහුණුවීම හම්බ වුණේ- ඒක සලකා බලා පත්වීම් දෙන්න. ඒ සියලුදෙනාටම අවස්ථාව දෙනවා, විෂය ගැළපීම් සහ ගුරු සේවා ව්‍යවස්ථාවේ අනෙකුත් කොන්දේසි මත.

**ගරු (ආචාර්ය) සරත් වීරසේකර මහතා**
(மாண்புமிகு (கலாநிதி) சரத் வீரசேகர)
(The Hon.(Dr.) Sarath Weerasekera)

ගරු ඇමතිතුමා,-

**ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)

පොඩ්ඩක් ඉන්න, මම ඔබතුමාට උත්තර දෙන්නම්.

ඊළඟ කාරණය බඳවා ගැනීම් සම්බන්ධවයි. දැන් විද්‍යාපීඨ 19ක් තිබෙනවා. විද්‍යාපීඨ 19ම ඒකාබද්ධ කරලා විශ්වවිද්‍යාලයක් සෑදීමේ කටයුත්ත දැන් අවසන් අදියරට ඇවිල්ලා තිබෙනවා. නීතිපතිගේ නිෂ්කාසනය ලැබුණු ගමන් අපි අමාත්‍ය මණ්ඩල අනුමැතිය අරගෙන ඒක ගැසට් කරනවා. එතකොට විද්‍යාපීඨ, විශ්වවිද්‍යාලයක්, කැම්පස් එකක් බවට පත් වෙනවා. ඊළඟට, faculties සහ departments තිබෙන්නේ. ඒ සඳහාත් ව්‍යුහය හදලා තිබෙන්නේ. මේක UGC එක පිළිගත් විශ්වවිද්‍යාලයක් බවට පරිවර්තනය වෙනවා. ඒකට බඳවා ගැනීමේදී අපි පළාත් අනුව තමයි තොරතුරු ලබා ගන්නේ. පළාත් අනුව තොරතුරු අරගත්තාට පසුව තමයි අපට පුළුවන් වෙන්නේ ඒ කටයුතු කරන්න.

ගරු ඩලස් අලහප්පෙරුම මැතිතුමනි, ඔබතුමා කිව්වා වාගේ හින්දු ආගම ඉගැන්වීම සඳහා මාතරින් ගුරුවරු සොයාගන්න අමාරුයි. ඒ සඳහා ගුරුවරු බඳවා ගන්නවා නම් අපට දමිළ ජනතාව සිටින ප්‍රදේශවලින් තමයි බඳවා ගන්න වෙන්නේ. ඒ ගොල්ලෝ ඒ තැන්වල අවුරුදු 5ක් සේවය කරනවාද කියන එක තමයි ඊළඟ ප්‍රශ්නය. ක්‍රිස්තියානි ආගම තිබෙනවා, හින්දු ආගම තිබෙනවා. ඒ වාගේ විවිධ විෂයන් තිබෙනවා. ඊට අදාළ යම් ශිෂ්‍ය සංඛ්‍යාවක් ඉන්නවා, නමුත් ඒ ප්‍රදේශවලින් ගුරුවරු බිහි වෙන්නේ නැහැ. ඒක නිසා ඒ කාරණය සැලකිල්ලට අරගෙන, එක් එක් පළාත්වලින් තොරතුරු අරගෙන "Z" අගය අනුව ජාතික මට්ටමින් බඳවා ගැනීමේදී ඒ විෂය ධාරාව ඉල්ලන අයට ප්‍රමුඛතාව දීලා බඳවා ගැනීමට දැනට කටයුතු කරගෙන යනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු ආචාර්ය සරත් වීරසේකර මැතිතුමා.

**ගරු (ආචාර්ය) සරත් වීරසේකර මහතා**
(மாண்புமிகு (கலாநிதி) சரத் வீரசேகர)
(The Hon.(Dr.) Sarath Weerasekera)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගරු අධ්‍යාපන ඇමතිතුමාගෙන් මම මේ ප්‍රශ්නය අහන්නේ.

ගරු ඇමතිතුමනි, ඔබතුමා දන්නවා ඇති, යුද්ධය කාලයේදී උතුර සහ උතුරු මැද පළාත්වල පාසල් වැසීගෙන යන තත්ත්වයක් තිබුණු බව. ඒ වෙලාවේ මම සිවිල් ආරක්ෂක බලකායේ අධ්‍යක්ෂ ජනරාල්වරයා හැටියට ඉතා හොඳින් අපොස උසස් පෙළ විභාගය සමත්, ඉගැන්වීමට හැකි සිවිල් ආරක්ෂක බලකායේ භටයින් ඒ පාසල්වලට අනුයුක්ත කළා. ඒ නිසා තමයි අපට ඒ පාසල් පවත්වාගෙන යන්න හැකි වුණේ. මේ වන විට ඒ ගොල්ලෝ වසර 17ක් තිස්සේ එම පාසල්වල උගන්වනවා. උතුරේ හිටපු ඒ සිවිල් ආරක්ෂක භටයින් සියලුදෙනාම වෙනම කැබිනට් පත්‍රිකාවක් මඟින් ගුරු සේවයට බඳවා ගත්තා.

නමුත් උතුරු මැද පළාතේ 108දෙනෙක් පමණ ඉන්නවා. තවම ඒ අය බඳවා ගෙන නැහැ. ඒ ගොල්ලන් ඉතා හොඳ ප්‍රතිඵල ගත්ත අය. මම අහන්නේ ඒ ගොල්ලන් බඳවා ගන්න අපි කැබිනට් පත්‍රිකාවක් දමනවාද කියලායි.

දෙවැනි කාරණය, දැනට ගුරු පුහුණුවක් ක්‍රියාත්මක කරගෙන යනවා. ඒක හෙට අනිද්දා පටන් ගන්නවා. සිවිල් ආරක්ෂක බලකායෙන් පඩි දෙන ගමන් ඒ ගොල්ලන් ඒ ගුරු පුහුණුවට අනුයුක්ත කරන්න අපට බැරිද? මොකද, ගැසට් එකේ එහෙම දෙයක් නැති නිසා අද ඔබතුමා ඒකට අනුමැතිය දුන්නොත්, ඒ අයට ඒක ලොකු දෙයක් වෙනවා. එතකොට ගුරු පුහුණුවෙන් පසුව ඒ ගොල්ලන් අනුයුක්ත කරන්න පුළුවන්.

**ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)
උතුරු මැද පළාතේ තොරතුරු ඉල්ලා තිබෙනවා, ඒ පිළිබඳ කැබිනට් පත්‍රිකාවක් දමන්න. ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ නමින්ම මට ඒ ඉල්ලීම අදම ලබා දෙන්න. මම ඒ ගොල්ලන් ගුරු පුහුණුවට ගන්න කියලා උපදෙස් දෙන්නම්.

**ගරු ලලිත් එල්ලාවල මහතා**
(மாண்புமிகு லலித் எல்லாவல)
(The Hon. Lalith Ellawala)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මටත් පොඩි අවස්ථාවක් දෙන්න.

ගරු ඇමතිතුමනි, ඔබතුමා මම බොහොම ගරු කරන අමාත්‍යවරයෙක්. මම පුංචි දෙයක් -පොඩි දෙයක්- දැන ගන්නයි කථා කරන්නේ. මම ඒකට වැඩි වෙලාවක් ගන්නේ නැහැ. ගරු ඇමතිතුමනි, ඔබතුමා ලොකු උත්සාහයක් ගත්තා, දෙමළ මාධ්‍ය පාසල්වල ගුරු පුරප්පාඩු ටික පුරවන්න. උදාහරණයකට කළුතර දිස්ත්‍රික්කයේ මගේ බණ්ඩාරගම ආසනයේ, ආරම්භ කරලා අවුරුදු හැටක් හැත්තෑවක් විතර ගත වෙලා තිබෙන පාසල් තිබෙනවා. ඒ පාසල් ආරම්භ කරපු දවසේ ඉඳන් ඉංග්‍රීසි, ගණිතය, විද්‍යාව වැනි විෂයයන් උගන්වන්න දෙමළ මාධ්‍ය ගුරුවරු නැහැ. ඔබතුමා ලොකු උත්සාහයක් ගත්තා, මේ ගුරුවරු ටික ඒ පාසල්වලට ලබා දෙන්න. ඒකට මම ඔබතුමාට ගරු කරනවා. නමුත් ඒක තවම කර ගන්න බැරි වුණා. ඒ කටයුත්ත කොයි කාලයේද කෙරෙන්නේ කියලා දැන ගන්න මම කැමතියි.

ගරු ඇමතිතුමනි, ඒත් එක්කම ප්‍රතිපත්තිමය තීන්දුවක් ගන්න ඕනෑ කාරණයක් තිබෙනවා. පාසල්වල ගුරු නිවාස හදන අවස්ථා අපි දැකලා තිබෙනවා. අපේ පළාත්වල සමහර වෙලාවට ගුරු නිවාස අවශ්‍ය නැති තැන්වලට, නගරයේ තිබෙන පාසල්වලට ගුරු නිවාස හදලා තිබෙනවා. ඒ පළාත්වල පාසල්වලට දෙමළ මාධ්‍යයෙන් උගන්වන ගුරුවරු උතුරු ප්‍රදේශයෙන් තමයි එන්නේ. හැබැයි, ඒ අයට ඇවිත් නවතින්න තැනක් නැහැ. මොකද, තිබෙන ගුරු නිවාස කඩා වැටිලා. කොහොමවත් ඒවායේ ඉන්න බැහැ. ඒවා ඒ තරමට ගරා වැටිලා තිබෙන්නේ. නමුත් ඒවා හැදෙන්නේ නැහැ. ඒ නිසා මම ඔබතුමාගෙන් ඉල්ලන්නේ මෙන්න මෙවැනි පාසල්වලට තමයි ගුරු නිවාස ඕනෑ කියලා ප්‍රතිපත්තිමය තීන්දුවක් ගන්න කියලායි. අවුරුදු හැටක්, හැත්තෑවක් තිස්සේ තිබුණු ගුරු පුරප්පාඩු ටික ඔබතුමා අධ්‍යාපන ඇමතිකමින් යන්නට පෙර පුරවන්න කියා ඉල්ලනවා. නිවැරදි තැනකට ඇවිල්ලා ඔබතුමා ලබන වතාවෙත් අධ්‍යාපන ඇමති වේවායි කියා මා ප්‍රාර්ථනා කරන ගමන් මෙන්න මේ ප්‍රශ්න ටික විසඳා දෙන්න කියන ගෞරවනීය ඉල්ලීම කරනවා.

**ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)
ගරු මන්ත්‍රීතුමාගේ ප්‍රාර්ථනයට මම ස්තුතිවන්ත වෙනවා. කොහොම වුණත් අපි භාර ගත්ත වගකීම තමයි මේ ඉටු කරගෙන යන්නේ. විශේෂයෙන්ම වතු ආශ්‍රිත පාසල්වලට 2,550දෙනෙක් ගුරු සහායකයන් හැටියට බඳවා ගන්න ගුරු සේවා ව්‍යවස්ථාවේ සුදුසුකම් අනුව අපි ගැසට් කළා. ගැසට් කරලා, අයදුම්පත් කැඳවලා අවසන්. දැන් විභාගය පවත්වන්න තිබෙන්නේ. නමුත් එක්තරා පිරිසක් උසාවියට ගිහිල්ලා ඒකට රිට් ආඥාවක් අරගෙන තිබෙනවා, තවත් ජන කොටසක් ඒකට ඇතුළත් කළ යුතුයි කියලා. හැබැයි අපි පොදුවේ කිව්වේ, ඒ ජනකොටස්වල පාසල් වතුකරයේ තිබෙනවා නම් ඒ ගොල්ලන්ට අයදුම් කිරීමට බාධාවක් නැහැ කියලායි. නමුත් තහනම් නියෝගය නිසා විභාගය පැවැත්වීම දැනට මාස දෙකක් ප්‍රමාද වෙලා තිබෙනවා. උසාවියෙන් ඒක නිරවුල් කරගෙන විභාගය පැවැත්වූවාම ඒ පත්වීම් ටික දෙන්න පුළුවන්. ඔබතුමාගේ ප්‍රදේශයේත් ගණනය කරලා තොරතුරු අරගෙන තිබෙන්නේ. බුලත්සිංහල, අගලවත්ත, මදුරාවල, වලල්ලාවිට කෙළවර -ඔය ප්‍රදේශ ගැන- මම දන්නවා නේ. ඔය ප්‍රදේශවල පුරප්පාඩු ගණනය කරලා අරගෙන තිබෙන්නේ.

**ගරු ගෙවිඳු කුමාරතුංග මහතා**
(மாண்புமிகு கெவிந்து குமாரதுங்க)
(The Hon. Gevindu Cumaratunga)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මටත් පොඩි කාරණයක් කියන්න තිබෙනවා.

ගරු ඇමතිතුමනි, අපි ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා. උතුරු පළාතේ සිංහල මාධ්‍ය උපාධිධාරී ගුරුවරු ගැන ප්‍රශ්නය අහපු වෙලාවේ ඔබතුමා නිවැරදි ප්‍රතිපත්තිය ප්‍රකාශ කරලා ඔවුන් බඳවා ගන්න බව කිව්වා. ඔවුන්ට විෂයට අදාළ උපාධිය තිබෙනවා. දෙමළ මාධ්‍යයෙන් තරග විභාග ප්‍රශ්න පත්‍රයක් හදලා ඒක වැරැදිසහගතව සිංහල මාධ්‍යයට හැරවීම නිසා ඔවුන් යම් අසරණ වීමකට ලක් වෙලා තිබෙනවා. හැබැයි, මේ පාර්ලිමේන්තුවේදීම මම පෙන්වා දුන්නා, රත්නපුර වැනි දිස්ත්‍රික්කවල දෙමළ මාධ්‍ය ගුරුවරු සඳහා අවශ්‍ය අයදුම්පත් ප්‍රමාණය නොලැබුණාම, අයදුම් කළ සියලුදෙනාට තරග විභාග ප්‍රතිඵල නොතකා පත්වීම් ලබා දී තිබෙන බව. උතුරු පළාතේත් සිංහල මාධ්‍යයෙන් ඉල්ලුම් කර තිබෙන උපාධිධාරීන් සංඛ්‍යාව -ඒ විෂය හදාරා තිබෙන සිංහල මාධ්‍ය උපාධිධාරීන් සංඛ්‍යාව- තිබෙන පුරප්පාඩු සංඛ්‍යාවට වඩා අඩුයි. අපි කලින් යෝජනා කළ වෙලාවේ "ඒක කරන්න පුළුවන්, ඒක කරන්නම්" කියලා ඔබතුමා පිළිගත්තා. හැබැයි, අපට දැන ගන්න ලැබිලා තිබෙන්නේ ඉතාම අවාසනාවන්ත විධියට උතුරු පළාතේ ආණ්ඩුකාරතුමිය මොන විධියටවත් ඒ පත්වීම් දෙන්නේ නැහැ කියනවා වාගේ ආකල්පයක ඉඳන් කටයුතු කරන බවක්. ඒ පත්වීම් දැනටත් දීලා නැහැ.

අප සමගිය ගැන කථා කරනවා නම්, එකමුතු ශ්‍රී ලංකාවක් ගැන කථා කරනවා නම් ඒ සියලු ජනතාව එකට ජීවත් වීම වැදගත් වෙනවා. උතුර පළාතේ විවිධ දුෂ්කරතා මැද ජීවත් වන සිංහල ජනතාවට එම පළාතේ ජීවත් වෙන්න බැරි තැනට පත් නොකර, ආණ්ඩුකාරතුමියගේ හිතුවක්කාරකම්වලට ඉඩ නොදී මේ කාරණාව සඳහා අධ්‍යාපන ඇමතිතුමා හැටියට මැදිහත් වෙන්න කියා අපි ඔබතුමාගෙන් ඉතා කාරුණිකව ඉල්ලා සිටිනවා. මොකද, දැන් පළාත් සභාවල මහජන නියෝජිතයෝ නැහැ.

බොහොම ස්තුතියි.

**ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම මේ ප්‍රශ්නය ආණ්ඩුකාරතුමියට දැනුම් දුන්නා. උපාධිධාරීන් 18දෙනකු පමණයි ඉන්නේ. උතුර පළාතෙන් සිංහල මාධ්‍යයෙන් උපාධිධාරීන් බිහි වෙන්නේ නැහැ. ඒ පිරිස පුරප්පාඩු සංඛ්‍යාවට වඩා අඩුයි. එතකොට තරග විභාගයක් පවත්වන්න තරම් දෙයක් එතැන නැහැ. ඒ නිසා මම කිව්වා, සුදුසුකම් පරීක්ෂා කර බලා, සුදුසුකම් තිබෙනවා නම් ව්‍යවස්ථාව අනුව පත්වීම් දෙන්න කියලා. ඒකේ ප්‍රමාදය තමයි තිබෙන්නේ. එම පත්වීම් දෙන්නේ නැහැ කියලා එතුමිය කිව්වේ නැහැ. පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවෙන් විමසා ඒ කටයුතු ටික කරයි. *[බාධා කිරීමක්]*

**ගරු ගෙවිඳු කුමාරතුංග මහතා**
(மாண்புமிகு கெவிந்து குமாரதுங்க)
(The Hon. Gevindu Cumaratunga)
ගරු ඇමතිතුමනි, අපි ඔබතුමාට කියනවා-

**ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)
මට බලයක් නැහැ පළාත් පත්වීමක් දෙන්න. ඒ නිසායි මා ඒ කටයුත්ත එහෙම කළේ. මට පුළුවන් නම් මම මෙලහකටත් ඒ පත්වීම් දීලා.

**ගරු ගෙවිඳු කුමාරතුංග මහතා**
(மாண்புமிகு கெவிந்து குமாரதுங்க)
(The Hon. Gevindu Cumaratunga)
මේ කාරණය අපි ගරු අගමැතිතුමාගේ අවධානයට යොමු කරනවා.

**ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)
හොඳයි.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි,-

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
දැන් දහදෙනෙක් විතර ගරු අධ්‍යාපන ඇමතිතුමාගෙන් ප්‍රශ්න ඇහුවා.

ගරු දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමා.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
මා ප්‍රශ්නය අහන්නේ එතුමාගෙන් නොවෙයි. විදේශ කටයුතු ඇමතිතුමා දැන් මේ ගරු සභාවේ සිටින නිසා, මා එතුමාගෙන් කෙටියෙන් ප්‍රශ්නයක් අහනවා.

ගරු ඇමතිතුමනි, ඔබතුමා දන්නවා, යුක්රේන - රුසියා යුද්ධයට අපේ රටිනුත් විශාල පිරිසක් ගිහිල්ලා සිටින බව. ගිහිල්ලා කථා කරලා, මේ ඇතිවෙච්ච ප්‍රශ්නය විසඳා ගන්න ඔබතුමා අපට යම් අවස්ථාවක් ලබා දුන්නා. හැබැයි, දැන් තිබෙන ප්‍රශ්නය, රුසියාවට ගිය අය පිළිබඳව එතැනින් පස්සේ කිසිම feedback එකක් නැති එකයි. එහේ දැන් හයසිය ගණනක් ඉන්නවා. ඒ අය සම්බන්ධයෙන් කරන්නේ මොකක්ද? 17දෙනෙක් මිය ගියා. දැන් 20දෙනෙක් මිය ගියා කියලා කියනවා. ඒ අයට මොකක්ද කරන්නේ? ඉන්දියාව නම් ඒ රටේ අය ගෙන්වා ගන්න දැන් වැඩ පිළිවෙළක් සකස් කරගෙන යනවා. ශ්‍රී ලංකාව විධියට අපි මොකක්ද කරන්නේ? ඇත්තටම ඒ අය විශාල හිරවීමක ඉන්නේ. ඒ ගොල්ලෝ අහනවා, "දැන් මොකක්ද කරන්නේ?" කියලා. ඒ අය සම්බන්ධයෙන් තිබුණු උනන්දුව, උද්‍යෝගය රජයෙන් ගිලිහිලා ද, එහෙම නැත්නම් ඒ අය වෙනුවෙන් කරන්නේ මොකක්ද කියලා අහනවා.

ගරු ඇමතිතුමනි, අනෙක් කාරණය මේකයි. ඒ අයගෙන් සැහෙන පිරිසකට විශ්‍රාම වැටුප ලැබුණා. නමුත්, දැන් ඒ විශ්‍රාම වැටුපත් නතර කරලායි තිබෙන්නේ. ඒ නිසා කරුණාකර මේ ප්‍රශ්නයට යම් පිළිතුරක් ලබා දෙන්න කියා මම ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා. දැන් embassy එකෙන් මෙහේට එන්න කියලා තිබෙනවා ඒ ගොල්ලන්ට. ඒ සඳහා අවශ්‍ය document එක හදන්න එක්කෙනෙකුට යන මුද්දර ගාස්තුව විතරක් රුපියල් ලක්ෂ දෙකක් පමණ වෙනවා. ඒ වාගේ 20ක් විතර තිබෙනවා. ඒ කියන්නේ ඒ වැඩේ කරන්න එක පුද්ගලයෙකුට රුපියල් ලක්ෂ හතරක් පහක් විතර යනවා. ඒ නිසා ඇත්තටම ඒ අය ලොකු අමාරුවක වැටිලා ඉන්නේ. මම මේ කියන්නේ මිය ගිය අයත් ඇතුළුව. ගරු ඇමතිතුමනි, කරුණාකර ඔබතුමාගේ කාර්යාලයේ නිලධාරීන් යොදවා රුසියානු තානාපති කාර්යාලය සමඟත් සාකච්ඡා කරලා, මේ පිරිසට යම් සහනයක් ලබා දෙන්න කියන එක තමයි මගේ ඉල්ලීම.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Order, please! මේ අවස්ථාවේදී ගරු නියෝජ්‍ය කථානායකතුමා මූලාසනයට පැමිණෙනවා ඇති.

*අනතුරුව ගරු (මේජර්) සුදර්ශන දෙනිපිටිය මහතා මූලාසනයෙන් ඉවත් වුයෙන්, නියෝජ්‍ය කථානායකතුමා [ගරු අජිත් රාජපක්ෂ මහතා] මූලාසනාරූඪ විය.*

*அதன்பிறகு, மாண்புமிகு (மேஜர்) சுதர்ஷன தெனிபிடிய அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, பிரதிச் சபாநாயகர் அவர்கள் [மாண்புமிகு அஜித் ராஜபக்ஷ] தலைமை வகித்தார்கள்.*

*Whereupon THE HON. (MAJOR) SUDARSHANA DENIPITIYA left the Chair, and DEPUTY SPEAKER [THE HON. AJITH RAJAPAKSE] took the Chair.*

**ගරු ගාමිණී වලේබොඩ මහතා**
(மாண்புமிகு காமினி வலேபொட)
(The Hon. Gamini Waleboda)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ කාරණයටම අදාළව මටත් ගරු ඇමතිතුමාගෙන් පොඩි පැහැදිලි කරගැනීමක් කරගන්න තිබෙනවා.

**ගරු ජනාධිපති නීතිඥ එම්.යූ.එම්. අලි සබ්රි මහතා (විදේශ කටයුතු සහ අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමා)**
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி எம்.யூ.எம். அலி சப்ரி - வெளிநாட்டு அலுவல்கள் அமைச்சரும் நீதி, சிறைச்சாலைகள் அலுவல்கள் மற்றும் அரசியலமைப்பு மறுசீரமைப்பு அமைச்சரும்)
(The Hon. M.U.M. Ali Sabry, PC - Minister of Foreign Affairs and Minister of Justice, Prison Affairs and Constitutional Reforms)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එතුමාත් කථා කළාට පසුව මම එක පාරටම උත්තර දෙන්නම්.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු ගාමිණී වලේබොඩ මන්ත්‍රීතුමා. ඉක්මනින් කියලා අවසන් කරන්න.

**ගරු ගාමිණී වලේබොඩ මහතා**
(மாண்புமிகு காமினி வலேபொட)
(The Hon. Gamini Waleboda)
මට අවස්ථාව දුන්නාට ස්තුතියි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

ගරු ඇමතිතුමනි, ගරු දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමා පැහැදිලි කළා වාගේම, ඇත්තටම දැන් මූලාසනයේ අසුන් ගෙන ඉඳලා නැඟිටලා ගියේ අපේ ආරක්ෂක සේවයේ හිටපු රණවිරුවෙක්. එතුමා එක්ක වැඩ කරපු, එතුමා යටතේ සේවය කරපු

[ගරු ගාමිණී වලේබොඩ මහතා]

කණ්ඩායමකුත් මේ කියපු පිරිසට අයත් වෙලා ඉන්නවා. මම මේ ගැන විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව එක්ක කථා කළා, ගරු ඇමතිතුමනි. ඒ විශ්‍රාම වැටුප ලබා දෙන්න නම්, ඒ අය ජීවත් වෙන බවට සහතිකයක් ඒ නිලධාරින්ට අවශ්‍යයි. නමුත්, ඒ සහතිකය රුසියාවේ සේවයට ගිය අයගේ පවුල්වල අයට ලංකාවෙන් ලබා දෙන්න විධියක් නැහැ. මොකද, ඒ අය දැන් මේ රටින් පිටට ගිහිල්ලා. ඊළඟට, අපේ රටේ රුසියානු තානාපති කාර්යාලයත් එක්ක කථා කළා. ඒ අයටත් යුද කඳවුරුවල ඉන්න, සටන් වදිමින් ඉස්සරහින්ම ඉන්න සෙබළුන්ගේ අත්සනක් හෝ ලේඛනයක් ලබා ගන්න විධියක් නැහැ. ඒ අය අතුරුදහන් වෙලා ද, ජීවත් වෙනවා ද කියන එක පිළිබඳව නිශ්චිත තහවුරුවක් නැති තත්ත්වයක් තුළ මේ වන විට විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව 50කට ආසන්න පිරිසකගේ විශ්‍රාම වැටුප අහෝසි කරලා තිබෙනවා. මේ පිළිබඳව කඩිනම් මැදිහත්වීමක් රජය විධියට සිදු කිරීමේ අවශ්‍යතාවක් තිබෙනවා, ගරු සභානායකතුමනි. අපේ රටේ 600ක් විතර පිරිසක් එහේ ඉන්නවා. මේක මහා ආපදාවක්. ආපදාවක් විතරක් නොවෙයි, මේක අපේ රටට අපවාදයක් බවටත් පත් වෙලා තිබෙනවා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු ඇමතිතුමනි, උත්තර දීලා අවසන් කරන්න.

**ගරු ජනාධිපති නීතිඥ එම්.යූ.එම්. අලි සබ්රි මහතා**
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி எம்.யூ.எம். அலி சப்ரி)
(The Hon. M.U.M. Ali Sabry, PC)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, දැන් කථා කළ මන්ත්‍රීවරුන් දෙදෙනාම ශ්‍රී ලංකාව නියෝජනය කරමින් අපේ State Minister එක්ක රුසියාවට ගියා; උත්සාහයක් දැරුවා. විපක්ෂයේ තවත් කණ්ඩායමකුත් ගියා. අපි ඒකටත් සම්පූර්ණයෙන් අවස්ථාව ලබා දුන්නා.

අපි දිගින් දිගටම ඔවුන් එක්ක සාකච්ඡා කරමින් ඉන්නේ; අපි උත්සාහය අත් හැරලා නැහැ. අපේ තානාපතිතුමා ගිය සතියේත් එහේ ගිහිල්ලා මුණ ගැසුණා කිව්වා, විශේෂයෙන්ම ඉන්දියාවේ මෝදි අගමැතිතුමා ගිය වෙලාවේදී ඒ වෙච්ච පොරොන්දුව උඩ. අපිත් කියන්නේ ඔවුන්ට එහෙම සලකනවා නම් අපටත් ඒ ආකාරයෙන්ම සලකලා අපේ අයත් ලංකාවට එවන්න කියලායි. නමුත්, තවම එහෙම යවන්නට තීන්දුවක් අරගෙන නැහැ කියන එක තමයි අවසාන වශයෙන් මට අපේ තානාපතිතුමා කිව්වේ. ඇත්ත වශයෙන් පසුගිය සති දෙක ගැන මට update එකක් නැහැ. ඔබතුමන්ලා දැන් මේ කාරණය මතක් කළ එක හොඳයි. මම නැවත වතාවක් update එකක් අරගෙන දැනුම් දෙන්නම්.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
හොඳයි, ගරු ඇමතිතුමා.

ප්‍රශ්න අංක 10 -2020/2024- (1), ගරු එස්.එම්. මරික්කාර් මහතා. *[සභා ගර්භය තුළ නැත.]*

දෙවන වටය.

## ශ්‍රී ලාංකික සිසුන් විදේශ රටවල හදාරන උපාධි පාඨමාලා: විස්තර

வெளிநாடுகளில் பட்டப் பாடநெறிகள் மேற்கொள்ளும் இலங்கை மாணவர்கள்: விபரம்

DEGREE COURSES FOLLOWED BY SRI LANKAN STUDENTS IN FOREIGN COUNTRIES: DETAILS

1157/2024

**1. ගරු ගාමිණී වලේබොඩ මහතා (ගරු මධුර විතානගේ මහතා වෙනුවට)**
(மாண்புமிகு காமினி வலேபொட - மாண்புமிகு மதுர விதானகே சார்பாக)
(The Hon. Gamini Waleboda on behalf of the Hon. Madhura Withanage)
අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) සාමාන්‍යයෙන් එක් වර්ෂයක් තුළ උසස් අධ්‍යාපන කටයුතු සඳහා විදේශගත වන ශ්‍රී ලාංකික සිසුන් සංඛ්‍යාව සහ ඒ සඳහා වැය වන මුදල වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) ඔවුන් විදේශගත වන රටවල් කවරේද;

(iii) එම සිසුන් හදාරනු ලබන උපාධි පාඨමාලා කවරේද;

(iv) එම උපාධි පාඨමාලා ශ්‍රී ලංකාවේදී හැදෑරිය නොහැකිද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

கல்வி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) சாதாரணமாக வருடமொன்றில் உயர்கல்வி நடவடிக்கைகளின் நிமித்தம் வெளிநாடு செல்லும் இலங்கை மாணவர்களின் எண்ணிக்கை மற்றும் அதற்காகச் செலவிடப்படும் தொகை தனித்தனியே யாதென்பதையும்;

(ii) அவர்கள் செல்லும் நாடுகள் யாவையென்பதையும்;

(iii) மேற்படி மாணவர்கள் பயிலும் பட்டப் பாடநெறிகள் யாவை என்பதையும்;

(iv) அப்பட்டப் பாடநெறிகளை இலங்கையில் கற்க முடியாதா என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Education:

(a) Will he inform this House -

(i) the number of Sri Lankan students who go abroad for higher education purposes in one year on average and the amount spent for it, separately;

(ii) the countries they visit for higher education;

(iii) the degree courses such students follow; and

(iv) whether those degree courses cannot be followed in Sri Lanka?

(b) If not, why?

**ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මම **සභාගත*** කරනවා.

** සභාමේසය මත තබන ලද පිළිතුර:*
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i) උසස් අධ්‍යාපන කටයුතු සඳහා ශ්‍රී ලාංකික සිසුන් විදේශගත වීමේදී රාජ්‍ය අංශය මෙන්ම පුද්ගලික අංශය විසින් ද විදේශ විනිමය වැය කරමින් විදේශගත වන බව නිරීක්ෂණය කරමි.

නමුත් පුද්ගලික අංශය/ විශ්වවිද්‍යාල මඟින් ශ්‍රී ලාංකික සිසුන් විදේශගත වීම පිළිබඳ තොරතුරු හෝ වැයවන මුදල් පිළිබඳ තොරතුරු අධ්‍යාපන අමාත්‍යාංශය වෙත නොලැබෙන අතර අධ්‍යාපන අමාත්‍යාංශයේ උසස් අධ්‍යාපන අංශය මඟින් ක්‍රියාත්මක කරනු ලබන ශිෂ්‍යත්ව වැඩසටහන් යටතේ විදේශගත වන ශ්‍රී ලාංකික සිසුන් සම්බන්ධ තොරතුරු පමණක් පහත පරිදි ඉදිරිපත් කරමි.

අධ්‍යාපන අමාත්‍යාංශයේ උසස් අධ්‍යාපන අංශය විසින් ක්‍රියාත්මක කරනු ලබන විදේශීය ශිෂ්‍යත්ව වැඩසටහන යටතේ ප්‍රථම හා පශ්චාත් උපාධි සඳහා 2023 වර්ෂයේදී සිසුන් 134දෙනෙකු සඳහා ශිෂ්‍යත්ව ප්‍රදානයන් හිමි වී ඇති අතර, 2024 වර්ෂය සඳහා 2024.08.21 දින වන විට ශිෂ්‍යත්ව අවස්ථාවන් 194ක් වෙනුවෙන් නාම යෝජනා අදාළ ශිෂ්‍යත්ව ප්‍රදානය කරන විදේශීය රටවල් මේ වන විට යොමු කර ඇත.

ඒ අනුව සාමාන්‍යයෙන් වාර්ෂිකව සිසුන් 120-175 අතර සංඛ්‍යාවක් මෙම ශිෂ්‍යත්ව වැඩසටහන් සඳහා විදේශගත වේ.

උක්ත ශිෂ්‍යත්ව වැඩසටහන් අතරින් කියුබානු ශිෂ්‍යත්ව වැඩසටහන හැරුණු කොට අනෙකුත් සියලු ශිෂ්‍යත්ව වැඩසටහන් සඳහා ශ්‍රී ලංකා රජය කිසිදු වැය බරක් නොදරයි.

කියුබානු පූර්ව උපාධි ශිෂ්‍යත්ව වැඩසටහන යටතේ වෛද්‍ය උපාධිය හැදෑරීම සඳහා විදේශගත වන සිසුන් වෙනුවෙන් අංක 11/0189/521/003 හා 2011.02.02 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය ප්‍රකාරව එක් සිසුවෙකුට ඇමෙරිකානු ඩොලර් 15 බැගින් වූ මාසික දීමනාවක් ගෙවීමට මෙම අමාත්‍යාංශය කටයුතු කරනු ලැබේ. ඒ අනුව, කියුබානු ශිෂ්‍යත්ව වැඩසටහන යටතේ අධ්‍යයන කටයුතු සිදු කරමින් සිටින සිසුන් සඳහා 2023 වර්ෂයට අදාළව ඇමෙරිකානු ඩොලර් 1,155ක් (බැංකු ගාස්තු ද ඇතුළත්ව) මෙම අමාත්‍යාංශය විසින් දරා ඇත. මෙම ශිෂ්‍යත්ව වැඩසටහන යටතේ මේ වනවිට වසරකට එක් පූර්ව උපාධි ශිෂ්‍යත්වයක් පිරිනැමේ.

(ii) 1. ඉන්දියාව
2. හන්ගේරියාව
3. එක්සත් රාජධානිය
4. චීනය
5. කියුබාව
6. ජපානය
7. සර්බියාව

(iii) එම සිසුන් හදාරනු ලබන උපාධි පාඨමාලා පහත පරිදි වේ.

**Undergraduate scholarships**

| Se No | Country | Programme | Stream |
|---|---|---|---|
| 1 | India | Nehru Memorial Scholarship Programme | Bio,Maths,Commerce,Art |
| | | Rajiv Ghandhi Scholarship Programme | Engineering |
| 2 | Cuba | Cuban Government Scholarships | Medicine |
| 3 | China | China Scolarship Council (CSC)programme | Medicine |
| 4 | Japan | Japanese MEXT Scholarship Programme | Mathematical Stream |
| 5 | Serbia | World Project in Serbia | Engineering |
| 6 | Hungary | Stipendium Hungaricum Scholarship Programme | Agricultural Science, Engineering Science, Economics Science |

**Postgraduate scholarships**

| | Country | Programme | Stream |
|---|---|---|---|
| 1 | India | Azard Maulana Scholarship Programme (Masters) | Engineering, Science and Agriculture courses. |
| | | Nehru Memorial Scholarship Programme (PhD) | Engineering, Science and Agriculture courses. |

[ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා]

| | Country | Programme | Stream |
|---|---|---|---|
| | | Nehru Memorial Scholarship Programme (Masters) | Engineering, Science, Business, Economics, Commerce, Humanities and Arts, |
| 2 | China | China Scolarship Council (CSC)Scholarship programme | Science Engineering, Agriculture, Medicine, Economics, Law, Management, Education, History, Literature, Philosophy and Fine Arts among others |
| 3 | UK | Commonwelth Scholarship Programme(Masters) | •Science and Technology for development<br>•Strengthening health system and capacity<br>•Promoting global prosperity<br>•Strengthening global peace, security and governance<br>•Strengthening resilience and response to crisis<br>•Access, inclusion and opportunity |
| 4 | Japan | Japanese MEXT Scholarship Programme | Haven't mentioned specifically |
| 5 | Hungary | Stipendium Hungaricum Scholarship Programme | Agricultural Science, Engineering Science, Masters Economics Science Any fields for PhD |

තවද, මෙම ප්‍රදානය කරනු ලබන පාඨමාලා අදාළ ප්‍රදානයන් සිදු කරනු ලබන රටවල් විසින් ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයන් මත වෙනස් විය හැක.

(iv) උක්ත උපාධි පාඨමාලා ශ්‍රී ලංකාව තුළ ද හැදෑරිය හැකි වුවත් රාජ්‍ය විශ්වවිද්‍යාලවලට ඇතුළත් වීමේ දී පවතින සීමිත අවස්ථාව හේතුවෙන් හා මෙම උපාධි පාඨමාලා ශිෂ්‍යත්ව ප්‍රදානයන් වශයෙන් ශ්‍රී ලාංකික සිසුන්හට හිමි වන අවස්ථාවන් වන බැවින් මෙම උපාධි පාඨමාලා හැදෑරීමට සිසුහු යොමු වෙති.

(ආ) අදාළ නොවේ.

## GSP Plus පහසුකම අනුව සේවක අයිතිවාසිකම් ලබා දීම: ගත් පියවර

GSP Plus வசதியின் அடிப்படையில் ஊழியர்களின் உரிமைகளை வழங்குதல்: நடவடிக்கை

GRANT OF WORKERS' RIGHTS AS PER GSP PLUS FACILITY: MEASURES TAKEN

1249/2024

**2. ගරු ගාමිණී වලේබොඩ මහතා (ගරු ඉරාන් වික්‍රමරත්න මහතා වෙනුවට)**

(மாண்புமிகு காமினி வலேபொட - மாண்புமிகு இரான் விக்கிரமரத்ன சார்பாக)

(The Hon. Gamini Waleboda on behalf of the Hon. Eran Wickramaratne)

කම්කරු හා විදේශ රැකියා අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) ශ්‍රී ලංකාවට ලබා දී ඇති GSP Plus සහනය අනුව ශ්‍රී ලංකාව විසින් සේවක අයිතිවාසිකම් සහ ආරක්ෂාව සම්බන්ධ විධිවිධාන කිහිපයක් ක්‍රියාත්මක කළ යුතු බව දන්නේද;

(ii) එසේ නම්, සේවක අයිතිවාසිකම් සුරැකීම සඳහා ගෙන ඇති පියවර කවරේද;

(iii) එවැනි කිසිදු පියවරක් මේ වනතෙක් ගෙන නොමැති නම්, එයට හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) (i) ඇඟලුම් ක්ෂේත්‍රයේ සේවයේ නියුතු සේවකයින් සඳහා නිසි ආරක්ෂිත ක්‍රියා මාර්ග නොමැති බව සහ ඇතැම් ඇඟලුම් ආයතන විසින් සේවකයන් සඳහා ආහාර පාන සැපයීම නවත්වා ඇති බවත්;

(ii) ඇඟලුම් කම්හල් තුළ සේවක සේවිකාවන් අතර සාමූහිකව කටයුතු කිරීම තහනම් කර තිබීම කාන්තා හා පිරිමි සියලු සේවකයන් කෙරෙහි අහිතකර බලපෑම් එල්ල කර ඇති අතර, විශේෂයෙන් එය වැඩ බිම තුළ ලිංගික හිංසනයට ලක් වන සේවිකාවන්ට බලපාන බවත්;

එතුමා දන්නේද?

(ඇ) (i) ඇඟලුම් ක්ෂේත්‍රයේ සේවයේ නියුතු සේවකයින් රැක ගැනීම සඳහා ගෙන ඇති පියවර කවරේද;

(ii) සේවක අයිතිවාසිකම් උල්ලංඝනය කිරීම් සඳහා අදාළ සේවායෝජකයන් වෙත වගවීමක් ඇති කිරීමට ගෙන ඇති පියවර කවරේද;

යන්න එතුමා වැඩිදුරටත් මෙම සභාවට දන්වන්නේද?

(ඈ) නො එසේ නම්, ඒ මන්ද?

தொழில் மற்றும் வெளிநாட்டு வேலைவாய்ப்பு அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) இலங்கைக்கு வழங்கப்பட்டுள்ள GSP Plus நிவாரண அடிப்படையில், தொழிலாளர்களின் உரிமைகள் மற்றும் பாதுகாப்புத் தொடர்பான பல்வேறு ஏற்பாடுகளை அமுல்படுத்துமாறு இலங்கை தேவைப்படுத்தப்பட்டுள்ளது என்பதை அவர் அறிவாரா என்பதையும்;

(ii) அப்படியாயின், தொழிலாளர்களின் உரிமைகளை மேம்படுத்துவதற்கு எடுக்கப்பட்ட நடவடிக்கைகள் யாவை என்பதையும்;

(iii) அவ்வாறான நடவடிக்கைகள் இதுவரை எடுக்கப்படவில்லை எனின், அதற்கான காரணங்களையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) (i) ஆடைத் தொழிலாளர்களுக்குப் பாதுகாப்பு நடவடிக்கைகள் இல்லாதிருப்பது பற்றியும் சில ஆடைத் தொழிற்சாலைகள் அவர்களுக்கு உணவு வழங்குவதை நிறுத்தியுள்ளமை பற்றியும் அவர் அறிவாரா என்பதையும்;

(ii) ஆடைத் தொழிற்சாலைகளில் சங்கம் அமைப்பதற்கான சுதந்திரம் மறுக்கப்படுதலானது ஆண் மற்றும் பெண் தொழிலாளர்களுக்குப் பாதிப்புகளை ஏற்படுத்துவதுடன், குறிப்பாகப் பாலியல் துன்புறுத்தல்களுக்கு ஆளாகும் பெண் தொழிலாளர்களைப் பாதிக்கிறது என்பதை அவர் அறிவாரா என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) (i) ஆடைத் தொழிலாளர்களைப் பாதுகாப்பதற்கும்;

(ii) இந்த மீறல்களுக்குத் தொழில்வழங்குநர்களை வகைப்பொறுப்புடையவர்களாக ஆக்குவதற்கும்;

எடுக்கப்பட்ட நடவடிக்கைகளை அவர் இச்சபைக்கு மேலும் அறிவிப்பாரா?

(ஈ) இன்றேல், ஏன்?

asked the Minister of Labour and Foreign Employment:

(a) Will he inform this House -

(i) whether he is aware that as per the GSP Plus status granted, Sri Lanka required to implement several provisions related to workers' rights and protection;

(ii) if so, the steps taken to safeguard workers' rights; and

(iii) the reasons, if no such steps have been taken yet?

(b) Is he aware of the -

(i) lack of protective measures for workers who are employed in the garment industry and that some garment factories have stopped providing them meals; and

(ii) denial of freedom of association of workers in garment factories has implications for both male and female workers and it especially affects the female workers, who are subjected to sexual harassments within the working station?

(c) Will he further inform this House of the steps taken to-

(i) protect workers who are employed in garment industry; and

(ii) hold employers accountable for the violations of workers' rights?

(d) If not why?

**ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, කම්කරු හා විදේශ රැකියා අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i) ඔව්.

(ii) 2017 මැයි මස 19 වන දින සිට ශ්‍රී ලංකාවට යුරෝපා සංගමයේ GSP Plus වෙළඳ පහසුකම (EU GSP Plus trade facility) ලැබුණි. මෙහි කොටසක් වශයෙන් ශ්‍රී ලංකාව සම්මුතීන් 27කට අදාළ ක්‍රියා මාර්ග ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය වන අතර ඉන් සම්මුතීන් 08ක් කම්කරු අංශයට සම්බන්ධ වේ. මෙම සම්මුතීන් ක්‍රියාත්මක කිරීමේදී ශ්‍රී ලංකාව සැලකිය යුතු ප්‍රගතියක් ලබා ඇති අතර, ඒවා කෙටියෙන් පහතින් සඳහන් කර ඇත.

01. ළමා ශ්‍රමය තුරන් කිරීම:

සම්මුති අංක 138: සේවයෙහි යෙදවීමේ අවම වයස පිළිබඳ සම්මුතිය

සම්මුති අංක 182: ළමා ශ්‍රමයේ අනර්ථකාරී ස්වරූපයන් පිළිබඳ සම්මුතිය
2021 ජනවාරි මස 22 වන දින ජාතික අධ්‍යාපන ප්‍රතිපත්තියට අනුකූලව ශ්‍රී ලංකාව විසින් රැකියා සඳහා ඇතුළත් වීමේ වයස අවුරුදු 14 සිට 16 දක්වා වැඩි කර ඇති අතර, ඒ සඳහා පහත පනත් 06 සංශෝධනය කරන ලදී.
1956 අංක 47 දරන ස්ත්‍රීන්, තරුණ අය සහ ළමයින් සේවයෙහි යෙදවීම පිළිබඳ පනත
1942 අංක 45 දරන කර්මාන්තශාලා ආඥාපනත
1954 අංක 19 දරන සාප්පු සහ කාර්යාල සේවක පනත
1941 අංක 27 දරන පඩිපාලක සභා ආඥා පනත
1927 අංක 27 දරන අවම වේතන (ඉන්දියානු කම්කරු) පනත
1958 අංක 15 දරන සේවක අර්ථසාධක අරමුදල් පනත
182 සම්මුතියට අදාළව ශ්‍රී ලංකාව 2021 නොවැම්බර් 18 වැනි දින අන්තරායකර ලැයිස්තුව යාවත්කාලීන කරන ලදී.
ඒ අනුව, දැනට වයස අවුරුදු 16 සහ 18 අතර ළමුන් සඳහා ගෘහ සේවය ඇතුළු අන්තරායකර රැකියා 71ක් හඳුනාගෙන ඇත.
මීට අමතරව, කම්කරු දෙපාර්තමේන්තුවේ කාන්තා හා ළමා අංශය මඟින් ප්‍රතිපත්තිමය පියවර සහ පරිපාලන ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කර ඇත. මෙම පියවරයන් මෙහෙයවනු ලබන්නේ කම්කරු හා විදේශ රැකියා අමාත්‍යාංශයේ නායකත්වය යටතේ ළමා ශ්‍රමය පිළිබඳ ජාතික මෙහෙයුම් කමිටුව මඟිනි.

02. බලහත්කාර සහ අනිවාර්ය කම්කරු සම්මුතීන්

සම්මුති අංක 29 : බලහත්කාරයෙන් සේවයේ යෙදවීම පිළිබඳ සම්මුතිය සහ

[ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා]

සම්මුති අංක 105: බලහත්කාරයෙන් සේවයේ යෙදවීම තුරන් කිරීම පිළිබඳ සම්මුතිය

2017 වසරේ දී යුරෝපා සංගමයේ GSP+ පහසුකම (EU GSP Plus trade facility) ලැබීමෙන් පසුව, ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ සහාය ඇතිව P29 බලහත්කාරයෙන් සේවයේ යෙදවීම සම්බන්ධ ප්‍රොටෝකෝලය අපරානුමත කිරීමට ශ්‍රී ලංකාව පියවර ගත්තේය. ත්‍රෛපාර්ශ්වික පාර්ශ්වකරුවන්ගේ සහාය ඇතිව, ශ්‍රී ලංකාව 2019 වසරේ දී P29 අපරානුමත කර මෙම සම්මුතිය යටතේ ඇති ප්‍රතිපාදන ක්‍රියාත්මක කිරීම සඳහා බලහත්කාරයෙන් සේවයේ යෙදවීම පිළිබඳ කම්කරු කාර්ය සාධක බලකාය පිහිටුවීය.

ජාත්‍යන්තර කම්කරු සංවිධානයෙහි CEACR කමිටුව විසින් බලහත්කාරයෙන් සේවයේ යෙදවීම සම්බන්ධයෙන් ඉදිරිපත් කරන ලද නිර්දේශ කිහිපයක් ඇති අතර, මෙම නිර්දේශ ක්‍රියාත්මක කිරීම සඳහා රජය සක්‍රියව සාකච්ඡා කරමින් සිටී.

03. සංගමයේ නිදහස සහ සාමූහික කේවල් කිරීමේ අයිතිය

සම්මුති අංක 87 : සංගමයේ නිදහස හා සංවිධානය වීමට ඇති අයිතිය ආරක්ෂා කිරීම

සම්මුති අංක 98 : සංවිධානය වීමට ඇති අයිතිය සහ සාමූහික කේවල් කිරීම පිළිබඳ සම්මුතිය

මෙම සම්මුතීන් යටතේ යුරෝපා සංගමය විසින් CEACR (සම්මුතීන් සහ නිර්දේශ ක්‍රියාත්මක කිරීම පිළිබඳ විශේෂඥ කමිටුව) නිර්දේශ සලකා බලන ලෙස ඉල්ලා සිටි අතර ඒවා සම්බන්ධයෙන් ගෙන ඇති වැදගත් නිර්දේශ සහ ක්‍රියාමාර්ග කිහිපයක් පහත සඳහන් වේ.

- වෘත්තීය සමිති වශයෙන් පිළිගැනීම පිණිස අනිවාර්ය වන සියයට 40 සීමාව පහත හෙළීම:

  මේ සම්බන්ධයෙන් තීරණයක් ගැනීම සඳහා කම්කරු කොමසාරිස් ජනරාල්වරයාගේ ප්‍රධානත්වයෙන් 2017 ඔක්තෝබර් මස 20 වැනි දින කම්කරු හා විදේශ රැකියා අමාත්‍යාංශය විසින් ත්‍රෛපාර්ශ්වික රැස්වීමක් කැඳවන ලදී. කෙසේ වෙතත්, බොහෝ නියෝජිත වෘත්තීය සමිති විසින් සියයට 40 සීමාව අඩු කිරීමට විරුද්ධ වූයේ, එය වෘත්තීය සමිති ගුණනය කිරීමට හේතු වන අතර සාමූහික කේවල් කිරීම තවදුරටත් සංකීර්ණ කරන බව පවසමිනි. එකඟතාවකට නොපැමිණි බැවින්, උපදේශන රැස්වීම්වලදී මෙය යුරෝපා සංගම් නියෝජිතයින්ට දැනුම් දෙන ලදී.

- අනිවාර්ය බේරුම්කරණයට කම්කරු ආරාවුල් යොමු කිරීම ඉවත් කිරීම:

  ත්‍රෛපාර්ශ්වික රැස්වීමේදී මේ පිළිබඳව සාකච්ඡා කළ අවස්ථාවේදී, බොහෝ වෘත්තීය සමිති ප්‍රකාශ කළේ වෘත්තීය ක්‍රියා මාර්ග අතරවාරයේදී අවහිරයක් ඇති වූ විට අවසන් විසඳුම මෙය බවයි. එබැවින්, මෙම විකල්පය ඉවත් නොකරන ලෙස ඔවුහු ඉල්ලා සිටියහ. මෙම රැස්වීම් අතරතුර මේ පිළිබඳ යුරෝපා සංගම් නියෝජිතයින්ට දැනුම් දෙන ලදී.

- යුක්ති සහගත නොවන කම්කරු පිළිවෙත් පිළිබඳ පැමිණිලි ලබා ගැනීම පිණිස වෘත්තීය සමිතිවලට අධිකරණ සඳහා සෘජු ප්‍රවේශය ලබා දීම:

  ත්‍රෛපාර්ශ්වික රැස්වීමේ දී ද මේ සම්බන්ධයෙන් සාකච්ඡා කෙරිණි. කෙසේ වෙතත්, ඇතැම් වෘත්තීය සමිති ප්‍රකාශ කළේ, වෘත්තීය සමිතිවලට සෑම විටම නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට නොහැකි වන බැවින් එහි වගකීම කම්කරු දෙපාර්තමේන්තුවට පැවරිය යුතු බවයි. පවතින ක්‍රමයේ අඩුපාඩු ඇත්නම් පරිපාලනමය පියවර මඟින් ඒවා විසඳා ගත හැකියි. ඉන් අනතුරුව, යුක්ති සහගත නොවන කම්කරු පිළිවෙත් සම්බන්ධ නඩු කඩිනම් කිරීම සඳහා කම්කරු දෙපාර්තමේන්තුව පියවර කිහිපයක් හඳුන්වා දෙන ලදී.

04. රැකියා සහ ජීවන වෘත්තීය වෙනස්කොට සැලකීම පිළිබඳ සම්මුතිය

සම්මුති අංක 100: සමාන පාරිශ්‍රමික පිළිබඳ සම්මුතිය

සම්මුති අංක 111: වෙනස්කොට සැලකීම පිළිබඳ (රැකියා සහ ජීවන වෘත්තීය) සම්මුතිය

මේ සම්බන්ධයෙන්, සේවා ස්ථානයේ වෙනස්කොට සැලකීම ඉවත් කිරීම සඳහා රජය විසින් බොහෝ පියවර ගෙන ඇත. සාප්පු හා කාර්යාල සේවක පනත සංශෝධනය කිරීම මඟින් කාන්තාවන් සඳහා රාත්‍රී වැඩ සීමා ලිහිල් කරන ලදී.

මීට අමතරව, ඉහත සම්මුතීන්ට අනුකූලව, රජය විසින් යෝජිත සේවා නියුක්ති පනතට ප්‍රතිපාදන ඇතුළත් කර ඇත. ඉන් වැදගත් විධිවිධාන කිහිපයක් පහත දැක්වේ.

වෙනස්කොට සැලකීමට එරෙහි විධිවිධාන

සේවා ස්ථානයේ හිංසනයට හා හිරිහැරයට එරෙහි විධිවිධාන

රැකියාවේ සමාන වටිනාකමක් සඳහා සමාන වැටුප් සහතික කිරීමේ විධිවිධාන

කාන්තා කම්කරුවන් සඳහා රාත්‍රී වැඩ ලිහිල් කිරීම

වෘත්තීය සමිති විධායක කමිටුවල කාන්තා නියෝජනය

අවසාන වශයෙන්, යුරෝපා සංගමය විසින් නිර්දේශ කර ඇති පරිදි සේවක අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සම්බන්ධයෙන් අමාත්‍යාංශය වැදගත් ක්ෂේත්‍ර ආමන්ත්‍රණය කර ඇත. එකඟතාවකට නොපැමිණෙන කාරණාවලදී, පාර්ශ්වකරුවන් සමඟ සාකච්ඡා කර එවැනි නිර්දේශ ආමන්ත්‍රණය කිරීමට අමාත්‍යාංශය අතිරේක පියවර ගනු ඇත.

(iii) ගෙන ඇති පියවර පිළිබඳ ඉහත (ii) හි සඳහන් පිළිතුරෙහි දක්වා ඇත.

(ආ) (i) ස්ත්‍රීන් තරුණ අය හා ළමයින් සේවයෙහි යෙදවීම පිළිබඳ පනතේ හා කර්මාන්තශාලා ආඥා පනතේ ප්‍රතිපාදන ප්‍රකාරව කාර්මික ව්‍යාපාරයක හෝ කර්මාන්තශාලාවක රාත්‍රී කාලයේ දී වැඩ කරන සෑම කම්කරු ස්ත්‍රියකටම සේවායෝජක විසින් කෑම සපයනු ලැබිය යුතු බවට ව්‍යවස්ථාපිතව සඳහන් වේ. නමුත්, කාර්මික ව්‍යාපාර හෝ කර්මාන්තශාලා යන අර්ථ නිරූපණයට නොවැටෙන වෙනත් ඕනෑම සේවා ස්ථානයක සේවය කරන සේවකයින්ට ආහාරපාන සැපයීම සේවායෝජකගේ අභිමතය පරිදි සිදු කරනු ලබන අතර, ඒ සඳහා සේවායෝජක වෙත ව්‍යවස්ථාපිත බැඳීමක් නොමැත. විශේෂයෙන්ම කාර්මික ව්‍යාපාරයක රාත්‍රී සේවයේ නියුක්ත කරන කාන්තා සේවිකාවන් සඳහා ආහාර පාන නොදෙන බවට නිශ්චිත සේවායෝජකයකුට එරෙහිව පැමිණිල්ලක් කම්කරු දෙපාර්තමේන්තුවට යොමු කරන අවස්ථාවක ඒ පිළිබඳව නෛතිකව කටයුතු කළ හැකි බව සඳහන් කරමි.

(ii) මෙම ප්‍රශ්නය තුළින් මතු කරන කාරණය අපැහැදිලි ය.

දැනට පවතින කම්කරු නීතියේ වැඩපළ තුළ සිදු වන ලිංගික හිංසනය වැළැක්වීම සඳහා සෘජු නෛතික ප්‍රතිපාදන නොමැති නිසා කම්කරු දෙපාර්තමේන්තුවට මෙවැනි ආකාරයේ පැමිණිලි හෝ තොරතුරු ලැබුණු විට අපරාධ නීතිය යටතේ පියවර ගැනීම සඳහා එයට අදාළ බලය ඇති බලධාරීන්ට වාර්තා කරන ලෙස පාර්ශ්වයන් දැනුවත් කිරීම කරනු ලබයි.

වැඩපළ තුළ ලිංගික හිංසනය වැළැක්වීමට අදාළ නෛතික ප්‍රතිපාදන ඉදිරියේ දී සිදු කිරීමට අපේක්ෂිත කම්කරු නීති ප්‍රතිසංස්කරණවල දී ඇතුළත් කිරීමට කටයුතු සිදු කරමින් පවතී.

(ඇ) (i) ඇඟලුම් ක්ෂේත්‍රයේ නියුතු සේවකයින්ගේ සේවා තත්ත්වයන් හා සේවා කොන්දේසි නියම කිරීම සඳහා ඇඳුම් සෑදීමේ කර්මාන්තය නමින් පඩිපාලක සභාවක් පඩිපාලක සභා ආඥා පනත ප්‍රකාරව පිහිටුවා ක්‍රියාත්මක කරනු ලබයි. මෙමඟින් මෙම ක්ෂේත්‍රයට අදාළ නීති ප්‍රතිපාදන මඟින් සේවකයින් රැක ගැනීම සඳහා අවශ්‍ය පියවර ගෙන ඇත.

තවද, 1956 අංක 47 දරන ස්ත්‍රීන් තරුණ අය හා ළමයින් සේවයේ යෙදවීමේ පනතේ 1942 අංක 45 දරන කර්මාන්තශාලා ආඥා පනතේ කාන්තාවන් රාත්‍රී සේවයේ යෙදවීමට අදාළ කොන්දේසි මඟින් ඇඟලුම් ක්ෂේත්‍රයේ සේවයේ නියුතු කාන්තා සේවකයින්ගේ සුබසාධනය, ආරක්ෂාව යනාදියට අදාළ ප්‍රතිපාදන තහවුරු කර ඇත.

(ii) කම්කරු දෙපාර්තමේන්තුවේ නීති ක්‍රියාත්මක කරන යන්ත්‍රණය වන දිවයිනේ පිහිටි සියලුම දිස්ත්‍රික් කම්කරු කාර්යාල, උප කම්කරු කාර්යාල සහ දිස්ත්‍රික් ඉංජිනේරු කාර්යාලවල සේවයේ නියුතු කම්කරු නිලධාරින්,

කර්මාන්තශාලා පරීක්ෂක ඉංජිනේරුවන් මාර්ගයෙන් ආයතන කම්කරු නීතිවලට අනුකූලව ක්‍රියාත්මක වන්නේ ද යන්න පිළිබඳ නිරන්තරයෙන් කාලීන පරීක්ෂණයන් සිදු කිරීම.

කම්කරු නීති උල්ලංඝනය කරන්නන් හඳුනාගෙන නඩු පවරා අදාළ නෛතික ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කිරීම.

සේව◌ායෝජකයින් කම්කරු නීති පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම.

(ආ) අදාළ නොවේ.

## පොළොන්නරුව දිස්ත්‍රික්කයේ රජයේ පාසල්: තාක්ෂණ විෂය ධාරාව ප්‍රචලිත කිරීම
## பொலன்னறுவை மாவட்டத்திலுள்ள அரச பாடசாலைகள்: தொழில்நுட்பப் பிரிவை ஊக்குவித்தல்
## GOVERNMENT SCHOOLS IN POLONNARUWA DISTRICT: PROMOTION OF TECHNOLOGY STREAM

1288/2024

**4. ගරු ගාමිණී වලේබොඩ මහතා (ගරු කිංස් නෙල්සන් මහතා වෙනුවට)**
(மாண்புமிகு காமினி வலேபொட - மாண்புமிகு கிங்ஸ் நெல்சன் சார்பாக)
(The Hon. Gamini Waleboda on behalf of the Hon. Kins Nelson)

අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) පොළොන්නරුව දිස්ත්‍රික්කයේ ඇති රජයේ පාසල් සංඛ්‍යාව කොපමණද;

(ii) එම පාසල්වල නම් කවරේද;

(iii) එම පාසල් අතරින් මේ වන විට තාක්ෂණික විෂය ධාරාව ඉගැන්වීමේ කටයුතු සිදු කරනු ලබන පාසල් සංඛ්‍යාව කොපමණද;

(iv) එම පාසල්වල නම් කවරේද;

(v) පොළොන්නරුව දිස්ත්‍රික්කයේ පාසල් සිසුන් අතර තාක්ෂණික විෂය ධාරාව ප්‍රචලිත කිරීම සඳහා ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

கல்வி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) பொலன்னறுவை மாவட்டத்திலுள்ள அரச பாடசாலைகளின் எண்ணிக்கை எத்தனையென்பதையும்;

(ii) மேற்படி பாடசாலைகளின் பெயர்கள் யாவையென்பதையும்;

(iii) மேற்படி பாடசாலைகளில் தற்போதுள்ள தொழிநுட்பப் பிரிவில் கற்பித்தல் நடவடிக்கைகள் மேற்கொள்ளப்படும் பாடசாலைகளின் எண்ணிக்கை எத்தனை என்பதையும்;

(iv) மேற்படி பாடசாலைகளின் பெயர்கள் யாவையென்பதையும்;

(v) பொலன்னறுவை மாவட்டப் பாடசாலை மாணவர்களுக்கு மத்தியில் தொழில்நுட்பப் பிரிவை பிரபல்யப்படுத்துவதற்காக எடுக்கப்படும் நடவடிக்கைகள் யாவை என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Education:

(a) Will he inform this House -

(i) the number of government schools in the Polonnaruwa District;

(ii) the names of those schools;

(iii) the number of schools which offer subjects in the Technology Stream at present, out of those schools;

(iv) the names of those schools; and

(v) the steps that would be taken to popularize the Technology Stream among the students of the Polonnaruwa District?

(b) If not, why?

**ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මම **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i) පොළොන්නරුව දිස්ත්‍රික්කයේ ඇති රජයේ පාසල් සංඛ්‍යාව 250කි.

(ii) එම පාසල්වල නම් ඇමුණුමෙහි** දක්වා ඇත.

(iii) එම පාසල් අතරින් මේ වන විට තාක්ෂණික විෂය ධාරාව ඉගැන්වීම් කටයුතු සිදු කරනු ලබන පාසල් සංඛ්‍යාව 14කි.

(iv) එම පාසල්වල නම් පහත දක්වා ඇත.

පොළොන්නරුව දිස්ත්‍රික්කයේ තාක්ෂණික විෂය ධාරාව සහිත පාසල් නාමාවලිය:

| අ/අ | පාසල් සංගණන අංකය | පාසලේ නම |
|---|---|---|
| 1 | 20069 | උමැප/පො/පො/තමන්/ රාජකීය මධ්‍ය ම.වි |
| 2 | 20072 | උමැප/පො/පො/තමන්/ පලුගස්දමන ම.වි |
| 3 | 20154 | උමැප/පො/පො/තමන්/ මුස්ලිම් මධ්‍ය ම.වි |
| 4 | 20037 | උමැප/පො/පො/ලංකා/ විජිත ම.ම.වි |
| 5 | 20155 | උමැප/පො/පො/ලංකා/ අල් හිලාල් මු.ම.වි |
| 6 | 20001 | උමැප/පො/හිඟු/හිඟු/ මින්නේරිය ජාතික පාසල |
| 7 | 20002 | උමැප/පො/හිඟු/හිඟු/ ආනන්ද බාලික ජාතික පාසල |
| 8 | 20004 | උමැප/පො/හිඟු/හිඟු/ ගිරිතලේගම ම.වි |
| 9 | 20035 | උමැප/පො/හිඟු/මැදි/ මැදිරිගිරිය මධ්‍ය ම.වි |
| 10 | 20036 | උමැප/පො/හිඟු/මැදි/ දිවුලන්කඩවල ම.වි |
| 11 | 20176 | උමැප/පො/හිඟු/ඇළ/ බකමූණ මහසෙන් මධ්‍ය ම.වි |
| 12 | 20219 | උමැප/පො/දිඹු/වැලි/ වැලිකන්ද ම.වි |
| 13 | 20103 | උමැප/පො/හිඟු/අරල/ විලයාය ම.ම.වි |
| 14 | 20112 | උමැප/පො/දිඹු/අරල/ ලීලාරත්න විජේසිංහ ම.වි |

***** පුස්තකාලයේ තබා ඇත.***
*** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
*** Placed in the Library.*

[ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා]

(v) තාක්ෂණ විෂය ධාරාව ක්‍රියාත්මක පාසල් සඳහා තාක්ෂණ පීඨ ඉදිකිරීම.

* පො/දිවුලන්කඩවල ජාතික පාසල - ඉදිකිරීම් අවසන් වී ඇත. 2024.07.05 දින විවෘත කිරීමට නියමිතය.

* පො/විජිත ම.ම.වි. - ඉදිකිරීම් අවසන් වෙමින් පවතී.

පාසල්වල නව නිපැයුම් සමාජ හා නවෝත්පාදන විද්‍යාගාර ඉදිකිරීම.

සමස්ත ලංකා රොබෝ තාක්ෂණ හා නව නිපැයුම් තරග කලාප හා පළාත් මට්ටමින් පැවැත්වීම.

නව තාක්ෂණ විෂය ධාරාව පිළිබඳව සිසුන් දැනුවත් කිරීමේ වෘත්තීය මාර්ගෝපදේශ වැඩසටහන් පැවැත්වීම.

ඉංජිනේරු/ ජෛව පද්ධති/ තාක්ෂණවේදය සඳහා විද්‍යාව යන විෂයයන් ඉගෙනුම ලබන සිසුන්ට ප්‍රායෝගික පුහුණු කඳවුරු හා සම්මන්ත්‍රණ කලාප මට්ටමින් පැවැත්වීම. මේ සඳහා පළාත් සභා හා SESIP ව්‍යාපෘතියෙන් මූල්‍ය ප්‍රතිපාදන වෙන් කර ඇත.

(ආ) අදාළ නොවේ.

## රජය සතු කෘෂිකාර්මික ගොවිපොළ : ඵලදායී ලෙස භාවිත කිරීම

## அரசாங்கத்துக்குச் சொந்தமான விவசாயப் பண்ணைகளும் காணிகளும்: விளைதிறன்மிக்க பயன்பாடு

## AGRICULTURAL FARMS OWNED BY GOVERNMENT: PRODUCTIVE USE

1706/2024

**5. ගරු ගාමිණී වලේබොඩ මහතා (ගරු කේ. පී. එස්. කුමාරසිරි මහතා වෙනුවට)**

(மாண்புமிகு காமினி வலேபொட - மாண்புமிகு கே.பி.எஸ். குமாரசிறி சார்பாக)

(The Hon. Gamini Waleboda on behalf of the Hon. K.P.S. Kumarasiri)

කෘෂිකර්ම සහ වැවිලි කර්මාන්ත අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) රජය සතු කෘෂිකාර්මික ගොවිපළ සංඛ්‍යාව කොපමණද;

(ii) එම ගොවිපළ සතු මුළු ඉඩම් ප්‍රමාණය අක්කරවලින් කොපමණද;

(iii) මේ වන විට එම මුළු ඉඩම් ප්‍රමාණය කෘෂිකාර්මික කටයුතු සඳහා ඵලදායී ලෙස භාවිත කර තිබේද;

(iv) ඵලදායී ලෙස භාවිත කර නොමැති ඉඩම්, කෘෂිකාර්මික කටයුතු සඳහා පෞද්ගලික ව්‍යවසායකයන්ට තාවකාලික පදනම මත ලබා දෙන්නේද;

(v) එසේ නම්, එලෙස ලබා දිය හැකි ඉඩම් ප්‍රමාණය කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නො එසේ නම්, ඒ මන්ද?

கமத்தொழில் மற்றும் பெருந்தோட்டக் கைத்தொழில் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) அரசாங்கத்துக்குச் சொந்தமான விவசாயப் பண்ணைகளின் எண்ணிக்கை யாதென்பதையும்;

(ii) மேற்படி விவசாயப் பண்ணைகளுக்குச் சொந்தமான மொத்த காணிகளின் அளவு ஏக்கர்களில் எவ்வளவென்பதையும்;

(iii) தற்போது மேற்படி மொத்த காணிகளும் கமத்தொழில் நடவடிக்கைகளுக்கு விளைதிறன்மிக்கவாறு பயன்படுத்தப்பட்டுள்ளனவா என்பதையும்;

(iv) விளைதிறன்மிக்கவாறு பயன்படுத்தப்படாதுள்ள காணிகள், விவசாய நடவடிக்கைகளுக்காக தனியார் தொழில்முயற்சியாளர்களுக்கு தற்காலிக அடிப்படையில் வழங்கப்படுமா என்பதையும்;

(v) ஆமெனில், அவ்வாறு வழங்கப்படக்கூடிய காணிகளின் அளவு யாதென்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Agriculture and Plantation Industries:

(a) Will he inform this House -

(i) the number of agricultural farms owned by the Government;

(ii) the total extent of land owned by aforesaid farms in acres;

(iii) whether the aforementioned total extent of land has been utilized for agricultural purposes productively;

(iv) whether the lands that have not been utilized productively will be given to private entrepreneurs for agricultural purposes on a temporary basis; and

(v) if so, the extent of land that can be provided?

(b) If not, why?

**ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා**

(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)

(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, කෘෂිකර්ම සහ වැවිලි කර්මාන්ත අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i) 29කි.

(ii) අක්කර 4,522කි.

(iii) කෘෂිකර්ම දෙපාර්තමේන්තුව සතු ඉහත සඳහන් භූමි බීජ හා රෝපණ ද්‍රව්‍ය නිෂ්පාදනය කිරීම සඳහා භාවිත කරන අතර, ගොවිපළවල් සතු භූමි බීජ වී, අතිරේක ආහාර භෝග බීජ, එළවලු බීජ, බීජ අර්තාපල්, රෝපණ ද්‍රව්‍ය හා සත්ත්ව පාලනය සඳහා භාවිත කරයි.

බීජ හා රෝපණ ද්‍රව්‍ය නිෂ්පාදනයේදී අවශ්‍ය යටිතල පහසුකම් සැපයීමට සහ ඉදිකිරීම් සඳහා ද එකී භූමි භාවිත කර ඇත. විශේෂයෙන් එළවලු බීජ හා බීජ අර්තාපල් ගොවිපළවල් තුළ අත්‍යවශ්‍යයෙන් සිදු කළ යුතු භෝග මාරු කිරීම සඳහා අවශ්‍ය භූමි ගොවිපළවල් තුළ වෙන් කර ඇත.

(iv) නැත.

(v) අදාළ නොවේ.

(ආ) කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ගොවිපළවල් සතු සියලු භූමි භාවිත කරනු ලබන්නේ ජාතික බීජ හා රෝපණ ද්‍රව්‍ය අවශ්‍යතාව සාක්ෂාත් කර ගැනීම සඳහාය. එමෙන්ම ජාතික ආහාර සුරක්ෂිතතාව උදෙසා ආහාර භෝග වගා කිරීමට අවශ්‍ය මූලික බීජ නිෂ්පාදනය මූලික කාර්යභාරය වන අතර, ඒ සඳහා මෙම සියලුම භූමි භාවිත කරන අතර, ඉදිරියේදී සංවර්ධනය කර බීජ නිෂ්පාදනය සඳහා භාවිත කිරීමට ඉතා සුළු භූමි ප්‍රමාණයක් පමණක් ගොවිපළවල් සතුව ඇත.

තාක්ෂණික වශයෙන් බීජ නිෂ්පාදනය කිරීමේදී ප්‍රභේද අතර හුදෙකලා කිරීමේ පරතර අනිවාර්යයෙන් පවත්වා ගත යුතු අතර, එක් එක් ප්‍රභේදයට ආසන්නයේ එම භෝගයේ ප්‍රභේද වගා කිරීමට නොහැකි වන අතර, පර්යේෂණවලින් තහවුරු කර ඇති පරිදි හුදෙකලා කිරීමේ පරතර පවත්වා ගත යුතුය. එමෙන්ම බීජ වගාවන් එකම භූමියේ අඛණ්ඩව වගා කිරීමට නොහැකි වන අතර, අනිවාර්යයෙන්ම භූමි මාරු කිරීම් සිදු කළ යුතුය.

තවද, බාහිර පර්ශ්වයන් හා එක්ව ගොවිපළ තුළ වගා කටයුතු සිදු කිරීමේදී රෝග හා පළිබෝධ පාලනය ඉතා දුෂ්කර විය හැකි අතර, එසේ සිදුවීමෙන් බීජ වගාවන්හට රෝග හා පළිබෝධ වැළඳීමේ හැකියාව ඉතා ඉහළ බැවින් මේ තුළින් මූලික බීජ නිෂ්පාදනයට හා බීජ කර්මාන්තයට විශාල බලපෑමක් ඇති විය හැක. (උඩරට අර්තාපල් බීජ ගොවිපළවල්)

ඉහත තාක්ෂණික කරුණුවලට අනුකූලව ගොවිපළවල් සතු භූමි තුළ බාහිර පාර්ශ්වයන් විසින් වගා කටයුතු සිදු කළහොත් ඒ තුළින් මූලික බීජ නිෂ්පාදනයට හා එහි ගුණාත්මකභාවයට ගැටලුකාරී තත්ත්වයන් ඇති වන බැවින් පෞද්ගලික ව්‍යවසායකයන් ගොවිපළවල් තුළට ඇතුළත් කර ගැනීමේ හැකියාවක් නොමැත.

## ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලය: පීඨ සහ පාඨමාලා

## வயம்ப பல்கலைக்கழகம்: பீடங்களும் பாடநெறிகளும்

## WAYAMBA UNIVERSITY: FACULTIES AND COURSES OFFERED

1732/2024

**6. ගරු ගාමිණී වලේබොඩ මහතා (ගරු ජගත් ප්‍රියංකර මහතා වෙනුවට)**
(மாண்புமிகு காமினி வலேபொட - மாண்புமிகு ஜகத் பிரியங்கர சார்பாக)
(The Hon. Gamini Waleboda on behalf of the Hon. Jagath Priyankara)
අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලයේ පවතින පීඨ සංඛ්‍යාව කොපමණද;

(ii) එම පීඨවල නම් කවරේද;

(iii) එම එක් එක් පීඨයේ උගන්වනු ලබන පාඨමාලා කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) (i) ඉහත විශ්වවිද්‍යාලය සඳහා අනුමත කර ඇති ඉංජිනේරු පීඨයේ ඉගැන්වීමට නියමිත පාඨමාලා කවරේද;

(ii) එම ඉංජිනේරු පීඨය පුත්තලම දිස්ත්‍රික්කයේ, වෙන්නප්පුව ප්‍රදේශයේ ස්ථාපිත කිරීමට සැලසුම් කර තිබූ බව දන්නේද;

(iii) එසේ නම්, එම ඉංජිනේරු පීඨය ඉදිකිරීමේ වර්තමාන ප්‍රගතිය කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

கல்வி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) இலங்கை வயம்ப பல்கலைக்கழகத்தில் காணப்படும் பீடங்களின் எண்ணிக்கை எத்தனையென்பதையும்;

(ii) மேற்படி பீடங்களின் பெயர்கள் யாவை என்பதையும்;

(iii) மேற்படி ஒவ்வொரு பீடத்திலும் கற்பிக்கப்படுகின்ற பாடநெறிகள் யாவை என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) (i) மேற்படி பல்கலைக்கழகத்துக்கு அங்கீகரிக்கப்பட்டுள்ள பொறியியல் பீடத்தில் கற்பிக்கப்படவுள்ள பாடநெறிகள் யாவை என்பதையும்;

(ii) இந்த பொறியியல் பீடத்தை புத்தளம் மாவட்டத்தின், வென்னப்புவ பிரதேசத்தில் நிறுவுவதற்கு திட்டமிடப்பட்டிருந்ததென்பதை அறிவாரா என்பதையும்;

(iii) ஆமெனில், மேற்படி பொறியியல் பீடத்தை நிர்மாணிக்கும் நடவடிக்கையின் தற்போதைய முன்னேற்றம் யாதென்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Education:

(a) Will he inform this House -

(i) the total number of faculties in the Wayamba University of Sri Lanka;

(ii) the names of those faculties; and

(iii) the courses offered in each faculty?

(b) Will he also inform this House -

(i) the courses that have been approved for the Faculty of Engineering in the aforesaid university;

(ii) whether he is aware that the said faculty was supposed to be built in the Wennappuwa area in Puttalam District; and

(iii) if so, the present progress of the construction of that Engineering Faculty?

(c) If not, why?

**ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මම සභාගත* කරනවා.

***සභාමේසය මත තබන ලද පිළිතුර:***
**சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :**
**Answer tabled:*

(අ) (i) ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලයේ පවතින පීඨ සංඛ්‍යාව 06කි.

(ii) 1. කෘෂිකර්ම හා වැවිලි කළමනාකරණ පීඨය

2. ව්‍යවහාරික විද්‍යා පීඨය

3. ව්‍යාපාර අධ්‍යයන හා මූල්‍ය පීඨය

4. පශු සම්පත්, ධීවර හා පෝෂණ පීඨය

5. තාක්ෂණ පීඨය

6. වෛද්‍ය පීඨය

[ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා]

(iii)

| පීඨය | උගන්වනු ලබන පාඨමාලා |
|---|---|
| කෘෂිකර්ම හා වැවිලි කළමනා-කරණ පීඨය | කෘෂිකර්මය පිළිබඳ විද්‍යාවේදී උපාධිය ජෛව පද්ධති තාක්ෂණය පිළිබඳ උපාධිය |
| ව්‍යවහාරික විද්‍යා පීඨය | සාමාන්‍ය විද්‍යාවේදී උපාධිය විද්‍යාවේදී (බද්ධ ප්‍රධාන) උපාධිය කාර්මික කළමනාකරණය පිළිබඳ විද්‍යාවේදී (විශේෂ) උපාධිය ව්‍යවහාරික ඉලෙක්ට්‍රොනික විද්‍යා විද්‍යාවේදී (විශේෂ) උපාධිය ගණිතය හා සංඛ්‍යානය පිළිබඳ විද්‍යාවේදී (විශේෂ) උපාධිය පරිගණක විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී (විශේෂ) උපාධිය |
| ව්‍යාපාර අධ්‍යයන හා මූල්‍ය පීඨය | බැංකුකරණය හා මූල්‍ය පිළිබඳ විද්‍යාවේදී (විශේෂ) උපාධිය ව්‍යාපාර කළමනාකරණය පිළිබඳ විද්‍යාවේදී (විශේෂ) උපාධිය ගිණුම්කරණය සහ මූල්‍ය පිළිබඳ විද්‍යාවේදී (විශේෂ) උපාධිය රක්ෂණය හා මූල්‍ය පිළිබඳ විද්‍යාවේදී (ගෞරව) උපාධිය |
| පශු සම්පත්, ධීවර හා පෝෂණ පීඨය | ආහාර විද්‍යාව හා පෝෂණය පිළිබඳව විද්‍යාවේදී උපාධිය ආහාර නිෂ්පාදනය හා තාක්ෂණ කළමනාකරණය පිළිබඳ විද්‍යාවේදී උපාධිය |
| වෛද්‍ය පීඨය | වෛද්‍ය විද්‍යාව හා ශල්‍ය වෛද්‍ය විද්‍යාව පිළිබඳ උපාධිය (MBBS) |
| තාක්ෂණ පීඨය | ඉදිකිරීම් තාක්ෂණය පිළිබඳ ඉංජිනේරු තාක්ෂණ ගෞරව උපාධිය විදුලි තාක්ෂණය පිළිබඳ ඉංජිනේරු තාක්ෂණ ගෞරව උපාධිය යාන්ත්‍රික විද්‍යාව සහ නිෂ්පාදන තාක්ෂණය පිළිබඳ ඉංජිනේරු තාක්ෂණ ගෞරව උපාධිය නැනෝ විද්‍යා තාක්ෂණය පිළිබඳ ඉංජිනේරු තාක්ෂණ ගෞරව උපාධිය |

(ආ) (i) ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලය සඳහා මේ වනතෙක් ඉංජිනේරු පීඨයක් පිහිටුවීම සම්බන්ධව යෝජනාවක් ඉදිරිපත් වී නොමැත. ඒ අනුව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මඟින් ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලය වෙත ඉංජිනේරු පීඨයක් පිහිටුවීම සම්බන්ධව අනුමැතියක් ලබා දී නොමැත.

(ii) ඉහත (ආ) (i) හි පරිදි වේ.

(iii) ඉහත (ආ) (i) හි පරිදි වේ.

(ඇ) අදාළ නොවේ.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ප්‍රශ්න අංක 10 -2020/2024- (1), ගරු එස්.එම්. මරික්කාර් මහතා.

**ගරු ගාමිණී වලේබොඩ මහතා**
(மாண்புமிகு காமினி வலேபொட)
(The Hon. Gamini Waleboda)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු එස්.එම්. මරික්කාර් මන්ත්‍රීතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නය අහනවා.

**ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර ලබා දීම සඳහා සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

***ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.***
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

**ගරු එම්.ඒ. සුමන්තිරන් මහතා**
(மாண்புமிகு எம்.ஏ. சுமந்திரன்)
(The Hon. M.A. Sumanthiran)
Sir, I rise to a point of Order.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ඔව්, ගරු මන්ත්‍රීතුමා.

**ගරු එම්.ඒ. සුමන්තිරන් මහතා**
(மாண்புமிகு எம்.ஏ. சுமந்திரன்)
(The Hon. M.A. Sumanthiran)
Thank you, Hon. Deputy Speaker.

Sir, I am raising a point of Order with regard to the agenda for today's Proceedings under Standing Order No. 22. There was a Private Members' Bill that I moved, which was read the First time. Then, there was a petition to the Supreme Court. The Supreme Court gave its Determination. The Bill came up for its Second Reading after several months, after the relevant Ministry did not give its report within the stipulated six months. At the Second Reading, it was passed without a debate and a vote. Thereafter, according to the Standing Orders under "Committee Stage of Bills" - Standing Order 57 and 58 - it was referred to the Legislative Standing Committee chaired by the Chairman of Committees, the Hon. Deputy Speaker himself. So, the Report of the Legislative Standing Committee was presented to Parliament by yourself, Hon. Deputy Speaker, on the 21st of August, 2024.

Then, Standing Order No. 72(1) states, I quote:

> "When a Bill has been reported to Parliament by the Legislative Standing Committee or a Select Committee without amendments, ...."

But, this Bill was reported with Amendments.

> " .... it may upon the day appointed for its consideration, be forthwith read a third time and passed or if Parliament so direct, the Third Reading may be postponed."

The Committee on Parliamentary Business made a decision that the Report of the Legislative Standing Committee would be reported to Parliament on the 21st of August, 2024 and the Bill would be taken up for Third Reading, in accordance with Standing Order Nos. 71, 72 and 73, today; that is, the 03rd of September. The Minutes came up before the Committee on Parliamentary Business yesterday and was also approved. But, it is not on the Order of Business for today, I understand. Why is that? Why has it not been taken up? Yesterday, at the Committee on Parliamentary Business, the Leader of the House said that for certain political considerations it was being delayed. Standing Orders do not permit delay for political considerations. The particular Standing Order states "...be forthwith read a third time..." The political consideration that he has referred to is that the Illankai Tamil Arasu Kadchi has taken a decision to support somebody other than President Ranil Wickremesinghe. So, this is a most horrendous thing that is happening. Standing Orders are being violated; decisions taken at the Committee on Parliamentary Business are being violated.

The passing of this Bill, everybody said, should be done with consensus and its Second Reading happened without even calling for a debate or a vote. And now, only because our party has decided not to support the President, it is being sabotaged, Standing Orders are being violated**.**

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු මන්ත්‍රීතුමා, කෙටියෙන් කියලා අවසන් කරන්න.

**ගරු එම්.ඒ. සුමන්තිරන් මහතා**
(மாண்புமிகு எம்.ஏ. சுமந்திரன்)
(The Hon. M.A. Sumanthiran)
Sir, this is a revenge that is being taken on the Tamil people because of a decision taken by our party. I spoke to the President yesterday and he said, "I have no problem. It must be taken up for Third Reading. I will tell the Leader of the House to do it." But, that has not happened.

When he took over as Prime Minister and President, we called him "Ranil Rajapaksa" for a good reason. And, when he is ending his term as President, he is proving that he is, in fact, "Ranil Rajapaksa." I know that he had no objection to its Third Reading being taken up, but he is prevented by the forces that are with him. But, that is no excuse! He is the President, he is the Chief Executive, he is the Head of the Cabinet and he cannot say, "I have directed that it be taken up".

When it comes to the Bill, this is a formal announcement only. We have gone through the full process. The Hon. Deputy Speaker knows, at the Legislative Standing Committee, the Bill was considered twice and it was unanimously agreed on, and its Second Reading was also unanimously agreed on by the House. So, at the last stage of the Bill, at the announcement of its Third Reading in the House, why is this being sabotaged like this? Now, I wish to inform the President that if he does this - tomorrow, there is one more chance of its Third Reading being taken up and announced - it is a revenge that he is taking on the Tamil people of this country because of a political decision that our party has taken, which we have a right to take, and therefore, he will forever be remembered as "Ranil Rajapaksa,

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]*
*[Expunged on the order of the Chair.]*

மாண்புமிகு ஜனாதிபதி அவர்கள்

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]*
*[Expunged on the order of the Chair.]*

தமிழ் மக்கள் முன்பாகவும் இந்த நாட்டு மக்கள் முன்பாகவும் காட்டப்படுவார். அவர் தமிழ் மக்களுகெதிராக செய்கின்ற இந்த விடயம் அதையே காட்டுகின்றது. தான் செய்வதாகக் கொடுத்த வாக்குறுதியை நிறைவேற்றவில்லை. அவர் பல வாக்குறுதிகளைக் கொடுத்திருக்கிறார். ஆனால், அவற்றில் ஒன்றையும் நிறைவேற்றவில்லை.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු මන්ත්‍රීතුමා, රීති ප්‍රශ්නය අවසන් කරන්න.

**ගරු එම්.ඒ. සුමන්තිරන් මහතා**
(மாண்புமிகு எம்.ஏ. சுமந்திரன்)
(The Hon. M.A. Sumanthiran)
Sir, I am finishing up.

கடைசி நேரத்தில் நான் சமர்ப்பித்த சட்டமூலத்தின் மூன்றாம் மதிப்பீட்டுக்கு அனுமதி கொடுப்பதாகச் சொல்லிவிட்டு, பின்னர் அதற்கான அனுமதியை வழங்காது தடுத்தமையானது அவர் எங்கள் மக்கள்மீதான வெறுப்பைக் காட்டுகின்ற நிகழ்ச்சியாகத்தான் நாங்கள் காண்கிறோம்.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
Sir, I rise to a point of Order.

**ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඉස්සෙල්ලා මට ඉඩ දෙන්න, ගරු සුමන්තිරන් මන්ත්‍රීතුමා ඉදිරිපත් කරපු රීති ප්‍රශ්නයට උත්තර දෙන්න. ඊට පසුව මෙතුමන්ලාගේ අදහස් කියන්නට පුළුවන්.

මම සිංහල භාෂාවෙන් කියන්නම්. මොකද, එතුමා දමිළ භාෂාවෙනුත් කථා කළා, ඒ ජනතාවට තේරෙන්න. මට ඕනෑ නම් ඉංග්‍රීසි භාෂාවෙන් කියන්නත් පුළුවන්. නමුත්, බහුතරයක් සිංහල නිසා මම සිංහලෙන්ම උත්තර දෙන්නම්.

එතුමා ගෙනා Private Members' Bill එක ඉතා හොඳයි. හිටපු පළාත් සභා මහ ඇමතිවරයකු හැටියට ඒකට මම එකඟයි. මොකද, යහ පාලන ආණ්ඩුව කාලයේ පළාත් සභා මැතිවරණ නීතියට ගෙනාපු සංශෝධනයක් නිසා අද පළාත් සභා මැතිවරණ පවත්වන්න බැරි වෙලා තිබෙනවා.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ඒ යෝජනාවට පක්ෂව අත ඉස්සුවේ කවුද? ඒකට එතුමාත් අත ඉස්සුවා.

**ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)
ඔව්, ඔබතුමා ඒක පසුව කියන්න. එතකොට, ඒ තිබෙන නෛතික අර්බුදයෙන් ගොඩ යන්න තමයි එතුමා ඒ Private Members' Bill එක ගෙනාවේ. ඒ කියන්නේ, පළාත් සභා මැතිවරණය නැවත පැවැත්වීම සඳහා නෛතික වශයෙන් ඉඩකඩ ලබා ගන්න. ඒකට අපි ඔක්කෝම එකඟයි; කවුරුත් විරුද්ධ නැහැ.

**ගරු ගෙවිඳු කුමාරතුංග මහතා**
(மாண்புமிகு கெவிந்து குமாரதுங்க)
(The Hon. Gevindu Cumaratunga)
අපි එකඟ නැහැ. සියලුදෙනා එකඟ නැහැ.

**ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)

That is right. ඒක තමයි මට දැන ගන්න ඕනෑ වුණේ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඊයේ Parliamentary Business Committee එකේදී මම කිව්වේ, කලින් Minutesවල එහෙම තිබුණත් යම් මන්ත්‍රීවරයෙක් විරුද්ධ වෙලා විවාදයක් ඉල්ලනවා නම් අපි ඒ අවස්ථාව දෙන්න ඕනෑ කියලා.

**ගරු එම්.ඒ. සුමන්තිරන් මහතා**
(மாண்புமிகு எம்.ஏ. சுமந்திரன்)
(The Hon. M.A. Sumanthiran)
විවාද කරන්න තිබුණු අවස්ථාව ඉවරයි. එහෙම නම් -

**ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)

Wait! I am on my feet now. - *[Interruption.]* Wait! Now you see that certain Members are opposing it. That is why - *[Interruption.]*

**ගරු ගෙවිඳු කුමාරතුංග මහතා**
(மாண்புமிகு கெவிந்து குமாரதுங்க)
(The Hon. Gevindu Cumaratunga)
ඒකේ තිබෙන අවාසි-

**ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)

ඔබතුමා මගේ කථාවෙන් පසු එතුමාට උත්තර දෙන්න. *[බාධා කිරීමක්]* පොඩ්ඩක් ඉන්න. මේ ප්‍රශ්නය අද මතු වෙන්නේ විශේෂයෙන්ම ජනාධිපතිවරණයක් ප්‍රකාශයට පත් කර තිබෙන අවස්ථාවක් නිසා තමයි. නැත්නම් ඒ තිබෙන විධියට කටයුතු කරගෙන ගියාට අපට ප්‍රශ්නයක් නැහැ. නමුත් මෙතැන තිබෙන ප්‍රශ්නය තමයි, සමහර මන්ත්‍රීවරු මෙම යෝජනාවට විරුද්ධ වීම. හැබැයි, යම්කිසි හේතුවක් නිසා එම යෝජනාව විවාදයට නොගැනීමෙන් එතුමන්ලාගේ විරුද්ධත්වය ප්‍රකාශ කරන්න අවස්ථාව නොලැබෙන්න පුළුවන්. හැබැයි, - *[බාධා කිරීම්]* පොඩ්ඩක් ඉන්න. දැන් ඒ අවස්ථාව තිබෙනවා. මේ ප්‍රශ්නය මතු වන නිසා තමයි මම කිව්වේ, අපි එකඟ වුණත් ඔබතුමාත් මේකට විරුද්ධ නැහැ කියලා විපක්ෂයත් එකඟ කර ගන්න ඕනෑ කියලා. මේකට විරුද්ධ නැහැ කියලා විපක්ෂය එකඟ වනවා නම් අපට ප්‍රශ්නයක් නැහැ.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)

Sir, I rise to a point of Order.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මෙතැන තිබෙන ප්‍රශ්නය මේකයි. සාමාන්‍යයෙන් විවාද කිරීමේ අවස්ථාව තිබෙන්නේ දෙවන වර කියැවීමේ අවස්ථාවේදී. නමුත් මේ පනත් කෙටුම්පත දෙවන වර කියැවීමේදී කිසිම විවාදයක් ඇති වෙලා නැහැ. දැන් තිබෙන්නේ Third Reading එක. ඒ නිසා මේ පනත් කෙටුම්පත ගැන දැන් විවාදයක් ගන්න පුළුවන්ද බැරි ද කියන ප්‍රශ්නය තමයි තිබෙන්නේ. ඒ නිසා අපට තිබෙන්නේ ඒ ක්‍රියා මාර්ගයේ ඉදිරියට යන්න. පක්ෂද, විරුද්ධද කියන අවස්ථාවේදී එය ප්‍රකාශ කරන්න පුළුවන්. අපට තිබෙන ප්‍රධාන ප්‍රශ්නය මේකයි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. අවුරුදු 7කට, 8කට වැඩි කාලයක් ගත වෙලාත් මේ රටේ පළාත් සභා මැතිවරණ පවත්වලා නැහැ. ඒවා නතර වෙලා තිබෙනවා. මේ රටේ පළාත් සභා මැතිවරණ පැවැත්වීම නතර වෙලා තිබෙන තුරු ඒවා පාලනය වෙන්නේ නිලධාරින් යටතේ. ඔබතුමාත් දන්නවා අද පළාත් සභාවල කටයුතු සම්පූර්ණයෙන්ම කරන්නේ නිලධාරින් බව. වෙන දා වාගේ මිනිහෙකුට ගිහින් කෙනෙක් හම්බ වෙන්න බැහැ, කථා කරන්න බැහැ, ප්‍රශ්නයක් විසඳා ගන්න බැහැ. එවැනි තත්ත්වයක් තිබෙන්නේ. ගරු සුමන්තිරන් මන්ත්‍රීතුමා ගෙනාපු පෞද්ගලික මන්ත්‍රීන්ගේ පනත් කෙටුම්පත දැන් Third Reading අවස්ථාවේ තිබෙන්නේ. ඉතින් ඒක තුන්වන වර කියවා අවසන් කළා නම් ඉවරයි. දැන් ඇයි මේ වාගේ ක්‍රියාවලියක් කරන්නේ? මේ ක්‍රියාවලිය කරන්නේ වෙනත් කාරණයක් නිසා නොවෙයි, ඉලංගෙයි තමිළ් අරසු කච්චි පක්ෂය-

**ගරු නීතිඥ ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு சட்டத்தரணி லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella, Attorney-at-Law)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මන්ත්‍රීතුමා.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ කාරණයත් කියන්න මට පොඩ්ඩක් අවස්ථාව දෙන්න.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු මන්ත්‍රීතුමා, මේක විවාදයක් කර ගන්න එපා.*[බාධා කිරීම්]* ඒක ඔබතුමාගේ අදහසක් නේ. එහෙම එකක් නොවෙයි.

**ගරු නීතිඥ ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு சட்டத்தரணி லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella, Attorney-at-Law)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, - *[බාධා කිරීම්]*

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මැතිතුමා, ඔබතුමාගේ කාරණය කියා අවසන් කරන්න.

**ගරු නීතිඥ ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு சட்டத்தரணி லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella, Attorney-at-Law)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම ඔබතුමාගේ අවධානය යොමු කරවනවා අගෝස්තු මාසයේ 08 වෙනි දා Parliamentary Business Committee එකේ Minutesවලට. - *[බාධා කිරීම්]* Please, let me speak.

**ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)

Sir, give the Hon. Gevindu Cumaratunga a chance.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු ගෙවිඳු කුමාරතුංග මන්ත්‍රීතුමාට අවස්ථාව දෙන්නම්. විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා නැඟිටලා ඉන්නේ.

**ගරු නීතිඥ ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு சட்டத்தரணி லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella, Attorney-at-Law)
එදා දෙවන වර කියැවීම අවසන් වුණා. ඒ Minutesවල සඳහන් වෙනවා, "The Hon. Leader of the House...." - ඒ කියන්නේ මෙතුමා - "....further proposed to schedule the same for consideration on Tuesday, the 03rd September, 2024" කියලා. මෙතුමා එකඟ වුණා, සැප්තැම්බර් මාසයේ 03වෙනි දා පළාත් සභා මැතිවරණ (සංශෝධන) පනත් කෙටුම්පත සභාවට ඉදිරිපත් කරන්න. නමුත් මෙතුමා ඒක කරලා නැහැ. ඒකයි අපි අහන්නේ ඒ ඇයි කියලා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු ගෙවිඳු කුමාරතුංග මැතිතුමාගේ කාරණයත් කියලා අවසන් කරන්න. *[බාධා කිරීමක්]*

**ගරු නීතිඥ ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு சட்டத்தரணி லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella, Attorney-at-Law)
පළාත් පාලන මැතිවරණයත් කල් දැම්මා. රටේ විශාල ප්‍රශ්නයක් තිබෙනවා. පළාත් සභා නැතුව ආණ්ඩුකාරවරු හිතුමනාපයට වැඩ කරනවා; මැතිවරණ නීති උල්ලංඝනය කරනවා. ඇත්ත වශයෙන්ම මේ පළාත් සභා ඡන්දය තියන්න අපි උදවු කරන්න කැමැතියි. අවුරුදු හතරකට කලින් මම කිව්වා, අපි පක්ෂව ඡන්දය දෙන්නම් අර පරණ ක්‍රමයට, අනුපාත ක්‍රමයට මැතිවරණය තියන්න කියලා. කොහොම හරි ගරු සුමන්තිරන් මැතිතුමා යෝජනාවක් ගෙනැල්ලා, අපි දෙගොල්ලම එකතු වුණා නේ. අපි එකඟ වුණා. ඉතින් ඒක කල් දාන්නේ නැතුව, - *[බාධා කිරීමක්]*

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු ගෙවිඳු කුමාරතුංග මන්ත්‍රීතුමා.

**ගරු ගෙවිඳු කුමාරතුංග මහතා**
(மாண்புமிகு கெவிந்து குமாரதுங்க)
(The Hon. Gevindu Cumaratunga)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ සම්බන්ධයෙන්, - *[බාධා කිරීමක්]*

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මැතිතුමා, ඔබතුමාගේ කාරණය කියලා අවසන් කරන්න.

**ගරු නීතිඥ ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு சட்டத்தரணி லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella, Attorney-at-Law)
ගරු සභානායකතුමාගෙන් මම අහන්න කැමැතියි, ඔබතුමා මේ පළාත් සභා මැතිවරණ (සංශෝධන) පනත් කෙටුම්පත හෙට ඉදිරිපත් කරනවාද කියලා.

**ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපි ගරු ගෙවිඳු කුමාරතුංග මන්ත්‍රීතුමාටත් අවස්ථාව දෙමු. ඊට පසු මම ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මැතිතුමාගේ ප්‍රශ්නයට උත්තර දෙන්නම්.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු ගෙවිඳු කුමාරතුංග මන්ත්‍රීතුමා.

**ගරු ගෙවිඳු කුමාරතුංග මහතා**
(மாண்புமிகு கெவிந்து குமாரதுங்க)
(The Hon. Gevindu Cumaratunga)
ඒක හොඳයි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේක පෞද්ගලික මන්ත්‍රී යෝජනාවක් හැටියටයි ආවේ. මේ පනත් කෙටුම්පත දෙවන වර කියවීම වෙලාවේ මම අගමැතිතුමාගෙනුත් ඇහුවා, ගරු කථානායකතුමාගෙනුත් ඇහුවා, මේ සම්බන්ධයෙන් අපි විවාදයක් දැන් කළ යුතුද කියලා. ඒ වෙලාවේ කිව්වා, මේක පෞද්ගලික මන්ත්‍රී යෝජනාවක් නිසා මොකක්ද කාරක සභාවකට යොමු කරනවා. එසේ යොමු කළාට පසු එතැනින් අනුමැතිය ලැබුණොත්, ඊට පසුව පාර්ලිමේන්තු විවාදයක් ලබා දෙනවා කියලා. ඒ නිසා තමයි අපි විවාදයක් ඉල්ලුවේ නැත්තේ. නැත්නම් අපි මේ ක්‍රියාවලියට විරුද්ධයි.

අනෙක් කාරණය මේකයි. බලන්න, සමානුපාතික ඡන්ද ක්‍රමය වෙනුවට කොට්ඨාසයට මන්ත්‍රීවරයෙක් ලැබෙන මැතිවරණ ක්‍රමයකට පළාත් පාලන ආයතන ඡන්ද ක්‍රමය වෙනස් කළා. ඒ විධියටම මහ මැතිවරණයත් වෙනස් කරනවා කියා අගමැතිතුමාගේ නිර්දේශ තිබෙනවා.

මෙතුමන්ලා අත උස්සලා මේ මැතිවරණ නැති කර ගත්තේත්, කොට්ඨාස ක්‍රමයට -මිශ්‍ර ක්‍රමයකට- මැතිවරණ තියන්න ඕනෑ කියලා. එතකොට අවුරුදු 6ක්, 7ක් පළාත් සභා නැතුව ඉඳලා ආපසු අර පරණ මැතිවරණ ක්‍රමයටම යනවා කියන්න මේක පිස්සන් කොටුවක්ද? අලුත් විධියට ඒ මැතිවරණ ක්‍රමය ගෙනැල්ලා මේ කටයුත්ත කරන්න නම් මොකක්ද කරන්න ඕනෑ? ජනාධිපතිවරණයක් අස්සේ මෙවැනි දේශපාලන තීන්දු ගෙන කටයුතු කරන්න එපා කියලා අපි මේ ගරු සභාවෙන් ඉල්ලා සිටිනවා. මේ අපේක්ෂකයෝ මැතිවරණ පොරොන්දු දෙනවා. උතුරට එකක් කියනවා; දකුණට එකක් කියනවා. ඒ නිසා ජනවරමක් අරගෙන මේ කටයුත්ත කරන්න. දැන් ජනවරමක් ලබා ගන්න අවස්ථාව තිබෙනවා. ජනවරමක් අරගෙන මේ කටයුත්ත කරන්න කියා අපි ඉතාම ඕනෑකමින් ඉල්ලා සිටිනවා.

**ගරු ඩලස් අලහප්පෙරුම මහතා**
(மாண்புமிகு டலஸ் அழகப்பெரும)
(The Hon. Dullas Alahapperuma)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු ඩලස් අලහප්පෙරුම මන්ත්‍රීතුමා.

**ගරු ඩලස් අලහප්පෙරුම මහතා**
(மாண்புமிகு டலஸ் அழஹப்பெரும)
(The Hon. Dullas Alahapperuma)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ රටේ මහජන නියෝජිත ආයතන තුනක් තිබෙනවා. අපි මේ කථා කරන වෙලාවේ ඒ මහජන නියෝජිත ආයතන තුනෙන් දෙකක් වහලා තිබෙන්නේ. ගරු සුමන්තිරන් මන්ත්‍රීතුමා ඉතාම පැහැදිලිව සඳහන් කළා, මෙහි තිබෙන තාක්ෂණික කාරණා පිළිබඳව. දැන් මහජන නියෝජිත ආයතන තුනෙන් දෙකක් වසා තිබෙනවා. එය එක කාරණාවක්, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

දෙවැනි කාරණය හැටියට ඉතා පැහැදිලිව කිව්වා, ඒකට හේතුව මොකක්ද කියලා. ඉතිහාසයේ මේ වාගේ හැසිරිච්ච අවස්ථා තිබෙනවා. දැන් බලන්න, පාර්ලිමේන්තුවේ ආණ්ඩු පක්ෂය පැත්තේ ඉඳලා අනෙක් පැත්තට පැමිණෙනකොට විමධ්‍යගත ප්‍රතිපාදන නවත්වනවා. ඉතිහාසයේ ඉඳලා - 1972 ඉඳලා - මෙතෙක් විමධ්‍යගත ප්‍රතිපාදන විපක්ෂයේ මන්ත්‍රීවරුන්ට ලබා දීපු ක්‍රමයක් තිබුණා. ඒක නැවැත්තුවා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු මන්ත්‍රීතුමා, අදාළ කාරණය ගැන කථා කරන්න.

**ගරු ඩලස් අලහප්පෙරුම මහතා**
(மாண்புமிகு டலஸ் அழஹப்பெரும)
(The Hon. Dullas Alahapperuma)
මම අවසාන කරනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. විමධ්‍යගත ප්‍රතිපාදන නැවැත්තුවා. ගරු රිසාඩ් බදියුදීන් මන්ත්‍රීතුමා දේශපාලන තීන්දුවක් ගත්තා කියලා එතුමාට වෙන් කරපු විමධ්‍යගත ප්‍රතිපාදන ජනාධිපති කාර්යාලය විසින් නැවැත්තුවා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු මන්ත්‍රීතුමා, රීති ප්‍රශ්නය ගැන කථා කරලා අවසන් කරන්න.

**ගරු ඩලස් අලහප්පෙරුම මහතා**
(மாண்புமிகு டலஸ் அழஹப்பெரும)
(The Hon. Dullas Alahapperuma)
විමධ්‍යගත ප්‍රතිපාදන නැවැත්තුවා. ඒක එතුමා කිව්වා. ඒ නිසා ප්‍රජාතන්ත්‍රවාදයට බල කිරීම් කරලා ප්‍රජාතන්ත්‍රවාදය මිලදී ගන්න මෙවැනි කටයුතු කිරීම කිසිසේත්ම යුක්තිසහගත නැහැ.

අවසාන වශයෙන් කියනවා නම්, පළාත් සභාවල ධුර කාලයට වැඩි කාලයක් දැන් පළාත් සභා වසා තිබෙනවා. අපි එදාත් මේකට විරුද්ධ වුණා, 2017 අංක 16 දරන සංශෝධන පනත ගෙනාපු වෙලාවේ. ඉතිහාසයේ පළමුවෙනි වතාවට, ඒක ඉදිරිපත් කළ ඇමතිවරයාත් ඒකට විරුද්ධව ඡන්දය දීමෙන් තමයි එදා ඒක පරාජයට පත් කළේ. නමුත් මේක රටේ අවශ්‍යතාවක්. ඒ නිසා කරුණාකරලා ඒකට ඉඩකඩ ලබා දෙන්න.

**ගරු විමල් වීරවංශ මහතා**
(மாண்புமிகு விமல் வீரவங்ஸ)
(The Hon. Wimal Weerawansa)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, -

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු විමල් වීරවංශ මැතිතුමා, ඉක්මනින් කියලා අවසන් කරන්න.

**ගරු විමල් වීරවංශ මහතා**
(மாண்புமிகு விமல் வீரவங்ஸ)
(The Hon. Wimal Weerawansa)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු සභානායකතුමාට මතක ඇති, පෞද්ගලික මන්ත්‍රී යෝජනාවක් හැටියට මේ පනත් කෙටුම්පත ඉදිරිපත් කළ වෙලාවේ දැන් ගෙවිඳු කුමාරතුංග මන්ත්‍රීතුමා ඇසූ ප්‍රශ්නයම මම එතුමාගෙන් අහපු බව. ගරු සභානායකතුමනි, එතකොට ඔබතුමා කිව්වා, කලබල වෙන්න දෙයක් නැහැ. මේක මොකක්ද කාරක සභාවකට ගිහිල්ලා ඒකේ සාකච්ඡා කරලා, එහෙම procedures එකක් අනුව තමයි එන්නේ කියලා. කැබිනට් මණ්ඩලය පිළිගත්තොත් ඊට පසුව මේක ගැන විවාදයකට අවස්ථාව ලැබෙනවා කියලා කිව්වා. අනෙක් මන්ත්‍රීවරු කිව්වා වාගේ මහජන නියෝජිත ආයතන අකර්මණ්‍ය වෙලා තිබෙන එකෙන් ප්‍රජාතන්ත්‍රවාදයට ප්‍රශ්නයක් තිබෙනවා. ඒක හරි. හැබැයි, දැන් ජනාධිපතිවරණයක් ඇවිල්ලා තිබෙනවා. හෙට අනිද්දා තැපැල් ඡන්දය පැවැත්වෙනවා. තව දවස් කිහිපයකින් ජනාධිපතිවරණය පැවැත්වෙනවා. එතකොට මේ රටේ අලුත් ජනවරමක් නිර්මාණයවීමට හෝ නොවීමට නියමිතයි. කවුරු හරි ජනාධිපති කෙනෙක් එන්න නියමිතයි. ඊට පසුව මේ ගැන සලකා බලනවා මිසක්, මේ කලබලේ අස්සේ මේක ගෙනෙන්න කියලා මොකක්ද මේ කරන්න හදන සෙල්ලම? මම කියන්නේ මේකයි. මහජන නියෝජිත ආයතනවල මහජන නියෝජිතයෝ ඉන්න ඕනෑ තමයි. හැබැයි, අපට අවශ්‍ය සාකච්ඡාව, සංවාදය නැතුව මෙහෙම දඩිබිඩියේ මේක කරන්න ඉඩ දීම සුදුසු වන්නේ නැහැ. ඒ නිසා ගරු සභානායකතුමනි, කරුණාකර ඔබතුමා එදා දීපු ප්‍රකාශයට අනුව කටයුතු කරන්න කියලා මම ඉතාම ඕනෑකමින් ඉල්ලනවා.

**ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු විමල් වීරවංශ මන්ත්‍රීතුමා මේ ප්‍රශ්නය මීට වාර දෙකකට කලින් මතු කළා. ඒ වෙලාවේ මම එතුමාට කිව්වා, විවාදයක් කෙරෙනවා නම් ඒකට අවස්ථාව ලැබෙයි කියලා. මීට අදාළව දැන් procedure එක follow කරලා තිබෙනවා. ජනාධිපතිවරණයක් මැද්දේ අපි ඉන්නේ. පාර්ලිමේන්තුවේ ඊළඟ සැසිය ලබන මාසයේ 08වැනි දා තිබෙනවා, ජනාධිපතිවරණයෙන් පසුව. කවුරුහරි කෙනෙක් ජනවරමෙන් තේරී පත්වෙයි. එතකොට මේ ගැන සාකච්ඡා කරනවා. අනෙක් එක, මේක හෙට පාස් කළාය කියලා, අද පාස් කළාය කියලා ලබන සුමානේ පළාත් සභා මැතිවරණය කැඳවන්න බැහැ නේ. *[බාධා කිරීමක්]* ඒකට procedure එකක් තිබෙනවා. Supreme Court එකේ තව තීන්දුවක් තිබෙනවා. *[බාධා කිරීමක්]* නැහැ, නැහැ. විසුරුවා - *[බාධා කිරීමක්]* නැහැ, පාර්ලිමේන්තුව - *[බාධා කිරීමක්]* නැහැ, නැහැ. එහෙම නම් ඔබතුමන්ලාට පුළුවන් නේ, විසුරුවන්නේ නැතුව මේක පාස් කරගන්න. *[බාධා කිරීම්]* ඔව්. *[බාධා කිරීම්]* නැහැ, නැහැ. ඔබතුමා හිනා වෙන්න එපා. පොඩ්ඩක් ඉන්න.

Hon. Sumanthiran, if you go through the recording of the proceedings of the Committee on Parliamentary Business yesterday, you will find what exactly you said and what the real situation there was. I do not want to confront you now over that matter, but what I am saying is what we suggested yesterday. We are in the middle of a Presidential Election and there are Members who raised this matter. At the outset, the Hon. Wimal Weerawansa raised this matter. Then, I answered him and said that there will be a debate on this Bill. Hon. Sumanthiran, you say that nobody asked for a debate and its Second Reading was passed. I do not know whether the Hon. Members are aware of it or not. That is a different matter.

But, it is our duty to see that all are given equal opportunity. So, that is why I suggested yesterday - we are not opposing it and if you get the consensus of the Hon. Members of all the parties of the Opposition, then, we have no question - that we schedule it for the next Session.

**ගරු එම්.ඒ. සුමන්තිරන් මහතා**
(மாண்புமிகு எம்.ஏ. சுமந்திரன்)
(The Hon. M.A. Sumanthiran)
Hon. Deputy Speaker, -

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු සුමන්තිරන් මන්ත්‍රීතුමා, ඉක්මනින් කාරණය කියලා අවසන් කරන්න.

**ගරු එම්.ඒ. සුමන්තිරන් මහතා**
(மாண்புமிகு எம்.ஏ. சுமந்திரன்)
(The Hon. M.A. Sumanthiran)
මම ඉක්මනින් අවසන් කරන්නම්.

Hon. Leader of the House, you referred to yesterday's proceedings of the Committee on Parliamentary Business. Yes, I did say that the Hon. Deputy Speaker had acted correctly, but it is you, Hon. Leader of the House, who suggested that the Third Reading be fixed for today. So, it should be passed. The agreement I had with the President is that before the Presidential Election, this legal hurdle would be cleared. Now, I am saying, because we took a decision not to back him at the Presidential Election, he is acting as a ranked

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]*
*[Expunged on the order of the Chair.]*

என்னால் கொண்டுவரப்பட்ட தனி உறுப்பினர் சட்டமூலத்தை 3ஆம் வாசிப்பிற்கு எடுத்து அங்கீகரிக்கப்படாத செயற் பாடானது, நாட்டில் மிக மோசமான ஓர்

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]*
*[Expunged on the order of the Chair.]*

சனாதிபதி செயற்படுவதன் வெளிப்பாடாகத்தான் இருக் கின்றது. அதாவது, ராஜபக்ஷ அவர்களோடு கூட்டுச்சேர்ந்து, மாகாண சபைத் தேர்தலை நடாத்தவிடாமல் தடுப்பதற்கான ஓர் இனவாதச் செயற்பாடாகத்தான் நாங்கள் இதனைக் காண்கின்றோம்; தமிழ் மக்கள் அனைவரும் இதனை உணர்ந்து கொள்ள வேண்டும்.

**ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු සභානායකතුමා.

**ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)
පොඩ්ඩක් ඉන්න. එතුමා දමිළ භාෂාවෙන් ඒක කිව්වේ දමිළ ජනතාවට. එතුමා ජනාධිපතිතුමාත් එක්ක තිබෙන එකඟතාව මොකක්ද කියලා අපි දැනගත්තේ එතුමා දැන් කියනකොටයි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

**ගරු එම්.ඒ. සුමන්තිරන් මහතා**
(மாண்புமிகு எம்.ஏ. சுமந்திரன்)
(The Hon. M.A. Sumanthiran)
පළමු දවස්වලම කිව්වා.

**ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)
Wait! I am not confronting you; I am aligning with you.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මට සිංහලෙනුත් කියන්න දෙන්න. එතුමා දමිළ භාෂාවෙන් ඔය කාරණය කිව්වා වාගේ, ගරු විමල් වීරවංශ මන්ත්‍රීතුමාත්, ගරු ගෙවිඳු කුමාරතුංග මන්ත්‍රීතුමාත් මතු කළා වාගේ සිංහල ජනතාවටත් අයිතියක් තිබෙනවා, ඔය ගැන කල්පනා කරන්න.

**ගරු එම්.ඒ. සුමන්තිරන් මහතා**
(மாண்புமிகு எம்.ஏ. சுமந்திரன்)
(The Hon. M.A. Sumanthiran)
මම සිංහලෙන් කියන්නම්.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ස්ථාවර නියෝග 27(2) යටතේ ප්‍රශ්නය, ගරු (පූජ්‍ය) අතුරලියේ රතන ස්වාමීන් වහන්සේ.

## පෞද්ගලිකව දැනුම් දීමෙන් ඇසූ ප්‍රශ්නය
## தனி அறிவித்தல் மூல வினா
## QUESTION BY PRIVATE NOTICE

### IMF වැඩසටහනෙහි බලපෑම
### IMF நிகழ்ச்சித்திட்டத்தின் தாக்கம்
### IMPACT OF IMF PROGRAMME

**ගරු (පූජ්‍ය) අතුරලියේ රතන හිමි**
(மாண்புமிகு (வண.) அத்துரலியே ரதன தேரர்)
(The Hon. (Ven.) Athuraliye Rathana Thero)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, IMF මැදිහත්වීම සම්බන්ධයෙන් මේ දිනවල විවිධ පක්ෂ ඔවුන්ගේ ප්‍රතිපත්තිවලත් සඳහන් කරනවා. මේ දිනවල විවිධ ප්‍රතිපත්ති ප්‍රකාශනත් ඉදිරිපත් කර තිබෙනවා. ඒවායේත් සඳහන් කර තිබෙනවා, IMF එක සම්බන්ධයෙන් ඔවුන්ට තිබෙන ස්ථාවරය ගැන. ඒ වාගේම රට දියුණු වෙමින් පවතින බවත්, IMF මැදිහත්වීම මඟින් රටේ ප්‍රශ්න විසඳා ගැනීමට හැකි වන බවත් ආණ්ඩුව මඟින් ප්‍රකාශයට පත් කර තිබෙනවා. IMF එක කොන්දේසියක් හැටියට මහ බැංකුව ස්වාධීන කිරීමේ අභිලාෂය මත බැංකු පනතක් ඉදිරිපත් කළ අතර, එම පනත තුළ ජන මත විචාරණයකට තුඩු දෙන වගන්ති තිස් ගණනකට අධික විශාල ප්‍රමාණයක් අන්තර්ගත වී තිබුණු බව මේ සභාව දන්නවා. ඒ වාගේම එම වගන්ති සම්පූර්ණයෙන් ඉවත්

[ගරු (පූජ්‍ය) අතුරලියේ රතන හිමි]

කිරීමට සිදු වූ අතර, එසේ නොමැති වූයේ නම් ඒ වගන්ති සම්මත කිරීම සඳහා පාර්ලිමේන්තුවේ තුනෙන් දෙකක බලයක් හා ජන මත විචාරණයක් අවශ්‍ය වෙනවා. ඒ අනුව අපි එම පනත සම්මත කරනු ලැබුවේ සරල බහුතරයෙන්. ශ්‍රී ලංකා මහ බැංකු පනත ශ්‍රී ලංකාවේ පුරවැසියෙක් හෝ ශ්‍රී ලංකාවේ හදන ලද පනතක් නොවන බවට, විදේශීය නියෝජිතයෙකු විසින් හදන ලද බවට විද්වතුන් අතරත්, රටේ විවිධ පුවත් පත්වලත් ඒ දවස්වල සාකච්ඡා වුණා. ඒ පිළිබඳව මේ සභාව දැනුවත් වන්නේ නම්, එය ඉතා වැදගත් බව තමයි මාගේ අදහස.

මේ වන විට IMF එක සමඟ වූ එකඟතා කිසිවෙකුටත් වෙනස් කළ නොහැකි අනුල්ලංඝනීය දේව වාක්‍ය හැටියට ප්‍රකාශ කර තිබෙනවා. ඒ වාගේම පවත්නා ආණ්ඩුව IMF එක සමඟ ඇති කර ගත් එකඟතා පරාජය වුවහොත් මේ රට සම්පූර්ණයෙන් අරාජික වෙන බවටත්, රට ගෙනියන්න බැරි බවටත් ප්‍රකාශ වෙලා තිබෙනවා. ඒ වාගේම එම ගිවිසුමේ සඳහන් වගන්ති ක්‍රියාත්මක නොකරන්නේ නම් රට ඉදිරියට ගෙන යා නොහැකි බවත් ප්‍රකාශ කර තිබෙනවා.

ජනාධිපතිවරණයක් පැවැත්වීමට නියමිත මේ වැදගත් අවස්ථාවේදී මා මෙම ගරු සභාවට මේ කාරණයත් කියන්න කැමැතියි. ජාත්‍යන්තර මූල්‍ය අරමුදල දියත් කරන ලද වැඩසටහනක් නිසා එය මැදිහත් වෙච්ච රටවල් වන ඉන්දුනීසියාව, මලයාසියාව, ග්‍රීසිය, ඉතාලිය, ආර්ජන්ටිනාව, බ්‍රසීලය වැනි රටවල විශාල බංකොලොත්භාවයක් ඇති වුණා. විශේෂයෙන්ම IMF එක සමඟ ගනුදෙනු කරපු ඒ රටවල ආණ්ඩු කඩාගෙන වැටිලා විරුද්ධ පක්ෂ බලයට පත් වුණා. ඒ අනුව IMF එකේ උපදෙස් ලබා ගැනීම හා ඒ අනුව කටයුතු කිරීම මේ ප්‍රශ්නවලට තිබෙන එකම විසඳුම නොවන බව ඉතා පැහැදිලි වෙනවා. මේ පිළිබඳව දැනගන්න ඕනෑ නම් අන්තර්ජාලයේ "IMF controversies" කියලා පරීක්ෂා කළාම හාවර්ඩ් විශ්වවිද්‍යාලයේ, කේම්බ්‍රිජ් විශ්වවිද්‍යාලයේ සිට සෑම විශ්වවිද්‍යාලයකම ආර්ථික විශේෂඥයන් විසින් ලියන ලද ඕනෑ තරම් ලිපිලේඛන දැකගන්න පුළුවන්.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඉදිරියේදී රට හරි දිශාවට ගෙන යෑම සඳහා මම මේ අසන ප්‍රශ්න ඉතා වැදගත් වේ යැයි කියා මා හිතනවා. ඒ නිසා මා බලාපොරොත්තු වෙනවා, මෙම ප්‍රශ්න සඳහා නිසි පිළිතුරක් ලබා දෙයි කියලා.

1. රනිල් වික්‍රමසිංහ මැතිතුමා ජනාධිපති ධුරයට පත් වුවාට පසුව මෙම රජය මඟින් කොපමණ ණය ප්‍රමාණයක් ලබා ගෙන තිබෙනවාද? කුමන ව්‍යාපෘති සඳහා ඒ ණය ලබා ගත්තේද? ඒ ගත් ණය ගෙවීම සඳහා වූ පොලී අනුපාතය කොපමණ වේද? එසේම ඒ ලබා ගත් ණය රටේ ආර්ථික ප්‍රශ්න විසඳීම සඳහා කුමන ආකාරයෙන් ඉවහල් වූයේද?

2. අපගේ දැනීම අනුව ඩොලර් මිලියන 367ක පමණ මුදලක් එක අවුරුද්දකට ලැබුණු අතර, ලංකාව දැනට තිබෙන තත්ත්වයට සාමාන්‍යකරණය වීම සඳහා එය කොපමණ ඉවහල් වූයේද?

3. ශ්‍රී ලංකා මහ බැංකු පනත රජයේ වුවමනාවට ඉදිරිපත් කළ දෙයක්ද? එසේ නොමැති නම් එය මහ බැංකුව ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ අවශ්‍යතාව මත ඉටු කළ දෙයක්ද?

4. ජන මත විචාරණයකට තුඩු දෙන තරම්, ඒ කියන්නේ මුදල් පිළිබඳ පාර්ලිමේන්තුව සතු වගකීම විදේශ ආයතනයකට පැවරෙන ආකාරයේ වගන්ති එම පනතට ඇතුළත් කිරීම පිළිබඳව මේ රජය දැනුවත්ව සිටියාද? දැනුවත්ව සිටියේ නම් එය ඉදිරිපත් කළේ මන්ද?

5. එමෙන්ම දැනට IMF සමඟ ඉදිරිපත් කර ඇති වැඩසටහන බලයට පත්වන කිසිවෙකුට වෙනස් කළ නොහැකි ද?

6. රජය දැනට ප්‍රකාශ කර ඇති ආකාරයට IMF සමඟ ඇතිකර ගත් එකඟතා කිසිවෙකුටවත් වෙනස් කළ නොහැකි ද? එසේ වුවහොත් රට බංකොලොත් වන බව රජය ප්‍රකාශ කර ඇති අතර, එය එසේ පිළිගන්නේ ද?

7. මහ බැංකු අධිපති නන්දලාල් වීරසිංහ මහතා විසින් ප්‍රකාශ කර තිබෙනවා, දැනට එකඟ වුණු IMF යෝජනා බිඳ වැටුණහොත් රට යළි ගොඩ ගැනීමට නොහැකි වන බව. එය මේ වාගේ මැතිවරණ කාල සීමාවක ප්‍රකාශයට පත් කිරීම ඉතාම වැරැදි කාරණයක් බව මම මේ අවස්ථාවේ සඳහන් කරන්න කැමැතියි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

IMF එක සමඟ සාකච්ඡා කිරීම හෝ මහ බැංකුව ස්වාධීන කිරීම ගැන අපට ප්‍රශ්නයක් නැහැ. නමුත්, රටේ මුදල් පිළිබඳ ස්වාධීනත්වය විදේශ රටවලට පැවරෙන ආකාරයටත්, රටේ බදු අනුපාත, බදු ගන්නා ආකාරය, සුබසාධන කපා හැරීම, දේශීය නිෂ්පාදන කඩා වැටීම ආදී කරුණු සම්බන්ධයෙන් IMF මැදිහත් වීම මුළු ලෝකයටම මහා පරිමාණයෙන් බලපා ඇති බව පිළිගත්ත කාරණයක් කියලාත් මේ ගරු සභාවට මම මේ අවස්ථාවේදී ප්‍රකාශ කරන්න කැමැතියි.

**ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු ස්වාමීන් වහන්සේ ඉදිරිපත් කළ ස්ථාවර නියෝග 27(2) ප්‍රශ්නයට අදාළ පිළිතුර විෂය භාර රාජ්‍ය අමාත්‍යතුමා විසින් හෙට හෝ ඉදිරි දිනයකදී ලබා දෙන්න බලාපොරොත්තු වෙනවා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

ගරු ජගත් කුමාර සුමිත්‍රාආරච්චි මැතිතුමාගේ ප්‍රකාශය.

**ගරු ජගත් කුමාර සුමිත්‍රාආරච්චි මහතා**
(மாண்புமிகு ஜகத் குமார சுமித்ராரச்சி)
(The Hon. Jagath Kumara Sumithraarachchi)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද දවසේ මේ ගරු සභාවට ඉදිරිපත් කරන්න බලාපොරොත්තු වන මාගේ ප්‍රකාශය මෙයයි. මම වසර 4ක් මේ පාර්ලිමේන්තුවේ කටයුතු කළා. ඒ කාල පරිච්ඡේදය තුළ මා නියෝජනය කරන සමෘද්ධි ව්‍යාපාරයේ සමෘද්ධි නිලධාරින්ගේ ප්‍රශ්න වාගේම, අඩු ආදායම්ලාභී මහජනතාවගේ ප්‍රශ්න ගැනත් කථා කළා. මා එම කටයුතු කිරීමේදී ආණ්ඩුව සමඟ දීර්ඝ වශයෙන් යම් යම් කාරණා පිළිබඳව සාකච්ඡා කළා.

ඒ වාගේම මේ පාර්ලිමේන්තුවට ආ ගමනේදී මට උදව් කළ මහින්ද රාජපක්ෂ හිටපු ජනාධිපතිතුමාට, ගරු දිනේෂ් ගුණවර්ධන මැතිතුමාට, වර්තමාන ජනාධිපතිතුමා ඇතුළු අපේ පාර්ශ්වයේ අපිත් එක්ක ළඟින් වැඩ කරපු හැමෝටම මේ තීරණාත්මක මොහොතේ ස්තුතිය පළ කරමින් මාගේ මේ ප්‍රකාශය කරනවා.

මම පාර්ලිමේන්තුවට ආපු දවසේ ඉඳන් ආණ්ඩුවේ හිටියත් විපක්ෂයේ මන්ත්‍රීවරයෙකු වාගේයි අදහස් පළ කළේ. ඒ, මහජනතාවගේ අවශ්‍යතා වෙනුවෙන්. බඩු මිල වැඩි වෙලා, ජීවන වියදම වැඩි වෙලා, පාසල් පොත පතේ ඉඳන් මිල වැඩි වෙලා, විදුලි බිල, ගෑස් මිල වැඩි වෙලා උද්ධමනය වැඩි වුණාම, තෙල් නැති වුණාම, විදුලිය නැති වුණාම මේ රටේ මහජනතාව වින්ද පීඩාව ගැන මේ පාර්ලිමේන්තුව ඇතුළේ නිරන්තරයෙන්ම මම කථා කරලා තිබෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඔබතුමාත් ඇතුළු ආණ්ඩු පක්ෂයේ මගේ සහෝදර මන්ත්‍රීවරුන් හැමෝමත් දන්නවා, සාමාන්‍ය ජනතාව ගැන මා කථා කළ බව. මම සමස්ත ලංකා සමෘද්ධි සංවර්ධන හා කෘෂිකර්ම පර්යේෂණ නිෂ්පාදන සහකාර නිලධාරි සංගමය නියෝජනය කරනවා, එහි ප්‍රධාන ලේකම් විධියට. ඔවුන්ගේ සහාය, ශක්තිය ඇතුව මේ පාර්ලිමේන්තුවට ආපු කෙනෙකු විධියට මම එදා ඉඳන්ම ඒ නිලධාරින්ගේ ගැටලු විසඳන්න දිගින් දිගටම උත්සාහ කළා. ඒ තුළ මට යම් ගැටලු ප්‍රමාණයක් විසඳා ගන්නත් අවස්ථාව ලැබුණා. ඒ සඳහා මැදිහත් වෙච්ච හැමෝටමත් මම ස්තුතිවන්ත වෙනවා.

නමුත්, මේ අවුරුදු 4ක කාල පරිච්ඡේදය තුළ මම බරපතළ විධියට මුහුණ දුන් කාරණාව මෙයයි. මේ වන විට සමෘද්ධි ව්‍යාපාරයට ස්වාභාවික ලෙස මරණයට පත් වෙන්න අවස්ථාව සලසා තිබෙනවා. සමෘද්ධි ව්‍යාපාරයෙන් සහන ලබපු අන්ත අසරණ, දුගී දුප්පත්, ඇස් පේන්නේ නැති, කන් ඇහෙන්නේ නැති හා විවිධ ආබාධවලට ලක් වෙච්ච දරුවෝ එක්ක තනි වුණු අහිංසක අම්මලා තාත්තලා රාශියකගේ ඒ සහනාධාරය අස්වැසුම වැඩ පිළිවෙළ තුළින් කපාහැර තිබෙනවා. පොඩි ප්‍රමාණයක් නොවෙයි, මේ නිසා ලක්ෂ 8කට විතර ඒ සහනාධාරය නැති වුණා. ඒ අහිංසක මිනිස්සුන්ගේ ප්‍රශ්නය කථා කරන්න මේ පාර්ලිමේන්තුවේ වෙන හඬක් නොතිබුණු නිසා මම දිගින් දිගටම ඒ ගැන කථා කළා. ඒ ගැන අවධානය යොමු කළා. ඒ වාගේම ගරු ජනාධිපතිතුමා ඇතුළු ආණ්ඩු පක්ෂයේ සියලුදෙනාගේත් අවධානය ඒ සඳහා මා යොමු කළා. ගරු දිනේෂ් ගුණවර්ධන අගමැතිතුමා අවස්ථා කිහිපයකදීම එයට මැදිහත් වෙන්නත් උත්සාහ කළා.

මම විශ්වාස කරනවා, මුදල් අමාත්‍යවරයා විධියට ගරු ජනාධිපතිතුමාට මේ ප්‍රශ්නය විසඳන්න අවස්ථාව තිබුණා කියලා. නමුත්, මුදල් අමාත්‍යාංශය දිගින් දිගටම ඒකට විරුද්ධ වුණා. ඒ වාගේම "අස්වැසුම" වැඩසටහන ජනාධිපතිතුමාගේ වැඩ පිළිවෙළක් නිසා එතුමා ඒ වැඩ පිළිවෙළ ඉස්සරහට ගෙනියනවා මිස, මේ සමෘද්ධි නිලධාරින්ගේ ප්‍රශ්න ටික විසඳන්න සහ සහනාධාරය කැපිච්ච අහිංසක අයට සාධාරණයක් ඉෂ්ට කරන්න උත්සාහයක් දරපු බවක් නම් මට පෙනුණේ නැහැ.

ඒ විතරක් නොවෙයි. සමෘද්ධි වැඩසටහනට රුපියල් බිලියන 60ක් පමණ තමයි වෙන් වුණේ. නමුත් මේ "අස්වැසුම" වැඩ පිළිවෙළට මුල් අවස්ථාවේදී රුපියල් බිලියන 206ක් පමණ වෙන් කළා. ඊට පස්සේ ඒ සඳහා වසරකට රුපියල් බිලියන 180ක පමණ - තුන් ගුණයක විතර - මුදල් ප්‍රමාණයක් වෙන් කළා වුණත් දුප්පතුන් රාශියකට ඒ සහනාධාරය ලැබුණේ නැහැ. ඒ මිනිස්සු ගැන කථා කරන්න කෙනෙක් හිටියේ නැහැ. ඒ මිනිස්සුන්ගේ දුක කියන්න කෙනෙක් හිටියේ නැහැ. ඒ අය වෙනුවෙන් මම දිගටම හඬ නැඟුවා විතරක් නොවෙයි, කොළඹ දිස්ත්‍රික්කයේ හැම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයකටම ගිහිල්ලා ඔවුන් පත් වෙච්ච අසරණ තත්ත්වය පිළිබඳව කථා කළා. ඇස් පෙනෙන්නේ නැති, කන් ඇහෙන්නේ නැති, ඇවිද ගන්න බැරිව ආබාධිත තත්ත්වයට පත් වෙච්ච අය පවා කිව්වේ, මගේ මුද්දරයත් කපලා, මම ජීවත් වෙන්නේ කොහොමද කියායි. එහෙම ප්‍රශ්නයක් තිබුණා. මම ඒ පිළිබඳව මේ ගරු සභාවේ අවධානය යොමු කළා. මගේ පාර්ශ්වයේ හිටපු මන්ත්‍රීවරු රාශියක්ම ඒ ගැන දන්නවා. එතුමන්ලා මා සමඟ ඒ ගැන සාකච්ඡා කළා. ඒ වාගේම එතුමන්ලා අවස්ථා කිහිපයකදීම ඒ ගැන හඬ නැඟුවා. නමුත්, ඒ ප්‍රශ්නය විසඳුණේ නැහැ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. ඔබතුමාටත් ඒ ප්‍රශ්නය තිබෙන බව මම දන්නවා. ගරු කථානායකතුමා පවා මේ ප්‍රශ්නය ගැන දන්නවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, හැබැයි මම විශ්වාස කළා, මේ ජනාධිපතිවරණය වෙලාවේදීවත් මේ ප්‍රශ්නය විසඳීම සඳහා ආණ්ඩුවේ සහ විශේෂයෙන්ම ජනාධිපතිතුමාගේ අවධානය යොමු වෙයි කියලා. මොකද, මේක තීරණාත්මක ජනාධිපතිවරණයක්; විශේෂ අවස්ථාවක්. නමුත් අවාසනාවකට පසුගිය 12වැනි දා පැවති සාකච්ඡාවේදී මුදල් අමාත්‍යාංශයේ මොළය උඩ ඉඳගෙන ඉන්න නිලධාරියෙක් කිව්වා, මේ ප්‍රශ්නය විසඳන්න පුළුවන්කමක් නැහැ, ඒකට විශාල මුදල් ප්‍රමාණයක් වියදම් වෙනවා කියලා. හැබැයි, ඒ සඳහා වැය වෙන්නේ විශාල මුදලක් නොවෙයි. ඒ අය පුංචි මුදලක්, විශාල මුදලක් විධියට පෙන්වලා අනෙක් පැත්තෙන් සමෘද්ධි නිලධාරින්, සමෘද්ධි ව්‍යාපාරය වැඩක් නැහැ කියලා පෙන්වන්න හැදුවා. දුප්පත්, අහිංසක මිනිස්සු මරණයක් වෙනුවෙන් සමෘද්ධි ව්‍යාපාරයෙන් ගත්ත රුපියල් 20,000 අද ඔවුන්ට ලැබෙන්නේ නැහැ. ඒ වාගේම විවාහයකදී ලැබුණු රුපියල් 10,000ක මුදල ඔවුන්ට ලැබෙන්නේ නැහැ. තුන් නිවුන් දරු උපතකට සමාජ ආරක්ෂණ මණ්ඩලයෙන් රුපියල් 20,000ක් ලබා දුන්නා. දැන් ඒ මුදල් ටිකත් ලැබෙන්නේ නැහැ. මොකද, අද ඒ මුදල් සම්බන්ධයෙන් වෙනත් බැංකු හරහා තමයි කටයුතු කරන්නේ. සමෘද්ධි ව්‍යාපාරය ඒ සඳහා සම්බන්ධ වෙන්නේ නැහැ. ඒ නිසා සමෘද්ධි ව්‍යාපාරයට ජනතාව සම්බන්ධ වෙන එක නතර වුණා. දුප්පත්කම නැති කිරීමේ වැඩ පිළිවෙළ අද දියාරු වෙමින්, එක තැන පල්වෙමින් තිබෙන තැනට පත් වෙලා තිබෙනවා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා කථාව කෙටියෙන් කළොත් හොඳයි.

**ගරු ජගත් කුමාර සුමිත්‍රාආරච්චි මහතා**
(மாண்புமிகு ஜகத் குமார சுமித்ராரச்சி)
(The Hon. Jagath Kumara Sumithraarachchi)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, සමෘද්ධි ව්‍යාපාරයෙන් වසරකට සිසුන් 43,000කට ශිෂ්‍යාධාර ලබා දුන්නා. දැන් ඒ වැඩ පිළිවෙළ නතර වෙලා තිබෙනවා. ඒ වාගේම මේ රටේ දුක් විඳින මිනිසුන්ට එදිනෙදා ජීවත් වෙන්න ලැබුණු සහනාධාරය එක්ක තිබුණු අනෙකුත් සියලු පහසුකම් ටිකත් නැති වුණා. නිවාස එක්ලක්ෂ දසදහසක් සමෘද්ධි ව්‍යාපාරයෙන් හදලා දුන්නා. ඒ වැඩ පිළිවෙළත් එතැනම නතර වෙලා තිබෙනවා. ඒ තත්ත්වය වෙනස් කරලා නිවැරදි කරන්න හැකියාව තිබියදීත් ඒවාට ඇහුම්කන් දුන් ප්‍රමාණය ප්‍රමාණවත් නැහැ කියන කාරණය මම කියනවා. අපි අවසාන වශයෙන් ජනාධිපතිවරණය වෙලාවේදීත් ගරු ජනාධිපතිතුමාට කිව්වා, මේ ප්‍රශ්නය විසඳන්න කියලා. නමුත් ඒ ප්‍රශ්නය විසඳුණේ නැහැ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. මම නියෝජනය කරන සමස්ත ලංකා සමෘද්ධි සංවර්ධන නිලධාරි සංගමය තීරණය කළා, මේ පිළිබඳව ජනාධිපතිතුමා හා විපක්ෂ නායකතුමා එක්ක කථා කරන්න. ජනාධිපතිතුමා එක්ක කථා කළත් ඒ ප්‍රශ්නය විසඳෙන්නේ නැති වෙනකොට විපක්ෂ නායකතුමා එක්ක කථා කළා. එහිදී එතුමා එකඟතාවක් දක්වා තිබුණා, සියලු ගැටලු විසඳන ගමන් දුක් විඳින, පොඩිවෙන, පෑගෙන මිනිසුන්ගේ ප්‍රශ්නත් හඳුනාගෙන ඉදිරි කාලයේදී ඒ සඳහා සාධාරණයක් ඉෂ්ට කරනවා කියලා. අන්න ඒ තත්ත්වයත් එක්ක තමයි මට යම්කිසි දේශපාලන තීරණයක් ගන්න සිද්ධ වුණේ. ඒ නිසා මම පනින්නන් වාලේ පක්ෂ, පාට මාරු කළේ නැහැ. ආණ්ඩුවේ ඉන්නකොට මට ගොඩක් හිත් රිදවීම් ඇති වුණා. පක්ෂය ඇතුළේ මට ලැබිය යුතු තත්ත්වය නොලැබුණු අවස්ථාවලදී හිත් රිදවීම් සිදු වෙලා තිබෙනවා. සමහර මැති ඇමතිවරුන්ට ප්‍රශ්න කියන්න ගියාම "ඔබතුමා මහ කරදරයක්" කියලා කියපු අවස්ථා තිබුණා. මම මිනිස්සුන්ගේ ප්‍රශ්න ගැනයි කථා කළේ. මම පෞද්ගලිකව කිසිම දෙයක් ඉල්ලන්න ගිහිල්ලා නැහැ.

[ගරු ජගත් කුමාර සුමිත්‍රාආරච්චි මහතා]

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, හැබැයි, එවැනි තත්ත්වයක් තුළ මේ කටයුතුවලට උදවු කරපු හොඳ ඇමතිවරුත් හිටියා. මම ඒ අයට ස්තුතිවන්ත වනවා. මම එවැනි දේවල් ඉවසාගෙන හිටියේ, මට ජන වරම ලැබුණේ ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ තුළින් නිසායි. නමුත් පක්ෂය ඇතුළේ ඇති වුණු තත්ත්වය තුළ, විශේෂයෙන්ම දුක් විඳින මිනිසුන්ගේ ප්‍රශ්න විසඳන්න කෙනෙක් නැතිවෙන තත්ත්වය තුළ මට තීන්දුවක් ගන්න සිදු වුණා, මේ ජනාධිපතිවරණයේදී පොඩි මිනිස්සු වෙනුවෙන් කථා කරන නායකයෙක් එක්ක වැඩ කරන්න. ඒ අනුව තමයි මම මේ ජනාධිපතිවරණයේදී විපක්ෂ නායක සජිත් ප්‍රේමදාස මැතිතුමාට සහාය දීමට තීරණය කළේ. ඒ අනුව මම අද මගේ සහෝදර මන්ත්‍රීවරුන්ගෙන් ඉවත් වෙලා, මේ සභාවේදීම විපක්ෂයට ගිහිල්ලා මා මෙතෙක් නඟපු හඬ විපක්ෂයේදී වඩාත් ශක්තිමත්ව ඉදිරියට ගෙනයන්න බලාපොරොත්තු වෙනවා. මෙතෙක් කාලයක් මට සහයෝගය ලබා දුන් හැමෝටම මම ස්තුතිවන්ත වෙනවා. විශේෂයෙන්ම මේ රටේ තැළෙන, පෑගෙන, පොඩිවෙන, සමෘද්ධි ව්‍යාපාරය වාගේම "අස්වැසුම" වැඩසටහනෙන් අසාධාරණයක් වෙච්ච සාමාන්‍ය මිනිස්සුන්ට කියනවා, අපි නිරන්තරයෙන්ම ඔබේ හඬ අවදි කරනවා, ඒ වෙනුවෙන් කැප වෙනවා කියලා. මම අද විපක්ෂයට යන්නේ වෙනත් කවුරුවත් කරපු විධියට, එහෙම නැත්නම් සමාජය කියන විධියට වාසි, වරදාන, වරප්‍රසාද බලාපොරොත්තුවෙන් නොවෙයි.

ජනතාවගේ පොදු අවශ්‍යතා සහ බලාපොරොත්තු ඉෂ්ට කිරීමේ අපේක්ෂාවෙන් තමයි මම එහෙම යන්නේ. එම කාරණාවත් මතක් කරමින්, ගරු කථානායකතුමාටත්, ගරු නියෝජ්‍ය කථානායකතුමාටත් ස්තුතිවන්ත වෙමින් මගේ අදහස් දැක්වීම අවසන් කරනවා. බොහොම ස්තුතියි.

***[අනතුරුව ගරු ජගත් කුමාර සුමිත්‍රාආරච්චි මහතා ආණ්ඩු පාර්ශ්වයේ සිට විරුද්ධ පාර්ශ්වයට ගියේය.]***

*[இச்சந்தர்ப்பத்தில் மாண்புமிகு ஜகத் குமார சுமித்ராரச்சி அவர்கள் அரச தரப்பிலிருந்து எதிர்த்தரப்பிற்குச் சென்றார்.]*

*[Thereupon, the Hon. Jagath Kumara Sumithraarachchi crossed from the Government to the Opposition benches.]*

## පනත් කෙටුම්පත් පිළිගැන්වීම
## சமர்ப்பிக்கப்பட்ட சட்டமூலங்கள்
## BILLS PRESENTED

### ශ්‍රී ලංකාවේ සත්‍යය, සමගිය සහ ප්‍රතිසන්ධානය සඳහා වන කොමිෂන් සභාව පනත් කෙටුම්පත
### இலங்கையில் உண்மை, ஒற்றுமை மற்றும் நல்லிணக்கத்துக்கான ஆணைக்குழு சட்டமூலம்
### COMMISSION FOR TRUTH, UNITY AND RECONCILIATION IN SRI LANKA BILL

"ශ්‍රී ලංකාවේ සත්‍යය, සමගිය සහ ප්‍රතිසන්ධානය සඳහා වන කොමිෂන් සභාව පිහිටුවීම සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද; ඒ කොමිෂන් සභාවේ බලතල සහ කර්තව්‍ය දැක්වීම සඳහා ද; ශ්‍රී ලංකාවේ සත්‍යය, සමගිය සහ ප්‍රතිසන්ධානය සඳහා වන කොමිෂන් සභාවේ නිර්දේශ ක්‍රියාත්මක කිරීම, නියාමනය කිරීමේ කාර්යය සඳහා කොමිෂන් සභාවේ නියාමන කමිටුව පිහිටුවීම සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද; ඒ හා සම්බන්ධ හෝ ඊට ආනුෂංගික කාරණා සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද වූ පනත් කෙටුම්පතකි."

***පිළිගන්වන ලද්දේ අග්‍රාමාත්‍ය සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමා වෙනුවට ගරු (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා විසිනි.***

***2024 සැප්තැම්බර් 18වන බදාදා දෙවන වර කියවිය යුතුයයි ද, එය මුද්‍රණය කළ යුතුයයි ද, අදාළ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතුයයි ද නියෝග කරන ලදී.***

*பிரதம அமைச்சரும் பொது நிருவாக, உள்நாட்டலுவல்கள், மாகாண சபைகள் மற்றும் உள்ளூராட்சி அமைச்சருமானவர் சார்பாக மாண்புமிகு (கலாநிதி) சுசில் பிரேமஜயந்த அவர்களால் சமர்ப்பிக் கப்பட்டது.*

*2024 செப்ரெம்பர் 18, புதன்கிழமை இரண்டாம் முறை மதிப்பிடப்பட வேண்டுமெனவும் அச்சிடப்பட வேண்டுமெனவும் உரிய துறைசார் மேற்பார்வைக் குழுவுக்கு ஆற்றுப்படுத்தப்பட வேண்டு மெனவும் கட்டளையிடப்பட்டது.*

*Presented by the Hon. (Dr.) Susil Premajayantha on behalf of the Prime Minister and Minister of Public Administration, Home Affairs, Provincial Councils and Local Government;*

*to be read a Second time upon Wednesday, 18th September, 2024 and to be printed; and to be referred to the relevant Sectoral Oversight Committee.*

### ජාතික ඉඩම් කොමිෂන් සභාව පනත් කෙටුම්පත
### தேசிய காணி ஆணைக்குழு சட்டமூலம்
### NATIONAL LAND COMMISSION BILL

"ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ නවවන උපලේඛනයේ, I වන ලැයිස්තුවේ (පළාත් සභා ලැයිස්තුව), II වන පරිශිෂ්ටයේ 3 වන ඡේදයේ විධිවිධාන බලාත්මක කිරීම සඳහා ජාතික ඉඩම් කොමිෂන් සභාව පිහිටුවීම සඳහා සහ ඊට සම්බන්ධ හෝ ආනුෂංගික කාරණා සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස වූ පනත් කෙටුම්පතකි."

***පිළිගන්වන ලද්දේ අග්‍රාමාත්‍ය සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමා වෙනුවට ගරු (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා විසිනි.***

***2024 සැප්තැම්බර් 18වන බදාදා දෙවන වර කියවිය යුතුයයි ද, එය මුද්‍රණය කළ යුතුයයි ද, අදාළ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතුයයි ද නියෝග කරන ලදී.***

*பிரதம அமைச்சரும் பொது நிருவாக, உள்நாட்டலுவல்கள், மாகாண சபைகள் மற்றும் உள்ளூராட்சி அமைச்சருமானவர் சார்பாக மாண்புமிகு (கலாநிதி) சுசில் பிரேமஜயந்த அவர்களால் சமர்ப்பிக் கப்பட்டது.*

*2024 செப்ரெம்பர் 18, புதன்கிழமை இரண்டாம் முறை மதிப்பிடப்பட வேண்டுமெனவும் அச்சிடப்பட வேண்டுமெனவும் உரிய துறைசார் மேற்பார்வைக் குழுவுக்கு ஆற்றுப்படுத்தப்பட வேண்டு மெனவும் கட்டளையிடப்பட்டது.*

*Presented by the Hon. (Dr.) Susil Premajayantha on behalf of the Prime Minister and Minister of Public Administration, Home Affairs, Provincial Councils and Local Government;*

*to be read a Second time upon Wednesday, 18th September, 2024 and to be printed; and to be referred to the relevant Sectoral Oversight Committee.*

## සමාගම් (සංශෝධන) පනත් කෙටුම්පත
## கம்பெனிகள் (திருத்தம்) சட்டமூலம்
## COMPANIES (AMENDMENT) BILL

"2007 අංක 07 දරන සමාගම් පනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි."

***පිළිගන්වන ලද්දේ කර්මාන්ත අමාත්‍යතුමා වෙනුවට ගරු (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා විසිනි.***

***2024 සැප්තැම්බර් 18වන බදාදා දෙවන වර කියවිය යුතුයයි ද, එය මුද්‍රණය කළ යුතුයයි ද, අදාළ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතුයයි ද නියෝග කරන ලදී.***

*கைத்தொழில் அமைச்சர் சார்பாக மாண்புமிகு (கலாநிதி) சுசில் பிரேமஜயந்த அவர்களால் சமர்ப்பிக்கப்பட்டது.*

*2024 செப்ரெம்பர் 18, புதன்கிழமை இரண்டாம் முறை மதிப்பிடப்பட வேண்டுமெனவும் அச்சிடப்பட வேண்டுமெனவும் உரிய துறைசார் மேற்பார்வைக் குழுவுக்கு ஆற்றுப்படுத்தப்பட வேண்டுமெனவும் கட்டளையிடப்பட்டது.*

*Presented by the Hon. (Dr.) Susil Premajayantha on behalf of the Minister of Industries;*

*to be read a Second time upon Wednesday, 18th September, 2024 and to be printed; and to be referred to the relevant Sectoral Oversight Committee.*

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

මීළඟට පෞද්ගලික මන්ත්‍රී පනත් කෙටුම්පත් ඉදිරිපත් කිරීමයි තිබෙන්නේ. ගරු ජගත් කුමාර සුමිත්‍රාආරච්චි මන්ත්‍රීතුමනි, ඔබතුමාට තවම විපක්ෂය පැත්තේ ආසනයක් වෙන් කර නැති නිසා හෙට දිනයේදී ඔබතුමාගේ පනත් කෙටුම්පත ඉදිරිපත් කරන්න.

**ගරු විමල් වීරවංශ මහතා**
(மாண்புமிகு விமல் வீரவங்ஸ)
(The Hon. Wimal Weerawansa)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මට විනාඩියක් දෙන්න.

ගරු සභානායකතුමනි, ශ්‍රී ලංකාවේ සත්‍යය, සමගිය සහ ප්‍රතිසන්ධානය සඳහා වන කොමිෂන් සභාව පිහිටුවීම පිළිබඳ පනත් කෙටුම්පත ගැසට් නිවේදනයක් හැටියට පළ කර තිබුණා. ඔබතුමා අද එහි පළමුවන වර කියවීමද සිදු කළේ?

**ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)

ඔව්.

**ගරු විමල් වීරවංශ මහතා**
(மாண்புமிகு விமல் வீரவங்ஸ)
(The Hon. Wimal Weerawansa)

මෙය ත්‍රස්තවාදයට විරුද්ධව ආරක්ෂක හමුදා විසින් සිදු කළ,- *[බාධා කිරීමක්]* ජිනීවාවල 30/1 දරන යෝජනාව අනුව එන පනත් කෙටුම්පතක්.

**ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)

ගරු මන්ත්‍රීතුමනි, මෙම පනත් කෙටුම්පත දෙවැනිවර කියවීමට දින 14ක් කල් තිබෙනවා. ඒ කාල සීමාව තුළදී උසාවියට යන්නත් පුළුවන්. ඊට පසුව උසාවියෙන් නියෝගය එන්න තව දින 21ක් තිබෙනවා. ඊට පසුව ආංශික අධීක්ෂණ කාරක සභාවට යන්නත් ඕනෑ.

**ගරු විමල් වීරවංශ මහතා**
(மாண்புமிகு விமல் வீரவங்ஸ)
(The Hon. Wimal Weerawansa)

ගරු සභානායකතුමනි, මේක ජිනීවාවල 30(1) යෝජනාවට අනුව ගෙනාපු පනත් කෙටුම්පතක්. මේ මඟින් වෙන්නේ මොකක්ද? දැනටම ආරක්ෂක හමුදා රණවිරුවන් 42කගේ නාමලේඛනයක් තිබෙනවා, නියෝග දීපු, blacklist කරපු. ඒ අයට විරුද්ධව පරීක්ෂණ කරන්න තමයි මේ පනත එන්නේ. මම ඔබතුමාගෙන් අහනවා, 69 ලක්ෂයක ජන වරම මේ පාර්ලිමේන්තුවේ ඔය ආණ්ඩු පක්ෂය තවමත් නියෝජනය කරනවා නම් මේ විධියේ පනතක් ගෙනෙන්න තිබෙන සදාචාරාත්මක බලය සහ අයිතිය මොකක්ද කියලා.

**ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)

ගරු මන්ත්‍රීතුමා, පනත් කෙටුම්පතක් න්‍යාය පත්‍රයට දාලා move කරලා තිබෙන්නේ. දැන් මේක ගැන debate කරන්න ඕනෑ නැහැ. ඒකට ඉදිරි කාලයේදී ඕනෑ තරම් අවස්ථාව ලැබෙනවා.

**ගරු ගෙවිඳු කුමාරතුංග මහතා**
(மாண்புமிகு கெவிந்து குமாரதுங்க)
(The Hon. Gevindu Cumaratunga)

ගරු සභානායකතුමනි, සුමන්තිරන් මන්ත්‍රීතුමා මතු කරපු ප්‍රශ්නයට ඔබතුමා කිව්වා වාගේම, අපේ රටේ ස්වාධීනත්වය සහමුලින් අභියෝගයට ලක්වෙන මෙවැනි පනත් කෙටුම්පතක් ඇයි මේ ජනාධිපතිවරණයක් පැවැත්වෙන වෙලාවේ ගෙනෙන්නේ? ඒකම වැරදියි නේ. ඒ වාගේම තමයි අර පළාත් සභාවල ඉඩම් බලතල සම්බන්ධයෙන් වන පනත් කෙටුම්පතත්. දැන් පළාත් සභා පනත සම්මත වෙලා අවුරුදු කීයක්ද? 1987 ඉඳලා බැලුවොත්, අවුරුදු 35කටත් වැඩියි. දැන් රජයක් අලුතින් පත් කරන්න තිබියදී, ජනාධිපතිවරණයක් පවත්වන්න තිබියදී ඉඩම් පිළිබඳ බලතල ක්‍රියාත්මක කිරීම සඳහා යෝජනාවක් අලුතින් ගෙනෙන්න එපා. අපි කියන්නේ, ඒක ජනතාවට තීරණය කරන්න දෙන්න කියලායි. ඔබතුමන්ලා ගිහින් ජනතාවට කියන්න මේ මතය. පත් වන නව රජයට අවස්ථාව දෙන්න ඒ සම්බන්ධයෙන් සුදුසු ක්‍රියාමාර්ග ගන්න.

**ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)

කවුරු හෝ ඒ පත් වන ජනාධිපතිතුමාටයි, කවුරු හෝ ආණ්ඩුවක් පත් වෙනවා නම් ඒ ගොල්ලන්ටයි ඒ අවස්ථාව ලැබෙව්. ඒ නිසා කලබල වෙන්න ඕනෑ නැහැ දැන්. *[බාධා කිරීමක්]* නැහැ, කිසිම කලබලයක් නැහැ. කලබලයක් තිබුණු නිසා තමයි රට මෙතැනට ගෙනාවේ. අද ඔය ඔක්කොම කථා කරන්නේ එදා මේ පාර්ලිමේන්තුව අල්ලාගන්න එක නවත්වපු නිසා. මේ පාර්ලිමේන්තුව අල්ලාගත්තා නම් ඔබතුමාත් නැහැ, මමත් නැහැ, මේගොල්ලනුත් නැහැ. *[බාධා කිරීමක්]* ඔබතුමා පක්ෂ නායකයෙක් නේ. මම පක්ෂ නායකයෙක් නොවෙයි, ඒ වෙලාවේ.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

න්‍යාය පත්‍රයේ විෂය අංක 1 සිට 3 දක්වා ඉදිරිපත් කිරීම.

## විදේශ නඩු තීන්දු අන්‍යෝන්‍යාව පිළිගැනීම, ලියාපදිංචි කිරීම සහ බලාත්මක කිරීම පිළිබඳ පනත් කෙටුම්පත
## வெளிநாட்டு தீர்ப்புக்களைப் பரஸ்பரம் ஏற்றங்கீகரித்தல், பதிவுசெய்தல் மற்றும் வலுவுறுத்துதல் சட்டமூலம்
## RECIPROCAL RECOGNITION, REGISTRATION AND ENFORCEMENT OF FOREIGN JUDGMENTS BILL

*දෙ වන වර කියවීමේ නියෝගය කියවන ලදී.*
*இரண்டாம் மதிப்பிற்கான கட்டளை வாசிக்கப்பட்டது.*
*Order for Second Reading read.*

**ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)
Hon. Deputy Speaker, I move,

"That the Bill be now read a Second time."

In addition to that, Sir, I also move Item No.2 - Code of Criminal Procedure (Amendment) Bill - and Item No.3 - National Minimum Wage of Workers (Amendment) Bill.

*ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.*
*வினா எடுத்தியம்பப்பெற்றது.*
*Question proposed.*

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
විවාදය ආරම්භ කිරීම, ගරු අලි සබ්රි ඇමතිතුමා. ඔබතුමාට මිනිත්තු 40ක කාලයක් තිබෙනවා.

[පූ.භා. 11.57]

**ගරු ජනාධිපති නීතිඥ එම්.යූ.එම්. අලි සබ්රි මහතා (විදේශ කටයුතු සහ අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමා)**
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி எம்.யூ.எம். அலி சப்ரி - வெளிநாட்டு அலுவல்கள் அமைச்சரும் நீதி, சிறைச்சாலைகள் அலுவல்கள் மற்றும் அரசியலமைப்பு மறுசீரமைப்பு அமைச்சரும்)
(The Hon. M.U.M. Ali Sabry, PC - Minister of Foreign Affairs and Minister of Justice, Prison Affairs and Constitutional Reforms)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම මුලින්ම මේ කාරණය කියන්න ඕනෑ. ශ්‍රී ලංකාවේ සත්‍යය, සමගිය සහ ප්‍රතිසන්ධානය සඳහා වන කොමිෂන් සභාව පනතින් කිසිම අවස්ථාවක, කවුරුවත් මේ රටේ රණ විරුවන් පාවා දෙන්න උත්සාහ කරන්නේ නැහැ. ඒක අපි සාකච්ඡා කරලාත් පෙන්වා දුන්නා. මොකද, අපේ මොළේ නරක් වෙලා නැහැ නේ. ඒකෙන් උත්සාහ කරන්නේ- *[බාධා කිරීමක්]* පොඩ්ඩක් ඉන්නකෝ. මට කථා කරන්න ඉඩ දෙන්න. ඔබතුමා වාඩිවෙන්න. *[බාධා කිරීමක්]* ඉන්නකෝ ඉතින්. මම කථා කරනවා නේ දැන්. පසුව උත්තර දෙන්න.

ඒකෙන් අපි උත්සාහ කරන්නේ කුමක් කරන්නද? අපි හැමෝම දන්නවා, දැනටමත් අපේ රටට විරුද්ධව ජිනීවා හරහා evidence gathering mechanism එකක් ක්‍රියාත්මක වෙන බව. රජයක් වශයෙන් අපි ඒකට සම්පූර්ණයෙන්ම විරුද්ධ වෙලා තිබෙනවා. 2015දී රජය එකඟ වෙලා ගත්ත ඒ තීරණයට විරුද්ධව අපි යෝජනාවෙන් එළියට ඇවිල්ලා තිබෙනවා. එළියට- *[බාධා කිරීමක්]* ඉන්නකෝ. මට පොඩ්ඩක් කථා කරන්න ඉඩ දෙන්නකෝ. *[බාධා කිරීමක්]* ඒක තමයි මේ කරන්න හදන්නේ. වාඩිවෙන්නකෝ. *[බාධා කිරීමක්]*

**ගරු ගෙවිඳු කුමාරතුංග මහතා**
(மாண்புமிகு கெவிந்து குமாரதுங்க)
(The Hon. Gevindu Cumaratunga)
ඔබතුමා මගේ ප්‍රශ්නයට උත්තර දීලා ඉන්නකෝ.

**ගරු ජනාධිපති නීතිඥ එම්.යූ.එම්. අලි සබ්රි මහතා**
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி எம்.யூ.எம். அலி சப்ரி)
(The Hon. M.U.M. Ali Sabry, PC)
මොකක්ද ප්‍රශ්නය? *[බාධා කිරීමක්]* ඉතින්, මම දැන් කථා කරන ගමන් ඉන්නේ. ඊට පසුව ඔබතුමා කථා කරන්න. *[බාධා කිරීමක්]*

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු මන්ත්‍රීතුමනි, ගරු ඇමතිතුමාගේ කථාව අවසන් වුණාට පසු ඔබතුමා ප්‍රශ්න අහන්න.

**ගරු ජනාධිපති නීතිඥ එම්.යූ.එම්. අලි සබ්රි මහතා**
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி எம்.யூ.எம். அலி சப்ரி)
(The Hon. M.U.M. Ali Sabry, PC)
මේකෙන් අපි උත්සාහ කරන්නේ මේ රටේ කාටවත් දඬුවම් දෙන්න නොවෙයි. මේ රටේ විතරක් නොවෙයි නේ මේ truth commissions ක්‍රියාත්මක වෙලා තිබෙන්නේ. මේක නේපාලයේ ක්‍රියාත්මක වෙලා තිබෙනවා; පේරු රාජ්‍යයේ ක්‍රියාත්මක වෙලා තිබෙනවා; දකුණු අප්‍රිකාවේ ක්‍රියාත්මක වෙලා තිබෙනවා. රටවල් 43ක විතර ක්‍රියාත්මක වෙලා තිබෙනවා. මේකෙන් උත්සාහ කරන්නේ, මේ ප්‍රශ්නවලට පිට රටවල් ඇඟිලි ගහන්න අවශ්‍ය නැහැ, අපි දේශීය යන්ත්‍රණයක් තුළ මේ වැඩේ කරනවා කියලා පිට රට ඇඟිලි ගැසීම් වළක්වා ගැනීමයි. මේක නොකළා නම් තමයි ඒ රටවල් මිනිස්සුන්ට කියන්නේ, "පීඩාවට පත් වෙච්ච අයට යන්න තැනක් නැහැ, එහෙනම් මෙහේට හරි එන්න" කියලා. මේක හරියට කියෙව්වොත් හොඳට තේරුම් ගන්න පුළුවන් ඒ කාරණය. ඒක පළමු කාරණය.

දෙවැනි කාරණය මේකයි. මේ පනත් කෙටුම්පතේ කොතැනකවත් දඬුවම් කිරීමේ බලයක් කාටවත් දීලා නැහැ. මේකෙන් සම්පූර්ණයෙන්ම බලය දීලා තිබෙන්නේ මේ පිළිබඳ සොයා බලා වාර්තා ඉදිරිපත් කරන්නයි. ඒකෙන් උත්සාහ,- *[බාධා කිරීමක්]* මොනවා දන්නවාද දන්නේ නැහැ. කියවන්නකෝ පොඩ්ඩක් සිංහලෙන් ඒක. ඒකෙන් උත්සාහ කරන්නේ යම්කිසි විධියකින්,- *[බාධා කිරීමක්]* ඒක දෙමළ පක්ෂවලිනුත් පිළිගන්නේ නැහැ නේ. එහෙම දෙයක් කරනවා නම් ඒ ගොල්ලන් පැනලා ඇවිල්ලා මේකට උදවු කරන්න එපායැ. ඒ ගොල්ලන් කියන්නේ විදේශීය බලවේගවලින් තිබෙන බලපෑමට මුහුණ දෙන්න බැරි නිසා මේ ඒක වළක්වාගන්න කරන බොරුවක් තමයි කියලා.

ඔබතුමන්ලා කියනවා, රණවිරුවන් දංගෙඩියට අරගෙන යනවා කියලා. ඒක වෙන්න බැහැ නේ. අපි රණවිරුවන් දංගෙඩියට අරගෙන යනවා නම්, දෙමළ පක්ෂ එකතු වෙලා අපට උදව් කරන්න එපායැ. ඒ අය ඒක පිළිගන්නේත් නැහැ; ඔබතුමන්ලා පිළිගන්නේත් නැහැ. ඒකට හේතුව, අපි ඒ අන්තයටවත් මේ අන්තයටවත් උදව් කරන්නේ නැති වීමයි. අපි කරන්නේ මධ්‍යස්ථව ඉඳලා ශ්‍රී ලංකාවේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව තුළ

අපේ ප්‍රශ්න විසඳා ගන්න ක්‍රමයක් ඉදිරිපත් කිරීම. අද ඒ පනත් කෙටුම්පත සම්මත වෙන්නේ නැහැ නේ. ඔබතුමා ඒකට විරුද්ධ නම්, Supreme Court එකට ගිහිල්ලා challenge කරන්න. ඔබතුමන්ලාට ඒකට අද ඉඳලා දවස් 14ක් තිබෙනවා. ඒ තුළ- *[බාධා කිරීමක්]* ඒක තමයි. එතැනට ගිහිල්ලා බලලා- *[බාධා කිරීමක්]* නැහැ ඉතින්, ඔබතුමන්ලාට ඕනෑ දෙයක් කරගෙන, ඊට පස්සේ ඉදිරියට කරගෙන යන්න. අපට යුතුකමක් තිබෙනවා, ජාත්‍යන්තරය ඉදිරියේ මේ රටේ පීඩාවට පත් වෙච්ච මිනිසුන්ට අවස්ථාවක් ලබා දෙන්න. මේක කාටවත් සීමා කරලා නැහැ. සිංහල සහ මුස්ලිම් අයත් ඉන්නවා, යුද්ධය නිසා පීඩාවට පත් වෙච්ච. ඒ අයටත් ගිහිල්ලා කරුණු කියන්න පුළුවන්. සත්‍ය සොයා ගැනීමෙන් මොකක්ද වෙන අඩුපාඩුව? කවුරු හරි වරදක් කරලා තිබෙනවා නම්, ඔවුන් දඬුවම් විඳිය යුතුයි. නමුත් සාමාන්‍ය මිනිසුන්ට දඬුවම් කරන්න බැහැ. මේකෙන් කරන්නේ සත්‍ය සොයා ගැනීම. සත්‍ය සොයා ගත්තාට පස්සේ වුණත් ඒ ටික යවන්න ඕනෑ Attorney-Generalට, නඩු පවරන්න පුළුවන්ද කියලා බලන්න. මේකෙන් අපි බලාපොරොත්තු වෙන්නේ නඩු පවරන්න නොවෙයි. මේකෙන් අපි බලාපොරොත්තු වෙන්නේ, මිනිසුන්ට- *[බාධා කිරීමක්]* ඔබතුමාට කිසිම- *[බාධා කිරීමක්]* මොකක්ද?

**ගරු ගෙවිඳු කුමාරතුංග මහතා**
(மாண்புமிகு கெவிந்து குமாரதுங்க)
(The Hon. Gevindu Cumaratunga)
දැන් ඔබතුමාම කිව්වා නේද දඬුවම් විඳිය යුතුයි කියලා?

**ගරු ජනාධිපති නීතිඥ එම්.යූ.එම්. අලි සබ්රි මහතා**
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி எம்.யூ.எம். அலி சப்ரி)
(The Hon. M.U.M. Ali Sabry, PC)
වැරැද්දක් කරලා තිබෙන අය දඬුවම් විඳින්න ඕනෑද, නැද්ද?

**ගරු ගෙවිඳු කුමාරතුංග මහතා**
(மாண்புமிகு கெவிந்து குமாரதுங்க)
(The Hon. Gevindu Cumaratunga)
මට මයික් එක දෙනවා නම් කියන්න පුළුවන්, වැරැද්ද-

**ගරු ජනාධිපති නීතිඥ එම්.යූ.එම්. අලි සබ්රි මහතා**
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி எம்.யூ.எம். அலி சப்ரி)
(The Hon. M.U.M. Ali Sabry, PC)
නැහැ, නැහැ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි. මම එතුමා එක්ක කථා කරන්න යන්නේ නැහැ. මේකෙන් උත්සාහ කරන්නේ, සත්‍ය සොයා බලන්න; පීඩාවට පත් වෙච්ච අයට සහනයක් සලසන්න; ඒ මිනිසුන්ට වේදිකාවක් ලබා දෙන්න. මේකේදී සිංහල, ද්‍රවිඩ, මුස්ලිම් කියලා වෙන් කරලා නැහැ. 1983 ඉඳලා අද වෙනකල් පීඩා විඳපු ඕනෑ කෙනෙකුට මෙතැනට යන්න පුළුවන්. මේක ලංකාවේ විතරක් ගෙනාපු දෙයක් නොවෙයි. මේක රටවල් 43ක් විතර ගෙනාපු දෙයක්. මේ විධියට තමයි අපි යම් කිසි conflict එකකින් පස්සේ මිනිස්සු අතර සාමය ඇති කර ගන්න උත්සාහ කරන්නේ. මේකෙන් අපි බලාපොරොත්තු වෙන්නේ කාටවත් දඬුවම් කරන්න නොවෙයි. මේකෙන් අපි අදහස් කරන්නේ සත්‍ය සොයා ගෙන මිනිස්සු අතර සාමය ඇති කිරීම. *[බාධා කිරීමක්]* ඔව්. ඔබතුමා ගිහිල්ලා බැලුවොත් තේරෙයි, තමන්ගේ මිනිස්සු නැති වුණාය කියලා 2000 ඉඳලා 2009 වෙනකල් 6,047දෙනෙක් කියා සිටිනවා. ඒ මිනිසුන්ට යන්න තැනක් නැහැ. අපට ලේසියෙන් ඒක නොසලකා හරින්න පුළුවන්. 6,047දෙනෙක් 2000 ඉඳලා 2009 වෙනකල් තමන්ගේ loved ones නැති වෙලාය කියලා අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයට කියා තිබෙනවා. අපි ඔවුන් හොයා ගන්න උත්සාහ කරන්න ඕනෑ. ඒ ගොල්ලන්ට ප්‍රශ්නයක් තිබෙනවා නම්, ගිහිල්ලා දුක කියන්න තැනක් තිබෙන්න ඕනෑ. ඒවා ගැන ප්‍රශ්න ඇති කරගෙන, හැම එකම ජාතිවාදී විධියට අරගෙන කටයුතු කළ යුතු නැහැ. Issues නැත්නම් issues create කරන්න හදනවා. එහෙම කරන්න ගියොත් අපට මේ ප්‍රශ්නය විසඳන්න හම්බ වෙන්නේ නැහැ. ඉතින් මේවා ඉදිරියට යන්න ඕනෑ. එතැනදී කිසිම විධියකින් කිසිම කොමිසමකට කාටවත් දඬුවම් කරන්න බලයක් ලැබෙන්නේ නැහැ. මේකේ තිබෙන එකම දේ සත්‍ය සොයා ගැනීමයි. යම් කිසි විධියක ප්‍රශ්නයක් තිබෙනවාය කියලා කියනවා නම්, ඒක Attorney-Generalට යවන්න පුළුවන්. Attorney-General බලන්න ඕනෑ, ලංකාවේ අපරාධ නීතිය අනුව බැලු බැල්මට නඩු පැවරිය හැකි වරදක් එතැනදී කරලා තිබෙනවාද කියලා. ඉතින් වරදක් කරලා තිබෙනවා නම් වෙන මොනවා කරන්නද? මේ බොරු බිල්ලෙක් මවන්නේ.

මේ ජනාධිපතිවරණයේදී හොඳ දෙයක් මම දැක්කා. ප්‍රථම වතාවට ජාතිය, ආගම මත මිනිස්සු බෙදෙන්නේ නැතුව, පොදුවේ ශ්‍රී ලාංකිකයන්ට තිබෙන issues ගැන මේකේ කථා කරනවා. ඒකට සමහර අය කැමැති නැහැ. නමුත් එතැනට තමයි අපි යන්න ඕනෑ. මිනිස්සු කථා කරන්න ඕනෑ ලාංකීය ප්‍රශ්න. මිනිස්සු කථා කරන්න ඕනෑ පොදුවේ මේ රටේ ජනතාවට තිබෙන ප්‍රශ්න ගැන සහ ආර්ථිකය ගැන, corruption ගැන, වඩා දියුණු තාක්ෂණය ගෙනෙන්නේ කොහොමද කියන ඒවා ගැන. කාලයක් තිස්සේ - අවුරුදු 25ක් තිස්සේ- මේක උළාගෙන කාපු කට්ටියක් ඉන්නවා. ඒ ගොල්ලන් හැම වෙලාවේම කියන්නේ ජාතිය අනතුරේ, ආගම අනතුරේ කියලා. දැන් මේකෙන් තවත් අලුත් එකක් උස්සාගෙන. නමුත් ඇති දෙයක් නැහැ මේ කෙටුම්පතේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම මගේ කථාවට එන්නම්. අපි ඉතා ප්‍රගතිශීලි අලුත් පනත් කෙටුම්පතකුත් දෙවැනිවර කියවීම සඳහා අද ඉදිරිපත් කරලා තිබෙනවා. ඒක අපරාධ නඩු විධාන සංග්‍රහයට ගෙනෙන සංශෝධනයක්. මොකක්ද අපි මේකෙන් කරන්න බලාපොරොත්තු වෙන්නේ? නඩු කටයුතු කඩිනමින් අවසන් කිරීම සහතික වීම සඳහා අපරාධ නඩු කටයුතුවලදී ඵලදායී ලෙස යුක්තිය පසිඳලීමේ කාර්යය වෙනුවෙන් වරද පිළිබඳ එකඟතාවට පත් වීම සඳහා වූ නෛතික රාමුවක් හඳුන්වා දීම. වරද පිළිබඳ එකඟතාවකට පත්වීම සඳහා වූ ක්‍රියාවලිය යනු, චූදිතයකු නඩු විභාගයට පෙනී සිටීම වෙනුවට තමා වරදකරු බව පිළිගන්නා බවට චූදිත හා පැමිණිල්ල මෙහෙයවන නීතිඥවරයා අතර ඇති කර ගන්නා ගිවිසුමක් වන අතර, එහි ප්‍රතිඵලයක් ලෙස අඩු චෝදනාවක් සඳහා අවම දණ්ඩනයක්, දඩ මුදල් හෝ වන්දි මුදලක් ගෙවීම සඳහා නිර්දේශයක් ලබා ගන්න පුළුවන්. මෙමඟින් විනිශ්චයකාරවරුන්ට, විත්තියේ නීතිඥවරුන්ට, පැමිණිල්ල මෙහෙයවන නීතිඥවරයාට හා මහජනතාවට ප්‍රතිලාභ අත් කර ගන්න පුළුවන්. දඬුවම නියම කිරීම සම්බන්ධයෙන් විනිශ්චයකාරවරුන්ට ඇති පූර්ණ අභිමතය රඳවා තබා ගනිමින් අඩු කාලයකින් නඩු අවසන් කර ගැනීම මඟින් නඩු ගොඩගැසීම අවම කර ගත හැකියි. අපරාධ නඩු කඩිනමින් විසඳා ගැනීම, අධිකරණ කටයුතුවල ප්‍රමාදය අවම කර ගැනීම, සැලකිය යුතු මට්ටමින් පිරිවැය ඉතිරි කිරීම ආදිය තුළින් මහජනතාවට ප්‍රතිලාභ ලැබෙන අතර, ඒ තුළින් අපරාධ යුක්ති ක්‍රමය සම්බන්ධයෙන් විශ්වාසයද වර්ධනය වෙනවා.

නඩුවක් විභාග කිරීම හා වරද පිළිබඳ එකඟතාවට පත් වී එකී නඩුව අවසන් කිරීම සංසන්දනය කිරීමේදී වරද පිළිබඳ එකඟතාවට පත් වී නඩුවක් අවසන් කිරීම සඳහා අවම කාලයක් වැය කිරීම මත විනිශ්චයකාරවරුන්ට, පැමිණිල්ල මෙහෙයවන නීතිඥවරුන්ට සහ විත්තියේ නීතිඥවරුන්ට සැලකිය යුතු සම්පත් ප්‍රමාණයක් ඉතිරි කර ගන්නට හැකි වෙනවා මෙන්ම නඩු ගොඩගැසීමද ඒකෙන් අඩු වෙනවා. අපරාධ නඩු විසඳීම සම්බන්ධයෙන් වඩාත් ඵලදායී ක්‍රියාමාර්ගයක් වශයෙන් වරද පිළිබඳ එකඟතාවට එළැඹීම ලොව පුරා පිළිගැනීමට ලක් වී ඇත. ඊට අමතරව වරද පිළිගැනීමේ එකඟතාවට සමගාමීව නිකුත් කෙරෙන අවම දඬුවම් හේතුවෙන් බන්ධනාගාර තදබදයද අඩු කර

[ගරු ජනාධිපති නීතිඥ එම්.යූ.එම්. අලි සබ්රි මහතා]

ගැනීමේ හැකියාව තිබෙනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මහාධිකරණවල පමණක් අපරාධ නඩු 30,000කට වඩා ගොඩ ගැසී පවතින අතර, එක් නඩුවක් අවසන් කිරීම සඳහා වසර 12ක පමණ සාමාන්‍ය කාලයක් ගත වන තත්ත්වය තුළ වරද පිළිබඳ එකඟතාවට පත්වීමේ ක්‍රියාවලිය ශ්‍රී ලංකාව සම්බන්ධයෙන් බෙහෙවින් වැදගත් වේ.

දැන් නඩු 30,000ක් තිබෙනවා. මහාධිකරණයේ නඩුවක් අහන්න අවුරුදු 10ක්, 12ක් යනවා. මහාධිකරණයෙන් appeal එකක් ගන්නවා Court of Appeal එකට. Court of Appeal එකේ ඒක ඉවර වෙන්න අවුරුදු තුන හතරක් යනවා. ඊට විරුද්ධව Supreme Court එකට ගියාම, තව අවුරුදු ගාණක් යනවා. ඒ නිසා 1998, 1999, 2000, 2001 කරපු වැරදිවලට සමහර වෙලාවට දැන් තමයි දඬුවම් දෙන්නේ. නීතිය පිළිබඳ විශ්වාසය සම්පූර්ණයෙන්ම කැඩී යන දෙයක් ඒකෙන් සිද්ධ වන්නට පුළුවන්. ඒ සඳහා වඩාත් සුදුසු ක්‍රමය වන්නේ වරද පිළිබඳ එකඟතාවට පත් වීම සඳහා වූ නෛතික රාමුවක් හඳුන්වා දීමයි. මේ සංශෝධනය අනුව නඩු විභාගයට පෙනී සිටීම වෙනුවට වරද පිළිගැනීමේ එකඟතාවක් විත්තිය හා පැමිණිල්ල අතර ඇති කරනු ලබන අතර එහි ප්‍රතිඵලයක් ලෙස අඩු චෝදනාවක් සඳහා අවම දඬුවම, දඩ මුදල් හෝ වන්දි මුදල් සඳහා නිර්දේශයක් ලබා ගත හැක. මේ යෝජනා, සංශෝධන මඟින් අපරාධ නඩු ඵලදායී ලෙස විසඳා ගැනීමට හා වරද පිළිගැනීමේ එකඟතාව අනුව අවම දඬුවම් ලබා ගැනීම තුළින් බන්ධනාගාර තදබදයද අඩු කර ගැනීමට හැකියාව ඇත.

Hon. Deputy Speaker, plea agreements have proven to be the most effective way to resolve criminal cases worldwide. In addition, lower sentences tied to a plea agreement address prison overcrowding. Plea agreements are important in Sri Lanka, as there is a large backlog of cases, which results in High Court litigation lasting up to 10 to 12 years. The backlog will continue to mount unless some relief is provided. A plea agreement system would expect to provide that relief.

By the proposed Amendment, the accused person and the prosecution enter into an agreement, where the accused would plead guilty instead of going to trial, in consequence of which there may be reduced charges and recommendation for a lower sentence, fine or restitution amount. By the proposed Amendment, it is also expected to resolve the criminal cases in an effective manner, where lower sentences tied to plea agreement would also address prison overcrowding.

Sir, this is a matter that the Subcommittee on Criminal Law Reforms had been discussing for a long period of time. Only the cases which really need to go to trial should go to trial. Otherwise, it is a waste of time of the lawyers, a waste of energy of everyone involved in the process and at the end of the Day, everyone gets exhausted. Therefore, it is accepted worldwide that a plea agreement and a plea bargaining entered into at the beginning between the accused and the prosecutor, which would also be supported by the prosecutor, and presented to court would help resolve this situation. The court would look into that and the discretion to agree to the plea bargain is totally vested in the court. So, we have put so many safeguards in place in this law because in terms of our law, everyone is presumed innocent until and unless proven guilty. We understand that and have placed certain safeguards in this law to protect the rights of the accused also. However, if the accused, at one point in time, wants to plead guilty because he knows whether he has committed the crime or not and shorten his term, he should also be given some sort of an inducement or encouragement to do so without wasting time of the court and the prosecutor and public money so that more important matters could be taken up by the court. That is an accepted system and I think it will open up a new chapter in the Sri Lankan criminal justice system. I hope that would work well and address prison overcrowding and clear the backlog of cases in courts. So, that is the reason behind bring in this Code of Criminal Procedure (Amendment) Bill.

I must also say that we are proposing two Amendments to this Bill at the Committee Stage as there were some concerns expressed by the Sectoral Oversight Committee as well as by some lawyers that if you leave the whole thing without any indication to the judge, since the judge is not bound by the agreement entered into or the suggestion made both by the accused and the prosecutor, and if the judge disregards the whole thing and gives a higher sentence, the accused could be prejudiced.

Therefore, an Amendment has been proposed to say "(b) Notwithstanding the recommendation of the parties, the court shall retain the sole discretion in sentencing and discretion to indicate the sentence that may be imposed." So, before reaching a final decision, if the learned judge could indicate, "This is what I have in mind", the accused can either decide to go ahead with it or withdraw from that and fight his case. I think that is reasonable. I agree with that and considered it in all aspects. I spoke to the Attorney-General's Department and others and different views were expressed, but ultimately, I thought that in a criminal justice system, the right of an accused is very cardinal. If the accused is going to give up his right to defend himself expecting a reduction in his sentence, but if a routine judge gives a higher sentence, it could be damaging and also have a repercussion on the success of this entire law. Therefore, we have decided to introduce that Amendment during the Committee Stage.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද දින දෙවනවර කියවීම සඳහා අප ඉදිරිපත් කර තිබෙන තවත් පනත් කෙටුම්පතක් තමයි, විදේශ නඩු තීන්දු අන්‍යෝන්‍යව පිළිගැනීම, ලියාපදිංචි කිරීම සහ බලාත්මක කිරීම පිළිබඳ පනත් කෙටුම්පත. එය, වෙනත් රටවල අධිකරණවල නඩු තීන්දු ශ්‍රී ලංකාව තුළ අන්‍යෝන්‍යව පිළිගැනීම, ලියාපදිංචි කිරීම සහ බලාත්මක කිරීම සඳහා ද; (93 වන අධිකාරය වූ) විදේශ නඩු තීන්දු බලාත්මක කිරීමේ ආඥාපනත සහ (94 වන අධිකාරය වූ) නඩු තීන්දු අන්‍යෝන්‍යව බලාත්මක කිරීමේ ආඥාපනත ඉවත් කිරීම සඳහා ද; සහ ඒ හා සම්බන්ධ හෝ ඊට ආනුෂංගික කාරණා සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද වූ පනත් කෙටුම්පතක්. මම මීට පෙර අධිකරණ අමාත්‍යවරයා වශයෙන් පත් වූ අවස්ථාවකදී මේ සඳහා වෙන වෙනම නීති දෙකක් ගෙනෙන්න උත්සාහ කළා. එකක් තමයි, Reciprocal Enforcement of Foreign Judgments. ඒක සාමාන්‍ය දෙයක්. අපි ඒ සඳහා ජනාධිපති නීතිඥ මෛත්‍රී වික්‍රමසිංහ මැතිතුමා යටතේ වෙනම කමිටුවක් පත් කරලා තිබුණා. එතුමා ඒ වැඩ කරගෙන ගියා. අපි තවත් කමිටුවක් පත් කරලා තිබුණා, ජනාධිපති නීතිඥ කුෂාන් ද

අල්විස් මැතිතුමා යටතේ. ඒ, ශ්‍රී ලංකාවේ විවාහ නීතිය සංශෝධනය කිරීම සඳහා. ඒ සංශෝධනය අවශ්‍යයි කියලා හුඟක් අය කාලාන්තරයක් තිස්සේ කියනවා. ඒ අයටම භාර දීලා තිබුණා, විදේශීය දික්කසාද නඩු තීන්දුවලට අදාළ කාරණයත්. නමුත් ඊට පසුව, හිටපු අධිකරණ ඇමතිතුමා ධුරයට පත් වුණාට පස්සේ එතුමා මේ දෙකම එකතු කරලා එක නීතියක් හැටියට ගෙනැල්ලා තිබෙනවා. ඒ නීතිය 2024 ජූනි මස 10වැනි දා ගැසට් කරලා තිබුණා. ඒක තමයි අපි මේ ඉදිරිපත් කරන්නේ. මේ මඟින් අපට අවශ්‍යයි, පිට රටවල අධිකරණවල නඩු තීන්දු ලංකාවේ ලියාපදිංචි කරලා අන්‍යෝන්‍යව ක්‍රියාත්මක කරන්න. එහෙම නැතිව ආයෙත් නඩු කියලා ඇති වැඩක් නැහැ.

So, based on the views of several experts in the field concerned, a draft Bill was developed by the Department of Legal Draftsman and the draft Bill consists of several salient features. They are, one, providing provision for the recognition and registration of a judgment for the dissolution or annulment of a marriage or separation of parties to a marriage, only if such judgment is obtained in respect of a marriage registered under the Marriage Registration Ordinance. Two, providing ground to raise objection for recognition of a foreign judgment for the dissolution or annulment of marriage or separation. Three, specification of judgment to which the new law applies and specification of the procedure to be followed by a court of law in recognition and registering a judgment identified by the proposed law. So, this law had amalgamated both the laws on matrimonial judgments as well as on money decrease. The amalgamation of both those into one law and some of the restrictions that are there, I believe, are a progressive step and are better than what is there.

But, I also feel that there are so many other areas we could have included in this. However, since everything has already been done now and this is a progressive legislation than what is in existence, we will go ahead with it and in the meantime, we need to continue to revisit this legislation because with the inclusion of some other areas, I feel, it could be bettered. I also feel that having two different laws would have been ideal, one, as the matrimonial law and the other, as the law on money decrease because the provisions are different to each other. However, this legislation is good; it is a long-felt need. So many people of Sri Lankan origin who marry here, go and live in some other countries, when they have their matrimonial disputes, go to the courts in their respective countries and get themselves divorced or separated. However, when they come to Sri Lanka to get those divorces effected or deal with the consequences of those divorces such as getting child custody or taking over property, there has been no proper procedure as to how it should be done. So, this legislation will address those issues and will, of course, serve those who are in need of this law. If they had divorced in some other country, they can come to Sri Lanka, register the judgment and have it considered as a judgment of our court, of course, subject to the rules, regulations and the conditions in this law. Therefore, I feel this will help a large segment, particularly the Sri Lankan expatriate community and those who have been living outside Sri Lanka and who wants to come back to Sri Lanka. This is a harmless law and will only help resolve the current situation.

So, these two legislations will help us. The one relating to the criminal justice system will help us reduce the backlog of court cases and speed up resolving the issues. The other one is, of course, on the recognition and enforcement of foreign judgments. You all know that if there is a foreign judgment, it cannot be implemented here unless a court in Sri Lanka empowers that.

You have to register that and get it enforced. Enforcement of the judgment means, if you want to go and seize a property or a bank account or even give a minor child's custody to the other party, a court order is required. So, that is how this is going to help those people. This is a long-felt need. I identified this in the year 2000 and immediately appointed two Subcommittees to go into those two areas.

Hopefully, we will follow this up with other relevant laws, particularly the law relating to breakdown of the marriage principle because in Sri Lanka, we have stringent divorce laws, in terms of which you have to prove a matrimonial fault. Even if the two parties have not been living together for a long period of time, it is almost impossible to go to court and get a divorce by consent or by agreement because the Sri Lankan law states that your fault has to fall within one of those three grounds, that is, permanent impotence at the time of marriage, adultery or malicious desertion. More or less, 80 per cent of the divorce cases today do not fall into any of those grounds. It is just that the partners have fallen apart and do not want to live with each other. Therefore, because the law is such, people are being forced to and encouraged to go to court and lie or asked to give evidence that is not true in order to get the divorce. So, it is time for us to move away from that and come up with the law on breakdown of the marriage principle. That means, if over a period, for a year or two, you have not lived with each other and both concede that, then you could get the divorce. That is how the Sri Lankan law had been for a long period of time; the Sinhala law had been so. It is under the English law that we have introduced the marriage principle. Now, the countries which introduced those laws, including the UK, the Netherlands and all the other countries have moved away from those laws. We are the only people holding onto those. So, this is a good time for us to do that and we are in the final phase of presenting that legislation. I think once you introduce that, the duration of 80 per cent of the current divorce cases filed on the breakdown of the marriage principle, which, sometimes, would take such a long period of time to contest, could be cut short.

So, we will continue to introduce such laws. I think there are a number of laws in the pipeline, which are a culmination of the work we started in the latter part of 2020, as I took over as the Minister of Justice. We managed to revisit about 88 laws. There were about 29 Subcommittees that we had appointed. All that was possible because the members of the legal profession volunteered to take ownership of that work because they thought, "All this is part of our own law, it is for our own country and we must contribute to that". So, I am very thankful to all those who helped us in drafting these laws, particularly the Attorney-General's Department for

[ගරු ජනාධිපති නීතිඥ එම්.යූ.එම්. අලි සබ්රි මහතා]

incorporating those amendments and looking into the Bills at their different stages and also the Legal Draftsman's Department for cooperating with us in incorporate those amendments. We know that when you draft a law, it goes up and down and that it is not an easy task. Therefore, I thought it fit to mention them here and thank them: the Subcommittee members, the Ministry Officials, the Legal Draftsman, the Attorney-General, and all those who got involved in drafting these laws and submitting them for the betterment of our country.

One other important thing is, as I said earlier when the Commission for Truth, Unity and Reconciliation in Sri Lanka Bill was presented, we cannot be prisoners of the past forever; we cannot live in the past and find fault with each other. If you carefully look at the First and the Second World Wars, those were fought among the members of Europe. They were killing each other, fighting with each other and ultimately, they dragged the whole world into those. But, ultimately, after the Second World War, after about 10, 15 years, they realized that it is such a useless exercise to fight with each other and thought, "If we get together, what would be the possibilities?"

Then, the Schuman Plan was brought in. Schuman was a former French Foreign Minister. He brought that in the early 50s in order to create the European Union. Today, they work together as the European Union, as a result of which we all could see what Europe has managed to achieve in terms of the Human Development Index, money and everything. It is one of the wealthiest continents in the world. Most of the people in Sri Lanka want to go there, if they have the opportunity. Therefore, it is important that we are not guided by the past and do not become prisoners of the past. We must have a fresh look at what we ought to achieve here. If those different countries in Europe with different denominations and different people could come together and create the European Union, which now has their own laws in most areas, their own customs union, their own currency and trade facility, why cannot we not have that in this country because we are members of the same country? And we have a Constitution which ensures equality and also protects the unitary status of the nation. Therefore, subject to those limitations, we should not always use race, religion or division for our political advancement. If you cannot be in politics for any longer and there is no good reason for you to be there because people are getting united, you should leave politics rather than creating differences among the people. Therefore, it is important, while we respect each other, to create a country where all of us, irrespective of our race, religion and language could live in peace and with dignity. That would not come by just by holding on to something which happened 50, 200 or 300 years ago. Everyone had made mistakes, but we must move on. That moving on could be made with determination, hard work, by giving in, sharing and caring. I think that is how countries have developed. We only say that we want to be like Singapore, but we forget why Singapore is Singapore today. It is because they work as Singaporeans who respect your race, religion, language and culture; they respect each other and is like a platform which allows everybody to move on. I am extremely grateful that in this year's Presidential Election, nobody is taking notice of race, religion or language; people are talking about national issues. Some people are trying to twist all that and take advantage, but people are ignoring it. People want someone who can drive this country forward, develop this nation and who can give a better level of life for everyone while creating a safe and secure future.

It is a good step. I think we should build on that and not go backward on that. I know, some people will lose out on it because no longer, their divisive agenda is sellable and they are upset about it. But, as a country, we should be proud that people are coming together and are talking about national issues and not about racial, ethnic or other artificial issues which have divided us for such a long period of time.

Sir, I am also grateful that at the Committee on Parliamentary Business, we have agreed to pass these good laws without a Division. And, we will continue to come up with such other laws. Law is a process which continues to evolve. You need to have standing committees looking into all these laws because no law is perfect. If you wait for a perfect law to come, it would never come.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු ඇමතිතුමනි, ඔබතුමාට තව මිනිත්තු දෙකක කාලයක් තිබෙනවා.

**ගරු ජනාධිපති නීතිඥ එම්.යූ.එම්. අලි සබ්රි මහතා**
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி எம்.யூ.எம். அலி சப்ரி)
(The Hon. M.U.M. Ali Sabry, PC)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපි කවුරුවත් සම්පූර්ණයෙන්ම -

**ගරු ගෙවිඳු කුමාරතුංග මහතා**
(மாண்புமிகு கெவிந்து குமாரதுங்க)
(The Hon. Gevindu Cumaratunga)
ගරු ඇමතිතුමනි, ඔබතුමාගේ කථාවෙන් පස්සේ මම අහන ප්‍රශ්නයට උත්තරයක් දෙනවාද?

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු ගෙවිඳු කුමාරතුංග මන්ත්‍රීතුමනි, දිවා ආහාර විවේකය සඳහා සභාවේ කටයුතු අත්හිටුවන්න තව මිනිත්තු දෙකක කාලයක් පමණයි තිබෙන්නේ.

**ගරු ජනාධිපති නීතිඥ එම්.යූ.එම්. අලි සබ්රි මහතා**
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி எம்.யூ.எம். அலி சப்ரி)
(The Hon. M.U.M. Ali Sabry, PC)
ඔබතුමා මිනිත්තුවකින් කියන්න. මම උත්තර දෙන්නම්.

**ගරු ගෙවිඳු කුමාරතුංග මහතා**
(மாண்புமிகு கெவிந்து குமாரதுங்க)
(The Hon. Gevindu Cumaratunga)
බොහොම ස්තුතියි.

ගරු ඇමතිතුමනි, අද දින ඉදිරිපත් කළ ශ්‍රී ලංකාවේ සත්‍යය, සමගිය සහ ප්‍රතිසන්ධානය සඳහා වන කොමිෂන් සභාව පනත් කෙටුම්පතෙහි දඬුවම් දීමේ විධිවිධාන නැහැ කියලා ඔබතුමා කිව්වා. එතැන කාරණා දෙකක් තිබෙනවා. වරදක් කරලා තිබෙනවා නම්, ඊට දඬුවම් ලැබිය යුතුයි කියලා ඔබතුමා කිව්වා. හැබැයි, මේ පනත් කෙටුම්පතේ ඒක නැහැ, මම පිළිගන්නවා. හැබැයි, මේ පනත් කෙටුම්පතට අනුව අපරාධ සම්බන්ධ සාක්ෂි එකතු කරනවා.

ඔබතුමාම අද ගෙනාපු අනෙක් පනත් කෙටුම්පතෙන් විදේශ නඩු තීන්දු ලංකාවට අදාළ කර ගන්න ප්‍රතිපාදන තිබෙනවා. මේ සාක්ෂි මත පිට රටකදී නඩු දැම්මොත් ඒ නඩු තීන්දු අපට අදාළ වෙන්න අවශ්‍ය ඒ දෙක අතර සම්බන්ධය ඔබතුමන්ලා හදලා තිබෙනවා. එක පනත් කෙටුම්පතක ඒ තත්ත්වය නැහැ. අනෙක් පනත් කෙටුම්පතේ තිබෙනවා.

ඒ වාගේම මේකටත් උත්තර දෙන්න, ගරු ඇමතිතුමනි. 1983 ඉඳන් කරපු අපරාධ ගැන හොයනවා නම්, ඒ සාක්ෂි එකතු කරනවා නම්, වන්දි ගෙවනවා නම්, මේකෙන් 1988-89 කාලය අයින් කරලා තිබෙන්නේ ඇයි? 1988-89 කාලයේ කරපු අපරාධ මේ සත්‍යයට අදාළ නොවන්නේ ඇයි? ඒවාත් මිනිස් ජීවිත නොවෙයිද? ඒවා තරුණ ජීවිත නොවෙයිද? ඒ අම්මලා දුක් වෙන්නේ නැද්ද? ඇයි ඉතින් ඒ කාලය ඉවත් කරලා තිබෙන්නේ?

**ගරු ජනාධිපති නීතිඥ එම්.යූ.එම්. අලි සබ්රි මහතා**
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி எம்.யூ.எம். அலி சப்ரி)
(The Hon. M.U.M. Ali Sabry, PC)
ඔබතුමා මේක පටලවා ගෙන තිබෙන්නේ, ගරු මන්ත්‍රීතුමා. අද ගෙනාපු පනත් කෙටුම්පතෙන් කරන්න පුළුවන්, දික්කසාද නඩු අපේ රටේ ලියාපදිංචි කරන්න පුළුවන් එකයි. මුදල් අය කරන්න තිබෙන දේවල් සම්බන්ධයෙන් අපරාධ නඩු ගෙනෙන්න බැහැ. ප්‍රශ්නය අහන්න ඉස්සෙල්ලා පොඩ්ඩක් කියවන්න. ඔබතුමා ඒකයි, මේකයි පටලවා ගෙන. කුමන්ත්‍රණ තිබෙනවා කියලා හිතුවොත් හැම දේම පෙනෙන්නේ කුමන්ත්‍රණ විධියට. එහෙම කිසිම අදාළත්වයක් නැහැ.

දෙවැනි කාරණය මෙයයි. එම පනත් කෙටුම්පත මඟින් කිසිම නඩුවක් දාන්න බැහැ. වරදක් කළොත් සාමාන්‍ය නීතිය යටතේ දඬුවම් කරන්න එපා යැ. ඒක වරදක්ද? වරදක් කළොත් නිකම් ඉන්න පුළුවන්ද? ඒක නිසා මේකෙන් අපි සත්‍යය විතරක් සොයලා -

**ගරු ගෙවිඳු කුමාරතුංග මහතා**
(மாண்புமிகு கெவிந்து குமாரதுங்க)
(The Hon. Gevindu Cumaratunga)
1988-89 කාලය ගැනත් හොයන්න.

**ගරු ජනාධිපති නීතිඥ එම්.යූ.එම්. අලි සබ්රි මහතා**
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி எம்.யூ.எம். அலி சப்ரி)
(The Hon. M.U.M. Ali Sabry, PC)
1988-89 සිදුවීම්වලට අදාළව වෙනම කොමිෂන් දාලා තිබුණා; තරුණයන් සම්බන්ධයෙන් කොමිෂන් දාලා තිබුණා. අසහනවලට සහන ලබා දීලා තිබෙනවා. අපි ඒවා සීමා කරලා නැහැ. අපි මේක එක ජාතියකට පමණක් සීමා කරලා නැහැ. අපේ සිංහල මනුස්සයෙක් පීඩා විඳිනවා නම්, එයාටත් පුළුවන් මෙතැනට එන්න. මුස්ලිම් මනුස්සයෙකුටත් පුළුවන්. මේ පනත් කෙටුම්පත අපි එක එක ජාතිවලට අදාළව ගෙනෙන එකක් නොවෙයි. දෙමළ පක්ෂ කියනවා, මේක ජාත්‍යන්තරයේ මුහුණ වහන්න කරන දෙයක් කියලා. ඔබතුමන්ලා කියනවා රණවිරුවන්ට විරුද්ධ එකක් කියලා. ඒ දෙකම වැරැදියි.

ස්තුතියි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
දිවා ආහාර විවේකය සඳහා සභාවේ කටයුතු පස් වරු 1.00 දක්වා අත්හිටුවනවා.

***රැස්වීම ඊට අනුකූලව තාවකාලිකව අත්හිටුවන ලදින්, අ.භා. 1.00ට නැවත පවත්වන ලදී.***
*அதன்படி அமர்வு இடைநிறுத்தப்பட்டு, பி.ப. 1.00 மணிக்கு மீண்டுந் தொடங்கிற்று.*
*Sitting accordingly suspended till 1.00 p.m. and then resumed.*

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු මුජිබුර් රහුමාන් මන්ත්‍රීතුමා. ඔබතුමාට මිනිත්තු 9ක කාලයක් තිබෙනවා.

[අ.භා. 1.00]

**ගරු මුජිබුර් රහුමාන් මහතා**
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මට මේ අවස්ථාව ලබා දීම පිළිබඳව ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා. විශේෂයෙන්ම අද දිනයේ අපරාධ නඩු විධාන සංග්‍රහය (සංශෝධන) පනත් කෙටුම්පතත්, සේවකයන්ගේ ජාතික අවම වේතනය (සංශෝධන) පනත් කෙටුම්පතත්, තවත් පනත් කෙටුම්පතකුත් විවාදයට ගන්නවා. ඒ කරුණුත් එක්ක අද දිනයේ විශේෂයෙන්ම ජනාධිපතිවරණය පැවැත්වෙන කාලයක මේ පාර්ලිමේන්තුව පවත්වා ගෙන යන නිසා ඊට අදාළ කරුණු කිහිපයක් සභාව හමුවේ කථා කරන්න මා බලාපොරොත්තු වෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද තිබෙන විශාල ප්‍රශ්නය තමයි, ගුවන් ගමන් බලපත්‍ර ලබා ගැනීමට තිබෙන ගැටලුව. අදත් අපි දැක්කා, බත්තරමුල්ලේ තිබෙන ආගමන හා විගමන දෙපාර්තමේන්තුව ඉදිරියේ විශාල පෝලිම් තිබෙනවා. මේ පෝලිම් ඇති වුණේ දවසෙන් දෙකෙන් නොවෙයි. මේවා වැරදි කළමනාකාරිත්වය මත ඇති වෙච්ච දේවල්. අවසානයේ දී මේ රටේ ඉන්න අහිංසක ජනතාවට තමයි ඒ පෝලිම්වලට ගිහිල්ලා වන්දි ගෙවන්න සිද්ධ වෙලා තිබෙන්නේ. 2019දීත් මේක තමයි වුණේ. වැරදි පුද්ගලයෙක් බලයට ගෙනැල්ලා වැරදි තීන්දුවක් ගත්තා. එම නිසා සම්පූර්ණයෙන්ම ආර්ථික විනාශයක් රටේම ඇති වුණා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ වාගේම දෙයක් තමයි නැවතත් මේ සිදු වෙලා තිබෙන්නේ. ඒ සඳහා අපට පෙන්වන්න පුළුවන් හොඳම උදාහරණය තමයි මේක. ආගමන හා විගමන දෙපාර්තමේන්තුව මේ ගුවන් ගමන් බලපත්‍ර අවසාන වෙනවා කියන එක මීට මාස හයකට, අටකට කලින් දන්නා දෙයක්. ඒක දැනගත්තේ දවසින් දෙකෙන් නොවෙයි. එතකොට, මීට කලින්, ගුවන් ගමන් බලපත්‍ර දවසකට 2,000ක් විතර වාගේ නිකුත් කළා. ඒ වාගේම එක් දින සේවයෙන් සපයන ගුවන් ගමන් බලපත්‍ර සීමාවක් නැතිව නිකුත් කළා. එවැනි තත්ත්වයක් තුළ විශේෂයෙන්ම ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ ඉන්න ආගමන විගමන පාලක ජනරාල්තුමා, ඇමතිතුමා ඇතුළු මේ සියලුදෙනා දන්නවා, තවත් මාස තුන, හතරක් යනකොට තිබෙන ගුවන් ගමන් බලපත්‍ර අවසන් වෙනවා කියලා. ඇයි, මේ පිළිබඳව කලින් තීන්දු අරගෙන මේ ඇණවුම ලබා දෙන්න ඕනෑ නිසි ආයතනයට එය ලබා නොදී මේ කටයුත්ත ප්‍රමාද කළේ? ඒකයි මෙතැන තිබෙන ප්‍රශ්නය. ඇයි මේ කටයුත්ත ප්‍රමාද කළේ? මේක ප්‍රමාද කරන්න ඕනෑ දෙයක් නොවෙයි. ආගමන හා විගමන

[ගරු මුජිබුර් රහුමාන් මහතා]

දෙපාර්තමේන්තුවේ පාලක ජනරාල්වරයා මාස හයකට කලින් දන්නවා, තමන් ළඟ ගුවන් ගමන් බලපත්‍ර stock එක තිබෙන්නේ 50,000යි කියලා. ඒ 50,000ක stock එක තිබෙනකොට මේ ඇණවුම භාර දෙන්න තිබුණා. නමුත්, එය භාර දුන්නේ නැහැ. මොකද, ඇමතිතුමායි, ජනාධිපති ලේකම්වරයෙකුයි අතර ලොකු ආරවුලක් ගියා. කාටද මේක භාර දෙන්නේ, මොන සමාගමට ද භාර දෙන්නේ කියලා ප්‍රශ්නයක් මතු වුණා. ජනාධිපති ලේකම්තුමා රණ්ඩු වුණා, එතුමාට ඕනෑ හිතවතෙකුට මේ ඇණවුම භාර දෙන්න. අනෙක් පැත්තෙන් ඇමතිතුමා උත්සාහ කළා, ඇමතිතුමාට ඕනෑ කෙනෙකුට මේ ඇණවුම භාර දෙන්න. අන්තිමට කොහෙන්ද මේ ප්‍රශ්නය කෙළවර වුණේ? අන්තිමේ දී මිනිස්සු ඇවිල්ලා පාස්පෝර්ට් එක ගන්න අවශ්‍ය token එක ගන්න රෑ, දවල් නොබලා දවස් ගණන් පෝලිමේ ඉන්නවා. දැන් දවසකට issue කරන්න පුළුවන් ගමන් බලපත්‍ර 200යි. මේ තුළින් පෙනෙන්නේ මොකක්ද? රනිල් වික්‍රමසිංහ ජනාධිපතිතුමාගේ කළමනාකාරිත්වය බලාගන්න පුළුවන්, මේ Immigration and Emigration Department එකේ තිබෙන පෝලිම් දිහා බැලුවොත්. මේ වැරදි කළමනාකාරිත්වය නිසා ඇති වූ දේවල්. කළමනාකාරිත්වය බිංදුවයි. නැත්නම් පාස්පෝර්ට් 50,000ක් තිබියදී මේ තීන්දුව ගන්න බැරි වුණාද?පාස්පෝර්ට් ටික ඉවර වෙනකන් ඉන්න ඕනෑද මොන ආයතනයට ද මේ ඇණවුම භාර දෙන්නේ කියලා තීන්දු කරන්න? අන්තිමට මේවායේ වගකීම ගන්න කෙනෙකුත් නැහැ. අන්තිමට පොලීසිය දාලා ඒ මිනිස්සු ඔක්කෝම එළවනවා. මේ වාගේ දේවල්වලින් තමයි මේ රටේ, ලෝකයේ මිනිස්සු පාරට ඇවිල්ලා කෑ ගහන්නේ. ඉතින් මිනිස්සුන් පාරට ගෙන්වා ගන්න වැඩ කරන්නේත් පාලකයෝ තමයි. පාලකයෝ ගන්නා වැරදි තීන්දු නිසා මිනිස්සු එනවා පාරට. ඉතින් පාරට ආවාට පස්සේ කියනවා, ත්‍රස්තවාදීන්, අරවාදීන්, ප්‍රචණ්ඩකාරීන් කියලා. ජනතාව ප්‍රචණ්ඩත්වයට යොමු කරන්නේ පාලකයෝ. ඒකට හේතුව පාලකයන්ගේ අසමත්භාවය, නිවැරදි තීන්දු නොගැනීම. මම හිතනවා, ජනාධිපතිවරණයට කලින් අද රටේ තිබෙන තත්ත්වය ජනතාවට හොඳ උදාහරණයක් කියලා. අසමත්, නිසි කළමනාකාරිත්වයක් කර ගන්න බැරි, පාස්පෝර්ට් එකක් වෙලාවට දී ගන්න බැරි මෙවැනි අසමත් පාලකයන් නැවත මේ රටේ බලයට ගෙනෙනවාද කියන එක තමයි මේ පෝලිම් දිහා බැලුවාම ජනතාවට හිතෙන්නේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, තව කාරණයක් තිබෙනවා. රාජ්‍ය සේවකයන්ගේ මූලික වැටුප රුපියල් 17,500ක් කරන්න ආණ්ඩුව තීන්දු කරලා තිබෙනවා. සමගි ජන සන්ධානය හැටියට මම කියන්න කැමැතියි, අපි රාජ්‍ය අංශයේ මූලික වැටුප් වැඩි වීම රුපියල් 25,000කින් පටන් ගන්නවා කියලා. ඒක අපේ ප්‍රතිපත්ති ප්‍රකාශයට ඇතුළත් කරලා තිබෙනවා. මොකද, රුපියල් 17,500ක් කියන්නේ ඉතා සුළු මුදලක් කියලා අපට තේරෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ජනාධිපතිතුමා ජම්ඉයියතුල් උලමා සංවිධානයේ සාමාජිකයන් හම්බවෙන්න ගියාම කියනවා මම දැක්කා, කොවිඩ් කාලයේ මුස්ලිම් ජාතිකයන්ගේ මෘත දේහ ආදාහනය කිරීම සම්බන්ධයෙන් සොයා බලන්න විශේෂ කාරක සභාවක් පත් කරනවා කියලා. මම හිතන විධියට අදයි, හෙටයි, ජනාධිපතිවරණයට කලින් තව දවසක් පාර්ලිමේන්තුව රැස්වෙයි. එම නිසා මේ විශේෂ කාරක සභාව පත් කරන්නේ කවදාද කියන ප්‍රශ්නය මම ජනාධිපතිතුමාට යොමු කරන්න කැමැතියි. සාමාන්‍යයෙන් රනිල් වික්‍රමසිංහ මැතිතුමා ඔය වාගේ කමිටු පත් කරන්න හරිම දක්ෂයි. ප්‍රශ්න එනකොට මොකක් හෝ කමිටුවක් දමලා ප්‍රශ්නයෙන් පැනලා යනවා. ඊයේ-පෙරේදා මැතිවරණ වේදිකාවකදීත් කියනවා මම දැක්කා, වංචා දූෂණවලට සම්බන්ධ උදවිය අල්ලන්නත් කමිටුවක් දමනවා කියලා. කමිටු දමන්නේම වැඩේ නොකර ඉන්න. ඒ හින්දා වැරදිකාරයෝ කවුද කියලා හොයන්න විශේෂ කාරක සභාවක් පත් කරනවා කියලා එතුමා ජම්ඉයියතුල් උලමා සංවිධානයට ලබා දුන් වාචික පොරොන්දුව ගැන මම මේ වෙලාවේ එතුමාට කියනවා, පාර්ලිමේන්තුව පවත්වන්න තව තිබෙන්නේ දින කීපයක් හින්දා තවත් පමා නොකර වහාම එම විශේෂ කාරක සභාව පත් කරන්න කියලා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඊළඟ කාරණාව මෙයයි. ජනාධිපතිතුමා ඊයේ-පෙරේදා කියනවා මම දැක්කා, සජිත් ප්‍රේමදාස මහත්මයා උතුරු, නැඟෙනහිර ද්‍රවිඩ ඡන්ද හොරකම් කරන්න ගියා, ඒ හොරකම අහුවුණා කියලා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ජනාධිපතිතුමා මේ කථාව කියන්නේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ රැස්වීමකට ගිහිල්ලා. මේ වෙනකොට ශ්‍රී ලංකා නිදහස් පක්ෂයත් කැලිවලට කැඩිලා තිබෙනවා. විශේෂයෙන්ම රාජ්‍ය බලය උඩ යම් කණ්ඩායමක් ශ්‍රී ලංකා නිදහස් පක්ෂය කියලා කොටසක් අල්ලාගෙන ඉන්නවා. ශ්‍රී ලංකා නිදහස් පක්ෂය කඩලා, ඒකට රාජ්‍ය අනුග්‍රහය දක්වලා, අද ජනාධිපතිතුමාට උදව් කරන කණ්ඩායමේ රැස්වීමට ගිහිල්ලා තමයි එතුමා කියන්නේ, සජිත් ප්‍රේමදාස මැතිතුමා සහ අපි දෙමළ ඡන්ද හොරකම් කරන්න හදනවා කියලා. මොකද ජනාධිපතිතුමා හිතාගෙන හිටියා, උතුරේ සිටින ඇමතිවරයෙකුයි, නැඟෙනහිර පළාතේ සිටින රාජ්‍ය ඇමතිවරයෙකුයි, කරුණා අම්මාන්නුයි ළඟට ගත්තාම ද්‍රවිඩ ඡන්ද ටික ගන්න පුළුවන් කියලා. අද උතුරු, නැඟෙනහිර තිබෙන සමහර දේශපාලන පක්ෂ, සමහර ස්වාධීන අපේක්ෂකයන්ට සහයෝගය ලබා දෙනවා. ඒ වාගේම ඉලංගෛයි තමිල් අරසු කච්චි පක්ෂය පැහැදිලිවම කිව්වා, සජිත් ප්‍රේමදාස මැතිතුමාට සහයෝගය දෙනවා කියලා. ඉතින්, ඉලංගෛයි තමිල් අරසු කච්චි පක්ෂය සජිත් ප්‍රේමදාස මැතිතුමාට සහයෝගය දෙන එක හොරෙන් කරන එකක් නොවෙයි. එතුමන්ලා ඒ ගැන මාධ්‍යවලට ප්‍රකාශ නිකුත් කළා. ඉතින් ජනාධිපතිතුමා ඒකට කලබල වෙන්නේ ඇයි? ජනාධිපතිතුමා ඒකට කලබල වෙන්න අවශ්‍ය නැහැ. මොකද, ජනාධිපතිතුමාට වැඩ කරන්න ඒ ප්‍රදේශ නියෝජනය කරන ඇමතිවරයෙක් ඉන්නවා, නියෝජ්‍ය ඇමතිවරු ඉන්නවා. ඒ අය හරහා එතුමාට ද්‍රවිඩ ඡන්ද ටික ගන්න පුළුවන්. ඒ ගැන අපට ප්‍රශ්නයක් නැහැ. ජනාධිපතිතුමා හිතාගෙන සිටියා, උතුරු, නැඟෙනහිර one-horse race එකක් යන්න පුළුවන් කියලා. ඉලංගෛයි තමිල් අරසු කච්චි පක්ෂය සජිත් ප්‍රේමදාස මැතිතුමා දිනවන්න තීන්දු කරපු ගමන් ජනාධිපතිතුමා කලබල වෙලා කියනවා, අපි ද්‍රවිඩ ඡන්ද හොරකම් කරන්න හදනවා කියලා. අපට ද්‍රවිඩ ඡන්ද හොරකම් කරන්න ඕනෑ නැහැ.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට වෙන් වූ කාලය අවසන්.

**ගරු මුජිබුර් රහුමාන් මහතා**
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)
කාලය අවසන්ද? මට විනාඩි 20ක කාලයක් වෙන්වෙලා තිබුණා නේ.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ඔබතුමාට මිනිත්තු 9ක කාලයක් පමණයි තිබුණේ.

**ගරු මුජිබුර් රහුමාන් මහතා**
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)
ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මන්ත්‍රීතුමාට වෙන් වූ කාලය මට ලබා දෙන්න. මම ඒ ගැන එතුමාත් එක්ක කථා කළා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
එතුමාට වෙන් වූ කාලය ඔබතුමාට ලබා දෙනවා. එතුමාට මිනිත්තු 7යි වෙන්වෙලා තිබුණේ.

**ගරු මුජිබුර් රහුමාන් මහතා**
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)
ඒ කාලය මට ලබා දෙන්න.

උතුරු, නැඟෙනහිර ප්‍රශ්නය වෙනුවෙන් අපි ලබා දෙන විසඳුම පිළිබඳව අපි අපේ ප්‍රතිපත්ති ප්‍රකාශය තුළිනුත් පැහැදිලිව කියලා තිබෙනවා.

**ගරු (ආචාර්ය) සුරේන් රාඝවන් මහතා (උසස් අධ්‍යාපන රාජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு (கலாநிதி) சுரேன் ராகவன் - உயர் கல்வி இராஜாங்க அமைச்சர்)
(The Hon.(Dr.) Suren Raghavan - State Minister of Higher Education)
මොකක්ද ඒ විසඳුම?

**ගරු මුජිබුර් රහුමාන් මහතා**
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)
ඒකේ කියලා තිබෙනවා, අපි පළාත් සභා ක්‍රමය ක්‍රියාත්මක කරනවා කියලා. ජනාධිපතිතුමාගේ ප්‍රතිපත්ති ප්‍රකාශයේ ඒක නැහැ. ඒ වාගේම ජාතික ජන බලවේගයේ ප්‍රතිපත්ති ප්‍රකාශයේත් ඒක නැහැ. ජනාධිපතිතුමා කිව්වා, 2023 පෙබරවාරි මාසයේ 4වැනි දා වෙනකොට බලය බෙදා දීම තුළින් මේ රටේ ද්‍රවිඩ ජනතාවගේ ප්‍රශ්නය අවසන් කරනවා කියලා. තවදුරටත් මේ ප්‍රශ්නය තියන්නේ නැහැ කිව්වා. නමුත් කෝ එය කළාද? 2023 පෙබරවාරි 4වන දා නොවෙයි, දැන් 2024 වසරේ පෙබරවාරි 4වන දාත් ඉවරයි.

**ගරු (ආචාර්ය) සුරේන් රාඝවන් මහතා**
(மாண்புமிகு (கலாநிதி) சுரேன் ராகவன்)
(The Hon. (Dr.) Suren Raghavan)
Sir, I rise to a point of Order.

**ගරු මුජිබුර් රහුමාන් මහතා**
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)
මට බාධා කරන්න එපා. ඒක point of Order එකක් නොවෙයි නේ. *[බාධා කිරීමක්]* ඔබතුමා සම්බන්ධයෙන් නොවෙයි නේ මම කථා කළේ.

**ගරු (ආචාර්ය) සුරේන් රාඝවන් මහතා**
(மாண்புமிகு (கலாநிதி) சுரேன் ராகவன்)
(The Hon. (Dr.) Suren Raghavan)
නැහැ, නැහැ, මම ඒ කමිටුවේ ඉන්නවා.

**ගරු මුජිබුර් රහුමාන් මහතා**
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)
හරි, ඔබතුමා ඉඳගන්නකෝ. මට ප්‍රශ්නයක් නැහැ, ඔබතුමා කමිටුවල බැරිනම් ඕනෑ තැනක ඉන්න. මට බාධා කරන්නේ නැතුව ඔබතුමාගේ කථාවේදී උත්තර දෙන්නකෝ. *[බාධා කිරීම්]*

**ගරු (ආචාර්ය) සුරේන් රාඝවන් මහතා**
(மாண்புமிகு (கலாநிதி) சுரேன் ராகவன்)
(The Hon. (Dr.) Suren Raghavan)
පාර්ලිමේන්තු කමිටුවක් තිබෙනවා, බලය බෙදීම පිළිබඳව; දහතුන්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය පිළිබඳව. ගජේන්ද්‍ර කුමාර් පොන්නම්බලම් මැතිතුමා හැර අනෙක් සියලුදෙනා ඒ කමිටුවට සහභාගි වෙනවා. රජයේ පාර්ශ්වයෙන් ජනාධිපතිතුමා සහ අගමැතිතුමා සහභාගි වෙනවා. දෙමළ පක්ෂ අතර තවම අවසාන තීරණයක් නැහැ, දහතුන්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ගේන්නේ කොහොමද කියලා. ඒකයි ප්‍රමාදය. අසත්‍ය කියන්න එපා ජාතියට.

**ගරු මුජිබුර් රහුමාන් මහතා**
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම කිව්වේ මේ කාරණය. ජනාධිපතිතුමා මේ පාර්ලිමේන්තුවට ඇවිල්ලා ප්‍රකාශයක් කළා, 2023 පෙබරවාරි මාසයේ 04වැනි දාට කලින් මේ ප්‍රශ්නය විසඳනවා කියලා. නමුත් විසඳුවේ නැහැ. දැන් 2024 පෙබරවාරි 04වන දාත් පහු වෙලා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඊළඟ කාරණය මේකයි. මේ සභා ගර්භයේ ජනාධිපතිතුමාගේ ආසනයට වම් පැත්තේ ආසනයේ ඉන්න කෙනාම -අගමැතිතුමා- පළාත් සභාවලට විරුද්ධයි. අගමැති ගරු දිනේෂ් ගුණවර්ධන මැතිතුමා ළඟ තියාගෙන පළාත් සභා හරහා ජාතික ප්‍රශ්නය විසඳනවා කියන්නේම විහිළු කථාවක්. ඕවා හොඳයි නිකම් කථා කරන්න; ඕවා හොඳයි නිකමට කියන්න. මේ රටේ විනාශය ඇති කරපු අයත් එක්ක එකතු වෙලා ඒවා කරන්න බැහැ. ඒකයි අපි කියන්නේ. ජනාධිපතිතුමාගේ ඔළුවේ තිබුණාට වැඩක් නැහැ. ජනාධිපතිතුමා එක්ක එකතු වෙලා ඉන්න බලවේග මේවාට විරුද්ධයි. ඒ උදවිය මේවා ගැන කථා කරපු උදවිය.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, දැන් කථාවක් ගෙනියනවා සජිත් ප්‍රේමදාස මැතිතුමා ඇතුළු සමගි ජන බලවේගයේ අපි එක්සත් ජාතික පක්ෂයත් එක්ක එහෙම නැත්නම්,- *[බාධා කිරීමක්]*

ගරු චන්දිම වීරක්කොඩි මන්ත්‍රීතුමා එතුමාගේ වෙලාවත් මට ගන්න කිව්වා. දැන් කථාවක් ගෙනියනවා, අපි ජනාධිපතිතුමා එක්ක එකතු වෙනවා කියලා. ජනාධිපතිතුමා එක්ක අපි මොකටද එකතු වෙන්නේ? අපි 2020දී සමගි ජන බලවේගය කියලා පක්ෂයක් හදාගෙන අලුත් දේශපාලන මතවාදයක් අරගෙන අලුත් නායකයෙක් එක්ක පාර්ලිමේන්තු මන්ත්‍රී ආසන 53ක් ලබා ගත්තා. අපි පාර්ලිමේන්තු මන්ත්‍රී ආසන 53ක් ලබාගෙන අද ප්‍රධාන විපක්ෂය හැටියට කටයුතු කරනවා. මේ ජනාධිපතිවරණයේ සියලු අපේක්ෂකයන්ට වඩා සජිත් ප්‍රේමදාස මැතිතුමා ඉදිරියෙන් ඉන්නවා කියන එක සියලුදෙනාම පිළිගෙන තිබෙනවා. හැම සමීක්ෂණ වාර්තාවකම තිබෙනවා, සජිත් ප්‍රේමදාස මැතිතුමා තමයි ඉදිරියෙන් ඉන්නේ කියලා. ඒ ප්‍රතිශතය සියයට පහකින්ද, සියයට එකකින්ද, සියයට දෙකකින්ද, සියයට දහයකින්ද කියන එක වැඩක් නැහැ. එහෙම තිබියදී අපි මොකටද රනිල් වික්‍රමසිංහ මහත්මයාත් එක්ක එකතු වෙන්නේ? අපට එහෙම අවශ්‍යතාවක් නැහැ. රනිල් වික්‍රමසිංහ මහත්මයා අපටත් ඇමතිකම් දෙන්න, එක එක දේවල් දෙන්න යෝජනා කළා. අපි පැහැදිලිව කිව්වා, ඔබතුමා එකතු වෙලා ඉන්නේ මේ රටේ ආර්ථිකය විනාශ කරපු කණ්ඩායමක් එක්ක කියලා. ඉතින්, ඒ කණ්ඩායමත් එක්ක එකතු වෙලා අපට රනිල් වික්‍රමසිංහ මහත්මයාත් එක්ක ගමනක් යන්න ඕනෑ නැහැ. අද මේ රටේ සියලු ජන කොටස් සමගි ජන බලවේගය ප්‍රමුඛ සමගි ජන සන්ධානයත් එක්ක එකතු වෙලා ඉන්නවා.

[ගරු මුජිබුර් රහුමාන් මහතා]

එහෙම තිබියදී අද ජනතා විමුක්ති පෙරමුණ කියනවා, අපි එකතු වෙලා ඉන්නවා කියලා. මම කියන්න කැමතියි, එහෙම එකතු වෙන්න අපේ ඔළුව මක්කුං වෙලා නැහැ කියලා. සමහර විට ජනතා විමුක්ති පෙරමුණට ආසාවක් ඇති, අපි රනිල් වික්‍රමසිංහ මහත්මයාත් එක්ක යන එකට. ඒගොල්ලන්ගේ හිතේ එහෙම බලාපොරොත්තුවක් ඇති. අපේ හිතේ නම් එහෙම බලාපොරොත්තු නැහැ. මොකද, ජනතා විමුක්ති පෙරමුණත් ඉතින් කාලයෙන් කාලයට එක එක අයත් එක්ක ගිය කට්ටිය නේ. ඒගොල්ලන් මහින්ද රාජපක්ෂත් එක්ක ගියා; චන්ද්‍රිකාත් එක්ක ගියා. මහින්ද රාජපක්ෂගේ බලය ගොඩනහන්න විශාල වැඩ කොටසක් කළා. ඒගොල්ලන් එහෙම කටයුතු කළා. නමුත් අපට එහෙම කටයුතු කරන්න අවශ්‍යතාවක් නැහැ.

අද සමගි ජන බලවේගයට රනිල් වික්‍රමසිංහ එක්ක යන්න හෝ වෙන කා එක්ක යන්න හෝ වුවමනාවක් නැහැ. අද මේ රටේ ප්‍රධාන දේශපාලන පක්ෂ ප්‍රවාහය තුළ රටේ ජනතාවගේ විශ්වාසය දිනා ගන්න පුළුවන් නායකයා බවට සජිත් ප්‍රේමදාස මැතිතුමා පත් වෙලා ඉන්නවා. සමාජ මාධ්‍ය තුළ මේ දේශපාලන නායකයන්ම, ඒ කියන්නේ ජනාධිපතිවරණ අපේක්ෂකයන්ම කියන්නේ, *[බාධා කිරීමක්]* - ඇයි, කලබල වෙන්නේ? කලබල වෙන්න වුවමනාවක් නැහැ. තව සති දෙකයි ජනාධිපතිවරණයට තිබෙන්නේ. ජනාධිපතිවරණ ප්‍රතිඵල එනකම් ඉන්න. නිකම් බොරුවට අපි අරයා එක්ක එකතු වෙනවා, මෙයා එක්ක එකතු වෙනවා කියලා අපට මඩ ගහනවා. අපි රනිල් වික්‍රමසිංහ එක්ක යනවා නම් එක එක්කෙනා ආසා ඇති. රනිල් වික්‍රමසිංහ එක්ක ඩීල් තිබෙන කට්ටිය තමයි ඒවා කියන්නේ. රනිල් වික්‍රමසිංහත් එක්ක ඊට ඊට ගනුදෙනු කරන කට්ටිය තමයි අපි -සමගි ජන බලවේගය- රනිල් එක්ක යනවා කියන්නේ. එහෙම යන්න ඕනෑ නැහැ, සමගි ජන බලවේගයට. අද මේ රටේ සියලු ජන කොටස්වල කැමැත්ත, සහයෝගය සමගි ජන බලවේගයට ලැබිලා තිබෙනවා. අද පේදුරුතුඩුවේ සිට දෙවුන්දර තුඩුව වෙනකම් සියලු ජන කොටස් සජිත් ප්‍රේමදාස මැතිතුමා පිළිගෙන තිබෙනවා. අද මේ ජනාධිපතිවරණය තුළ මහ පොළොවේ යථාර්ථය අපට පේන්න තිබෙනවා. මම කථා කරන්නේ Facebook එකේ තිබෙන යථාර්ථය ගැන නොවෙයි. මහ පොළොවේ තිබෙන යථාර්ථය අනුව කරපු සමීක්ෂණවලින් ලැබිලා තිබෙන තොරතුරු අනුව මේ රේස් එකේ ඉදිරියෙන්ම ඉන්නේ සජිත් ප්‍රේමදාස මැතිතුමායි.

එහෙම තිබියදී ඔය කියන විධියේ වැඩ කරන්න අපේ මොළය කොලොප්පම් වෙලාවත්, එහෙම නැත්නම් මොළය අවුල් වෙලාවත් නැහැ. ඒ වාගේම අපට එහෙම කරන්න කිසිම අවශ්‍යතාවකුත් නැහැ. ඒ නිසා අපි ඒවා තරයේ ප්‍රතික්ෂේප කරනවා. එවැනි කථා කියන අයටත් අපි කියනවා, ඔය වාගේ බොළඳ විශ්වාස තබාගෙන ඉන්න එපා කියලා. තමුන්නාන්සේලාට තිබෙන දේශපාලන දැනුම ඒවා තුළින්ම පෙනෙනවා. ජනාධිපති අපේක්ෂකයෝ ඇවිල්ලා මේ ගැන ජනතාව ඉදිරියේ කියනවා නම්, ඔවුන්ගේ දැනුම ගැන ජනතාවට හිතා ගන්න පුළුවන්; ඔවුන්ට තිබෙන දැනුමේ ප්‍රමාණය හා දේශපාලන අත්දැකීම් ගැන ජනතාවට හිතා ගන්න පුළුවන්.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද සැප්තැම්බර් මාසයේ 03වැනි දා. අපි සියලුදෙනා දන්නවා, ජනාධිපතිවරණයට තව තිබෙන්නේ සති දෙකකට ආසන්න කාලයක්, වැඩිම වුණොත් දවස් 18ක වාගේ කාලයක් බව. අපි පක්ෂයක් හැටියට මේ රටේ ජනතාවට අපේ ප්‍රතිපත්ති ප්‍රකාශනය ඉදිරිපත් කරලා තිබෙනවා. වංචාව හා දූෂණය පිළිබඳව, අපි ගන්නා වූ ඉදිරි ක්‍රියා මාර්ග පිළිබඳව, රාජ්‍ය සේවය පිළිබඳව, මේ රටේ පාඩු ලබන ආයතන පිළිබඳව, මේ රටේ ජනතාවගේ සුබසාධනය පිළිබඳව අපේ ප්‍රතිපත්ති ප්‍රකාශනයෙන් පැහැදිලිවම ජනතාවට කරුණු කියලා තිබෙනවා. ඒ කරුණු මත ඉදිරිපත් කරලා තිබෙන ප්‍රතිපත්ති ප්‍රකාශනවලින් තමන්ට පිළිගන්න පුළුවන් කාගේ ප්‍රතිපත්ති ප්‍රකාශනයද කියන එක වාගේම තමන්ට පිළිගන්න පුළුවන් හොඳ කණ්ඩායමක් ඉන්න පක්ෂය මොකක්ද කියාත් මේ රටේ ජනතාවට තේරුම් ගන්න පුළුවන්. ඒ නිසා, අද සජිත් ප්‍රේමදාස මැතිතුමා එක්ක ඉන්න කණ්ඩායමට අභියෝග කරන්න පුළුවන් කණ්ඩායමක් ඉන්නවාද? ජනාධිපතිතුමා එක්ක ඉන්න කණ්ඩායම කවුද? ජනාධිපතිතුමා එක්ක ඉන්න කණ්ඩායමෙන් භාගෙට භාගයක් උසාවිවල නඩු තිබෙන අය; වැරදි තීන්දු ගත්ත උදවිය; මේ රටට බාල පොල් තෙල් ගෙනාපු උදවිය.

**ගරු (ආචාර්ය) සුරේන් රාඝවන් මහතා**
(மாண்புமிகு (கலாநிதி) சுரேன் ராகவன்)
(The Hon. (Dr.) Suren Raghavan)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම රීති ප්‍රශ්නයක් අහනවා. න්‍යාය පත්‍රය අනුව නම් අද තිබෙන්නේ, විදේශ නඩු තීන්දු අන්‍යෝන්‍යාව පිළිගැනීම, ලියාපදිංචි කිරීම සහ බලාත්මක කිරීම පිළිබඳ පනත් කෙටුම්පත, අපරාධ නඩු විධාන සංග්‍රහය (සංශෝධන) පනත් කෙටුම්පත හා සේවකයන්ගේ ජාතික අවම වේතනය (සංශෝධන) පනත් කෙටුම්පත පිළිබඳව කථා කිරීමටයි. එහෙම නැතුව, ඊළඟ ජනාධිපතිවරණයේදී දිනන්නේ කවුද කියලාවත්, සංඛ්‍යාලේඛනවත්, කාගේවත් ප්‍රකාශ පිළිබඳවවත් නොවෙයි අද කථා කරන්නේ. ඒ නිසා අනන්‍යතාව තබාගෙන, න්‍යාය පත්‍රය අනුව කටයුතු කරමින්, මට වඩා දන්නා මේ ගරු මන්ත්‍රීතුමා ඒ ඒ විධියට කටයුතු කළ යුතුයි කියලා මම මතක් කරන්න කැමැතියි. කරුණාකරලා, come back to the topic. We are debating something important and this is not a debate on who is going to win. - *[Interruption.}*

**ගරු මුජිබුර් රහුමාන් මහතා**
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)

Hon. Deputy Speaker, I am speaking about the topic. I am clearly talking about the crimes that happened in the past in this country. So, you must understand that my speech is related to the Bill that has been presented to this House; you must understand that.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම කථා කරමින් සිටියේ අපරාධ නඩු විධාන සංග්‍රහය (සංශෝධන) පනත් කෙටුම්පතට අදාළ වන කරුණු කාරණා පිළිබඳවයි. පසු ගිය කාලයේ බාල බෙහෙත් ගෙනාවා. ඒ වෙනුවෙන් ගත්ත පියවර මොකක්ද? බාල බෙහෙත් දාලා මිනිස්සුන්ගේ ඇස් අන්ධ වුණා. සමහර මිනිස්සුන්ගේ ජීවිත නැති වුණා. ඊළඟට, සීනි බදු වංචාවෙන් රුපියල් මිලියන 15,000ක විතර මුදලක් ආණ්ඩුවට අහිමි වුණා. ඊළඟට බාල පොල් තෙල් ගෙනාවා. සුදු ලූනු ගෙනාවා. සුදු ලූනු ගෙනැල්ලා කන්ටේනර් පිටින් පුච්චලා දැම්මා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, චීනයෙන් අසූචි පොහොර ගෙනාවා. ඔබතුමන්ලා ඇමෙරිකානු ඩොලර් මිලියන 6.9ක් චීන්නුන්ට ගෙව්වා. කෝ, ඒ මුදල් ටික ආපසු ගත්තාද? මට කියන්න, ඒ ඩොලර් මිලියන 6.9 ගෙව්වේ කවුද කියලා? දැන් ඒ හිටපු ඇමතිතුමා ඉන්නේ ජනාධිපතිතුමා එක්ක නොවෙයිද? ඒ මුදල් ආපහු ගන්න පුළුවන් වුණාද? ගත්තේ නැහැ නේ. ඔබතුමන්ලා හිතුවා, මේ ඉන්නේ කොණ්ඩේ බැඳපු චීන්නු කියලා. ඩොලර් මිලියන 6.9ක් ගෙව්වා; ආපු පොහොර නැවත් ආපසු හරවා යැව්වා. මේගොල්ලන් හිතාගෙන හිටියේ කොණ්ඩේ බැඳපු චීන්නු තමයි ඉන්නේ කියලා. චීනා අන්තිමට පොහොර ටිකත් ගෙන්වා ගත්තා; ඩොලර් මිලියන 6.9කුත් ගත්තා. චීනා අපට පොල්ල තිබ්බා. ඒ වෙනුවෙන් ගත්ත නීතිමය පියවර මොකක්ද?

කියන්නකෝ, නඩු දැම්මාද? දැන් නැඟිටලා කථා කරපු උසස් අධ්‍යාපන රාජ්‍ය ඇමතිතුමා කියන්නකෝ, ඒ චීන සමාගමට නඩු දැම්මාද කියලා?*[බාධා කිරීමක්]* නඩු දැම්මේ නැහැ. ඉතින්, මේවා අපරාධ නේ. මේවා ගැන තමයි අපි කථා කරන්නේ. මොකද, නඩු දමන්න බැරි? *[බාධා කිරීමක්]* මේවා තමයි අපරාධ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඊළඟට VSF ගනුදෙනුව පිළිබඳවත් කථා කරන්න මම කැමතියි. ඒක මහ දවල් වෙච්ච වංචාවක්. මේ රටේ ආණ්ඩුවට ලැබෙන්න ඕනෑ රුපියල් කෝටි 90,000ක මුදලක් කොහේදෝ ඉන්න විදේශීය සමාගමකට දීලා, ඇමෙරිකානු ඩොලර් 25 ගණනේ විදේශිකයෙකුගෙන් අය කර ගන්න තමුන්නාන්සේලා කැබිනට් මණ්ඩලයේ අනුමැතිය අරගෙන දුන්නා. හැබැයි, ශ්‍රේෂ්ඨාධිකරණය ඒ ගනුදෙනුව නැවැත්වූවා.

ඒක මහා වංචාවක්. මේ වාගේ අපරාධ කරපු, අපරාධ නඩු දමන්න ඕනෑ පිරිසක් තමයි ජනාධිපතිතුමාගේ campaign එකේ ඉන්නේ. ඒ ඔක්කොම මේ අපරාධ නඩු විධාන සංග්‍රහය පනතත් එක්ක සම්බන්ධ වනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. මම මේ කියපු හැම ගනුදෙනුවකම තිබෙන්නේ මේ රටේ ජනතාවගේ බදු මුදල්. මේ ඔක්කොම ජනතාවගේ බදු මුදල්. මේ බදු මුදල් එක්කයි ඔබතුමන්ලා සෙල්ලම් කළේ.

**ගරු (ආචාර්ය) සුරේන් රාඝවන් මහතා**
(மாண்புமிகு (கலாநிதி) சுரேன் ராகவன்)
(The Hon. (Dr.) Suren Raghavan)
දැන් නම් කථා කරනවා.

**ගරු මුජිබුර් රහුමාන් මහතා**
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)
ඔව්, මම කලිනුත් කිව්වේ ඒක තමයි.

**ගරු (ආචාර්ය) සුරේන් රාඝවන් මහතා**
(மாண்புமிகு (கலாநிதி) சுரேன் ராகவன்)
(The Hon. (Dr.) Suren Raghavan)
නැහැ, නැහැ.

**ගරු මුජිබුර් රහුමාන් මහතා**
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)
මොකද නැත්තේ? ඔබතුමා හිටියේ වෙන ලෝකයක. ඒක හින්දා ඔබතුමාට ඒක තේරුණේ නැහැ. ඔබතුමා හිටියේ රනිල් වික්‍රමසිංහ මහත්මයාගේ ලෝකයේ. දැන් තමයි, ඔබතුමා පියවි ලෝකයට ආවේ. මගේ කථාවෙන් පස්සේ.

**ගරු (ආචාර්ය) සුරේන් රාඝවන් මහතා**
(மாண்புமிகு (கலாநிதி) சுரேன் ராகவன்)
(The Hon. (Dr.) Suren Raghavan)
නැහැ, නැහැ.

**ගරු මුජිබුර් රහුමාන් මහතා**
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)
නැත්තේ මොකද? ඔබතුමා පියවි ලෝකයට ආවේ දැනුයි. මේ සභාවට එනකොටම මම දැන ගත්තා, ඔබතුමා ඇවිල්ලා නිකම් වාඩි වෙලා ඉන්නේ නැහැ මොනවා හෝ කියවනවා කියලා. *[බාධා කිරීමක්]* අනෙක් මන්ත්‍රීවරු ඔක්කොම සද්ද නැතිව අහගෙන ඉන්නවා.*[බාධා කිරීමක්]*

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ඔව්, ගරු සුරේන් රාඝවන් රාජ්‍ය ඇමතිතුමා.

**ගරු (ආචාර්ය) සුරේන් රාඝවන් මහතා**
(மாண்புமிகு (கலாநிதி) சுரேன் ராகவன்)
(The Hon. (Dr.) Suren Raghavan)
දැන් එතුමාට දීලා තිබෙන කාලය තුළ කථා කරන්න දෙයක් නැති නිසා මාත් එක්ක විවාදයකට යන්න උත්සාහ කරනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. මෙච්චර වෙලා අපි COPF Meeting එකේ වාඩි වෙලා හිටියා. ඊට පස්සේ මහ බැංකුවේ නිලධාරින් විසින් ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රගති වාර්තාව ඉදිරිපත් කළා. ඔයගොල්ලන්ට ඒක නොවෙයි අවශ්‍ය කරන්නේ. ජාතියේ වැදගත්කම නොවෙයි අවශ්‍ය කරන්නේ. ඊළඟ ඡන්දය දිනලා ඇමති කෙනෙක් වෙනවාද නැද්ද කියන එකයි. එ් පටු දේශපාලනයේ මම නැති බව ඔබතුමා හොඳටම දන්නවා. වෘත්තිකයෙක් හැටියට මම දායක වෙන්නේ මේ රටේ අනාගතය පිළිබඳවයි.

**ගරු මුජිබුර් රහුමාන් මහතා**
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)
ගරු රාජ්‍ය ඇමතිතුමනි, අපට ඇමතිකම් ලොකුයි නම් ජනාධිපතිතුමා අගමැති වෙච්ච වෙලාවේ අඬගහපු ගමන් අපි යනවා. ජනාධිපති වුණාම අඬගහපු ගමන් යනවා, අපට ඇමතිකම් ලොකු නම්. අපි ඇමතිකම් බලාගෙන දේශපාලනය කරන්න ආවේ නැහැ. ඊට වඩා වෙනස් දේශපාලන අදහසක් මතයි අපි ආවේ. දේශපාලනමය වශයෙන් මේ රටේ විශාල පරිවර්තනයක් කරන්න ඕනෑය කියන එක තමයි අපේ මූලික අදහස. ඒ හින්දා මතක තබා ගන්න, අපි ඇමතිකම්වලට දේශපාලනය කරන මිනිස්සු නොවෙයි කියන එක. ඔබතුමා ජනාධිපතිතුමා එක්ක ගියා, රාජ්‍ය ඇමතිකමක් දීපු නිසා. හැබැයි, අපි එහෙම යන්නේ නැහැ. ශ්‍රී ලංකා නිදහස් පක්ෂයෙන් ආපු ඔබතුමාට අන්තිමට රාජ්‍ය ඇමතිකමක් දුන්නා, ඔබතුමා ගියා.

**ගරු (ආචාර්ය) සුරේන් රාඝවන් මහතා**
(மாண்புமிகு (கலாநிதி) சுரேன் ராகவன்)
(The Hon. (Dr.) Suren Raghavan)
මම කියන්නම්, මම කියන්නම්.

**ගරු මුජිබුර් රහුමාන් මහතා**
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)
මොකක්ද කියන්න යන්නේ? *[බාධා කිරීමක්]* මොකක්ද කියන්නේ?

**ගරු (ආචාර්ය) සුරේන් රාඝවන් මහතා**
(மாண்புமிகு (கலாநிதி) சுரேன் ராகவன்)
(The Hon. (Dr.) Suren Raghavan)
මම චන්ද්‍රිකා මහත්මිය එක්ක වැඩ කළා. මම මෛත්‍රීපාල මහත්මයා එක්ක වැඩ කළා. මම ගරු මහින්ද රාජපක්ෂ මහත්මයා එක්ක වැඩ කළා. මම ගෝඨාභය මහත්මයා එක්ක වැඩ කළා. මම දැන් රනිල් මහත්මයා එක්ක වැඩ කරනවා. මට ඒක කියන්න ලජ්ජා නැහැ. ඇයි, මම එහෙම කළේ? පක්ෂයක්, පාටක් වෙනුවෙන් නොවෙයි, මගේ මව් රට වෙනුවෙන් වැඩ කරන ප්‍රතිපත්තියක් මත. ඔබතුමා වුණත් හෙට බලයට ආවොත් මම ඔබතුමා එක්කත් වැඩ කරන්න ලැහැස්තියි. මට බලය නොවෙයි අවශ්‍ය වෙන්නේ. මම ඉපදුණු මේ රට ඉස්සරහට ගෙනියන්නේ කොහොමද කියන ප්‍රතිපත්තියයි මට අවශ්‍ය වෙන්නේ. ඒක මතක තබා ගන්න.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු මුජිබුර් රහුමාන් මන්ත්‍රීතුමා, ඔබතුමාට තව මිනිත්තු තුනක් තිබෙනවා.

**ගරු මුජිබුර් රහුමාන් මහතා**
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)
හොඳයි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

ගරු රාජ්‍ය ඇමතිතුමනි, ඒවා අභ්‍යන්තර ප්‍රශ්න. මෛත්‍රීපාල මැතිතුමාගේ ප්‍රශ්න, ඔබතුමාගේ ප්‍රශ්න අපට අදාළ නැහැ. ඒවා ඔක්කොම ඔබතුමන්ලාගේ පක්ෂයේ internal politics. ඒවා ඔබතුමන්ලා විසඳා ගන්න ඕනෑ. මේ සභාවට ඇවිල්ලා අපට ඒවා කියලා වැඩක් නැහැ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම මුල ඉඳන්ම කිව්වේ මේකයි. අද මේ රටේ බලාපොරොත්තු වන වෙනස කරන්න පුළුවන් කණ්ඩායම ඉන්නේ සමගි ජන බලවේගයේ සජිත් ප්‍රේමදාස මැතිතුමා එක්කයි. ඒ හින්දා තමයි ඒ කණ්ඩායමට අද නොයෙකුත් ආකාරයේ අවලාද නඟන්න, මඩ ගහන්න හැම කෙනාම උත්සාහ කරන්නේ.

මම තමුන්නාන්සේලාට තව කාරණයක් කියන්න කැමැතියි. විශේෂයෙන්ම ජනාධිපතිවරණයට තව දවස් 18ක වාගේ කාලයක් ඉතුරු වෙලා තිබෙනවා. ඒ දවස් 18ක කාලය තුළදී මේ රටේ සියලු ජන කොටස්වල විශ්වාසය දිනාගත් නායකයා බවට අද සජිත් ප්‍රේමදාස මැතිතුමා පත් වෙලා ඉන්නවා. ඒ විශ්වාසය කඩන්න විපක්ෂයේ ඉන්න කණ්ඩායම්, ආණ්ඩු පක්ෂයේ ඉන්න කණ්ඩායම් ප්‍රචාරය කරනවා, අපි රනිල් වික්‍රමසිංහ මහත්මයා එක්ක එකතු වෙන්න යනවාය කියලා. අපි මොකටද රනිල් වික්‍රමසිංහ මහත්මයා එක්ක එකතු වෙන්න යන්නේ? රනිල් වික්‍රමසිංහ මහත්මයා ඡන්දය ඉල්ලන්නේ දිනන්න නොවෙයි. රනිල් වික්‍රමසිංහ මහත්මයාව කවුරු හරි අන්දලා තිබෙනවා දිනනවා කියලා. එතුමා දිනන්නේ නැහැ කියලා දන්නවා. එතුමා ඡන්දය ඉල්ලන්නේ අනුර කුමාරව දිනවන්න. ඒක අපි දන්නවා.

ඒක තමයි එතුමාගෙයි, අනුර කුමාර දිසානායක මන්ත්‍රීතුමාගෙයි ඩීල් එක. ඒක අපි නොදන්නවා නොවෙයි. බලන්නකෝ, ඇන්දාම ලස්සනට හිටපු රනිල් වික්‍රමසිංහ මහත්තයාගේ ෂර්ට් එකත් තමුන්නාන්සේලා ගැලෙව්වා නේ. ගලවලා වෙන ෂර්ට් එකක් ඇන්දුවා නේ. බලන්න, එතුමා අද ඉන්න විධිය. හරියට රෝහිත අබේගුණවර්ධන මන්ත්‍රීතුමා අඳින ෂර්ට් එක වාගේ එකක් එතුමාට අන්දවලා තිබෙනවා. කෝ, අලියා ලකුණ? අද අලියාත් නැහැ. සිරිකොතේ අලියාත් නැහැ. අලියා ගලවලා දැන් මලකඩ කාපු ගෑස් ටැංකියක් දාලා තිබෙනවා. පිස්සු වැඩ නේ. කොහොම තිබුණු පක්ෂයක්ද ඒ? මොන තරම් ප්‍රතාපවත්ව තිබුණු පක්ෂයක්ද ඒ? අන්තිමට ඒ පක්ෂයම බින්දුවට බැස්සුවා නේ. රනිල් වික්‍රමසිංහ මහත්තයාට පොහොට්ටුවේ කට්ටිය කිව්වා, එනවා නම් අලියා අත හරින්න ඕනෑ, ෂර්ට් එක මාරු කරන්න ඕනෑ කියලා. මේ යන විධියට ගියොත් හෙට අනිද්දා වනකොට එතුමාගේ කලිසමත් මාරු කරවයිද දන්නේ නැහැ. ඒ මනුස්සයා නැති කරලා දැම්මා. ඉතින්, කොහොමද ඡන්දය දිනන්නේ? ඡන්දය දිනන්න බැහැ. රනිල් වික්‍රමසිංහ මහත්තයා අන්දවනවා. එතුමා අඳින ෂර්ට් එක වෙනුවට වෙන ෂර්ට් එකක් අන්දවලා තිබෙනවා. ඒක අන්දවලා තිබෙන්නේ ඒක ඇන්දොත් දිනනවා කියලා. ඒ ෂර්ට් එක ඇන්දා කියලා මිනිස්සු ඡන්දය දෙයිද? අලියා ලකුණත් නැති කළා. ඔක්කොම විනාශ කළා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මොන තරම් අවලාද නැඟුවත්, මොන දේ කිව්වත් සමගි ජන බලවේගය, සන්ධානය මෙවර ජනාධිපතිවරණයෙන් ජයග්‍රහණය ලබනවා. ඒ ජයග්‍රහණය ඔය මඩවලින්, එක එක අවලාදවලින් නතර කරන්න බැහැ කියන කාරණයත් කියමින්, මට මේ කාලය ලබා දීම ගැන ඔබතුමාට ස්තුතිවන්ත වෙමින් මම නිහඬ වෙනවා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු වඩිවේල් සුරේෂ් රාජ්‍ය අමාත්‍යතුමා. ඔබතුමාට මිනිත්තු 19ක කාලයක් තිබෙනවා.

[1.25 p.m.]

**ගරු වඩිවේල් සුරේෂ් මහතා (කම්කරු රාජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு வடிவேல் சுரேஷ் - தொழில் இராஜாங்க அமைச்சர்)
(The Hon. Vadivel Suresh - State Minister of Labour)
Hon. Deputy Speaker, today, we are debating the National Minimum Wage of Workers (Amendment) Bill to increase the minimum wage of the private sector employees.

Sir, this Bill, the Second Reading of which is scheduled to be taken up, proposes Amendments to the National Minimum Wage of Workers Act, No. 3 of 2016. The primary goal of this Amendment is to raise the current national minimum wage for private sector employees from Rs. 12,500 to Rs. 17,500. More than three million of the Sri Lankan workforce is currently employed in the private sector.

Presently, several key legal frameworks are in place to determine wages of these workers. Notably, wages are set by the decision of the Wages Boards established under the Wages Boards Ordinance, No. 27 of 1941. Additionally, wages are also set through collective agreements between employers and employees. Sir, the Wages Boards Ordinance determines wages only to industries for which Wages Boards have been established. Currently, Wages Boards have been set for 44 such industries. However, the decisions of the Wages Boards do not cover all the employees in the private sector in Sri Lanka.

Prior to the National Minimum Wage of Workers Act, No. 03 of 2016, wages for employees, particularly of those who were covered under the Shop and Office Employees (Regulation of Employment and Remuneration) Act, were primarily determined through agreements made at the time of recruitment of employees. Although unionized workers have been able to get their wages raised, the majority of the private sector workers are unable to negotiate with their employers to get their wages increased. In addition to that, the high rate of unemployment and prevalence of unskilled workers further hinder their ability to negotiate for better salaries upon hiring. That is why the Government intervened through legal provisions to protect these vulnerable workers by mandating wage increases.

Sir, for the first time in Sri Lanka, the national minimum wage for all employees working in the private sector was introduced through a statutory law effective from 1st January, 2016. Initially, that set a minimum monthly wage of Rs. 10,000 for workers and a minimum of Rs. 400 for daily-wage workers and that amount was set based on the official Poverty Line of Rs. 6,117 at that time. By an Amendment to this Act in 2021, the minimum monthly wage was increased from Rs. 10,000 to Rs. 12,500 and the daily wage from Rs. 400 to Rs. 500, effective from August, 2021. Currently, the private sector employers are required to pay a minimum monthly wage of Rs. 16,000 to workers, which includes the national minimum wage of Rs. 12,500 and the budgetary allowance of Rs. 3,500, as mandated by the Budgetary Relief Allowance of Workers Act, No. 36 of 2005 and the Budgetary Relief Allowance of Workers Act, No. 4 of 2016.

Sir, due to the recent economic crisis, the cost of living has increased significantly. Yet, there has been no corresponding raise in the minimum wage of the private sector employees since 2021. It has been observed that many employers currently pay a minimum wage of Rs. 16,000 to employees in the security service, cleaning service and small shops and offices. This amount is insufficient, given the current cost of living. According to the Department of Census and Statistics, the Official Poverty Line has risen to Rs. 16, 326 by May, 2024. This indicates that the national minimum wage for private sector employees is below the Official Poverty Line.

Sir, this Amendment aims to raise the current monthly national minimum wage from Rs. 12,500 to Rs. 17, 500 and the daily minimum wage from Rs. 500 to Rs. 700. With this increase, the employers will be legally required to pay a minimum of Rs. 21,000 to the private sector employees, which includes the increased Rs. 17,500 and the Budgetary Relief Allowance of Rs. 3,500. Raising the national minimum wage to Rs. 21,000 is also likely to increase the contribution percentage to the Employees' Provident Fund and the Employees' Trust Fund, which have been established for workers' social security. Additionally, employers will be legally required to base workers' gratuity calculation on this new minimum wage, resulting in higher gratuity payments for employees. This Amendment is both timely and essential. Therefore, I call on everyone to lend their support for the approval of this Amendment.

கௌரவ பிரதிச் சபாநாயகர் அவர்களே, மலையகத்திலும் நாட்டின் ஏனைய பகுதிகளிலும் இருக்கின்ற பலர் இன்று தனியார்துறையிலே - கடைகளிலும் தொழிற்சாலைகளிலும் - கடமையாற்றி வருகின்றார்கள். அவர்களின் குறைந்தபட்ச சம்பளம் 12,500 ரூபாயிலிருந்து 17,000 ரூபாயாக அதிகரிக்கப்படுகின்றது. அதாவது, அடிப்படைச் சம்பளம் 5,000 ரூபாயினை அதிகரிப்பதோடு, வரவு செலவுத் திட்டத்திலே நிர்ணயிக்கப்பட்ட 3,500 ரூபாய் கொடுப்பன வையும் சேர்த்து குறைந்தபட்ச சம்பளமாக 21,000 ரூபாயினை ஒரு தோட்டத் தொழிலாளி அல்லது வேறு தொழில் செய்பவர்கள் பெற வேண்டும் என்பதைத் தொழில் அமைச்சின் மூலமாக நாங்கள் சட்டபூர்வமாக முன்வைக்கின்றோம். இது சம்பந்தமாக, தொழில் அமைச்சின் Sectoral Oversight Committeeயிலே கலந்துரையாடப்பட்டிருக்கிறது. ஆகவே, ஒவ்வொரு வேலைதருநரும் கம்பனி அல்லது கடைச் சொந்தக் காரர் ஒவ்வொருவரும் இதனை ஏற்றுக்கொள்ள வேண்டி யிருக்கும். அந்த விடயத்தைச் சட்டபூர்வமாக்குவதற்கான நடவடிக்கை எடுக்கப்பட்டிருக்கின்றது. தொழில் இராஜாங்க அமைச்சராகப் பொறுப்பேற்ற குறுகிய காலகட்டத்திலே எனக்குக் கிடைத்த பாரியதொரு வரப்பிரசாதமாகவும் பாக்கியமாகவும் இதனை நான் கருதுகின்றேன்.

அந்தத் தொழிலாளர் வர்க்கத்தைச் சார்ந்தவன் என்ற வகையிலே, அவர்களுடைய சம்பள உயர்வு சம்பந்தமாக இன்றுகூட சம்பள நிர்ணய சபை கூடி ஆராய்ந்து கொண்டிருக்கின்றது என்ற விடயத்தைக் கூற வேண்டும். அந்த வகையில், தனியார்துறையில் வேலை செய்யும் அனைத்துத் தொழிலாளர்களினதும் சம்பளத்தை அரசாங்கம் அதிகரிப்ப தென்பது வரவேற்கத்தக்கதாக இருக்கின்றது. ஆகவே, இந்த சம்பள உயர்வு சட்டமாக்கப்பட்டு, அனைத்து தனியார் தொழிலாளர்களுக்கும் அதனைப் பெற்றுக்கொள்ளக்கூடிய ஏற்பாடுகள் மேற்கொள்ளப்பட்டிருக்கின்றன. அது தவிர, அந்தத் தொழிலாளர்களுக்குரிய ஊழியர் சேமலாப நிதி - EPF, ETF and gratuity என அனைத்தும் உள்ளடங்கலாக பாரியதொரு தொழில் பாதுகாப்பு - தொழில் காப்புறுதி - இதிலே உறுதி செய்யப்படுகின்றது என்பதையும் நான் இந்தச் சந்தர்ப்பத்திலே தெரிவித்துக் கொள்கின்றேன்.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ පනත් කෙටුම්පත ගැන කථා කරන මේ අවස්ථාවේ මම ස්තුතිවන්ත වෙනවා, අදාළ Sectoral Oversight Committee එකටත්, මීට ඉස්සෙල්ලා කම්කරු ඇමති විධියට කටයුතු කරපු ගරු මනූෂ නානායක්කාර මැතිතුමාටත්, අපේ අමාත්‍යාංශයේ ලේකම්තුමාටත්, කම්කරු කොමසාරිස්තුමා ඇතුළු අනික් සියලු නිලධාරින්ටත්. මොකද, සේවකයන්ගේ ජාතික අවම වේතනය (සංශෝධන) පනත් කෙටුම්පත ගෙනැල්ලා තිබෙන්නේ සේවකයන් සඳහා ජාතික අවම මාසික වේතනය සහ අවම දෛනික වේතනය වැඩි කරන්නයි. අවම මාසික වේතනය - the minimum wage - රුපියල් 12,500 සිට රුපියල් 17,500 දක්වා රුපියල් 5,000කින් වැඩි කරනවා කියලා මේ පනත් කෙටුම්පතේ කියලා තිබෙනවා. Budgetary allowance එක වන රුපියල් 3,500ත් එනකොට සාමාන්‍යයෙන් අඩුම පඩිය රුපියල් 21,000ක් ලැබෙනවා. ඒ කියන්නේ, කඩවල වැඩ කරන, factoriesවල වැඩ කරන, පෞද්ගලික ආයතනවල වැඩ කරන සාමාන්‍ය සේවකයෙකුටත් රුපියල් 21,000ක් ලැබෙනවා කියන එක. එතකොට රුපියල් 17,500කට EPF, ETF සහ gratuity ලැබෙනවා. ඇත්තටම කම්කරු පන්තියට විතරක් නොවෙයි, පිට වැඩ කරන සේවකයන්ටත්, පෞද්ගලික ආයතනවල වැඩ කරන සේවකයන්ටත් ලොකු ගෞරවයක් මේ රජය තුළින් ලබා දීලා තිබෙනවා. මේ වෙනුවෙන් බොහෝ නිලධාරින්, දේශපාලනඥයන් -මැති ඇමතිවරුන්- සහයෝගය ලබා දීලා තිබෙනවා.

කම්කරු රාජ්‍ය ඇමති හැටියට කෙටි කාලයක් තුළ පාර්ලිමේන්තුවට මෙය ඉදිරිපත් කරන්න මටත් භාග්‍යයක් ලැබිලා තිබෙනවා. කම්කරු පන්තියෙන් ආපු කෙනෙක් හැටියට මම ඒ ගැන සන්තෝෂ වෙනවා. වතුකරයේ ජනතාවගේ පඩි සම්බන්ධයෙන් පඩි පාලක සභාවේ සාකච්ඡාවක් මගේ අමාත්‍යාංශයෙන් මේ වන විටත් කරගෙන යනවා. ඒ සම්බන්ධවත් සවස් වෙනකොට ජනතාව දැනුවත් කරන්න අපි සූදානම් වෙනවා.

බොහොම ස්තුතියි. நன்றி! வணக்கம்!

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

ගරු ගෝවින්දන් කරුණාකරම් මන්ත්‍රීතුමා. ඔබතුමාට මිනිත්තු 7ක කාලයක් තිබෙනවා.

[பி.ப. 1.36]

**ගරු ගෝවින්දන් කරුණාකරම් මහතා**
(மாண்புமிகு கோவிந்தன் கருணாகரம்)
(The Hon. Govindan Karunakaram)

கௌரவ பிரதிச் சபாநாயகர் அவர்களே, இன்று குற்றவியல் நடவடிக்கைமுறைச் சட்டக்கோவை (திருத்தம்) சட்டமூலம் மீதான விவாதமும் நடைபெறும் வேளையில், நான் எமது அரசியலமைப்பை மீறும் குற்றவாளிகள் சம்பந்தமாகவே பேச விழைகின்றேன். ஜனாதிபதித் தேர்தல் நடைபெறவிருக்கின்ற நிலையில், பாராளுமன்றத்தில் உரையாற்றுவதை நான் பெருமையாக நினைக்கின்றேன். இந்த ஜனாதிபதித் தேர்தல் வட, கிழக்கு மக்களுக்கு மாத்திரமல்ல, தென் பகுதி மக்களுக்கும் பல உண்மைகளை வெளிப்படுத்தும் நிலையை ஏற்படுத்தியுள்ளது. ஆகவே, இவ்வுரையாற்றுவதில் எனக்கு மகிழ்வாகும். அதாவது, நடைபெறவிருக்கின்ற ஜனாதிபதித் தேர்தலும் அது தொடர்பான பரப்புரைகளுமே எனது இன்றைய உரைக்குக் காரணமாகும். அந்த வகையில், இது எனக்கு மகிழ்வளிக்கும் தருணமாகும்.

மாகாண சபைத் தேர்தல் இதுவரை ஏன் நடத்தப்படவில்லை? அதற்கான காரணம் என்ன? ஆளும் கட்சியின் தேர்தல் தோல்விப் பயமா? இல்லை, அதற்கிடையில் ஏற்பட்ட சட்டச் சிக்கலா? அப்படியாயின், அந்தச் சட்டச் சிக்கல் ஏற்படுவதற்குக் காரணம் என்ன? அதற்கு யார் காரணம்? என்பது பற்றியெல்லாம் இந்த நேரத்தில் நான் பேச விரும்பவில்லை. 1987ஆம் ஆண்டு கைச்சாத்திடப்பட்ட இந்திய - இலங்கை ஒப்பந்தத்தின் பிரகாரம் இலங்கை அரசியலமைப்பின் 13ஆவது திருத்தமாக எமது சட்டவாக்க மீயுயர் சபையான பாராளுமன்றத்தால் முறைப்படி நிறைவேற்றப்பட்டு எமது அரசியலமைப்பின் பிரிக்கமுடியாத ஒரு பாகமாக மாகாண சபைகள் அமைந்துள்ளது. எமது நாட்டின் ஜனாதிபதி, பிரதமர், பாராளுமன்ற உறுப்பினர்கள் அனைவரும் தமது பதவிப் பிரமாண வைபவத்தின்போது, இலங்கை ஜனநாயக சோசலியக் குடியரசின் அரசியலமைப்புக்குப் பற்றுறுதியோடு பணிபுரிவதாகவும் அதற்கு விசுவாசமாக இருப்பதாகவும் அரசியலமைப்பை உறுதியாகக் காப்பதாகவும் உறுதியுரை செய்து பதவியேற்கின்றார்கள். இந்த உறுதியுரையை இதுவரை ஆட்சி செய்த ஆட்சியாளர்கள் கடைப்பிடித் துள்ளார்களா? அவ்வாறு கடைப்பிடித்திருந்தார்களாயின் இந்த நாட்டில் பொருளாதாரப் பிரச்சினை தோற்றம் பெற்றிருக்காது; நீண்ட வரிசைகள் - queue - உதயமாகியிருக்காது. ஏன், 'அரகலய'கூட ஏற்பட்டிருக்காது. மக்களால் தெரிவு செய்யப்பட்ட அரசுத் தலைவரும் பிரதமரும் பின் கதவால் ஓடி ஒளிந்துகொள்ளும் தேவையும் வந்திருக்காது. நீண்ட காலமாக மாகாண சபைத் தேர்தல்கள் நடத்தப்படவில்லை. வட மாகாண சபைத் தேர்தல் 2018ஆம் ஆண்டு நடைபெற்றிருக்க வேண்டும். கிழக்கு மாகாண சபைத் தேர்தல் 2017ஆம் ஆண்டு நடைபெற்றிருக்க வேண்டும். அதையண்மித்த காலங்களில் தென் மற்றும் ஏனைய மாகாண சபைத் தேர்தல்களும் நடைபெற்றிருக்க வேண்டும். ஆனால், மாறிமாறி வந்த ஆட்சியாளர்கள் மாகாண சபைத் தேர்தல் தொடர்பாக அக்கறையற்றவர்களாகவே இருந்தனர். இதற்கு ஆளும் கட்சி மாத்திரமல்ல, எதிர்க்கட்சிகளும் பொறுப்பேற்க வேண்டும்.

கௌரவ பிரதிச் சபாநாயகர் அவர்களே, கடந்த காலத்தில் உள்ளூராட்சி சபைத் தேர்தல் தொடர்பாகத் தேர்தல் பிரகடனம் செய்யப்பட்டு, வேட்பு மனுக்கள் கோரப்பட்டு, அதன் பின்னர் அரசாங்கத்தின் தோல்விப் பயத்தைப் பின்னால் வைத்து, பொருளாதாரப் பிரச்சினையை முன்னால் வைத்து அத்தேர்தல் ஒத்திவைக்கப்பட்டது. இந்தத் தேர்தல் ஒத்திவைப்புத் தொடர்பாக நாட்டின் எதிர்க்கட்சிகளும் சிவில் அமைப்புக்களும் அரச சார்பற்ற நிறுவனங்களும் வெகுசன ஊடகங்களும் காட்டிய அக்கறையில் ஒரு துளியையேனும் மாகாண சபைத் தேர்தல்கள் தொடர்பாகக் காட்டவில்லை. இதற்கான காரணம், மாகாண சபை அமைப்பும் மாகாண சபைத் தேர்தலும் இலங்கை அரசியலமைப்பின் பிரிக்க முடியாத அம்சம் என்பதைவிட, அது வடக்கு, கிழக்குத் தமிழ் மக்களுடைய பிரச்சினை என்பதாகவே தென்பகுதி அரசியல் கட்சிகளும் தென்பகுதி ஊடகங்களும் தென்பகுதி மனித உரிமை அமைப்புகளும் அரச சார்பற்ற நிறுவனங்களும் கருதுகின்றமையாகும்.

உள்ளூராட்சித் தேர்தல் ஒத்திவைக்கப்பட்டமை தொடர்பாகத் தங்களது அடிப்படை உரிமை மீறப்பட்டதாக நீதி கோரி உச்ச நீதிமன்றம் சென்ற அரசியல் கட்சிகள், மனித உரிமைச் செயற்பாட்டாளர்கள் மாகாண சபைத் தேர்தல் நடத்தப்படாததால் தங்களது அடிப்படை உரிமை மீறப்பட்டதாக உணரவில்லை. எதற்கெடுத்தாலும் சட்ட வியாக்கியானம் கொடுக்கும் சட்டவியலாளர்கள் இதன்மூலம் தமது அடிப்படை உரிமைகள் மீறப்பட்டதாக உணரவில்லை. மாகாண சபைத் தேர்தல் நடத்தப்படாமை தொடர்பாகச் சட்டத்தரணிகள் சங்கமும் மூச்சுவிடவில்லை. ஏனென்றால், மாகாண சபை என்பது வடக்கு, கிழக்குத் தமிழர் தொடர்பான பிரச்சினை என்பதுவே இவர்கள் அனைவரதும் கருத்துருவாக்க மாகும். இது எமது அரசியலமைப்பின் ஒரு பகுதி என்பது இவர்களால் உணரப்படவில்லை. தமிழில் ஒரு பழமொழி யுள்ளது, "தனக்குத் தனக்கென்றால் சுளகு படக்கு படக்கு என்று அடிக்குமாம்" என்று. இது யாருக்குப் பொருந்துமோ தெரியாது. ஆனால், தென்பகுதி அரசியல் தலைவர்களுக்குச் சாலப் பொருந்தும்.

ஜனாதிபதித் தேர்தல் சூறாவளியும் வேட்பாளர்களது விஞ்ஞாபனமும் வெளிவந்துவிட்டது. வேட்பாளர்களின் பரப்புரைகள் வேகமாக நடக்கின்றன. அவர்களுடைய விஞ்ஞா பனமும் பரப்புரையும் என்னை வியக்க வைக்கின்றது. 1987ஆம் ஆண்டு கொண்டுவரப்பட்ட பதின்மூன்றாவது அரசியலமைப்புச் சீர்திருத்தம் எமது அரசியலமைப்பின் பிரிக்க முடியாத அங்கமாக மாறியது. ஆனால், அதனை முழுமையாக அமுல்படுத்துவதில் இந்த நாட்டின் அரசுகளும் அதனை அமுல்படுத்த வலியுறுத்துவதில் இங்குள்ள எதிர்க்கட்சிகளும் அக்கறை காட்டவில்லை. 1948இன் சுதந்திரத்துக்குப் பின்னரான எமது நாட்டின் அரசியல் வரலாற்றில் நாம் நோக்கக்கூடிய விசேட அம்சம் என்னவென்றால், ஆளும்கட்சி எத்தகைய திட்டங்களைக்கொண்டு வந்தாலும், அது மக்கள் நலன் சார்ந்த திட்டங்களாக இருந்தாலும்கூட, பல்வேறு வியாக்கியானங்களைக் கூறி அதனை எதிர்ப்பதே எதிர்க்கட்சி களின் சம்பிரதாயக் கடமையாக இருப்பதுதான். ஆனால், எமது அரசியலமைப்பின் பதின்மூன்றாவது திருத்தத்தை முழுமையாக அமுல்படுத்தாது, அதனை எவ்வாறு கருவில் அழிக்கலாம், எவ்வாறு குறைப் பிரசவமாக்கலாம் என்பதில் மட்டும் ஆளும் கட்சிக்கும் எதிர்க்கட்சிக்குமிடையில் எழுதப்படாத புரிந் துணர்வு ஒப்பந்தம் உள்ளதா? என்ற ஐயம் எனக்கு உள்ளது.

எதிர்வரும் ஜனாதிபதித் தேர்தலில் போட்டியிடும் வேட்பாளர்களின், குறிப்பாகச் சுயேட்சை வேட்பாளர் ரணில் விக்கிரமசிங்ஹ, ஐக்கிய மக்கள் சக்தி வேட்பாளர் சஜித் பிரேமதாஸ, இன்று தேசிய மக்கள் சக்தியாக முகம் காட்டும் அன்றைய ජනතා විමුක්ති පෙරමුණ வேட்பாளர் தோழர் அநுர

குமார திஸாநாயக்க ஆகியோரது விஞ்ஞாபனத்தில் வடக்கு, கிழக்கு வாழ் தமிழ் மக்களது பிரச்சினைகள் தொடர்பாகக் குறிப்பிடப்பட்டிருப் பவைகளையும் வடக்கு, கிழக்கில் அவர்களது பிரசாரங்களையும் அவதானிக்கும்போது நான் உண்மையில் எனது உடம்பைக் கிள்ளிப் பார்க்கிறேன்; எனது கேட்கும் திறனைச் சந்தேகிக்கின்றேன். இவர்களது உரைகளைப் பத்திரிகைகளில் வாசிக்கும்போது எனது கட்புலனை ஐயுறுகின்றேன். அந்தளவுக்கு இவர்களது தேர்தல் விஞ்ஞாபனங்களும் தேர்தல் பரப்புரைகளும் அமைந்துள்ளன. பதின்மூன்றாவது அரசியலமைப்புச் சீர்திருத்தம் தொடர்பான இவர்களது பரப்புரைகள் மற்றும் தேர்தல் விஞ்ஞாபனங்களில் குறிப்பிட்டுள்ளவைகள் தொடர்பாக, குறித்த அரசியலமைப்புச் சீர்திருத்தம் ஏற்பட்ட 1987ஆம் ஆண்டிலிருந்து இதுவரை இவர்களது கட்சி மாநாடுகளிலோ அல்லது பாராளுமன்றத்தில் வடக்கு, கிழக்குப் பிரச்சினைகள் தொடர்பான விவாதங்கள் நிகழ்கின்றபோதோ தமது உரைகளில் எதையாவது கூறியுள்ளார்களா? ஏதோ நேற்றுத்தான் பதின்மூன்றாவது அரசியலமைப்புச் சீர்திருத்தம் கொண்டுவரப்பட்டது போன்றும் நாளை அதனை அமுல்படுத்துவதாகவும் தமது பரப்புரைகளிலும் தேர்தல் விஞ்ஞாபனத்திலும் இவர்கள் குறிப்பிடுவதிலிருந்து நாம் இவர்களைப் பற்றிப் பூரண தெளிவடைந்துள்ளோம்.

இத்தகைய சூழ்நிலையில்தான், வெல்ல முடியாதெனத் தெரிந்தும் எமது பொதுப் பிரதிநிதியாக முன்னாள் பாராளு மன்ற உறுப்பினர் ஒருவரை வடக்கு, கிழக்குவாழ் தமிழ் மக்களின் ஏகோபித்த ஆதரவுடன் ஜனாதிபதி வேட்பாளராக நிறுத்தியுள்ளோம் என்பதை இன்று தென்னிலங்கைசார் அரசியல் கட்சிகளும் ஜனாதிபதி வேட்பாளர்களும் புரிந்து கொள்ள வேண்டும்.

இதற்கு முன்னர் நடந்த ஜனாதிபதித் தேர்தல்களில் வட, கிழக்குவாழ் தமிழர்கள் ஒன்றிணைந்து பொது வேட்பாளரை நிறுத்தவில்லை. வட, கிழக்குவாழ் தமிழர்கள், தமிழ்த் தேசியத்தின்பால் ஆதரவுகொண்ட அன்றைய தலைவர் விஜய குமாரணதுங்கவின் மனைவி சந்திரிகா பண்டாரநாயக்க குமாரதுங்க அவர்களை 'சமாதானப் பறவை' என ஆதரித்தார்கள்; அவர் வெற்றி பெற்றார். அவ்வாறே மைத்திரிபால சிறிசேன அவர்களை ஆதரித்தார்கள்; அவர் வென்றார். கோட்டாபய ராஜபக்ஷ அவர்களை வட, கிழக்கு மக்கள் ஆதரிக்கவில்லை. ஆனால், அவரை ஆதரித்த மக்களால் அவர் 'அரகலய' மூலம் துரத்தியடிக்கப்பட்டார். ஆனால் இன்றைய தேர்தல் கள நிலவரம் வேறு! பண்டைய உரோம சாம்ராச்சியம் தொடர்பாக ஒரு வழக்குமொழி உண்டு. அதாவது, "All roads lead to Rome" - "எல்லாப் பாதைகளும் உரோமாபுரி நோக்கியே செல்கின்றன" என்பதே அது. அதைச் சற்று மாற்றி நமது நாட்டின் இன்றைய சூழ்நிலையில், - all the presidential candidates lead to the North and the East - "எல்லா ஜனாதிபதி வேட்பாளர்களும் வட, கிழக்கு நோக்கியே பயணிக்கிறார்கள்" என்று கூறலாமா என்று யோசிக்கின்றேன்.

இன்று ஏன் எம்மிடையே 'தமிழ்த் தேசிய பொது ஜனாதிபதி வேட்பாளர்' என்ற எண்ணக்கரு உருவானது? இதுவரை மலையகத்தில் இல்லாத வகையில் ஏன் ஒரு ஜனாதிபதி வேட்பாளர் உருவாகினார்? தற்போது இவர்களது பரப்புரையில் 13ஆவது அரசியலமைப்புத் திருத்தம் தொடர்பாக இவர்கள் கூறுவதை அமுல்படுத்தியிருந்தால் வட, கிழக்குத் தமிழர்களும் மலையகத் தமிழர்களும் இலங்கையராக ஜனாதிபதித் தேர்தலில் போட்டியிடும் இந்த வேட்பாளர் களுடன் கைகோர்த்திருப்பார்கள். ஆனால், 1987ஆம் ஆண்டு அரசியலமைப்பின் 13ஆவது சீர்திருத்தம் அமுல்படுத்தப் பட்டதிலிருந்து இதுவரை இன்று இவர்கள் கூறும் எத்தகைய விடயம் தொடர்பிலும் சிறு துளிகூட முயற்சி செய்யவில்லை. அதனால்தான் 'தமிழ்த் தேசிய பொது வேட்பாளர்' என்ற எண்ணக்கரு இன்று உருவாகியது. வட, கிழக்கு மக்களிடையே ஏன் தனித் தமிழ் நாடு என்ற எண்ணக்கரு உருவாகியதோ, அதற்கு எப்படி நீங்கள் காரணமோ, அதுபோன்று இன்றைய 'தமிழ்த் தேசிய பொது வேட்பாளர்' என்ற எண்ணக்கருவுக்கும் நீங்களே காரணம்!

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ඔබතුමාට නියමිත කාලය අවසානයි, ගරු මන්ත්‍රීතුමා.

**ගරු ගෝවින්දන් කරුණාකරම් මහතා**
(மாண்புமிகு கோவிந்தன் கருணாகரம்)
(The Hon. Govindan Karunakaram)
I am winding up, Sir.

எம் மக்களது சுயநிர்ணய உரிமை! எம் மக்களது நில உரிமை! எம் மக்களது மொழி உரிமை! அச்சுறுத்தல் இல்லாது வாழும் உரிமை! ஒருமித்த பிரிக்கப்படாத ஐக்கிய இலங்கைக்குள் சமத்துவமாக வாழும் உரிமை! இவை யாவும் இலங்கை ஜனநாயக சோசலிசக் குடியரசின் மக்கள் என்ற வகையில் வட, கிழக்குவாழ் தமிழ் மக்களின் அடிப்படை உரிமைகள்! ஆகவே, வட, கிழக்குவாழ் தமிழ் மக்களின் வாழ்வுரிமை தொடர்பாக இன்னுமோர் அடிப்படை உரிமை வழக்கு உயர் நீதிமன்றத்தில் தொடரப்படுமானால் அது என்னால்தான் தொடரப்படும். அத்தகைய வழக்கு ஒன்று எனது விருப்பத் தெரிவல்ல. ஏனெனில், பிரிவினைப் போராட்டம், அதன் வலிகள், அதனால் நாடு கண்ட பிரளயங்கள், அதன்மூலம் நான் கற்ற பாடம் என்பன எமது நாட்டின் நலன் கருதியதே! ஒவ்வொருவரும் நாட்டு நலனா, கட்சி நலனா, தனிநபர் நலனா? எனச் சிந்திக்க வேண்டும். இன்று இந்தச் சபையில் மூன்றாம் மதிப்பீட்டுக்காக எடுக்கப்படவிருந்த மாகாணசபை தேர்தல்கள் (திருத்தம்) சட்டமூலம் தடுக்கப்பட்டிருக்கின்றது. அதுசம்பந்தாகவும் நீங்கள் சிந்திக்க வேண்டுமெனக் கேட்டு விடைபெறுகின்றேன். நன்றி.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
මීළඟට, ගරු චින්තක අමල් මායාදුන්න මැතිතුමා. ඔබතුමාට මිනිත්තු 14ක කාලයක් තිබෙනවා.

Order, please! මේ අවස්ථාවේදී කවුරුන් හෝ ගරු මන්ත්‍රීවරයෙක් මූලාසනය සඳහා ගරු ජගත් සමරවික්‍රම මන්ත්‍රීතුමාගේ නම යෝජනා කරන්න.

**ගරු ජනාධිපති නීතිඥ එම්.යූ.එම්. අලි සබ්රි මහතා**
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி எம்.யூ.எம். அலி சப்ரி)
(The Hon. M.U.M. Ali Sabry, PC)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, "ගරු ජගත් සමරවික්‍රම මන්ත්‍රීතුමා දැන් මූලාසනය ගත යුතුය" යි මා යෝජනා කරනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***අනතුරුව ගරු නියෝජ්‍ය කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වුයෙන්, ගරු ජගත් සමරවික්‍රම මහතා මූලාසනාරූඪ විය.***
*அதன்பிறகு, மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு ஜகத் சமரவிக்ரம அவர்கள் தலைமை வகித்தார்கள்.*
*Whereupon THE HON. DEPUTY SPEAKER left the Chair, and THE HON. JAGATH SAMARAWICKRAMA took the Chair.*

[අ.භා. 1.45]

**ගරු චින්තක අමල් මායාදුන්න මහතා**
(மாண்புமிகு சிந்தக அமல் மாயாதுன்ன)
(The Hon. Chinthaka Amal Mayadunna)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද දිනයේ අපරාධ නඩු විධාන සංග්‍රහය (සංශෝධන) පනත් කෙටුම්පත සහ විදේශ නඩු තීන්දු අන්‍යෝන්‍යව පිළිගැනීම, ලියාපදිංචි කිරීම සහ බලාත්මක කිරීම පිළිබඳ පනත් කෙටුම්පතත්, සේවකයන්ගේ ජාතික අවම වේතනය (සංශෝධන) පනත් කෙටුම්පතත් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර තිබෙනවා. මේ අවස්ථාවේදී මම මුලින්ම සඳහන් කළ යුතුයි, අපරාධ නඩු විධාන සංග්‍රහය හරහා අප කළ යුතු ලොකු කාර්යභාරයක් තිබෙන බව.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පසුගිය කාලය තුළ අපි දැක්කා අපරාධ නඩු විධාන සංග්‍රහය යටතේ අපේ රට තුළ කටයුතු කෙරෙන්නේ නැතුව සමහර කාරණා මඟ හැරී ගිය ආකාරය. ඒ වාගේ කාරණාවක් මම දැන් සඳහන් කරන්නම්. 2023.12.04වැනි දාත් මම පාර්ලිමේන්තුවේදී හෙළිදරව්වක් කළා, විශේෂයෙන්ම මලල ක්‍රීඩාව සම්බන්ධව සහ ඔලිම්පික් කමිටුවේ දූෂිත කටයුතු සම්බන්ධව. විශේෂයෙන්ම ජාතික ඔලිම්පික් කමිටුවේ සභාපති විසින් 2023.12.08 දිනැති ලිපිය මඟින් ගරු ක්‍රීඩා ඇමතිතුමා වෙත ඉදිරිපත් කර ඇති, නියෝජනය සම්බන්ධයෙන් වන විමර්ශන වාර්තාව ගැනත් මෙහිදී සඳහන් කළ යුතුයි. පසුගිය කාලයේ මම පෙන්නුවා, ඔලිම්පික් කමිටුව ඇමෙරිකානු ඩොලර් 2,500ක අල්ලස් මුදලක් ගත් සිද්ධියක්. ජාතික ඔලිම්පික් කමිටුවේ ඉන්නා විශේෂිත පුද්ගලයෙක් තමයි මැක්ස්වෙල් ද සිල්වා. ඔහු එම කමිටුවේ ලේකම්වරයා හැටියට කටයුතු කරනවා. ගාමිණී ජයසිංහ, චන්දන ලියනගේ, සුරන්ජිත් ප්‍රේමදාස වැනි මේ රටේ අභිංසක මලල ක්‍රීඩකයින් අප රටට කීර්තියක් අත්කර දෙන අවස්ථාවේදී එම ක්‍රීඩකයින්ගේ මුදල් හා ක්‍රීඩා සමාජවල මුදල් වංචා කිරීම පිළිබඳව මම දිගින් දිගටම කරුණු දැක්වූවා. ඒ කාරණාත් එක්ක මම කියන්න උත්සාහ කළේ, අපරාධ නඩු විධාන සංග්‍රහය යටතේ මෙන්න මේ අයට නඩු පවරන්න ඕනෑය කියන කාරණයයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පසුගිය දා ප්‍රංශයේ පැරිස් නුවර පැවැත් වූ ඔලිම්පික් තරගාවලියට සහභාගි වෙන්න ක්‍රීඩකයින් 6දෙනෙක් ගියා. ඒ අතරතුර wild card entry එක යටතේ පිහිනුම් ක්‍රීඩාව සඳහා තවත් දෙදෙනෙකුට අවස්ථාව ලැබුණා. මේ අවුරුදු 75ක කාලයේදී ඔලිම්පික් ක්‍රීඩා ඉතිහාසය තුළ අපට දිනාගත හැකි වුණේ ඇත්තටම පදක්කම් දෙකයි. මේ අවස්ථාවේදී සුසන්තිකා ජයසිංහ මහත්මිය අපි ආඩම්බරයෙන් මතක් කරනවා. එතුමියට පවා කෙනෙහිලිකම් සිද්ධ වුණා. මැක්ස්වෙල් ද සිල්වා වාගේ පුද්ගලයෝ අපේ ක්‍රීඩකයින් පිටරට යවා වංචා සහගතව මුදල් ලබා ගෙන තිබෙනවා. ඒ වාගේම ගාමිණී ජයසිංහ වාගේ අය අවුරුදු 15ක් තිස්සේ සිදුකර තිබෙන ක්‍රියාවලිය නිසා විශේෂයෙන්ම මලල ක්‍රීඩා අංශයේ වාගේම විවිධ ක්‍රීඩා ක්ෂේත්‍ර තුළ පිබිදීම නැති වෙලා තිබෙන බව අපි දකිනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ජාතික ඔලිම්පික් කමිටුවේ දූෂණ, වංචා සම්බන්ධයෙන් සැඟවී තිබුණු කරුණු මට සොයා ගන්න පුළුවන් වුණා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ජාතික ඔලිම්පික් කමිටුවේ සභාපති විසින් 2023.12.08 දිනැති ලිපිය මඟින් ගරු ක්‍රීඩා හා යෞවන කටයුතු අමාත්‍යතුමා වෙත ඉදිරිපත් කර ඇති, නියෝජනය සම්බන්ධයෙන් වන විමර්ශන වාර්තාව - එම රහසිගත වාර්තාව - මේ අවස්ථාවේදී මම **සභාගත*** කරනවා.

දැනට ක්‍රීඩා අමාත්‍යවරයෙක් නැති නිසා ගරු ජනාධිපතිතුමා යටතේ තමයි ක්‍රීඩා අමාත්‍යාංශයත් තිබෙන්නේ. විශේෂයෙන්ම මේ වාගේ අක්‍රමිකතා සිදු කරන පුද්ගලයන්ට අපරාධ නඩු විධාන සංග්‍රහය යටතේ නඩු පවරා දඬුවම් ලබා දෙන්න කියන කාරණාව විශේෂයෙන්ම මා මතක් කරනවා. ජාත්‍යන්තර ඔලිම්පික් කමිටුව තුළින් අපේ රටේ ඔලිම්පික් කමිටුවට එන මුදල් අපේ රටෙන් ක්‍රීඩා තරග සඳහා ජාත්‍යන්තරයට යන දරුවන්ට නොදී මේ පිංගුත්තරයන්ගේ සාක්කුවලට දමා ගැනීම පිළිබඳව, මේ දූෂණය පිළිබඳව විශේෂයෙන්ම හොයන්න කියන කාරණාව මතක් කරමින් මම නිහඬ වෙනවා. බොහොම ස්තූතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු එම්.ඒ. සුමන්තිරන් මැතිතුමා. ඔබතුමාට මිනිත්තු 12ක කාලයක් තිබෙනවා.

[1.50 p.m.]

**ගරු එම්.ඒ. සුමන්තිරන් මහතා**
(மாண்புமிகு எம்.ஏ. சுமந்திரன்)
(The Hon. M.A. Sumanthiran)
Hon. Presiding Member, I would like to congratulate the Hon. Minister of Justice, Prison Affairs and Constitutional Reforms for bringing in the Reciprocal Recognition, Registration and Enforcement of Foreign Judgments Bill. What we had all these years was a very old piece of legislation, which was not useful or adequate for current purposes and often, we had difficulty in recognizing foreign judgments. I am glad that this Bill is being taken up for debate today because we should have kept up with the times, but, at least now, a new piece of legislation is being introduced.

While we are on that, I must say that there are several pieces of legislation that have been introduced in this House in the last 20 months or so mostly by your predecessor and former senior, who is a Presidential candidate now, the Hon. (Dr.) Wijeyadasa Rajapakshe, President's Counsel. He claims that there had been about 75 or so new laws introduced. We have not kept count of that. Nevertheless, law reform is an important issue and modernizing our laws is an essential feature and I am glad that some of the laws that were brought in were necessary and served to fulfil a long-felt need.

Yet for all, today, I stand here disappointed that the only piece of legislation that ought to have been passed much earlier, in fact, in the last Parliament itself, to clear the legal block that had been created by the Amendment that was brought in 2017 to the Provincial Council Elections Act has not been taken up today. In that Parliament itself, I brought a Private Members' Bill to remove that legal tangle and enable Provincial Council Elections to be held under the system that existed prior to that Amendment. Unfortunately, that did not see the light of day and then, there was a change. I brought in the Bill all over again a second time. Then, Parliament was prorogued and I had to bring it a third time. But, what I brought the third time survived until today. It was actually sent to the Attorney-General; he took his own time and thereafter, it was gazetted. The Bill was read the

---

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

First time and then, there were two petitioners who went to the Supreme Court on that. They cited me as a respondent and I appeared in person. Then, the Supreme Court gave its Determination stating that subject to the change of wording the Supreme Court itself suggested, it could be passed with a simple majority.

Thereafter, the Bill was taken up for Second Reading after a lapse of several months. After President Ranil Wickremesinghe took office, he promised that several provisions of the devolution arrangements that we find today in the Constitution would be implemented. He started a process in December, 2022, an All-Party Conference. Then, he had five consecutive meetings with our party, the Tamil National Alliance. We attended all of those despite several parties boycotting same. We wanted to co-operate with that effort. He claimed that we would resolve the outstanding Tamil national question before the $75^{th}$ Independence Day, which fell on the $04^{th}$ of February, 2023. But, that did not happen. He kept promising all of this for a long period of time and as the Presidential Election neared, he again started discussions with us on the old promises and one of those things that we told him was, "Provincial Council Elections must be held. It cannot be delayed like this forever." He agreed. There was no time to bring in an amendment from the Government side to that Act and my Amendment was awaiting to be taken up for Second Reading. So, he agreed that that could be taken up and passed, and he even said that this is the first time that, under this Constitution, a Private Members' Bill would actually become a law. And, he kept his promise. When the Second Reading of the Bill was taken up, there was no call for a debate, there was no call for a Division and it was passed. Thereafter, since it was a Private Members' Bill, it was referred to the Legislative Standing Committee. The Legislative Standing Committee met twice, made the necessary Amendments that had been suggested by the Supreme Court and gave its Report to this House on the $21^{st}$ of August, last month. At that time, it was agreed that the Third Reading would be taken up today. The Third Reading is a mere formality of presenting the Report of the Legislative Standing Committee and accepting it. Any Member of the House, if he wanted it, could have asked for a Division at the Third Reading. So, it was up to the House to either accept it or reject it. But, something else intervened in between.

The Central Working Committee of the Ilankai Tamil Arasu Kadchi met two days ago, on Sunday, the $01^{st}$ of September in Vavuniya and after a long deliberation of five hours - that was the fifth meeting at which we were considering these matters - we took a definite decision not to support the so-called Tamil common candidate. Ours is the only Tamil party which has taken that courageous decision not to support the so-called Tamil common candidate. We have been branded traitors, we have been called names, but for the sake of our people and for the sake of the country, we took that courageous decision with an overwhelming majority. Then, at the end of the meeting, before the resolution was passed, those who dissented were asked and they said, "No, we do not need a vote. It can be accepted." So, it was accepted wholeheartedly without a division. That is what our Central Committee decided. When we took that decision, we also took a decision that, as a responsible political party, which is the main Tamil political party, it is our bounden duty to inform our people as to whom they should vote.

We cannot leave it open; we have to give guidance to our people. On that account, we considered the relative merits of the manifestos presented by three main candidates and decided unanimously to support the Hon. Leader of the Opposition Sajith Premadasa. That decision could have gone any way. But, that is a decision taken by our party to give guidance to our people as to how they should vote. They may follow it; they may not follow it. But, something strange happened thereafter. Until that point, the President and the Government were agreeable to the passage of this piece of legislation; they were agreeable that it should be taken up for the Third Reading today. But, all that changed and yesterday, at the Meeting of the Committee on Parliamentary Business, I was told that it could not be taken up today. That is what you call "a political witch-hunt"; that is what you call "acting without principles". I told the Hon. (Dr.) Susil Premajayantha at the Meeting yesterday that a large number of Tamil people are very sympathetic to the President on various basis, that he still had a lot of support. But, by this one act, he has exposed his true self to the people.

இந்த ஒரு நடவடிக்கையின்மூலம் தான் யார் என்பதை அவர் திரும்பவும் மக்களுக்கு நிரூபித்திருக்கின்றார். வாய்ச் சொல்லால் பலவிதமான வாக்குறுதிகள் கொடுப்பதும், அதை அமுல்நடத்துவதைப்போலக் காட்டுவதும், இறுதித் தறுவாயிலே அதற்கான கடைசி அடியெடுப்பைச் செய்யாமல் விடுவதும் ரணில் விக்கிரமசிங்ஹ அவர்களின் சுபாவம் என்பதை இந்தத் தருணத்திலும் காண்பித்திருக்கின்றார். தனக்கு வாக்களிக்காமல் விடுகின்ற தீர்மானத்தைப் பிரதான தமிழ்க் கட்சி எடுத்திருப்பதன் காரணமாக, தமிழ் மக்களைத் தண்டிக்கவேண்டுமென்று, அரைகுறைத் தீர்வாக இருந்தாலும்கூட இருக்கின்ற மாகாண சபைகளை நடத்தவிடாமல் பண்ணுவதற்காக இப்படியாக மிக மோசமான ஒரு நடத்தையிலே ரணில் விக்கிரமசிங்ஹ அவர்கள் இன்றைக்கு இறங்கியிருக்கின்றார். அவருடைய இந்த நடத்தையின்மூலம், கடந்த ஞாயிற்றுக்கிழமை 1ஆம் திகதி தமிழரசுக் கட்சியினராகிய நாங்கள் அவருக்கு ஆதரவளிப்பதில்லையென்று எடுத்த தீர்மானம் சரியானதென்று நிரூபணமாகின்றது.

அதேநேரம், பிரதான எதிர்க்கட்சித் தலைவருக்கு நாங்கள் ஆதரவு கொடுக்கின்றபோது அவருக்கும் இதனை ஓர் எச்சரிக்கையாகச் சொல்லிவைக்க விரும்புகின்றேன். அதாவது, அவர் கொடுத்திருக்கின்ற வாக்குறுதிகளோடு எங்களுடன் இணங்குகின்ற விடயங்களை முழுமையாக நிறைவேற்ற வேண்டும். இல்லையென்றால் இந்த நாடு அழிவுப் பாதைக்குள் செல்லும்! சென்ற தடவையும் எங்களுடைய மக்களில் பெரும்பான்மையானவர்கள் அவருக்கு வாக்களித்திருந்தார்கள். அதுபோல் இந்தத் தடவையும் தமிழ் மக்கள் எதிர்க்கட்சித் தலைவருக்கு வாக்களிப்பார்கள். ஆனால், நாடு பூராவும் அவர் வெளிப்படையாகச் சொல்லியிருக்கின்ற விடயங்கள் நடைமுறைப்படுத்தப்பட வேண்டும். இல்லையென்றால் இது பாரதூரமான விளைவுகளை ஏற்படுத்தும் என்ற எச்சரிக்கையோடு எனது பேச்சை முடித்துக்கொள்கின்றேன். நன்றி.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු බන්දුල ගුණවර්ධන අමාත්‍යතුමා. ඔබතුමාට මිනිත්තු 19ක කාලයක් තිබෙනවා.

[අ.භා. 2.04]

**ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා (ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு (கலாநிதி) பந்துல குணவர்தன - போக்குவரத்து மற்றும் நெடுஞ்சாலைகள் அமைச்சரும் வெகுசன ஊடக அமைச்சரும்)
(The Hon. (Dr.) Bandula Gunawardana - Minister of Transport and Highways and Minister of Mass Media)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගරු මධුර විතානගේ මන්ත්‍රීතුමාගේ විනාඩි 20ක කාලයත් මට එකතු කරගන්න කිව්වා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට පෙර කථා කළ ගරු සුමන්තිරන් මන්ත්‍රීතුමා ගරු ජනාධිපතිතුමා පිළිබඳව කරපු සටහන සාධාරණ නැති බව මම ප්‍රථමයෙන්ම ප්‍රකාශ කළ යුතු වෙනවා. මක්නිසාද යත්, මේ ගරු සභාවේ සිදුවන කටයුතු ජනාධිපතිතුමාගේ නියෝගය අනුව තීරණය නොවන නිසා. ජනාධිපතිතුමාත්, අමාත්‍යවරුත් යම් යම් කරුණු කලින් සිදු කරගන්න තීන්දු-තීරණ ගත්තත්, ඒ යෝජනා Parliamentary Business Committee එකට ඉදිරිපත් වුණාම එහි සිටින ආණ්ඩු පක්ෂයේත්, විපක්ෂයේත් සියලුදෙනාගේ එකඟතාව ඇතුව තමයි ඒවා ඉදිරිපත් කරන්න ඕනෑ. ගරු සුමන්තිරන් මන්ත්‍රීතුමනි, ඒ බව ඔබතුමා හොඳටම දන්නවා. උදාහරණයක් විධියට ගත්තොත්, මට ඉතා හදිසියේ සම්මත කරගත යුතු සංශෝධන පනත් කෙටුම්පත් කිහිපයක් තිබෙනවා. මම බොහෝ කලක සිට ඒවා න්‍යාය පත්‍රයට ඇතුළු කරන්න කියලා ඉල්ලීම් කර තිබෙනවා. මට මේ ජනාධිපතිවරණයට පෙර එය කර ගැනීමේ බරපතළ අවශ්‍යතාවකුත් තිබෙනවා. නමුත්, Parliamentary Business Committee එකේ ඊට වඩා ප්‍රමුඛතාව දිය යුතු කරුණු තිබෙනවා කියලා ඒවා න්‍යාය පත්‍රයට දාපුවාම, මගේ පනත් කෙටුම්පත නොදැම්මේ ඇයි කියලා මම දේශපාලන තීන්දු-තීරණ ගන්නවා නම්, එතකොට මම මොන්ටිසෝරි හැසිරීමක් තමයි මේ ගරු සභාව ඇතුළේ පෙන්නුම් කරන්නේ. ඒ නිසා මම හිතනවා, ගරු ජනාධිපතිතුමා අන් කවර යුගයකටත් වඩා මේ රටත්, මේ රටේ අනාගතයත්, ජාතියේ පැවැත්මත්, ජාතීන් අතර සමගියත් ආදී දේවල් පදනම් කරගෙන විශාල දැක්මක් ඇතිව තමයි එතුමාගේ ප්‍රතිපත්ති ප්‍රකාශන සහ ආණ්ඩුවේ වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කරලා තිබෙන්නේ කියලා. මෙය ලංකා ඉතිහාසයේ තීරණාත්මක අවස්ථාවක් නිසා ගරු ජනාධිපතිතුමා ස්වාධීන අපේක්ෂකයෙකු ලෙස ජනාධිපතිවරණයට ඉදිරිපත් වෙන්නේ ජාති, ආගම්, කුල, වර්ණ, ලිංග භේදවලින් තොරවයි. ඒ වාගේම දේශපාලන පක්ෂ, පාට භේදවලින් තොරව ජාතික ප්‍රතිපත්තියක් ක්‍රියාත්මක කිරීම සඳහා ස්වාධීන අපේක්ෂකයෙකු ලෙසයි එතුමා මේ ජනාධිපතිවරණයට ඉදිරිපත් වෙන්නේ.

අපි නිදහසින් පස්සේ මෙතෙක් කල් කර තිබෙන්නේ, යම්කිසි දේශපාලන පක්ෂයක දේශපාලන ප්‍රතිපත්ති හා වැඩ පිළිවෙළක් දිනවීම සඳහා මහජන සහයෝගය ඉල්ලීමයි. "අලියා" ලකුණෙන් එක්සත් ජාතික පක්ෂය, "අත" ලකුණින් හෝ "පුටුව" ලකුණින් ශ්‍රී ලංකා නිදහස් පක්ෂය, මහජන එක්සත් පෙරමුණ ආදී විවිධ දේශපාලන පක්ෂ තමන්ගේ පාක්ෂිකයන්ගේ, හිතවතුන්ගේ හා රටේ විවිධ පාර්ශ්වයන්ගේ සිතුම් පැතුම්, ඕනෑකම් අනුව ඒ ඒ පක්ෂයේ ප්‍රතිපත්තිය ජයග්‍රහණය කරවීම සඳහායි ජනාධිපතිවරණයට ඉදිරිපත් වෙලා තිබෙන්නේ. හැබැයි, ලංකාවට නිදහස ලබා දුන් එක්සත් ජාතික පක්ෂය, විවෘත ආර්ථිකය හඳුන්වා දුන් ජේ.ආර්. ජයවර්ධනලාගේ "අලියා" ලකුණ දරන එක්සත් ජාතික පක්ෂයෙන් මෙවර ජනාධිපතිවරණයට කිසිදු අපේක්ෂකයෙකු ඉදිරිපත් වෙන්නේ නැහැ. ඒ පක්ෂයේ සම්පූර්ණ සහයෝගය දෙන්නේත්, ස්වාධීන අපේක්ෂක රනිල් වික්‍රමසිංහ මහතාගේ වැඩ පිළිවෙළටයි. 1956දී පොදුජන යුගය උදා කරපු එස්.ඩබ්ලිව්.ආර්.ඩී. බණ්ඩාරනායක මැතිතුමා, පිලිප් ගුණවර්ධන මැතිතුමා ඇතුළු කණ්ඩායම එකතු වෙලා මහජන එක්සත් පෙරමුණ හැදුවාට, මහජන එක්සත් පෙරමුණෙන් මෙවර ජනාධිපතිවරණයට අපේක්ෂකයෙකු ඉදිරිපත් වෙන්නේ නැහැ. ස්වාධීන අපේක්ෂක රනිල් වික්‍රමසිංහ මැතිතුමාටයි ඔවුන් සහාය දෙන්නේ.

මේ ලෝකයේ ප්‍රථම අග්‍රාමාත්‍යවරිය වූ සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනිය විසින් පෝෂණය කළ ශ්‍රී ලංකා නිදහස් පක්ෂය "අත" ලකුණින් හෝ "පුටුව" ලකුණින් මෙවර ජනාධිපතිවරණයට අපේක්ෂකයෙකු ඉදිරිපත් නොකරන අතර, ස්වාධීන අපේක්ෂක රනිල් වික්‍රමසිංහ මහතාට තමයි ඒ පක්ෂයත් සහාය දෙන්නේ. ඊළඟට කන්ද උඩරට සෞම්‍ය මූර්ති තොණ්ඩමන්ලා ඇති කරපු පක්ෂ හා ජීවන් තොණ්ඩමන් ඇමතිතුමා ප්‍රමුඛ කණ්ඩායම් සහාය දෙන්නේත් ස්වාධීන අපේක්ෂකයාට. නැඟෙනහිර පළාතේ මහාමාත්‍ය ලෙස සිටි සිවනේසතුරෙයි චන්ද්‍රකාන්තන් -පිල්ලෙයාන්- රාජ්‍ය ඇමතිතුමා සහාය දෙන්නේත් ස්වාධීන අපේක්ෂකයාට. ඊළඟට අපේ මුස්ලිම් ජන කොටස් නියෝජනය කරන මන්ත්‍රීවරුන් විශාල පිරිසක් සිටින අතාඋල්ලා මන්ත්‍රීතුමන්ලාගේ පක්ෂය සහාය දෙන්නේත් ස්වාධීන අපේක්ෂකයාට.

එම දේශපාලන පක්ෂවල වෙන වෙන ප්‍රතිපත්ති, අරමුණු තිබෙනවා. ඒ ප්‍රතිපත්ති, අරමුණු වෙනුවෙන් නොවෙයි, රට දිනවීම සඳහා ජාතික ප්‍රතිපත්තියක් නීතිගත කරලා තිබෙන අපේක්ෂකයා ලෙස තමයි රනිල් වික්‍රමසිංහ ජනාධිපතිතුමා මෙවර ජනාධිපතිවරණයට ඉදිරිපත් වෙන්නේ. එහිදී අපි විවිධ මැතිවරණ ප්‍රතිපත්ති ප්‍රකාශනවල ඇති කරුණු කවර ආකාරයට සඳහන් කළත්, කිසි කෙනෙකුට මේ රටේ ආණ්ඩු කරන්න බැහැ. මොකද, ජාත්‍යන්තර මූල්‍ය අරමුදල සමඟත්, අපට ණය දුන් ලෝකයේ සියලු ණය හිමියන් සමඟත් ඇති කරගත්තා වූ ගිවිසුම්වලින් පරිබාහිරව තමන්ගේ සිතුම් පැතුම් අනුව ලංකා ආණ්ඩුවට කිසිසේත්ම මේ රටේ දවසක්වත් ආණ්ඩු කරන්න බැහැ.

මම උදාහරණයක් වශයෙන් මේ කාරණය කියන්නම්. පසුගිය කාල වකවානුවේ අපේ සංචිත බින්දුවට හිඳිලා, අපේ ණයවර ලිපිය ලෝකය පිළිගන්නේ නැතුව, අපට ඉන්ධන ගෙනෙන්න බැරිව, ගෑස් ගෙනෙන්න බැරිව, අල, ලූනු, මිරිස්, පරිප්පු වැනි ආහාර ද්‍රව්‍ය ගෙනෙන්න බැරිව, ළදරු කිරි පිටි ගෙනෙන්න බැරිව, අමතර කොටස් ගෙනෙන්න බැරිව, යන්ත්‍ර-සූත්‍ර, උපකරණ ගෙනෙන්න බැරිව මුළු රටම අඩපණ වුණා. අපට හුස්ම ගන්න පුළුවන්කම ලැබුණේ, අන්තර්ජාතික විශ්වසනීයභාවය ඇති කර ගත්තේ, ජාත්‍යන්තර මූල්‍ය අරමුදල සමඟ විස්තීර්ණ ණය ගිවිසුම ඇති කර ගැනීමෙන්. කවුරු ආණ්ඩුව ගත්තත්, කවුරු ජනාධිපති වුණත් 2025, 2026, 2027ට ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ සහාය හා කොන්දේසි අත්හැරියොත් ඒ ආණ්ඩුව පවතින්නේ නැහැ. ඇයි, ආණ්ඩුව පවතින්නේ නැත්තේ?

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, 2025 වර්ෂයට මේ රටේ බාහිර සම්පත් පරතරය - external resource gap එක - ඇමෙරිකානු ඩොලර් බිලියන 5,018ක් වෙනවා කියලා පුරෝකථනය කර තිබෙනවා. ඇමෙරිකානු ඩොලර් බිලියන 5,018ක් කියන්නේ ඉතා විශාල මුදලක්. මොකද, ජාතිය සතු මුළු සංචිත ප්‍රමාණය ලෙස තිබෙන්නේ ඇමෙරිකානු ඩොලර් බිලියන 5.6යි. අපට 2025 අවුරුද්දට ඇමෙරිකානු ඩොලර් බිලියන 5ක් මදි

වෙනවා. ඒ කියන්නේ, තව මාස හතරකින්. ඒ මදිවෙන ප්‍රමාණය පියවා ගන්න රනිල් වික්‍රමසිංහ ජනාධිපතිවරයා ගිවිසගෙන තිබෙන්නේ කොහොමද? ඇමෙරිකානු ඩොලර් මිලියන 663ක් Extended Fund Facility කියලා හම්බ වෙනවා. තව ඇමෙරිකානු ඩොලර් මිලියන 700ක් Budgetary Support සඳහා හම්බ වෙනවා. ඊළඟට, ලබන අවුරුද්දේ අය වැය හදන්න ඇමෙරිකානු ඩොලර් මිලියන 700ක් දෙනවා. World Bank එක ඇමෙරිකානු ඩොලර් මිලියන 400ක් දෙනවා. Asian Development Bank එකත් ඇමෙරිකානු ඩොලර් මිලියන 300ක් දෙනවා. අපට ණය ගෙවන්න නැතුව ඉන්න ඉඩ දීලා තිබෙන නිසා ඇමෙරිකානු ඩොලර් මිලියන 3,655ක ණය සහනයක් ලැබෙනවා. ඉතින් මේ ටික නැතුව තව මාස හතරකින් අය වැය හදන්නේ කොහොමද?

ඇමෙරිකානු ඩොලර් බිලියන 5ක් කියන්නේ, රුපියල් බිලියන 1,500ක්. හැබැයි, ගිය අවුරුද්දේ රටේ මුළු ආදායම රුපියල් බිලියන 3,000යි. ඒකෙන් භාගයක් නැති වුණාම මේ රට 2025 වර්ෂයේදී පවත්වාගෙන යන්නේ කොහොමද? ඒ වාගේම 2026දීත් එම ගැටලුව එනවා. 2027දී -තව අවුරුදු තුනකින්- සිදු වන දේත් මම කියන්නම්. 2027දී ඇමෙරිකානු ඩොලර් මිලියන 3,911ක බාහිර සම්පත් පරතරයක් - external resource gap එකක් - ඇති වන බවට පුරෝකථනය කර තිබෙනවා. එය ගිවිසුමේ ඇතුළත් කර තිබෙනවා. කීයක්ද ලැබෙන්නේ? Extended Fund Facility කියලා ලැබෙනවා, ඇමෙරිකානු ඩොලර් මිලියන 329ක්. Budgetary Support කියලා ලැබෙනවා, ඇමෙරිකානු ඩොලර් මිලියන 600ක්. World Bank එකෙන් ලැබෙනවා, ඇමෙරිකානු ඩොලර් මිලියන 300ක්. Asian Development Bank එකෙන් ලැබෙනවා, ඇමෙරිකානු ඩොලර් මිලියන 300ක්. ඊළඟට, ඇමෙරිකානු ඩොලර් මිලියන 1,482ක ණය සහනයක් ලැබෙනවා. 2027දී රට පවත්වාගෙන යන්න මදි වනවා, ඇමෙරිකානු ඩොලර් බිලියන 1.5ක්. ඇමෙරිකානු ඩොලර් බිලියන 1.5ක් කියන්නේ කොච්චරක්ද? කොළඹ මහ මුහුද ගොඩ කරලා අවුරුදු ගණනක් තිස්සේ හදලා මේ රටට ලැබුණු විශාලම ආයෝජනය තමයි, Colombo Port City ව්‍යාපෘතිය. එහි වටිනාකම කීයද? ආයෝජනය කීයද? ඇමෙරිකානු ඩොලර් බිලියන 1.4යි. අපට 2027දී රට පවත්වාගෙන යන්න මදි වනවා, ඇමෙරිකානු ඩොලර් බිලියන 1.5ක්. එතකොට IMF ගිවිසුමට අනුව අපට ඉඩ දෙනවා, ජාත්‍යන්තර මූල්‍ය වෙළෙඳ පොළට ගිහිල්ලා sovereign bond එකක් issue කරන්න. ඕනෑම කෙනෙක් පුළුවන් නම් කියන්න, මේ වෙලාවේදී මම අභියෝග කරනවා, sovereign bond එකක් අරගෙන ගියොත් ලෝකයේ ඉන්න බලු කපුටෙක්වත් ඒ bond එකට දායක වෙන්නේ නැහැ කියලා. මොකද, ඒක ගන්න අපට කොන්දේසියක් තිබෙනවා. ඒ කොන්දේසිය තමයි, 2025දී අපි සතු වත්කම් ඇමෙරිකානු ඩොලර් බිලියන 8 දක්වා වැඩි කරන්න ඕනෑ; 2026දී එය ඇමෙරිකානු ඩොලර් බිලියන 10 දක්වා වැඩි කරන්න ඕනෑ; 2027දී එය ඇමෙරිකානු ඩොලර් බිලියන 14 දක්වා වැඩි කරන්න ඕනෑ. 2027දී ඇමෙරිකානු ඩොලර් බිලියන 14 දක්වා විදේශ වත්කම් වැඩි වුණේ නැත්නම් ඇමෙරිකානු ඩොලර් බිලියන 1.5ක sovereign bond එක issue කරන්න බැහැ. එතකොට ඇමෙරිකානු ඩොලර් බිලියන 1.5ක ණය ටික ලැබුණේ නැත්නම් 2026දී රට පවත්වාගෙන යන්න බැහැ. මේ අනතුර දන්නා නිසා තමයි ජනාධිපතිතුමා හැම වෙලාවේදීම තේරෙන භාෂාවෙන් කියන්නේ, "අපි දැන් යන්නේ වැල් පාලමක" කියලා.

ඒ වැල් පාලමෙන් එගොඩ වෙන්න හදනකොට යන්තම් හෝ අපේ කකුල වෙනස් වුණොත්, කඩාගෙන වැටුණොත් මුළු රටම කඩාගෙන වැටෙනවා. ඒ නිසා තමයි ආසියානු සංවර්ධන බැංකුවෙන් අවසාන නිරීක්ෂණ චාරිකාවට පැමිණි කණ්ඩායමේ නායක පීටර් මහතා කිව්වේ, ශ්‍රී ලංකාවේ අනාගත ගමන් මාවත යන්නේ දැළි පිහි අතුරපු මාවතක; පිහිතල අතුරපු මාවතකය කියලා. පිහිතල අතුරපු මාවතක යනකොට සෙල්ලම් දාන්න බැහැ. මොකද, කකුල් කැපිලා අබ්බගාත වෙනවා. ඒ, IMF Agreement එක.

අපේ විදේශ කටයුතු අමාත්‍ය ගරු අලි සබ්රි මැතිතුමා ඉතා පැහැදිලිව දන්නවා, මේ විදේශ ණය ප්‍රතිව්‍යුහගතකරණය කිරීම මොන තරම් අමාරු වුණාද කියලා. IMF එක ණය තිරසරභාවය පිළිබඳ විශ්ලේෂණයක් - Debt Sustainability Analysis එකක් - කරලා, ඒ අනුව ඉන්දියාවත්, ප්‍රංශයත්, ජපානයත් කියන රටවල් තුන ප්‍රමුඛ Official Creditor Committee - OCC - කියලා ණය කමිටුවක් හදාගෙන තමයි ලෝකයත් එක්ක ගනුදෙනු කළේ. මේ සඳහා අසාමාන්‍ය මහන්සියක්, වෙහෙසක් රටේ රාජ්‍ය නායකයා වශයෙන් ගරු ජනාධිපතිතුමා ගත්තා. ඉන්දියාවට ගිහිල්ලා, ඉන්දියාවේ රාජ්‍ය නායකත්වය, ඉන්දියාවේ නියෝජිතයන් සමඟ විදේශ කටයුතු අමාත්‍යතුමන්ලා සාකච්ඡා කළා; චීනයට ගිහිල්ලා චීන ජනාධිපතිතුමා ඇතුළු චීන රජය සමඟ සාකච්ඡා කළා; ජපානයට ගිහිල්ලා ජපන් රජය සමඟ සාකච්ඡා කළා; පැරිසියට ගිහිල්ලා, ප්‍රංශ ආධාර කණ්ඩායම් එක්ක සාකච්ඡා කළා. අවුරුද්දකට වැඩි කාලයක් බොහෝදෙනෙක් අසාමාන්‍ය ලෙස මහන්සි වෙලා තමයි මේ ණය ගෙවන ආකාරය පිළිබඳ ගිවිසුම්වලට අත්සන් කරලා තිබෙන්නේ. ලංකාවේ දේශපාලන වෙනස්කම් වුණා කියලා මේ රට අත්සන් කරපු ගිවිසුම් වෙනස් කරන්න පුළුවන්ද? ලෝකය එහෙම වෙනස් කරනවාද? එහෙම කරනවා කියලා ඔබතුමන්ලාට ලෝකයට කියන්න පුළුවන්ද? මේ රටේ මේ කරන දේශපාලන භූත විකාර දන්නා නිසාම මේ රටවල් කියා තිබෙනවා, මේවා මේ ආකාරයට කරන්නට අපි මේ ණය සහනය අවුරුදු තුනකට දෙන්නේ, ඊට පසුව ඔබතුමන්ලා ණය ගෙවන ආකාරය පිළිබඳ අපි විශ්වාස කරන්න නම්, මේ කියන ඒවා කවුරු ජනාධිපති වුණත්, කවුරු ආණ්ඩු කළත් කරනවාය කියන එකට අණපනත් පාර්ලිමේන්තුව විසින් සම්මත කරන්නය කියලා. ඒ අනුව අපි මීට අදාළ ප්‍රධාන නීති 5ක් දැනට සංශෝධනය කරලා තිබෙනවා.

ඉතිහාසය පුරාම සෑම ආණ්ඩුවක්ම සල්ලි අච්චු ගහලා තිබෙනවා. පියවා ගන්න බැරි අය වැය පරතරයක් ඇති වුණාම ඒ අය වැය පරතරයේ නොපිය වූ හිඟය පියවා ගැනීම සඳහා හැම ආණ්ඩුවම දිගින් දිගටම සල්ලි අච්චු ගහනවා. ජනතාව පඩි වැඩියෙන් දියව් කියනවා, උද්ඝෝෂණ කරනවා, පිකට් කරනවා, පෙළපාළි යනවා. පොලීසියෙන් කඳුළු ගෑස් ගහනවා. ඒත් ඒවා නතර වෙන්නේ නැහැ. ඉතින් ආණ්ඩුව "හිටපියව්" කියලා සල්ලි අච්චු ගහලා පඩි වැඩි කරනවා. ජනතාව රක්ෂා දියව් කියනවා, අට්ටාල ගහනවා, නිදා ගන්නවා. ඊට පස්සේ රක්ෂා ටික දෙනවා. ඒවාට අවශ්‍ය මුදල අච්චු ගහලා දෙනවා. ඉතිහාසය පුරාම මේක කළා. දිගටම සල්ලි අච්චු ගහලා දුන්නා. ඕනෑම දේශපාලන පොරොන්දුවක් දෙනවා. අපි බලයට ආවාම දුප්පත් මිනිස්සුන්ට රුපියල් 20,000 ගණනේ බෙදලා දෙනවා කියනවා. රණසිංහ ප්‍රේමදාස ජනාධිපතිතුමා ජනාධිපතිවරණයට එනකොට කිව්වා, සෑම දුප්පතෙකුටම රුපියල් 25,000 බැගින් බැංකු පොතේ දමලා දෙනවා කියලා. බුදුහාමුදුරුවන් පල්ලා දාලා දෙනවා කියලා සහතික වශයෙන් කියලා ඡන්දය ගත්තා. 1989 වර්ෂයේ එතකොට අපි හිටියේ විපක්ෂයේ. එතකොට මිනිස්සු ඇහුවා කෝ, රුපියල් 25,000 කියලා. ජාතික ඉතිරි කිරීමේ බැංකුවෙන් ඒ රුපියල් 25,000ට පොලිය තමයි මාසයක් ගණනේ එවනවා කිව්වේ. මිනිස්සු ඉල්ලා සිටියා තමන්ගේ රුපියල් 25,000 දෙන්න කියලා. ඒකට නඩු දැම්මා. උසාවිය කිව්වා, ප්‍රේමදාස ආණ්ඩුව සත 25ක්වත් තැන්පත් කරලා නැහැ කියලා. සෑම දුප්පතෙකුටම රුපියල් 25,000ක් දෙනවා කියලා ලංකාවේ දේශපාලන ඉතිහාසයේ ලොකුම බොරු පොරොන්දුව දීලා තමයි එතුමා ජනාධිපතිවරණය ජයගත්තේ.

[ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා ]

දැන් කියනවා, රුපියල් 20,000ක් දෙනවා කියලා. එදා රුපියල් 25,000යි දෙනවා කිව්වේ. පුතාණෝ ඒ බොරුවට වඩා ටිකක් අඩු කරලා කියලා තිබෙනවා. එතුමා කියනවා, රුපියල් 20,000ක් දෙනවා කියලා. කොහෙන්ද දෙන්නේ? තාත්තා රුපියල් 25,000ක් බැංකු පොතේ දමලා දෙනවා කියලා ජාතික ඉතිරිකිරීමේ බැංකුවෙන් රුපියල් 250ක් තැන්පතු පොලිය විධියට යවලා, අන්තිමට උසාවි තීන්දුව අනුව සත 5ක්වත් බැංකු පොතට දැම්මේ නැහැ කියලා තිබෙනකොට, කාටවත් රුපියල් 25,000ක් හම්බ වෙච්ච නැති රටක රුපියල් 20,000ක් කොහෙන්ද දෙන්නේ? සල්ලි අච්චු ගහලා දෙන්න පුළුවන්ද? මීට ඉස්සෙල්ලා නම් පුළුවන්. දැන් බැහැ. මේ පාර්ලිමේන්තුව පනතක් සම්මත කරලා තිබෙනවා, ශ්‍රී ලංකා මහ බැංකු පනත කියලා. ඒ පනත අනුව සල්ලි අච්චු ගැසීම තහනම්. ශ්‍රී ලංකා මහ බැංකු අධිපති හා මුදල් මණ්ඩලය එල්ලා මරනවා කියලා, මිනිය දණහිසට පහළින් වන පරිදි ගෙනියලා වළලන්න කිව්වත්, පොදු මහජනයා ඒකට විරුද්ධයි කිව්වත්, මිනිය දණහිසෙන් පහළට දමලා ගෙනියලා වළලනවා මිසක් සල්ලි අච්චු ගහන්න බැහැ. ඉස්සර එක "චච්චිල්". චච්චිල් කියන්නේ ඔට්ටු නැහැ. දැන් සල්ලි අච්චු ගහන්න බැහැ, ඕනෑ ඕනෑ තරම් ණය ගන්න බැහැ.

මහින්ද රාජපක්ෂ මුළු රජය කාලයේම, යුද්ධයට ණය දෙන්නේ නැති කාලයේ, 2007දී තමයි පළමුවැනි Sovereign Bond එක issue කළේ. එහි වටිනාකම කීයද? ඇමෙරිකානු ඩොලර් මිලියන 500යි. ඒ අවුරුදු 10ටම ඇමෙරිකානු ඩොලර් බිලියන හයහමාරයි. යහ පාලන ආණ්ඩුව කාලයේ තමුන්නාන්සේලා Sovereign Bonds issue කළා, ඇමෙරිකානු ඩොලර් බිලියන 12ක. මීට පස්සේ කාගේ ආණ්ඩුව ආවත් ඒවා කරන්න බැහැ. මොකද, මේ ගරු සභාව පනතක් සම්මත කරලා තිබෙනවා. ඒක තමයි, Public Debt Management Act එක. ඒ කියන්නේ රාජ්‍ය ණය කළමනාකරණ පනත. මේ රාජ්‍ය ණය කළමනාකරණ පනත නිසා ණය ගන්නත් බැහැ.

ඒ වාගේම රුපියල් 20,000ක් දෙනවා, ඒවා මේවා දෙනවා කියලා අය වැයට දමන්නත් බැහැ. මොකද, තවත් පනතක් සම්මත කරලා තිබෙනවා, රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනත කියලා. මේ පනත යටතේ, මේ පාර්ලිමේන්තුවේ Budget Office එකක් තිබෙනවා. ඒ Budget Office එකේ ඉන්නේ දේශපාලනඥයෝ නොවෙයි, විෂයානුබද්ධ ප්‍රායෝගික බුද්ධිමතුන්. ඔවුන්ට රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනතේ තිබෙන විධිවිධානවලින් බැහැරව දේශපාලනඥයෝ කියන ඒවා Budget එකට දමන්න බැහැ. හරියට මැතිවරණ කොමසාරිස් වාගේ. අපි පනතක් සම්මත කරලා මැතිවරණ කොමසාරිස්ට බලය දීලා තිබෙනවා, සාධාරණ හා යුක්තිසහගත මැතිවරණයක් පවත්වන්න කියලා. එතකොට අපි මොකක් කිව්වත්, එතුමා පනතේ තිබෙන විධිවිධාන කියනවා මිස අපට ඕනෑ ඒවා කරන්නේ නැහැ. ඒක නිසා තමුන්නාන්සේලාගේ ප්‍රතිපත්ති ප්‍රකාශනවල දමලා තිබෙන ඒවා අය වැයට ඇතුළත් කරන්න බැහැ, රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනත අනුව.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ රටේ මහා පරිවර්තනයක් වෙන්න ඕනෑ. කෘෂිකර්මය, කර්මාන්ත, සේවා, අධ්‍යාපනය, සෞඛ්‍ය, නිවාස, ආයෝජන කියන මේ සියල්ල පරිවර්තනය කරන්න ඕනෑ. ඒ සඳහා ආර්ථික පරිවර්තන පනත - Economic Transformation Act - කියලා පනතක් තිබෙනවා. ලෝක ප්‍රජාවත් එක්ක එකඟ වෙන්න අවශ්‍ය නියමයන් නිශ්චිත වශයෙන් එම පනතේ දක්වලා තිබෙනවා. අපි ඔය කියන විධියට බදු වෙනස් කළාට කමක් නැහැ, හැබැයි, GDP එකෙන් සියයට 15ක් හෝ ඊට වඩා වැඩියෙන් ලංකා ආණ්ඩුවේ ආදායම තබා ගන්නම ඕනෑ. ඒක තමයි නීතිය.

ඊළඟට ප්‍රාථමික ගිණුමේ - Primary Account එකේ - සියයට 2.3ක අතිරික්තයක් තිබෙන්න ඕනෑ. රාජ්‍ය සේවක වැටුප්, විශ්‍රාම වැටුප්, අස්වැසුම, සහනාධාර, පොලී ගෙවීම් කරන්න ප්‍රාථමික ගිණුමේ සියයට 2.3ක අතිරික්තයක් තිබෙන්න ඕනෑ. ගෙවුම් ශේෂයේ ජංගම ගිණුමේ හිඟය දළ දේශීය නිෂ්පාදනයෙන් සියයට 1ට වඩා වැඩි වෙන්න බැහැ. සියයට 1කට වඩා අඩුවෙන් තිබෙන්න ඕනෑ. 2032දී රජයේ නොපියවූ මුළු ණය ප්‍රමාණය දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 95ට වඩා අඩුවෙන්න ඕනෑ. ණය වාරික හා පොලී ගෙවීම් - debt services - සියයට 4.5ට වඩා වැඩිවෙන්න බැහැ. තනි ඉල්ලකමකට උද්ධමනය තිබෙන්න ඕනෑ. තනි ඉලක්කමකට පොලී අනුපාතය තිබෙන්න ඕනෑ. ආර්ථික වර්ධන අනුපාතය - economic growth rate එක - සියයට 5ක් හෝ ඊට වඩා වැඩියෙන් පවත්වාගෙන යන්න ඕනෑ. විරැකියා අනුපාතය - unemployment ratio එක - සියයට 5ට වඩා අඩුවෙන් තිබෙන්න ඕනෑ. කාන්තා ශ්‍රම සහභාගීත්වය සියයට 40ට වඩා වැඩි වෙන්න ඕනෑ. මේ වාගේ කොන්දේසි රාශියක් ඇතුළත් කරලා 2048 වනවිට දුප්පත්කම නැති, ඒක පුද්ගල ආදායම ඇමෙරිකානු ඩොලර් 20,000ට වඩා වැඩි දියුණු රටක් බවට මේ රට පරිවර්තනය කිරීම සඳහා අවශ්‍ය ගමන් මාර්ගය - road map එක - මේ Economic Transformation Act එකේ තිබෙනවා.

ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය - BOI, අපනයන සංවර්ධන මණ්ඩලය - Export Development Board - කියන ඒවා එකතු කරලා වෙනම ආයතනයක් හදන්න ඕනෑ, නිදහස් වෙළඳ කලාප සහ ජාත්‍යන්තර වෙළඳාම සඳහා වූ කාර්යාලය ලෙස. ආයෝජන පිළිබඳ ක්ෂණිකව තීන්දු තීරණ දෙන්න ඕනෑ. එහෙම නැත්නම් ආයෝජකයෝ එන්නේ නැහැ. පසුගිය අවුරුද්දේ සිංගප්පූරුවේ සෘජු විදේශ ආයෝජනය - foreign direct investment - බිලියන 140යි. ඉන්දියාවේ බිලියන 70යි; වියට්නාමයේ බිලියන 28යි; තායිලන්තයේ බිලියන 20යි; අපේ රටේ බිලියනයයි. ඇයි ඒ? විකාරරූපී දේවල් කියන රටවලට එන්න ආයෝජකයන්ට ඔළුවේ අමාරුවක් තිබෙනවාද? විවිධ ශක්‍යතා වාර්තා - feasibility reports - හදලා, ඒ රටවල අවදානම් ප්‍රමාණය හදලා, දේශපාලන නායකයෝ කියන භූත කථා අහලා ආයෝජකයෝ රටකට එනවාද? එන්නේ නැහැ. ඒ නිසා තමයි මේ නීති හදන්නේ.

ගරු කැබිනට් ඇමතිතුමා දන්නවා, ඕස්ට්‍රේලියාව එක්ක ද්විත්ව බදුකරණය වැළැක්වීමේ ගිවිසුමට අත්සන් කිරීම ඊයේ කැබිනට් මණ්ඩලයෙන් අනුමත කර ගත්තා කියලා. මේ නීති හදන්නේ, මේ මැදි ආදායම් උගුලෙන් මිදෙන්න ඉතා විශාල විදේශ ආයෝජනයක් රට ඇතුළට එන්න ඕනෑ නිසායි. එහෙම ගන්න නම් ඒකට ඕනෑ විධියට ආයතන 4ක් හදන්න මේ පනතේ කියා තිබෙනවා. ඒවා තමයි, ආර්ථික කොමිෂන් සභාව, නිදහස් වෙළඳ කලාප සහ ජාත්‍යන්තර වෙළඳාම සඳහා වූ කාර්යාලය, ජාතික ඵලදායිතා කොමිෂන් සභාව, ශ්‍රී ලංකා ආර්ථික විද්‍යා සහ ජාත්‍යන්තර වෙළෙඳ ආයතනය. මේ පනත කියවන්න. තමුන්නාන්සේලා පනත ගැන සාකච්ඡා කළෙත් නැහැ, පනත කියෙව්වෙත් නැහැ. තමුන්නාන්සේලා කළේ මොකක්ද? පනත් කෙටුම්පත පිළිබඳ විවාදය පටන් ගත් වෙලාවේ ලක්ෂ්මන් කිරිඇල්ල මන්ත්‍රීතුමායි, විපක්ෂ නායකතුමායි මේකට විරුද්ධයි කිව්වා. ඊට පස්සේ කවුරුවත් කථා කරන්නේ නැතිව ඉඳලා පනත් කෙටුම්පත සම්මත වුණාට පස්සේ ඔක්කෝමලා විරුද්ධත්වය සටහන් කරගන්න කිව්වා. ඉතින් ඒ විධියට ඔබතුමන්ලාට රටක් කරන්න පුළුවන්ද? ජාතික වැඩ පිළිවෙළක් ප්‍රතිපත්තියක් ලෙස හදලා, ඒක නීතියක් බවට පත් කරලා මේ ජනාධිපතිවරණයට ඉදිරිපත් වෙන්නේ එක මනුස්සයායි. ඒ, රනිල් වික්‍රමසිංහ මැතිතුමා විතරයි.

විපක්ෂ නායකතුමාට කියන්න පුළුවන්ද, "මම ශ්‍රී ලංකා මහ බැංකු පනත වෙනස් කරලා සල්ලි අච්චු ගහනවා" කියලා? විපක්ෂ

නායකතුමාට කියන්න පුළුවන්ද, "අපි ඔරොත්තු නොදෙන ආකාරයෙන් ණය ගන්නවා, අපි රාජ්‍ය ණය කළමනාකරණ පනත වෙනස් කරනවා" කියලා? විපක්ෂ නායකතුමාට පුළුවන්ද, "මගේ යෝජනා ඔක්කෝම දානවා. Budget Office එක අයින් කරලා, රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනතට මම පයින් ගහනවා" කියන්න? විපක්ෂ නායකතුමාට කියන්න පුළුවන්ද, "ආර්ථික පරිවර්තන පනත මම වෙනස් කරනවා" කියලා?

ඊළඟට, හොරු අල්ලන්න සහ හොරකම්, වංචා, දූෂණ කරන්න බැරි වෙන්න Anti-Corruption Act කියලා වෙනම පනතක් pass කරලා තිබෙනවා. ඒ යටතේ දේශපාලනඥයෝ, දේශපාලනඥයන්ගේ දරු පවුල්, ප්‍රාදේශීය දේශපාලනඥයන් - ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරුන්, පළාත් සභා මන්ත්‍රීවරුන්- වෘත්තීය සමිති නායකයන්, රාජ්‍ය සේවකයන් විතරක් නොවෙයි පෞද්ගලික සමාගම්වල සභාපති හා අධ්‍යක්ෂ මණ්ඩලත් asset declarations කරන්න ඕනෑ.

එතකොට ඉස්කෝලයකට බස් එකක් දුන්නොත්, කවුද බස් එක දුන්නේ, බස් එකට වැය වුණු මුදල කීයද, ඒක accountවල කොහේද තිබෙන්නේ කියලා කියන්න ඕනෑ. සුහුරු පන්ති කාමරයකට Tablet එකක් දෙනවා නම්, ඒ Tablet එක දුන්නේ කවුද, ඒකට සල්ලි කොහෙන්ද ලැබුණේ කියලා කියන්න ඕනෑ. එහෙම නැත්නම් ඒක වංචාවක්, දූෂණයක්, අක්‍රමිකතාවක් වෙනවා. දැන් එවැනි වංචා, දූෂණ, අක්‍රමිකතා කරන්න බැහැ. මොකද, දැන් Anti-Corruption Act එක තිබෙනවා. ඉස්සර හොරකම් කළා වෙන්න පුළුවන්. ඉදිරියට රැස්වීම් පවත්වනවා නම් ඒ රැස්වීම්වලට කවුද වියදම් කළේ, stagesවලට කොච්චර මුදලක් වැය වුණා ද, ලයිට්වලට කොච්චර මුදලක් වැය වුණා ද, සෙනඟ අදින්න බස්වලට කොච්චර මුදලක් වැය වුණාද කියලා කියන්න ඕනෑ.

සම්මත කරපු විශේෂ පනත් 5ක් දැන් තිබෙනවා. ඒවා ආයුධ පහක් වාගෙයි. ඒ පනත් පහ තමයි ආර්ථික පංචායුධය. සල්ලි අච්චු ගහන්න බැහැ, ශ්‍රී ලංකා මහ බැංකු පනත නිසා. ඔරොත්තු නොදෙන විධියට ණය ගන්න බැහැ, රාජ්‍ය ණය කළමනාකරණ පනත නිසා. විවිධ දේවල් අය වැයට ඇතුළත් කරන්න බැහැ, රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනත නිසා. තමන්ට ඕනෑ ඕනෑ විධියට ආර්ථික ප්‍රතිපත්ති වෙනස් කරන්න බැහැ, ආර්ථික පරිවර්තන පනත නිසා. හොරකම් කරන්න බැහැ, Anti-Corruption Act එක නිසා. මේ පනත් පහ තමයි ආර්ථික පංචායුධය. මේවා නීති බවට පත් කරලා තිබෙනවා. මේ නීති පහ ගැන රනිල් වික්‍රමසිංහ මැතිතුමා හැර වෙනත් එක නායකයෙක්වත්, එක ජනාධිපතිවරණ වේදිකාවක හෝ එක වචනයක්වත් කථා කරලා තිබෙනවාද? මගේ ප්‍රශ්නය ඒකයි. එහෙම කථා කරන්නේ නැතුව එක එක්කෙනාගේ ඇඳුම් ගැන, කන බොන විධිය ගැන, ඇවිදින විධිය ගැන කථා කරනවා. මේ රට ගිනි කන්දක් උඩ තාච්චියක් තියාගෙන සොසේජස් බැදගෙන කන ජාතියක් ඉන්න රටක්. හැබැයි, වැරදි අත්හදා බැලීමක් කරන්න ගිහින් පීලි පැන්නොත් පත් වන ඕනෑම ආණ්ඩුවක්, ඕනෑම ජනාධිපතිවරයෙක් මාසයක්වත් ආණ්ඩු කරන්නේ නැහැ. එහෙම කොහොමද ආණ්ඩු කරන්නේ?

මේ වන කොට කොටස් වෙළඳ පොළ දවස ගණනේ කඩා වැටෙනවා. එහෙම වෙන්නේ ගනුදෙනුකරුවන් තුළ තිබෙන බය නිසා. මිනිසුන් බය කරනවා. මොකද, මිනිස්සු දන්නවා මේ රටේ පැවැති භීෂණය පිළිබඳව. එදා ගොවිජන සේවා මධ්‍යස්ථාන පුච්චලා, ට්‍රාන්ස්ෆෝමර් කඩලා, පළමුවෙන් ඡන්දය දමන්න යන පස්දෙනා මරලා, මරපු මිනිස්සු දණහිසට පහළින් අරගෙන ගිහින් වළලන්න නියම කරලා තිබුණා. මිනිස්සු භීෂණයෙන් තැති අරගෙන ඉන්නේ. අහන අහන මිනිහා බය වෙලා ඉන්නේ. මොකද, මල්ලිලා සතුන් වගේ හැසිරෙනවා කියලා ඔප්පු කරලා තිබෙනවා.

මැයි 09 වැනි දා පාර්ලිමේන්තුවේ හිටපු අහිංසක පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු වුණු අමරකීර්ති අතුකෝරළ මහත්මයා එතුමාගේ නිවසට යනකොට නිට්ටඹුවේදී ඇදගෙන ගියා; මිනිහෙකුට දෙන්න පුළුවන් උපරිම වධ දුන්නා; ම්ලේච්ඡ ලෙස ඝාතනය කළා. මේ ව්‍යවස්ථාදායකය නියෝජනය කරන මන්ත්‍රීවරු හැත්තෑදෙදෙනෙකුගේ -අප හැමෝගෙම- ගෙවල් පිච්චුවා. විපක්ෂයේ ඉන්න දැවැන්ත ශරීරයක් තිබුණු කුමාර වෙල්ගම මන්ත්‍රීතුමා සම්පූර්ණ ලෙඩෙක් කළා. මිනිසුන් පිස්සු වට්ටලා, 800කගේ විතර ගෙවල් ගිනිබත් කළා. මේ රටේ ප්‍රජාතන්ත්‍රවාදයේ උත්තරීතර ආයතනය වන පාර්ලිමේන්තුවට ගහන්න මෙතැන ඇවිල්ලා වට කළා. පාර්ලිමේන්තුව ගිනි තියලා අරාජික කළා නම් මොකද වෙන්නේ? හැම දාම මේ සභාවේ කථා කරන විපක්ෂ නායකවරයා ඒ පිළිබඳව අඩු ගණනේ විරෝධය දක්වලාවත් තිබෙනවාද? ව්‍යවස්ථාදායකයේ තමන්ගේ සහෝදර පිරිසක් ඒ විධියට තළලා, පොඩි කරලා, මරලා දාන කොට, "මේක ම්ලේච්ඡත්වය, මේක ප්‍රචණ්ඩත්වය, මේක මිනීමැරුම, මේක ලේ වැගිරීම. මේක කරන්න එපා" කියලා කියා තිබෙනවාද? අඩු ගණනේ ඒ ගැන ශෝකය පළ කරලාවත් තිබෙනවාද? ඒක වැරදියි කියලාවත් කියා තිබෙනවාද? කියන්නේ නැහැ. බිය ඇති කරනවා. මර බිය ඇති කරනවා. 1989 ඡන්දය ඉල්ලන්න යන කොට මටත් දැනුම් දීලා තිබෙනවා, "ඡන්දයට ඉදිරිපත් වන එවුන්ට දඬුවම මරණයයි! මේ හොර පාර්ලිමේන්තුව වර්ජනය කරව්!" කියලා. අපි හැමෝම මැරෙනවා තමයි. මැරෙන්නේ එක සැරයයි තමයි. ඒත් හැම මිනිහෙකුටම ගෞරවාන්විත මරණයක් තිබෙන්න ඕනෑ. මර බිය ඇති කරලා, මිනිසුන්ගේ ගෙවල් ගැන බලාගන්නම් කියලා තර්ජනය කරලා ආණ්ඩු අරන් රටක් කරගෙන යන්න පුළුවන්ද? රටේ නීතියට ගරු කරන්නේ නැද්ද? අන්තර්ජාතික නීතියට ගරු කරන්නේ නැද්ද?

මේ රට ලේ විලක් කරන පාප කර්මයට සම්බන්ධ වෙන්න එපා. අපි යකඩ ගැටෙන අමිහිරි ශබ්දය, උණ්ඩයේ අමිහිරි සුවඳ, දුක, වේදනාව, මර ළතෝනිය බොහෝ කාලයක් විඳලා තිබෙන මිනිස්සු. එහෙම ජාතියක් අපි. මේ රටට මෙවර වැරදුණොත් ඇෆ්ගනිස්ථානය, වෙනිසියුලාව, සිම්බාබ්වේ ආදි රටවලට වුණා වාගේ සියලුදෙනා අප දාලා ගියොත් මොකද වෙන්නේ? IMF Agreement එකේ මූලික ඉලක්ක දශමයකින් හෝ වෙනස් කළොත්, ඒ නිසා ඒ මිනිස්සු ගියොත් -යනවා කියලා කිව්වත් ඇති- ඩොලරයේ අගය රුපියල් 600කට, 700කට ඉහළ යයි.

අද මොකක්ද බංග්ලාදේශයට වෙලා තිබෙන්නේ? එදා රනිල් වික්‍රමසිංහ මැතිතුමා අග්‍රාමාත්‍යවරයා වෙලා නොසිටියා නම්, අපේ රටේ වෙන්නේත් බංග්ලාදේශයේ වූ දේමයි. එහෙම නම්, පාර්ලිමේන්තුවට ගිනි තියනවා; රට අරාජික වෙනවා; උසාවිය පන්නනවා. ඒ ආපු සියලුදෙනාගේ පින්තූර අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ තිබෙනවා.

බංග්ලාදේශයේ වුණේ මොකක්ද? ඒ අගමැතිතුමිය පැන්නුවා. ව්‍යවස්ථාදායකයේ මන්ත්‍රීවරුන් 26දෙනෙකු මැරුවා. විනිශ්චයකාරවරුන් අයින් කළා, Supreme Court එකේ. දේපළ කොල්ල කෑවා. ගිනි තිබ්බා. සුළු ජාතීන්ට ගැහුවා. ඒ රටට අද වෙනකල් හුස්ම ගන්න බැහැ. අද සියලු ආයෝජකයෝ යනවා, බංග්ලාදේශයෙන්. එහේ වෛද්‍ය විද්‍යාලයේ ඉගෙන ගන්නා අපේ ළමයි ආපහු එනවා. ඒ රට ආයෙත් අවුරුදු 10කට ගොඩ ගන්න බැහැ. ඒකම තමයි ලංකාවටත් කරන්න හදන්නේ, නිශ්චිත වැඩ පිළිවෙළක්, ප්‍රතිපත්තියක් නැතුව, රටේ ඉන්න මිනිසුන් මුළා කරලා, බය කරලා -බිය වද්දලා-, ගණන්කාරකම් පෙන්නලා.

රටක නීරෝගී ප්‍රජාතන්ත්‍රවාදය පවතින්න ඕනෑ. දිනනවා පරදිනවා කියන්නේ එකක්. ජනාධිපතිවරණයකදී හැටහුටහමාරක් දෙනා ඡන්දය ඉල්ලුවාට හැමදාම දෙදෙනෙකු අතර විතරයි තරගය

[ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා ]

තිබෙන්නේ. අනෙක් අයගේ සද්දෙ විතරයි. ඒ දෙදෙනාගෙන් එක්කෙනෙක් දිනනවා. නමුත්, පරදින මිනිස්සුත් ජීවත් වෙන්න ඕනෑ. පැරදුණාට පසුවත් මිනිසුන්ගේ ව්‍යාපාර තිබෙන්න ඕනෑ; කර්මාන්ත තිබෙන්න ඕනෑ. තමන්ගේ ඉතා මුරණ්ඩු තීන්දු තීරණ ප්‍රායෝගිකව මේ මහ පොළොවේ පැළ කරවන්න බැහැ. ඒ නිසා තමයි අපි කියන්නේ, කරන්න පුළුවන් දෙයක් කිව්වේ නැත්නම්, කියන්න පුළුවන් දෙයක් කළේ නැත්නම් නැවත වතාවක් රට බංකොලොත් වන බව. මොකද, අපි හැමදාම කරන්න බැරි දෙයක් කියලා තමයි මිනිසුන්ගෙන් ඡන්දය අරගෙන තිබෙන්නේ. කරන්න බැරි දෙයක් කියලා, ජනප්‍රිය පොරොන්දුවක් දීලා ඡන්දය අරගෙන ආණ්ඩුවක් කරන්න පුළුවන් වුණේ, මීට ඉස්සර වෙලා. ඇයි, එතකොට සල්ලි අච්චු ගහන්න පුළුවන් වුණා නේ. ඒ තත්ත්වය වෙනස් කරපු නායකයා රට හුස්ම ගන්න පුළුවන් තත්ත්වයට ගෙනැල්ලා, උණ්ඩියල් ක්‍රමයට රුපියල් 420ට ගිය ඩොලරය 300ට ගෙනැල්ලා, සියයට 79ට නැඟලා තිබුණු උද්ධමන අනුපාතය තනි ඉලක්කමට ගෙනාවා. සියයට 30ට තිබුණු පොලී අනුපාතය තනි ඉලක්කමකට ගෙනාවා. උද්ධමනය තනි ඉලක්කමකට ගෙනාවා. මේ අවුරුද්දේ ආර්ථික වර්ධන වේගය සියයට 3ක් කියලා IMF එක පූර්ව අනුමානයක් කළාට සියයට 5ක වර්ධනයක් ඇති වෙලා තිබෙනවා. ඒ තුළ ඇති වෙච්ච space එකේ ඇති වන ආදායම් වැඩි වීම මත සෑම රජයේ සේවකයෙකුගේම අවම වැටුප රුපියල් 50,000ට වැඩි වන විධියට අය වැය යෝජනාවලට ඇතුළත් කරලා, සමෘද්ධි සහනාධාරය තුන්ගුණයකින් වැඩි කරලා "අස්වැසුම" නමින් ලබා දීලා, මේ මහ පොළොවේ -මේ උපන් බිමේ- අඟලක්වත් නැති පවුල් 24,000කට ඉඩම් අයිතිය දෙන්න, නිවාස අයිතිය දෙන්න කටයුතු කරලා ගොඩ ගත්තු, අතිදුෂ්කර තත්ත්වයක තිබුණු මේ නැති වෙච්ච රට අත්හදා බැලීම් කරන්න ගිහිල්ලා නැවත විනාශ කරන්න දායක වෙන්න එපා. මෙය අප සියලුදෙනාගේ රට. එය රැක ගැනීම සඳහා පටු දේශපාලන පක්ෂ පාට භේදයෙන් තොර, බලය සඳහා වන වැඩ පිළිවෙළකින්, ප්‍රතිපත්තියකින් තොර වැඩ පිළිවෙළක්, ජාතික ප්‍රතිපත්තියක් ක්‍රියාත්මක කිරීම සඳහා එකතු වෙන්න කියලා ආරාධනා කරමින්, මට මේ අවස්ථාව ලබා දීම ගැන මූලාසනයට ස්තුතිවන්ත වෙමින් මගේ වචන කිහිපය අවසන් කරනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු ඉරාන් වික්‍රමරත්න මන්ත්‍රීතුමා. ඔබතුමාට මිනිත්තු 12ක කාලයක් තිබෙනවා.

[අ.භා. 2.39]

**ගරු ඉරාන් වික්‍රමරත්න මහතා**
(மாண்புமிகு இரான் விக்கிரமரத்ன)
(The Hon. Eran Wickramaratne)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට මේ අවස්ථාව ලබා දුන්නාට ස්තුතියි.

Sir, first of all, I would like to say something about the Provincial Councils Elections (Amendment) Bill, which had gone through its First Reading, the Second Reading and was scheduled to be taken up in Parliament today for its Third Reading. Unfortunately, it has not been permitted to be taken up in Parliament today. It is very unfortunate because, as we know, the provincial councils have not been in operation for quite some time now and that is really an issue about democracy. I do not agree with the Hon. M.A. Sumanthiran when he says that the Provincial Councils Elections (Amendment) Bill not being taken up today is an injustice perpetrated on the Tamil-speaking people because that is actually an injustice perpetrated on all Sri Lankans.

Every Sri Lankan has a right to decide on his particular provincial council, his local authority, the Parliament and his President. We have been looking at a very dangerous trend in this country, a trend of authoritarianism. The United Nation’s report which has just come out has shown that in the last two years, this country has become more and more authoritarian. The Supreme Court judgment given just a few days ago specifically stated that the President of the country has no right to postpone the Local Government Elections. He has absolutely no right. We all are elected on a set of rules, laws and on the Constitution and we have to operate within that, whether you are the President, a Cabinet Minister, a Member of Parliament or just a citizen. That has been violated or in other words, the supremacy or the sovereignty of the people has been violated, according to that judgment. We believe in a democratic way of life and leaders cannot say, "We know what is best for everybody and we decide what is best for everybody". That just cannot happen. The rule of law has to be upheld and the Judiciary's verdicts have to be upheld.

I heard some Hon. Members say that if the Provincial Councils Elections (Amendment) Bill was taken up today, it would have created some problems because we are on the brink of an election. I do not agree with that at all because these Bills go through a certain, long process: the White Paper goes to the Attorney-General's Department, then, to the Legal Draftsman's Department and after the First and the Second Readings, the Bill goes to the Legislative Standing Committee and then only it comes up for the Third Reading. That is how it is passed. So, this particular Bill has also gone through that whole process and that is why we completely object to what the Government did today by not putting it before the House for its Third Reading.

I heard another Hon. Member of Parliament say that all the provincial councils were forced on us by India. I do not know what kind of crap they come and speak here. Are we really going to say that the Parliamentary system was forced on us by the British people? I think we need to grow up a little bit. These are global developments; democracy is a global development. These are different levels in a democracy. How those political systems - parliamentary systems, presidential systems, devolved systems and many different systems - operate differ. If people feel that provincial councils are not suitable for this country, then we can certainly have a Referendum and when you have a Referendum, you are going to ask the people in the province whether they need the provincial council or not. You have to ask that from the relevant people. We are not opposed to democracy, but we are absolutely opposed to trying to postpone the democratic framework in any way. Therefore, we completely condemn the attempt made today to postpone that legislation, which could have helped us to hold the Provincial Council Elections by adopting the framework that was in place earlier or based on the system that existed earlier.

මම අද විශේෂයෙන්ම කථා කරන්නට කැමැතියි, සේවකයන්ගේ ජාතික අවම වේතනය (සංශෝධන) පනත් කෙටුම්පත ගැන. මේ සංශෝධනය තමයි ජාතික අවම වැටුප රුපියල් 12,500 සිට රුපියල් 17,500 දක්වා රුපියල් 5,000කින් වැඩි කිරීම හා ජාතික අවම දෛනික වැටුප රුපියල් 500 සිට 700 දක්වා රුපියල් 200කින් වැඩි කිරීම. අපි ඒ සංශෝධනවලට විරුද්ධ නැහැ.

නමුත්, මම මේකත් කියන්න අවශ්‍යයි. ඇත්තටම අද රට බංකොලොත් වෙලා තිබෙන්නේ. තව විධියකට කිව්වොත් මිනිස්සු ජීවත් වෙන්නේ අමාරුවෙන්. මට ප්‍රථමයෙන් කථා කළ ඇමතිතුමා ජාත්‍යන්තර මූල්‍ය අරමුදල එක්ක තිබෙන ගිවිසුම ගැනයි, ඒ අය සමඟ එකඟත්වයට ඇවිල්ලා තිබෙන කාරණාවලින් යම්කිසි ප්‍රතිශත ප්‍රමාණයක් ඉෂ්ට කරගෙන තිබෙනවා කියන එක ගැනයි සඳහන් කළා. එතකොට අපට තිබෙන ගැටලුව, ප්‍රශ්නය මේකයි. එතුමන්ලා ඒක පෙන්වන්නේ විශාල ජයග්‍රහණයක් වාගේ. ඒක විශාල ජයග්‍රහණයක් නොවෙයි. මොකද, අපි දන්නවා දරිද්‍රතා රේඛාවෙන් පහළ මිලියන 3ක් විතර පිරිසක් තමයි සිටියේ. දැන් ඒක මිලියන 7කට ඉහළ ගිහිල්ලා තිබෙනවා. ඒ කියන්නේ මිනිස්සු දුප්පත් කරලා, දුප්පත් කරලා අපට කියනවා ගිවිසුමක් සාර්ථක කර ගත්තා කියලා. ඒ නිසා මම හිතනවා ඒක දිහා එහෙම බලන්නට බැහැ කියලා. අපි සමබරව ඒක ගැන බලන්න ඕනෑ. ආර්ථික ස්ථාවරභාවය අවශ්‍යයි. නමුත් ඊට වඩා වැදගත් වන්නේ සමාජ ස්ථාවරභාවයයි. ඉතින් මිනිස්සු බිත්තියටම තල්ලු කරලායි ඒක කරලා තිබෙන්නේ. අපි කිව්වා නම් "අපි ඒක සංශෝධනය කරනවා" කියලා, අනිවාර්යයෙන්ම සංශෝධනය කරනවා. ඒකේ දෙකක් නැහැ. අපි අඩු ආදායම්ලාභීන් ආරක්ෂා කරනවා, ගැබිනි මාතාවන්, කුඩා දරුවන් අනිවාර්යයෙන්ම ආරක්ෂා කරනවා. ජ්‍යෙෂ්ඨ පුරවැසියන් අනිවාර්යයෙන්ම ආරක්ෂා කරනවා. අපි දන්නවා ආදායමක් අවශ්‍යයි කියලා. තිබෙන මිනිස්සුගෙන් ගන්නවා, ඒකේ දෙකක් නැහැ. අපි දන්නවා ආදායමක් අවශ්‍යයි කියලා. නමුත්, අපි මිනිස්සු දරිද්‍රතා රේඛාවෙන් පහළට නොවෙයි ඉහළටයි දාන්නේ. මිනිස්සු ඒ රේඛාවෙන් ඉහළට දාන්න තමයි අපේ වැඩ පිළිවෙළ තිබෙන්නේ.

සියලු පාර්ශ්වකරුවන් සමඟ සාකච්ඡා කිරීමෙන් අනතුරුව අපි පොරොන්දු වෙලා තිබෙනවා පෞද්ගලික අංශයේ සේවා නියුක්තිකයන් සඳහා අවම මාසික වැටුප රුපියල් 17,500 සිට රුපියල් 25,000 දක්වා හෝ සංශෝධනය කරන බවට. ඇයි, අපි එහෙම කියන්නේ? රජයේ ලේඛන අනුව උද්ධමනය සියයට 70කින් ඉහළට ගිහින් තිබෙනවා, ආහාර උද්ධමනය සියයට 100කින් ඉහළට ගිහිල්ලා තිබෙනවා. මම මේ ගැන එක තැනකදී කියනකොට අම්මා කෙනෙක් මා නතර කරලා කිව්වා, " මම හිතන්නේ නැහැ ඔබතුමා මාර්කට් එකට ගිහිල්ලා තිබෙනවා කියලා" යනුවෙන්. මම ඇහුවා, ඇයි අම්මේ එහෙම කියන්නේ කියලා. එතකොට ඒ අම්මා කිව්වා, "ඔබතුමා දන්නේ නැද්ද, සමහර ආහාර ද්‍රව්‍යවල මිල දෙගුණයකින් තුන් ගුණයකින් ඉහළට ගිහිල්ලා තිබෙනවා. ඔබතුමා කියන්නේ සියයට 100ක් විතරයි, එක් ගුණයකින් විතරයි" කියලා. ඉතින් මට ඒ අම්මා බැන්නා. ඇත්ත කථාව ඒකයි. බොහෝදෙනෙක් දරිද්‍රතා රේඛාවෙන් පහළට ගිහිල්ලා තිබෙනවා. ඉතින් ඒ අය බොහෝම අමාරුවෙන් තමයි ජීවත් වෙන්නේ. ඒ නිසා තමයි අපි යෝජනා කරන්නේ මේ වැටුප 25,000ක්වත් විය යුතුයි කියලා.

මේ රටේ තව කට්ටියක් ඉන්නවා දෛනික වැඩ කරන. වැඩ කරන්නේ දිනපතා. ඒ අය සමාගමකට යන්නේ නැහැ, ඒ අයට විශ්‍රාම වැටුපක් ලැබෙන්නේ නැහැ. ඒ අයට අර්ථසාධක අරමුදලින් කිසිවක් ලැබෙන්නේ නැහැ. අපි ඒ අයට යමක් කළ යුතුමයි. දිනපතා වැඩ කරන පුද්ගලයන්, තව විධියකට කිව්වොත් ගිග් ආර්ථිකයේ රැඳෙන හුඟක් අය ඉන්නවා. කම්කරුවන් විතරක් නොවෙයි වෙන වෙන ක්ෂේත්‍රවල හුඟක් අය ඉන්නවා. ගිග් ආර්ථිකය තුළ උගත් තරුණ තරුණියන් පවා ඉන්නවා. ඒ අයටත් ආරක්ෂාවක් නැහැ. ඒ වාගේම, ගෘහ සේවක සේවිකාවන් ඉන්නවා. ඒ අයටත් ආරක්ෂාවක් නැහැ. අවුරුදු 20ක්, 30ක් වැඩ කරනවා. වැඩ කරලා ඉවර වුණාම කිසිම ඉතිරියක් නැහැ. ඒ අය අර්ථසාධක අරමුදලේ කොටස්කරුවන්වත් වෙලා නැහැ. සොයලා බලලා අපි ඒ අයට අවස්ථාවක් ලබා දෙනවා. මොකද, අවුරුදු 30ක් වැඩ කළ අය සමහර විට ඉදිරියට අවුරුදු 30ක විශ්‍රාම ජීවිතයක් ගත කරනවා. ඒ අයට අනිවාර්යයෙන්ම ආරක්ෂාවක් අවශ්‍යයි. ඒ අය ජ්‍යෙෂ්ඨ පුරවැසියන් වුණාම, විශ්‍රාම වැටුපක් නැත්නම් අඩුම ගානේ අර්ථසාධක අරමුදලකින්වත් ඒ අයට ඉතිරියක් ලබා දෙන්නට ඕනෑ. එතකොට මොකක්ද මෙතැන තිබෙන ගැටලුව?

රාජ්‍ය සේවකයන්ට ගෙවන ප්‍රමාණය අඩුයි. රාජපක්ෂ ආණ්ඩුව යටතේ රාජ්‍ය සේවකයන් ප්‍රමාණය ලක්ෂ 7 සිට ලක්ෂ 14ක් දක්වා ඉහළ ගිහිල්ලා තිබෙනවා. ඒ සංඛ්‍යාවේ ප්‍රශ්නයක් තිබෙනවා. ඒකට වග කියන්න ඕනෑ, මෙතැන හිටපු ජනාධිපතිවරු සහ මුදල් ඇමතිවරු. මොකද, ඒ අය මැතිවරණයකට ඉස්සෙල්ලා පොරොන්දුවක් දෙනවා, "අපි රාජ්‍ය සේවයට ලක්ෂයක් බඳවා ගන්නවා" කියලා. ඒ වාගේ කථා තමයි ඔවුන් මැතිවරණවල දී කිව්වේ. ඒ හරහා ඒ අය ඡන්දය ලබා ගත්තා. ඊට පස්සේ රාජ්‍ය සේවකයන් බඳවා ගත්තා. නමුත් රාජ්‍ය සේවකයන්ට නිසි වෙළඳ පොළ වැටුපක් දුන්නේ නැහැ. මේක රාජ්‍ය සේවකයන්ගේ වරද නොවෙයි, දේශපාලනඥයන්ගේ වරද. රාජ්‍ය කාර්යාලවලට සමහර අය පත් කරලා තිබෙනවා. එක කාර්යාලයකට මම ගියා. ඒ කාර්යාලයට 55දෙනෙක් පත් කරලා ඉන්නවා. නමුත් මේස දෙකයි, පුටු දෙකයි තිබුණේ. ඒ අයට කියලා තිබෙනවා ලු, ඉඳලා හිටලා ඇවිල්ලා වාඩි වෙන්න කියලා. මෙන්න කරලා තිබෙන වැඩේ! එම නිසා දේශපාලනඥයා මේකට වග කියන්න ඕනෑ. අපට උසස් රාජ්‍ය සේවයක් ඕනෑ. ඒ අයට වෙළෙඳ පොළ වටිනාකමක් තිබෙන වැටුපක් දෙන්න ඕනෑ.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තව විනාඩියක කාලයක් තිබෙනවා.

**ගරු ඉරාන් වික්‍රමරත්න මහතා**
(மாண்புமிகு இரான் விக்கிரமரத்ன)
(The Hon. Eran Wickramaratne)

ලක්ෂ්මන් කිරිඇල්ල මැතිතුමාගේ කාලයත් එතුමා මට ලබා දුන්නා. ඒ සඳහා එතුමාගේ අවසරය තිබෙනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

හොඳයි.

**ගරු ඉරාන් වික්‍රමරත්න මහතා**
(மாண்புமிகு இரான் விக்கிரமரத்ன)
(The Hon. Eran Wickramaratne)

අපි රාජ්‍ය සේවකයන්ගේ විශ්‍රාමික ප්‍රතිලාභ සුරකින්න අවශ්‍යයි. ඒක කරන්නම ඕනෑ. 2016 - 2019 කාලය තුළ විශ්‍රාමිකයන්ට අහිමි වූ විශ්‍රාම වැටුප් ලබා දීමට හා විශ්‍රාම වැටුප් විෂමතාවට තිරසර විසඳුමක් අපි ලබා දෙන්නට ඕනෑ. ඒ සඳහා විසඳුමක් දෙන්නම ඕනෑ. විශ්‍රාමික ප්‍රජාව වෙත වඩා ඉහළ ප්‍රතිලාභ සලසන අයුරින් රාජ්‍ය සේවා විශ්‍රාමිකයන්ගේ භාර අරමුදලේ කළමනාකාරිත්වය ශක්තිමත් කරනු පිණිස 1999 අංක 40 දරන රාජ්‍ය සේවා විශ්‍රාමිකයන්ගේ භාර අරමුදල පනත අපි සංශෝධනය

[ගරු ඉරාන් වික්‍රමරත්න මහතා ]

කරනවා. අපි විශ්‍රාමිකයන්ගේ ඒ ප්‍රශ්නය විසඳනවා. ඒ ගොල්ලන්ට 2016 - 2019 කාලය තුළ ඒ විශ්‍රාම වැටුප ලැබුණේ නැහැ. අපි ඒ ප්‍රශ්නය විසඳනවා. අපි මේ පනතත් නැවත සංශෝධනය කරනවා.

ඒ වාගේම රණවිරුවන්ගේ සුබසාධනය ගැනත් වචනයක් කියන්න ඕනෑ. අපි රණවිරු කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තුවක් ආරම්භ කරනවා. අපේ ආණ්ඩුව පත් වෙලා මාස 6ක් තුළදී අපි ඒක ආරම්භ කරන්න බලාපොරොත්තු වෙනවා. වර්තමානයේ රණවිරු සුබසාධනය සඳහා වගකීමෙන් බැඳී සිටින දැනට පවත්නා සියලු ආයතන අපි මේ දෙපාර්තමේන්තුව යටතට ගෙනෙනවා. ඒ අයගේ පුනරුත්ථාපන කටයුතු, සෞඛ්‍ය කටයුතු, වෘත්තිය, අධ්‍යාපනික, උපදේශන හා නිවාස ගැටලු ආදිය - ඒ අයට හුඟක් ප්‍රශ්න තිබෙනවා - නිරාකරණය කරන ක්‍රමය තමයි මම මෙතැනදී සඳහන් කරන්නේ. ඒ වාගේම විශ්‍රාමික රණවිරුවන්ට අදාළ "එක නිලයක්, එක විශ්‍රාම වැටුපක්" කියන ප්‍රතිපත්තිය ගෙනෙනවා. ඒකට කියනවා "One Rank, One Pension" ප්‍රතිපත්තිය කියලා. විශේෂයෙන්ම රණවිරුවන්ට "One Rank, One Pension" ප්‍රතිපත්තිය අපි ගෙනෙනවා.

ඒ වාගේම ඒ අයට වෙනත් ගැටලුත් තිබෙනවා. ඒ ගැටලු විසඳීම සඳහා අපි විශේෂිත ඔම්බුඩ්ස්මන්වරයෙකුත් පත් කරනවා. රණවිරුවන්ට ඒ න්‍යාය යටතේ ගිහිල්ලා කථා කරලා මාස 6ක කාලයක් තුළදී නිර්දේශයක් ලබා ගන්නට පුළුවන්. අපි මේ වාගේ හැම කොටසක්ම බලලා තිබෙනවා. අපි අද කථා කරන්නේ අවම වැටුප වැඩි කිරීම ගැනයි. නමුත් මේ කියන සමහර කොටස් ඒකටම අයිති වෙන්නේ නැහැ. හැබැයි ඒ අයගේ ප්‍රශ්න ගැනත් අපි බලන්න ඕනෑ.

අවසාන වශයෙන් මම මේ කාරණයත් කියන්න ඕනෑ. මට ප්‍රථමයෙන් කථා කළ බන්දුල ගුණවර්ධන ඇමතිතුමා කිව්වා, පසුගිය රජය ඩොලර් බිලියන 12ක් ණයට ගත්තා කියලා. ඒ කියන්නේ 2015 - 2019 කාලයේ. නමුත් ඒ ගත්ත ණය ප්‍රමාණයෙන් භාගයක්ම ඉතිරියක් හැටියටයි තිබුණේ. ඒ කියන්නේ, ඩොලර් බිලියන 6ක් Foreign Exchange Reserves තිබුණේ. අපි දන්නවා, රට බංකොලොත් වෙනකොට ඒක බින්දුවට වාගේ කඩාගෙන වැටුණු බව. එහි ඩොලර් බිලියන 6ක් තිබුණා. ඒ අවස්ථාවේ එහි ඩොලර් බිලියන 5.6ක්, 5.7ක්, ඒ කියන්නේ ඩොලර් බිලියන 6කට කිට්ටු වෙන්න තිබුණා. ඒ කියන්නේ ගත්ත ණය ප්‍රමාණයෙන් භාගයක්ම එතැන තිබුණා. අනෙක් කොටසින් සියයට 90ක්ම -මේ ගැන පර්යේෂණ ආයතන කියයි- පාවිච්චි කළේ පසුගිය කාලය තුළ ගත් ණය ගෙවීමට හා ඒවාට පොලිය ගෙවීමට. එහෙම බැලුවොත් ඇත්තටම අපි අලුතින් අරගෙන තිබෙන්නේ බොහොම සුළු ණය ප්‍රමාණයක්.

අපි මේ කාරණය පැහැදිලි කළ යුතුමයි. මොකද, ලොකු දෙයක් වෙලා තිබෙනවා කියලා පින්තූරයක් හදලා තිබෙන නිසා. හැමදාම කියන කථාව නේ ගෑස් පෝලිම නැති වුණා, පෙට්‍රල් පෝලිම නැති වුණා කියන එක. ඒ කියන්නේ රටේ ආර්ථික ප්‍රශ්න විසඳිලා තිබෙනවා කියන මතය තමයි ඇති කරලා තිබෙන්නේ. නමුත් ඒ මතය සම්පූර්ණයෙන්ම වැරැදියි.

අපි ඒ මතය සම්පූර්ණයෙන් ප්‍රතික්ෂේප කරනවා. එතුමා කියපු එක දෙයක් එක්ක විතරයි මම එකඟ වුණේ. එතුමා කිව්වා, පාර්ලිමේන්තුවට ගිනි තියන්න ආවාම ඒකට විරුද්ධ වෙන්න ඕනෑ කියලා. අනිවාර්යයෙන්ම විරුද්ධ විය යුතුයි. පක්ෂය මොකක් වුණත් කමක් නැහැ, පාර්ලිමේන්තු ක්‍රමය වෙනුවෙන් ප්‍රජාතන්ත්‍රවාදී රාමුවක් තුළ අපි එකට හිටගන්න ඕනෑ කියලා විශ්වාස කරනවා. මම නැවතත් මේ කාරණය ප්‍රකාශ කරන්න ඕනෑ. එතුමා කිව්වා, ගෙවල් පුච්චන කොට, ගෙවල්වලට හානි කරනකොට අපි ශෝකය ප්‍රකාශ කළේ නැහැ කියලා. ඒක නිවැරැදි කරන්න ඕනෑ. අපි අනිවාර්යයෙන්ම ශෝකය ප්‍රකාශ කළා. විශේෂයෙන් අපට නැතිවුණු හිතවත් මන්ත්‍රීතුමා ගැන අපි කනගාටු වුණා. ඒ විතරක් නොවෙයි. විපක්ෂ නායකතුමා ඇරෙන්න මමත් මේ සභාවේ දී එය ප්‍රකාශ කරලා තිබෙනවා. රනිල් වික්‍රමසිංහ මැතිතුමාගේ නිවසට පහර දුන් වෙලාවේත් අපි ඒක සම්පූර්ණයෙන් හෙළා දැක්කා. මොකද, ඒක ප්‍රජාතන්ත්‍රවාදී දෙයක් නොවන නිසා. අපි ප්‍රජාතන්ත්‍රවාදය ආරක්ෂා කරන්න ඕනෑ. මම දන්නවා, එතුමා කියන්න හැදුවේ මේ වාගේ ඉතිහාසයක් තිබෙන අය ඉන්නවා කියන එකයි. එදා ඒ සිදුවීම වුණු දවසක ගෝල්ෆේස් පිටියේ දී මටත් පහරක් වැදුණා. මම ඒකෙන් යාන්තම් බේරුණා. අපි ඒ දේශපාලනය සම්පූර්ණයෙන් හෙළා දකිනවා. ඒකෙන් අපි ඈත් වෙන්න ඕනෑ. නමුත් අපි ඔක්කෝම එකතු වෙලා රට ගොඩ ගනිමු. ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ප්‍රේම්නාත් සී. දොලවත්ත මන්ත්‍රීතුමා. ඔබතුමාට මිනිත්තු 14ක කාලයක් තිබෙනවා.

[අ.භා. 2.55]

**ගරු නීතිඥ ප්‍රේම්නාත් සී. දොලවත්ත මහතා**
(மாண்புமிகு சட்டத்தரணி பிரேம்நாத் சி. தொலவத்த)
(The Hon. Premnath C. Dolawatte, Attorney-at-Law)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගරු උදයන කිරිඳිගොඩ මන්ත්‍රීතුමාගේ වෙලාවත් මට ලැබිලා තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගෑස් පෝලිම විතරක් අවසන් කරලා අද උදන් අනනවා කියලා අපේ විපක්ෂයේ මන්ත්‍රීතුමා කිව්වාට, අපට ඒ කාලයේ තිබුණු ලොකුම ප්‍රශ්නය තමයි ගෑස් පෝලිම කියන එක අපි දන්නවා. ඒ කොහොම වුණත් අද දිනයේ විශේෂ අණ පනත් තුනක් මේ ගරු සභාවේ සාකච්ඡා වෙනවා. විශේෂයෙන්ම නඩු කටයුතු කඩිනමින් අවසන් කිරීම සහතික කිරීම සඳහා අපරාධ කටයුතුවලදී එලදායීවන ආකාරයට බලපාන අපරාධ නඩු විධාන සංග්‍රහය සංශෝධනය වෙනවා. ඒ වාගේම විදේශ නඩු තීන්දු අන්‍යෝන්‍යාව පිළිගැනීම, ලියාපදිංචි කිරීම සහ බලාත්මක කිරීම සඳහා නව නීතියක් සම්පාදනය වෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ රටේ යුක්තිය පසිඳලීමේ යන්ත්‍රණය තුළ නඩු කටයුතු විසඳීමේ දී විශාල කල්ගත වීමක් සිදු වෙන බව අපි දන්නවා. සමහර අවස්ථාවල දී යුක්තිය පසිඳලන අවස්ථාව වනවිට ඒ යුක්තියේ තවදුරටත් වලංගුතාවක් නොමැති තත්ත්වයක් නිර්මාණය වෙලා තිබෙනවා. මහාධිකරණවල නඩු 30,000ක්, 40,000ක් ගොඩගැහිලා තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ නඩු කටයුතු කඩිනමින් අවසන් කිරීම සඳහා අපරාධ නඩු කටයුතුවලදී අද සම්පාදනය වෙන නීතිය විශේෂයෙන් සාමාන්‍ය මහේස්ත්‍රාත් අධිකරණය තුළ, මහාධිකරණ තුළ -අපේ අධිකරණ පද්ධතිය තුළ- නොනිල වශයෙන් මීට පෙරත් සිදු වුණා. නමුත් මේ පනත් කෙටුම්පත අද පනතක් වීමෙන් පසුව විත්ති පාර්ශ්වයට සහ පැමිණිලි පාර්ශ්වයට -දෙපාර්ශ්වයටම- යම් ආකාරයේ එකඟතාවක් මත තමන්ගේ ඉල්ලීම කරලා නීතිමය ස්වරූපයක් තුළ විත්තිකරුවන්ට තමන්ගේ වරද කියා පෑමට ඇති හැකියාව සහ ඒ ඉල්ලීම කරන්න තිබෙන ඉඩප්‍රස්තාව නිර්මාණය කිරීමක් තමයි සිදු වන්නේ. අපට මේ සම්බන්ධව උදාහරණ ගන්න පුළුවන් රටවල් තිබෙනවා. එය ලංකාවටත් යොදා ගැනීම උචිතයි කියලා මා විශ්වාස කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ රටේ විවාහ ආඥා පනත යටතේ තමයි විවාහ බන්ධනයට ලක් වන්නේ. ඒ වෛවාහික පොරොන්දුව, ගිවිස ගැනීම, විවාහය ලියාපදිංචි කිරීම ලංකාවේ නීතිය තුළ සිදු වුණාම, සාමාන්‍ය ක්‍රමයට අනුව විවාහය විසුරුවා හැරීම ලංකාවේ නීතිය මඟින්ම කළ යුතුයි. නමුත් අද සම්මත වන පනත් කෙටුම්පත නීතියක් බවට පත් වීම තුළින් එකී විදෙස් නඩු තීන්දුව අදාළ කරගෙන එය ලියාපදිංචි කිරීම තුළින් ලංකාවේ විවාහයක් විසුරුවා හැරීම සහ එකී නෛෂාංගික කටයුතුවලට අවශ්‍ය ඉඩප්‍රස්තා විවර කරලා දෙනවා. මම හිතනවා, මෙය අපට සම්පාදනය වෙන ඉතාම සුවිශේෂී නීතියක් කියලා. ඒ වාගේම මෙවැනි නීති තවදුරටත් යාවත්කාලීන කළ යුතුයි.

ඒ එක්කම අපේ රටේ වැඩකරන අහිංසක ජනතාවගේ අවම වේතනය රුපියල් 12,500 සිට රුපියල් 17,500 දක්වා වැඩි කිරීමත් අද සිද්ධ වෙනවා. ඔය කියන තත්ත්වය තුළ අපි දකින දෙයක් තමයි, කුඩා සාප්පු හා කාර්යාල බොහොමයක අවුරුදු 18ක්, අවුරුදු 20ක්, අවුරුදු 22ක් පමණ වන තරුණ-තරුණියන්ගේ ශ්‍රමය සූරාකන තත්ත්වයක් පවතින බව. මූලික වේතනය බොහොම අඩු අගයක තියලා අනෙකුත් දීමනා හරහා අදාළ වැටුප් ලබා දීම තමයි ඔවුන් කරන්නේ. නමුත් අද රජය මේ විධියේ තීන්දුවක් ගැනීම තුළ, මෙවැනි වේතනයක් සඳහා අවශ්‍ය අවම වැටුප් ප්‍රමාණය තීරණය කිරීම තුළ සහ ඒ අදාළ අනෙකුත් ගෙවීම් හරහා, විශේෂයෙන්ම පෞද්ගලික අංශයේ සේවකයන්ගේ වැටුප් වර්ධනය වීමක් සිදු වෙනවාය කියන කාරණය සතුටින් ප්‍රකාශ කරන්න පුළුවන්. ඒ සඳහා අවශ්‍ය නීති රාමුව අපේ ආණ්ඩුව තුළින් මේ අවස්ථාවේ සකසා දෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, කඳුකරය, සබරගමුව, කොළඹ දිස්ත්‍රික්කයේ අවිස්සාවේල්ල, පහතරට ආදී ප්‍රදේශවල ඉන්න අපේ අහිංසක දමිළ ජනතාව, ඒ කියන්නේ තේ ඇතුළු වැවිලි කර්මාන්තයේ යෙදෙන දමිළ ජනතාවගේ දවසේ වේතනය රුපියල් 1,700ක් කියලා අපේ ජනාධිපතිතුමා සහ අපේ ආණ්ඩුව මේ වන විට නියම කරලා තිබෙනවා. ඒ පිළිබඳව මේ වන විටත් පඩිපාලක සභාව තුළ සාකච්ඡා කරමින් තිබෙනවා. සමහර ආයතන ඒ වේතනය ගෙවන්න එකඟ වෙලා තිබෙනවා. මම හිතනවා, ඒ සාකච්ඡා සාර්ථක වෙලා අපේ සහෝදර දමිළ ජනතාවට ඒ වේතනය ලැබෙයි කියලා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ විධියට ආර්ථික වශයෙන් අපි ඉස්සරහට යද්දී සහ මේ කාරණා ගැන කථා කරද්දී අපි හිටපු තැන සහ අපි අද ඉන්න තැන ගත්තාම අහසට පොළොව වාගේයි. විපක්ෂයේ ඉන්න මන්ත්‍රීවරුන් හුදෙක් බලය ලබා ගැනීමේ අරමුණ නිසා ජනාධිපතිතුමා කරපු ඒ සේවය දැන් අගය කරන්නේ නැහැ. ඒ අයට ඒ අවස්ථාව තිබුණා, මේ තත්ත්වයට නායකත්වය දෙන්න. හැබැයි, ඒ අභියෝගය භාර ගන්න ඒ අය බය වුණා. ඒ අයටත් වඩා, ඒ කණ්ඩායමටත් වඩා ඒ අයගේ නායකත්වය ඒ සඳහා විශාල බියක් දැක්වුවා. ඒ අයගේ කණ්ඩායමේ හිටපු ගරු හරින් ප්‍රනාන්දු හිටපු ඇමතිතුමා, ගරු මනුෂ නානායක්කාර හිටපු ඇමතිතුමා රට වෙනුවෙන් ඉදිරියට ඇවිල්ලා ඒ අවශ්‍ය තීන්දු අරගෙන රටේ ආර්ථිකයට විශාල සේවයක් කළා. උදාහරණයක් හැටියට ගත්තාම, මනුෂ නානායක්කාර හිටපු අමාත්‍යතුමාගේ අමාත්‍යාංශයේ මැදිහත් වීම මත ඇමෙරිකානු ඩොලර් බිලියන 12ක් විදේශ ප්‍රේෂණ වශයෙන් පසුගිය කාලයේ ලංකාවට ගෙන්වාගෙන තිබෙනවා. සංචාරක ව්‍යාපාරය ගත්තාම, අපි පසුගිය කාලයේ ඊට අදාළව සම්පූර්ණයෙන් වැටුණු රාජ්‍යයක් හැටියට හිටියත්, ලෝකයේ සංචාරක ව්‍යාපාරයේ දියුණුම තැනකට එන්න මේ වෙනකොට අපට පුළුවන්කම ලැබිලා තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අවදානමක් ගන්න බය වුණේ නැත්නම්, අවදානමක් ගතේත් නැත්නම් මේ තැනට මේ රට හැදෙන්නේ නැහැ. ඒ නිසා අපි එදා හිටපු තැන ඉඳලා අද වෙනකොට මේ තත්ත්වයට රට ගෙනැල්ලා තිබෙනවා. කවුරු හරි කෙනෙක් කියනවා නම්, ගෑස් පෝලිම නැති කළා, ඩීසල් පෝලිම නැති කළා, පෙට්‍රල් පෝලිම නැති කළා පමණයි කියලා, ඒක බොහොම කුහක ප්‍රකාශයක් හැටියටයි මා දකින්නේ. ඇයි, මම එහෙම කියන්නේ? 2023 සැප්තැම්බර් මාසයේ දිනයක ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ කළමනාකාර අධ්‍යක්ෂිකා ක්‍රිස්ටලිනා ජෝර්ජියේවා මහත්මිය කියා තිබෙනවා, රටේ සමස්ත ආර්ථික වාතාවරණය වැඩිදියුණු කිරීමට ශ්‍රී ලංකා රජය දක්වන කැපවීම පිළිබඳව ඔවුන් සෑහීමකට පත් වෙනවා කියලා. මේ ජාත්‍යන්තර නායකයන් -ජාත්‍යන්තරව පිළිගත් අය- ඒ ආර්ථික තත්ත්වය තුළ කියන කාරණා තමයි මම අද ඔබතුමාට ඉදිරිපත් කරන්නේ. ඒ එක්කම 2023 සැප්තැම්බර් 19වෙනි දා දකුණු කොරියානු ජනාධිපති Yoon Suk Yeol මහතා කියා තිබෙනවා, ජනාධිපති ගරු රනිල් වික්‍රමසිංහ මැතිතුමා ශ්‍රී ලංකාව වෙනුවෙන් ගෙන යන ආර්ථිකය ප්‍රකෘතිමත් කිරීමේ සැලසුම සඳහා එතුමාගේ පූර්ණ සහාය හිමි වෙන බවත්, රටේ පවතින උග්‍ර ආර්ථික අර්බුදය සමනය කිරීම අරමුණු කර ගත් රනිල් වික්‍රමසිංහ මැතිතුමාගේ මේ වැඩ පිළිවෙළට ප්‍රශංසා කරමින් රනිල් වික්‍රමසිංහ මැතිතුමාගේ කැපවීම එතුමා අගය කරන බවත්. අපි හුදෙක් කුහක ලෙස මේ කරුණු හංගන්න හොඳ නැහැ.

ඕස්ට්‍රේලියාවේ හිටපු අග්‍රාමාත්‍ය ස්කොට් මොරිසන් මහතා 2024 ජූලි 18වැනි දා කියලා තිබෙනවා, ශ්‍රී ලංකාවේ වඩාත්ම අභියෝගාත්මක කාල පරිච්ඡේදයක් තුළ ජනාධිපතිතුමා අත් කරගෙන තිබෙන දේ වෙනුවෙන් එතුමාගේ ප්‍රණාමය පුද කිරීමට අවශ්‍ය බවත්, වසර දෙකකට පෙර ඇති වූ ආර්ථික අර්බුදයෙන් පසු රට තුළ ස්ථාවරත්වයක් ඇති කිරීමට රනිල් වික්‍රමසිංහ මහතා සමත් වී තිබෙන බවත්. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ආසියානු සංවර්ධන බැංකුවේ සභාපති මසට්සුගු අසකාවා මහතා 2024 මැයි 5වැනි දා කියලා තිබෙනවා, ආර්ථික සහ ක්‍රියාකාරි සැලැස්ම සම්බන්ධයෙන් ශ්‍රී ලංකාව අත් කරගෙන ඇති ප්‍රගතිය පිළිබඳව එතුමා ජනාධිපති රනිල් වික්‍රමසිංහ මහතාට සහ ශ්‍රී ලංකා රජයට ප්‍රශංසා කරන බව. ඒ වාගේම ජපාන විදේශ කටයුතු අමාත්‍ය යෝකෝ කමිකාවා මහත්මිය 2024 මැයි 4වැනි දා කියලා තිබෙනවා, ණය අර්බුදය විසඳීමට සහ ආර්ථික අර්බුදයෙන් රට ගොඩ ගැනීමේ ප්‍රතිසංස්කරණ කිරීමට රනිල් වික්‍රමසිංහ මහතා දක්වන නායකත්වය එතුමා අගය කරන බව. මේ කථා කරන්නේ, රනිල් වික්‍රමසිංහ ජනාධිපතිතුමා ගැන. ඒ වාගේම 2024 පෙබරවාරි මාසයේ 19වැනි දා දකුණු සහ මධ්‍යම ආසියානු කටයුතු පිළිබඳ එක්සත් ජනපද සහකාර රාජ්‍ය ලේකම් ඩොනල්ඩ් ලූ මහතා කියලා තිබෙනවා, එතුමා සේවය කරන කලාපය තුළ ශ්‍රී ලංකාවේ කථාව තරම් වේගවත් යළි පිබිදීම පිළිබඳ කථාවක් තවත් ඇත්තේ නැහැ කියලා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේවා හිතලු කියලා කවුරු හරි කියනවා නම්, මේවා ජයග්‍රහණ නොවෙයි කියලා කවුරු හරි කියනවා නම්, පැහැදිලිවම ඒවා කුහක, වෛරී ප්‍රකාශ හැටියටයි අපි දකින්නේ. ඒ කියන්නේ ඒ අයට මේ ජයග්‍රහණයට, මේ මල් වට්ටියට අත ගහන්න බැරිවීම මත කරන ප්‍රකාශ හැටියටයි අපි එම ප්‍රකාශ දකින්නේ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

2024 අවුරුද්ද තුළ රාජ්‍ය සේවකයන්ට රුපියල් 10,000ක දීමනාවක් ලබා දෙන්න අපට පුළුවන්කම ලැබී තිබෙනවා. ඒ වෙලාවේ මේ රට තුළ විශාල වර්ජන රැල්ලක් තිබුණා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, හිටපු කෘෂිකර්ම ඇමතිවරයෙකු වන අනුර කුමාර දිසානායක මහතා, හිටපු ඇමතිවරයෙකු වන ලාල්කාන්ත මහතා ඇතුළු ජනතා විමුක්ති පෙරමුණේ සාමාජිකයන් එම වර්ජන රැල්ල ක්‍රියාත්මක කරද්දී අපේ රටේ ජනතාව ඒ වර්ජන රැල්ලට ඉදිරියෙන් සිටියේ. එදා දුම්රිය සේවකයන් ස්ට්‍රයික් කරද්දී අපේ රටේ ගෞරවනීය ජනතාව අපට

[ගරු නීතිඥ ප්‍රේමනාත් සී. දොලවත්ත මහතා]

කිව්වා, ඔය වර්ජනවලට හිස නවන්න එපා, කෝච්චියෙන් නොවෙයි ඔවුන් පයින් ගෙදර යන්නම් කියලා. හැබැයි, ජනතාව එහෙම කියනකොට ජනතා විමුක්ති පෙරමුණ එම වර්ජන රැල්ල හකුළා ගත්තා. එවැනි තත්ත්වයක් තිබියදීත් ජනාධිපතිතුමා තවදුරටත් රජයේ සේවකයන්ගේ තත්ත්වය වර්ධනය කරන්න අවශ්‍ය නායකත්වය දක්වලා, වැටුප් සම්බන්ධයෙන් කරුණු-කාරණා සොයන්න කමිටුවක් පත් කළා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, සාමාන්‍යයෙන් රාජ්‍ය සේවකයන්ට වැටුප් ලබා දීමේ හැකියාව තිබෙන්නේ රටේ බදු ආදායම සහ රාජ්‍ය සේවකයන්ට ගෙවන වැටුප් අතර වූ ප්‍රතිශතය මතයි. ඒක තමයි අපි බලන්න ඕනෑ. සාමාන්‍යයෙන් රාජ්‍ය සේවක වැටුප් සඳහා අවශ්‍ය ප්‍රතිශතය 25කට වඩා වැඩි නම් අපි කියනවා, ඒක රජයට බරක් කියලා.

2019 අවුරුද්දේ රජයේ බදු ආදායම රුපියල් බිලියන 1,734.9යි. රාජ්‍ය සේවක වැටුප් ගෙවන්න රුපියල් බිලියන 686.5ක් වැය වුණා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එය ප්‍රතිශතයක් වශයෙන් 39.6ක්. 2020 අවුරුද්දේ බදු ආදායම රුපියල් බිලියන 1,216යි. රාජ්‍ය සේවක වැටුප් සඳහා රුපියල් බිලියන 794ක් වැය වෙලා තිබෙනවා. එය ප්‍රතිශතයක් වශයෙන් 65.3යි. 2021 අවුරුද්දේ බදු ආදායම රුපියල් බිලියන 1,298යි. රාජ්‍ය සේවක වැටුප් සඳහා රුපියල් බිලියන 845ක් අවශ්‍ය වුණා. එය ප්‍රතිශතයක් වශයෙන් 65යි. 2022 අවුරුද්දේ බදු ආදායම රුපියල් බිලියන 1,751යි. රාජ්‍ය සේවක වැටුප් සඳහා රුපියල් බිලියන 956ක් අවශ්‍ය වුණා. එහි ප්‍රතිශතය 54යි. 2023 අවුරුද්දේ රජයේ බදු ආදායම රුපියල් බිලියන 2,720යි. රාජ්‍ය සේවක වැටුප් සඳහා රුපියල් බිලියන 939ක් වැය වෙලා තිබෙනවා. එහි ප්‍රතිශතය 34යි. 2024 අවුරුද්දේ අප්‍රේල් මාසය දක්වා බදු ආදායම රුපියල් බිලියන 1,117යි. රාජ්‍ය සේවක වැටුප් සඳහා රුපියල් බිලියන 301යි, ඒ ප්‍රතිශතය 27යි. ඒ අනුව 2024 අවුරුද්දේ ඉදිරි කාලය පිළිබඳව කළ පුරෝකථනය අනුව බදු ආදායම තවදුරටත් රුපියල් බිලියන 3,880ක් වශයෙන් ලැබෙනකොට, රාජ්‍ය සේවක වැටුප් සඳහා රුපියල් බිලියන 905ක් අවශ්‍ය වෙනවා. ඒ කියන්නේ ඒ ප්‍රතිශතය 23.7ක්. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මෙම නිර්ණය කිරීම් මත තමයි 2025.01.01 සිට මේ විධියට වැටුප් වැඩි කරන්න පුළුවන් කියලා අපි කියන්නේ. මේක හිතලුවක්, ඡන්ද පොරොන්දුවක් නොවෙයි. අපි දෙන්න බැරි දෙයක් ගැන කියනවා නොවෙයි. මේක අපේ ක්‍රමය තුළ, අපි අරගෙන ආපු ප්‍රතිපත්ති තුළ, අපි බීපු අමාරු බෙහෙත් තුළ ඇති කර ගත් සංවර්ධනයක්.

දැන් අනුර කුමාර දිසානායක මහත්මයා කියනවා, මේ වෙලාවේ රුපියල් 25,000කින් රාජ්‍ය සේවක වැටුප් වැඩි කරන්න බැහැ කියලා. හැබැයි, අපේ ජනාධිපතිතුමා -අපේ මුදල් ඇමතිතුමා- කියනවා, නැහැ, ඒක කරන්න පුළුවන් කියලා. කොහොමද? කමිටුවක් පත් කරලා, ඒ කමිටුව විසින් නිර්ණය කරලා තමයි මේ විධියට වැටුප් වැඩි කරලා තිබෙන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ රාජ්‍ය සේවය ගත්තාම කාර්යාල කාර්ය සහායක III ශ්‍රේණියේ වැටුප රුපියල් 5,450කින්, II ශ්‍රේණියේ වැටුප රුපියල් 8,760කින්, I ශ්‍රේණියේ වැටුප රුපියල් 10,950කින් වැඩි වෙනවා. කාර්යාල කාර්ය සහායක විශේෂ ශ්‍රේණියේ වැටුප රුපියල් 13,980කින් වැඩි වෙනවා.

රියදුරු සේවයේ III ශ්‍රේණියේ වැටුප රුපියල් 6,960කින්, II ශ්‍රේණියේ වැටුප රුපියල් 9,990කින් සහ I ශ්‍රේණියේ වැටුප රුපියල් 13,020කින් වැඩි වෙනවා. රියදුරු විශේෂ ශ්‍රේණියේ වැටුප රුපියල් 16,340කින් වැඩි වෙනවා.

සමෘද්ධි සංවර්ධන නිලධාරි III ශ්‍රේණියේ වැටුප රුපියල් 8,340කින්, II ශ්‍රේණියේ වැටුප රුපියල් 11,690කින් සහ I ශ්‍රේණියේ වැටුප රුපියල් 15,685කින් වැඩි වෙනවා.

කළමනාකරණ සහකාර III ශ්‍රේණියේ වැටුප රුපියල් 10,140කින් වැඩි වන අතර II ශ්‍රේණියේ වැටුප රුපියල් 13,490කින්, I ශ්‍රේණියේ වැටුප රුපියල් 17,550කින් වැඩි වෙනවා.

සංවර්ධන නිලධාරි III ශ්‍රේණියේ වැටුප රුපියල් 12,710කින් වැඩි වන අතර II ශ්‍රේණියේ වැටුප රුපියල් 17,820කින් හා I ශ්‍රේණියේ වැටුප රුපියල් 25,150කින් වැඩි වෙනවා.

මහජන සෞඛ්‍ය පරීක්ෂක හා පවුල් සෞඛ්‍ය සේවිකා III ශ්‍රේණියේ වැටුප රුපියල් 12,885කින් වැඩි වන අතර II ශ්‍රේණියේ වැටුප රුපියල් 17,945කින් සහ I ශ්‍රේණියේ වැටුප රුපියල් 25,275කින් වැඩි වෙනවා.

විකිරණවේදී සහ ඖෂධවේදී III ශ්‍රේණියේ වැටුප රුපියල් 13,280කින් වැඩි වෙනවා. එහි II ශ්‍රේණියේ වැටුප රුපියල් 18,310කින් සහ I ශ්‍රේණියේ වැටුප රුපියල් 25,720කින් වැඩි වෙනවා.

තවද, හෙද නිලධාරි III ශ්‍රේණියේ වැටුප රුපියල් 13,725කින් වැඩි වන අතර II ශ්‍රේණියේ වැටුප රුපියල් 18,835කින් සහ I ශ්‍රේණියේ වැටුප රුපියල් 26,165කින් වැඩි වෙනවා.

විදුහල්පති III ශ්‍රේණියේ වැටුප රුපියල් 23,425කින් වැඩි වන අතර II ශ්‍රේණියේ වැටුප රුපියල් 29,935කින් හා I ශ්‍රේණියේ වැටුප රුපියල් 39,395කින් වැඩි වෙනවා.

ගුරු සේවයේ විද්‍යා පීඨ ගුරුවරුන් සඳහා රුපියල් 17,480කින් වැටුප් වැඩි වෙනවා. උපාධිධාරි ගුරුවරුන්ට රුපියල් 19,055කින් වැටුප් වැඩි වෙනවා. ගුරු සේවය 2 - II ශ්‍රේණියේ වැටුප රුපියල් 20,425කින් සහ 2 - I ශ්‍රේණියේ වැටුප රුපියල් 28,675කින් වැඩි වෙනවා. ගුරු සේවය I ශ්‍රේණියට රුපියල් 38,020කින් වැටුප් වැඩි වෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ රාජ්‍ය සේවය තිබුණේ කොහොමද? මීට අවුරුදු දෙකකට ඉස්සෙල්ලා රාජ්‍ය සේවකයන්ට වැටුප් ගෙවන්න යෝජනා වුණේ අවස්ථා දෙකකට. එහෙම වෙන්න ගිය රාජ්‍ය සේවකයන්ට අපි 2025 අවුරුද්දේ මේ විධියට වැටුප් ගෙවන්න තීරණය කරලා තිබෙනවා. ඒක හිතලුවක් නොවෙයි; බොරු පොරොන්දුවක් නොවෙයි. අපි ඒකට අදාළ කමිටුව පත් කරලා, ඒ කමිටුවේ නිර්දේශ මත තමයි අදාළ තීරණ අරගෙන තිබෙන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ නිසා අපි පැහැදිලිව කියන්න ඕනෑ, මේවා ඡන්ද පොරොන්දු නොවෙයි කියලා. මා ළඟ ඒ Cabinet Paper එක තිබෙනවා. ඒ Cabinet Paper එක මම මේ අවස්ථාවේදී **සභාගත*** කරනවා.

---

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

ඒ වාගේම ඊට අදාළ අතුරු වාර්තාව මා ළඟ තිබෙනවා. වැටුප් වැඩිවීම වෙන්නේ කොහොමද කියලා එහි සඳහන් වෙලා තිබෙනවා. දැන් තිබෙන ප්‍රශ්නය මේකයි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ගරු විපක්ෂ නායකතුමා ඒ වැටුප් ගැළපීමේ වචන දෙකක් වෙනස් කරලා, අවම වැටුප රුපියල් 57,500ක් කරලා තිබෙනවා. ප්‍රශ්නයක් නැහැ. අමාරු බෙහෙත් බීලා, මේ අභියෝගය, මේ අර්බුදය භාර අරගෙන, භය වෙන්නේ නැතිව, මේ අර්බුදයෙන් පලා යන්නේ නැතිව ආණ්ඩුවක් හැටියට අපි අමාරු තීන්දු - තීරණ අරගෙන රට මේ තැනට ස්ථාවරව ගෙනැත් තිබෙනවා. හංසයාගේ එක එක රත්තරන් පිහාටුව ගලවාගෙන හෙමින් හෙමින් ඉස්සරහට එන්න ඕනෑ අවස්ථාවක හංසයාගේ සම්පූර්ණ පිහාටු ටික ගලවලා එක්වරම දියුණු වෙන්න, එක්වරම පොහොසත් වෙන්න උත්සාහ කරන තත්ත්වයක්ද දැන් තිබෙන්නේ කියන ගැටලුව අප හමුවේ තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි මේ කාරණය පැහැදිලිවම කියන්න ඕනෑ. රාජ්‍ය සේවකයාට වැටුප් අහිමි වෙලා දුර්මුඛව, දුක්මුසුව ඉන්න සිදු වෙමින් තිබියදී, රටක් හැටියට, රාජ්‍යයක් හැටියට බංග්ලාදේශයට, මාලදිවයිනට ඇති වෙලා තිබෙන තත්ත්වය අපේ රටේ නිර්මාණය වෙමින් තිබියදී ඒ තත්ත්වය නැති කළේ ආණ්ඩුව හැටියට අපි ඔක්කොම රනිල් වික්‍රමසිංහ මැතිතුමා එක්ක එකතු වෙලා මේ අභියෝගය භාර අරගෙන වැඩ කරපු නිසායි. ඒ අභියෝගය භාර අරගෙන වැඩ කරනකොට සමහර වෙලාවට අපට ප්‍රසිද්ධ නොවන, දේශපාලන නොවන තීන්දු - තීරණ ගන්න සිද්ධ වුණා. එහි ප්‍රතිඵලයක් හැටියට අද රට ස්ථාවර වෙලා තිබෙනවා. ඒ නිසා සමස්ත රාජ්‍ය සේවකයන්ගෙන්, සමස්ත රටවැසියන්ගෙන් අපි ඉල්ලීමක් කරනවා, ඉතාම කඩිනමින් ලබා දෙනවා කියා පොරොන්දු වන්නා වූ, විශාල වෙනසක් සඳහා කරන්නා වූ ඉල්ලීම්වලදී ඔබේ මනස වෙනස් කර ගන්න එපා කියලා.

අපි මේ තිබෙන තත්ත්වය ඉදිරියට ගෙන යෑම කළ යුතුයි. රටක් හැටියට ලෝකය හමුවේ අපේ රට වැටිලා සිටි අවධියක් තිබුණත්, මේ වෙලාව අපේ රට කෙමෙන් කෙමෙන් ඉදිරියට එන වෙලාවක්, රටක් හැටියට අපි ස්ථාවර වන වෙලාවක්. මම හිතනවා, සවිඥානික බුද්ධියක් ඇති, පැසුණු මනසක් ඇති සියලුදෙනා මේ කියන තත්ත්වය තේරුම් අරගෙන, "පිරුණු කළේ දිය නොසැලේ" කියනවා වාගේ බොහොම නිහඬව ඒ අවශ්‍ය කටයුතු සම්පාදනය කරමින්, මේ රටේ එළඹෙන ජනාධිපතිවරණයේදී රාජ්‍ය සේවකයෝ හැටියට තමන්ගේ භූමිකාව ඉෂ්ට කරන්න බලාගෙන ඉන්නවා කියලා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, රනිල් වික්‍රමසිංහ මැතිතුමා යහ පාලන ආණ්ඩුව කාලයේ පොලිස් නිලධාරින්ට සියයට 40කින් වැටුප් වැඩි කළා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට මිනිත්තු 2ක කාලයක් තිබෙනවා.

**ගරු නීතිඥ ප්‍රේම්නාත් සී. දොලවත්ත මහතා**
(மாண்புமிகு சட்டத்தரணி பிரேம்நாத் சி. தொலவத்த)
(The Hon. Premnath C. Dolawatte, Attorney-at-Law)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට විනාඩි 20ක කාලයක් ලැබිලා තිබෙනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
විනාඩි 6ක කාලයක් තමයි එකතු කරන්න කියලා තිබෙන්නේ.

**ගරු නීතිඥ ප්‍රේම්නාත් සී. දොලවත්ත මහතා**
(மாண்புமிகு சட்டத்தரணி பிரேம்நாத் சி. தொலவத்த)
(The Hon. Premnath C. Dolawatte, Attorney-at-Law)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට විනාඩි 20ක් දෙනවා කියලා තමයි කිව්වේ.

ඒ එක්කම ආරක්ෂක අංශවල ආහාර දීමනාව හා බටා ආදී සියල්ල ලබා ගැනීමේ හැකියාව තුළ රාජ්‍ය සේවකයන් සියලුදෙනාට ඒ දීමනා හරහා විශාල වශයෙන් තමන්ගේ ආර්ථික පසුබිම දියුණු කර ගන්න අවශ්‍ය ඉඩකඩ මේ අමාරු කාලය තුළ අපි සම්පාදනය කරලා තිබෙනවා. අපි ඒ සියල්ල සිද්ධ කරනකොට, අද එක පැත්තකින් සජබ වේදිකාව තුළ ඔවුන්ම කියනවා, "අපේ පක්ෂය බංකොලොත් වෙලා තිබෙන්නේ බස් ම බෙදලා", "අපේ පක්ෂය බංකොලොත් වෙලා තිබෙන්නේ smart boards ම බෙදලා" කියලා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තව මිනිත්තු 7ක කාලයක් තිබෙනවා.

**ගරු නීතිඥ ප්‍රේම්නාත් සී. දොලවත්ත මහතා**
(மாண்புமிகு சட்டத்தரணி பிரேம்நாத் சி. தொலவத்த)
(The Hon. Premnath C. Dolawatte, Attorney-at-Law)
ස්තුතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

මම අහන්න කැමැතියි, පක්ෂයක් පාලනය කරන්නේ ඒ විධියට නම්, බංකොලොත් වෙනතුරු බස් බෙදනවා නම්, බංකොලොත් වෙනතුරු smart boards බෙදනවා නම් ඒක බොහොම අමාරු තත්ත්වයක් නේද කියලා. ඉස්සෙල්ලාම තමන්ගේ පක්ෂය ස්ථාවර වෙන්න ඕනෑ. තමන්ගේ පක්ෂය බංකොලොත් කර ගන්නවා නම්, එහෙම අය රටක් සම්බන්ධයෙන් ඉදිරියේදී තීරණ ගන්නකොට කොයි විධියට කටයුතු කරයිද? ඒ නිසා අවධානයෙන් කටයුතු කරන්න ඕනෑ. බෙදනවා කියලා බෙදලා හරියන්නේ නැහැ. දැන් ඔය කියන විධියට සහන දෙනවා කියලා යෝජනා කරලා හරියන්නේ නැහැ. ඒ සහන දෙන ක්‍රමයක් අනුගමනය කරන්න ඕනෑ. ඒ සහන දෙන ක්‍රමයක් කියන්න ඕනෑ.

එතැනින් එහාට ගිහිල්ලා ජනතා විමුක්ති පෙරමුණ අද කථා කරන්නේ මොනවාද? අද පෞද්ගලික අධ්‍යාපන ආයතනවල ඉගෙන ගන්නා, ඉගෙන ගත්ත, එම අධ්‍යාපන ආයතනවලින් උපාධි ගත්ත කිසිම කෙනෙකුට ජනතා විමුක්ති පෙරමුණට ඡන්දයක් දෙන්න හිතෙන්න විධියක් නැහැ. මොකද, නිදහසින් පස්සේ රට පාලනය කරපු සෑම පාලන තන්ත්‍රයකටම ජනතා විමුක්ති පෙරමුණේ දායකත්වය ලබා දෙන ගමන්ම, කැරලි ගසමින් - ඒ සියල්ල කරමින් - 1982දී ගෙනාපු ධවල පත්‍රිකාවේ ඉඳලා නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණවලට ඔවුන් විරුද්ධ වුණා. ඒ වාගේම අපේ රටේ දරුවන්ට උසස් අධ්‍යාපනය දෙන්න ආණ්ඩුවට සියයට සියයක් හැකියාව නොමැතිවීම කියන කාරණය මත, පෞද්ගලික අංශයට ආරාධනා කරලා උසස් අධ්‍යාපනය දියුණු කරන්න යන සෑම අවස්ථාවකදීම ජනතා විමුක්ති පෙරමුණ පෞද්ගලික විශ්වවිද්‍යාල බිහි කිරීමට විරුද්ධව කථා කළා. ඒ හැම වෙලාවේදීම ජනතා විමුක්ති පෙරමුණ ප්‍රකාශ කළේ, අධ්‍යාපන කඩ වසා දැමිය යුතුයි කියායි. එහෙම නම් මේ රටේ උසස් අධ්‍යාපනය ලබමින් පෞද්ගලික විශ්වවිද්‍යාලවල සිටින දරුවන්ගෙන් වාගේම, ඒ පෞද්ගලික විශ්වවිද්‍යාලවලින් උපාධිය ලබාගෙන රටට යම් ආකාරයක සේවයක් කරන ගුරු භවතුන්ගෙන් ඡන්දයක් ඉල්ලන්න ජනතා විමුක්ති පෙරමුණට සදාචාරාත්මක අයිතියක් නැහැ. මොකද, ඒ අය දිගින් දිගටම

[ගරු නීතිඥ ප්‍රේමනාත් සී. දොලවත්ත මහතා]

හැමදාම ප්‍රකාශ කළේ, තමන්ට අවශ්‍ය වෙන්නේ නිදහස් අධ්‍යාපනය කියන කාරණයයි. මේ රටේ නිදහස් අධ්‍යාපනය සපයන්න බැරි, Advanced Level විභාගය ලියන ලක්ෂ තුනක් වූ දරුවන්ගෙන් උසස් අධ්‍යාපනය ලබන්න බැරිව ඉතිරි වන දරුවන්ගේ නැණ පහන් දල්වන්න පෞද්ගලික උසස් අධ්‍යාපන ආයතන ඇති කිරීමේදී ජනතා විමුක්ති පෙරමුණේ අය දැඩි විරෝධය පෑ බව අපට රහසක් නොවෙයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඊයේ කැබිනට් මණ්ඩලයට කැබිනට් සන්දේශයක් ඉදිරිපත් කරමින් අපේ රටේ කල් ගිය පළාත් පාලන මැතිවරණය සඳහා ඉදිරිපත් වූ නාම යෝජනා පිළිබඳ තීන්දුවක් අරගෙන තිබෙනවා. එම ඒකාබද්ධ කැබිනට් සන්දේශය ඉදිරිපත් කිරීම වෙනුවෙන් මම කැබිනට් මණ්ඩලයට ස්තුතිවන්ත වෙනවා. මොකද, පූර්වයේ ඉදිරිපත් කරන ලද නාම යෝජනා අනුව පළාත් පාලන මැතිවරණය පැවැත්වුවහොත් මේ රටේ ලක්ෂ 9ක තරුණ ප්‍රජාවකට ඡන්ද අයිතිය පාවිච්චි කිරීමට හැකියාව ලැබෙන්නේ නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද නිරන්තරයෙන්ම මේ පාර්ලිමේන්තුව තුළ කථා කළා, පෞද්ගලික මන්ත්‍රී පනත් කෙටුම්පත් සම්බන්ධයෙන්. අවංකවම මම සතුටු වෙනවා, මේ පාර්ලිමේන්තු ඉතිහාසය තුළ සම්මත වෙච්ච එකම පෞද්ගලික මන්ත්‍රී පනත් කෙටුම්පත මේ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරලා, එය පනතක් බවට පත් කරන්න පුළුවන්කම ලැබීම පිළිබඳව. ඒ කියන්නේ මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, 2023 අංක 30 දරන පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් (සංශෝධන) පනත තුළින් අපේ රටේ තරුණයන්ට සියයට 25ක කෝටාවක් සහිතව නාම යෝජනා ලබා දීමේ හැකියාව ලබා දෙන්න මට පුළුවන් වුණා. ඒ සම්බන්ධයෙන් පාර්ලිමේන්තුවේ පක්ෂ විපක්ෂ සියලු මන්ත්‍රීවරුන්ට, කැබිනට් මණ්ඩලයට සහ ගරු ජනාධිපතිතුමාට මම ස්තුතිවන්ත වෙනවා. විශේෂයෙන්ම අපේ රටේ පෞද්ගලික මන්ත්‍රී පනත් කෙටුම්පතක් නීතියක් බවට පත්වීම බොහොම විරල දෙයක්. ඒ නිසා තමයි එය පාර්ලිමේන්තු ඉතිහාසය තුළ එවැනි පෞද්ගලික පනත් කෙටුම්පතක් සම්මත වෙච්ච පළමුවෙනි අවස්ථාව වෙන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මගේ තර්කය මේකයි. විශේෂයෙන්ම අද මෙවැනි තත්ත්වයක් නිර්මාණය වෙලා තිබෙනවා. එය මේ අදාළ කැබිනට් පත්‍රිකාවේ පැහැදිලිව සඳහන් කර තිබෙනවා. පූර්වයේ ඇති නාම යෝජනා සැලකිල්ලට ගනිමින් මේ මැතිවරණය පැවැත්වුවහොත් නවලක්ෂයක තරුණයන්ට හිමි ඡන්ද අයිතිය වාගේම නාම යෝජනා තුළ තරුණයන්ට ලබා දී ඇති සියයට 25ක නියෝජනය අහිමි වෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ නිසා පූර්වයේ තිබෙන කල් ගත වුණු, ඇල්මැරුණු, අවුරුදු ගණනක් තිස්සේ දිගටම ඇදගෙන එන මේ නාම යෝජනා සියල්ල අවසන් කරලා, ඉදිරි කාලය තුළ පවත්වන පළාත් පාලන ආයතන මැතිවරණයට නව නාම යෝජනා ඉදිරිපත් කිරීම සුදුසුයි කියන කාරණය පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරු හැටියට අපිත් මේ අවස්ථාවේදී අනුමත කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඇල්පිටිය පළාත් පාලන ආයතනය ගැන අද අපට සතුටු වෙන්න පුළුවන්. මොකද, ඇල්පිටිය පළාත් පාලන ආයතනයේ නාම යෝජනාවල සියයට 25ක තරුණ නියෝජනයක් තිබෙනවා. අපේක්ෂකයෝ 25දෙනෙක් නාම යෝජනා ඉදිරිපත් කර තිබෙනවා. ඒ අපේක්ෂකයෝ 25දෙනාගෙන් 7දෙනෙක් තරුණයෝ. ඒ අනුව, හතරෙන් එකක අවස්ථාව තරුණයන්ට ලැබිලා තිබෙන බව මා මේ අවස්ථාවේ පැහැදිලිව කියන්න ඕනෑ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද අපි හමුවේ තිබෙන්නේ විශාල වගකීමක්. අපේ අනාගතය සහ අපේ දේශපාලන අනාගතය වෙනුවෙන් අපි ඉදිරියේදී කටයුතු කරන්නේ කොහොමද, අපි පූර්වයේ විශ්වාස කරපු දේවල්, අපේ පූර්වයේ පසමිතුරුකම් කියන ඒ සියල්ල නොසලකා රට වෙනුවෙන් අපි එකතු විය යුතු කාලය තමයි අද එළඹිලා තිබෙන්නේ. මේ යන මාර්ගය දුෂ්කර වුවත්, මේ යන මාර්ගය බොහොම සාර්ථක, නිවැරදි මාර්ගයක්. අපි කවුරුත් දන්නවා මේ රටේ ආර්ථික තත්ත්වය. අද සියලුදෙනා කථා කරන්නේ රටේ ඇති කළ යුතු ජාතික ප්‍රතිපත්ති ගැනයි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. රාජ්‍ය ණය කළමනාකරණ පනත, රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනත, ආර්ථික පරිවර්තන පනත, ශ්‍රී ලංකා මහ බැංකු පනත හා දූෂණ විරෝධී පනත කියන මේ සියලු අණපනත්වලින් අපි විරාත් කාලයක් බලාපොරොත්තු වෙච්ච, අපි විරාත් කාලයක් ඉල්ලපු ජාතික ප්‍රතිපත්තියක් ආර්ථිකය වෙනුවෙන් සම්පාදනය කරලා තිබෙනවා. එහි තවදුරටත් යා යුතු මඟක් තිබෙනවා. විශේෂයෙන්ම ආර්ථික පරිවර්තන පනතේ 4 වන වගන්තිය යටතේ පැහැදිලිව දක්වා තිබෙනවා, අපි ළඟා කරගත යුතු අපේ ආර්ථික ඉලක්ක. ඉතින්, ජාතික ප්‍රතිපත්ති ආර්ථිකය වෙනුවෙන් සැකසෙමින් පවතින අවස්ථාවක, IMF එකේ යෝජනා අනුව අපි නිවැරදිව ස්ථාවරයකට යන අවස්ථාවක, රජයේ පැවැත්ම ස්ථාවරව පවත්වාගෙන යන අවස්ථාවක, රාජ්‍ය බැංකු ටික නිවැරදිව ඉස්සරහට යන අවස්ථාවක අපි ඉන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එදා අපට විශාල සැකයක් තිබුණා, අපි බැංකුවේ deposit කරපු මුදල් ටික අපට withdraw කර ගන්න පුළුවන්ද කියලා. හැබැයි, අපි ඒ සියලු සැක අවසන් කර ගත්තා. අද බංග්ලාදේශය ගත්තාම, සුළුතර අහිංසක බෞද්ධයන් මරනවා; සුළුතර හින්දු භක්තිකයන් මරනවා. අද ඒ රටේ ප්‍රජාතන්ත්‍රවාදයට ඉඩක් නැහැ, නීතියේ පාලනයක් නැහැ. ජනතා විමුක්ති පෙරමුණ කියනවා වාගේ, අධිකරණ බලය ගමට ගිහින් තිබෙන්නේ. එය අද අපට ඇස් පනා පිට පෙනෙන්න තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මාලදිවයින අද සම්පූර්ණයෙන්ම බංකොලොත් වෙලා තිබෙනවා. අපේ කලාපයේ මෙවැනි තත්ත්ව පෙනෙන්න පැවතීම තුළ මම ඉල්ලීමක් කරනවා, අපේ අනාගත දේශපාලන දිශානතිය බලන්නේ නැතුව, අපේ පාට, පක්ෂ, අපි මොකක්ද කරන්නේ කියන එක බලන්නේ නැතුව මේ වෙලාවේ අපි රට වෙනුවෙන් තීරණයක් ගැනීම කළ යුතුයි කියලා. ඒ කාරණය මතක් කරමින් මා නිහඬ වනවා.

බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ජයන්ත සමරවීර මන්ත්‍රීතුමා. ඔබතුමාට මිනිත්තු 7ක කාලයක් තිබෙනවා.

**ගරු ජයන්ත සමරවීර මහතා**
(மாண்புமிகு ஜயந்த சமரவீர)
(The Hon. Jayantha Samaraweera)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට මිනිත්තු 10ක් වෙන් වෙලා තිබෙන බවයි කිව්වේ.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔබතුමාට ලබා දී තිබෙන්නේ නම් මිනිත්තු 7ක කාලයක්.

Order, please! මේ අවස්ථාවේදී කවුරුන් හෝ ගරු මන්ත්‍රීවරයෙක් මූලාසනය සඳහා ගරු මන්ත්‍රීවරයෙකුගේ නමක් යෝජනා කරන්න.

**ගරු ජනාධිපති නීතිඥ එම්.යූ.එම්. අලි සබ්රි මහතා**
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி எம்.யூ.எம். அலி சப்ரி)
(The Hon. M.U.M. Ali Sabry, PC)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "ගරු මංජුලා දිසානායක මන්ත්‍රීතුමිය දැන් මූලාසනය ගත යුතුය" යි මා යෝජනා කරනවා.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***අනතුරුව ගරු ජගත් සමරවික්‍රම මහතා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු මංජුලා දිසානායක මහත්මිය මූලාසනාරූඪ විය.***

*அதன்பிறகு, மாண்புமிகு ஜகத் சமரவிக்ரம அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, (திருமதி) மஞ்சுலா திசாநாயக்க அவர்கள் தலைமை வகித்தார்கள்.*
*Whereupon THE HON. JAGATH SAMARAWICKRAMA left the Chair and THE HON. (MRS.) MANJULA DISSANAYAKE took the Chair.*

[අ.භා. 3.24]

**ගරු ජයන්ත සමරවීර මහතා**
(மாண்புமிகு ஜயந்த சமரவீர)
(The Hon. Jayantha Samaraweera)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, අපරාධ නඩු විධාන සංග්‍රහය (සංශෝධන) පනත් කෙටුම්පතත්, විදේශ නඩු තීන්දු අන්‍යෝන්‍යාව පිළිගැනීම, ලියාපදිංචි කිරීම සහ බලාත්මක කිරීම පිළිබඳ පනත් කෙටුම්පතත්, සේවකයන්ගේ ජාතික අවම වේතනය (සංශෝධන) පනත් කෙටුම්පතත් සාකච්ඡාවට භාජන වන මේ වෙලාවේ ඒ පිළිබඳව විපක්ෂයේ ගරු මන්ත්‍රීතුමන්ලා දරපු අදහස්වලට මුළුමනින්ම මාගේ එකඟතාව පළ කරමින්, විශේෂයෙන් අපරාධ නඩු විධාන සංග්‍රහයට අදාළ කාරණයට පාර්ශ්වීයව බලපාන කරුණක් පිළිබඳව, මේ සමාජයේ, මේ ගරු සභාවේ හරිහමන් අවධානයකට ලක් නොවුණු, බැරෑරුම් ප්‍රහාරයක් පිළිබඳව මේ ගරු සභාවේ අවධානය යොමු කරවලා, ජාතික උරුමයන් සුරැකීම උදෙසා ක්‍රියාත්මක වීම පිණිස වන පාර්ලිමේන්තු මන්ත්‍රී සංසදය මඟින් පත්කරන ලද අනුකමිටුව විසින් සකස් කරන ලද, බුදු දහම හා ඉතිහාසය විකෘති කිරීම වැළැක්වීම සඳහා නිර්දේශ ඉදිරිපත් කිරීම පිළිබඳ වාර්තාව සභාගත කරන්න මම බලාපොරොත්තු වෙනවා.

එය ආගමික කටයුතු හා සහජීවනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවටත්, බුද්ධශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාවටත් යොමු කරන ලෙස ඔබතුමියගෙන් ඉල්ලා සිටිනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, අපි ඉන්නේ අපේ ඉතිහාසයේ ඉතාම අවිනිශ්චිත මොහොතක කියලා කිව්වොත් මම හිතනවා මම වඩා නිවැරදියි කියලා. මොකද කියලා, විය හැක්කේ කුමක්ද කියලා කිසිදු නිශ්චිතතාවක්, කිසිදු ස්ථිරතාවක් නොමැති මොහොතකයි අපි ඉන්නේ. අපි වැටී තිබෙන මේ ශෝචනීය ආර්ථික තත්ත්වයෙන්, ඛේදනීය තත්ත්වයෙන් ගොඩ ඒම "වැල් පාලමෙන් එගොඩවීම හැර අන්කිසිවක් නොවෙයි" කියලා එකා පරයා එකා කියමින් ඉන්න වේලාවකයි අපි ඉන්නේ. අපි නම් විශ්වාස කරන්නේ නැහැ, "දැන් ඉතින් කරන්න දෙයක් නැහැ, වැල් පාලමෙන් එගොඩ වෙලා යන්න ඕනෑ ඉතුරු ටිකත්" කියලා, මේ අප වැටී තිබෙන බිහිසුණු ආර්ථික අර්බුදයෙන්, මේ ශෝචනීයභාවයෙන්, බංකොලොත්භාවයෙන් අපට ගොඩ එන්න පුළුවන් වෙයි කියලා. ඒ නිසා තමයි "සර්වජන බලය" දේශපාලන සන්ධානය හැටියට අපි මේ ජනාධිපතිවරණයට ඇවිල්ලා, "එක්ව නංවන රටක් - සතුට පිරුණු දැයක්" හැටියට මේ රට ගොඩනගන්නේ කොහොමද කියලා සර්වජන අපේක්ෂකයා හැටියට දිලිත් ජයවීර මැතිතුමා ඉදිරිපත් කරලා තිබෙන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මේ ශෝචනීය ආර්ථික තත්ත්වය ඇතුළේ, මේ ඛේදනීය ආර්ථික තත්ත්වය ඇතුළේ, මේ විෂම තත්ත්වය ඇතුළේ අපි එකිනෙකා මේ උගුලට පැටලිලා ඉන්න වෙලාවේ රටක් හැටියට, සමාජයක් හැටියට, ජාතියක් හැටියට තවත් ඉතා මාරක මෙහෙයුමක් මේ තත්ත්වය ඇතුළෙන් අපට නොදැනීම ක්‍රියාත්මක වෙනවා. මේ ගරු සභාවේවත් ඒ පිළිබඳව නිසි අවධානයක් යොමු වුණේ නැහැ; වෙලා නැහැ. තනි තනි මන්ත්‍රීවරු හැටියට ගත්තොත් මේ පිළිබඳව සංවේදීතාවක් තිබෙනවා. නමුත් සභාවක් හැටියට, අපි සමාජ සත්වයෝ හැටියට එහෙම හරි හමන් අවධානයක් ඒකට යොමු කරලා නැහැ. ඒ තමයි අපේ සමාජය බිඳ වැට්ටීමේ න්‍යාය පත්‍රය.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට තව විනාඩි දෙකක කාලයක් තිබෙනවා.

**ගරු ජයන්ත සමරවීර මහතා**
(மாண்புமிகு ஜயந்த சமரவீர)
(The Hon. Jayantha Samaraweera)
කථාව පටන්ගන්නකොටම වේලාව ඉවරයි කියනවා නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, අපි දන්නවා අද අපේ සමාජය බිඳ වැට්ටීම සඳහා කටයුතු සිද්ධ වන ආකාරය. එක පැත්තකින් මතවාදීව බිඳ වැට්ටීමට, සංස්කෘතිය බිඳ වැට්ටීමට, සමාජ සංස්ථා බිඳ වැට්ටීමට, පවුල බිඳ වැට්ටීමට, පුද්ගලයා බිඳ වැට්ටීමට වශයෙන් අපේ සමස්ත සමාජය බිඳ වැට්ටීමේ මහා මෙහෙයුමක් දියත් වෙලා තිබෙනවා. ඒ අතර ප්‍රධාන තැනක් තමයි බුදු දහම සහ ඉතිහාසය විකෘති කිරීම.

අද මධ්‍යස්ථාන 11කින් බුදු දහම විකෘති කරනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි. එදා මිහිඳු මහ රහතන් වහන්සේ ප්‍රධාන සත්නමක් ලංකාවට වැඩමවීමෙන් මේ රට බෞද්ධ දේශනාව කේන්ද්‍රීය රටක් බවට පත් වුණා. දේවානම්පියතිස්ස රජතුමාගේ මහා විහාර පූජාවත් එක්ක මේ රටේ මහාවිහාරීය ථේරවාදී භික්ෂු සම්ප්‍රදාය පැවැත්මට ආවා. අද ඒක තමයි මුළු මහත් ලෝකයට සම්බුද්ධ දේශනාවේ නිසි හරය නිවැරදිව රැගෙන යමින් ඒ සම්බුද්ධ භාෂිතය මුළු මහත් ලොවට ප්‍රකට කරන මහාවිහාරීය ථේරවාදී භික්ෂු සම්ප්‍රදාය බවට පත් වෙලා තිබෙන්නේ. අද ඒ මහාවිහාරීය ථේරවාදී භික්ෂු සම්ප්‍රදායට අමු අමුවේ ගහනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි. අද සදහම්, සම්බුද්ධ සුළඟක් ලෝකයේම හමාගෙන යන වේලාවක්. අදත් එහෙමයි, එදාත් එහෙමයි. බර්ට්‍රන්ඩ් රසල් කියන මහා ගණිතඥයා ඒ බව කියනවා, "මා කිතුනුවකු නො වූයේ ඇයි" කියන කෘතියෙන්. ඒ විතරක් නොවෙයි. මේ රටේ පුරවැසියෙකු වෙච්ච ආතර් සී. ක්ලාක් මැතිතුමා මේ බව ඉතා මැනවින් කියනවා, "ගැඹුරු මුහුද" වශයෙන් පරිවර්තනය වුණු එතුමාගේ "The Deep Range" කියන කෘතියෙන්.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට නියමිත කාලය අවසානයි. දැන් කථාව අවසන් කරන්න.

**ගරු ජයන්ත සමරවීර මහතා**
(மாண்புமிகு ஜயந்த சமரவீர)
(The Hon. Jayantha Samaraweera)
මට ලැබී තිබෙන වේලාව ඉතාම සීමිතයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, ජාතික උරුමයන් සුරැකීම උදෙසා ක්‍රියාත්මක වීම පිණිස වන පාර්ලිමේන්තු මන්ත්‍රී සංසදය මඟින් පත්කරන ලද අනුකමිටුව විසින් බුදු දහම හා ඉතිහාසය විකෘති කිරීම වැළැක්වීම සඳහා නිර්දේශ සහිත වාර්තාවක් සකස් කරනු ලැබුවා. මේ රටේ වැඩ සිටින ඉතාම ප්‍රඥාවන්ත - ඉතාම නැණවත් -, ගුණවත් ත්‍රෛනිකායික භික්ෂූන් වහන්සේලා පිරිසකගේ සහභාගිත්වයෙන් සහ මේ රටේ වියත් ගිහි ප්‍රභූන් ගණනාවකගේ සහභාගිත්වයෙන් දවස් කිහිපයක් උදේ 9.00 ඉඳන් සවස 5.00, 6.00 විතර වනකල් පාර්ලිමේන්තුවේ කාරක සභා කාමරවල සාකච්ඡා කරලා, ඒ වාගේම දවස් 4ක් විතර අර්ධ සැසි පවත්වලා ඒ සියලුදෙනාගෙන් ලිඛිත වාර්තා අරගෙන සකස් කරපු බුදු දහම හා ඉතිහාසය විකෘති කිරීම වැළැක්වීම සඳහා නිර්දේශ ඉදිරිපත් කිරීම පිළිබඳ වූ එම වාර්තාව මම මේ අවස්ථාවේදී **සභාගත*** කරනවා.

මූලාසනයේ සිටින ඔබතුමියගෙන් නැවතත් මම ඉතාම ඕනෑකමින් ඉල්ලා සිටිනවා, මෙම වාර්තාව ආගමික කටයුතු හා සහජීවනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවටත්, ඒ වාගේම බුද්ධ ශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාවටත් යොමු කරලා මේ නිර්දේශ වහාම ක්‍රියාත්මක කරලා මේ සමාජය බිඳ වැට්ටවීමේ න්‍යාය පත්‍රය, මතවාදය බිඳ වැට්ටවීමේ ක්‍රියාවලිය, අපේ සංස්ථා බිඳ වැට්ටවීමේ ක්‍රියාවලිය, අපේ සංස්කෘතිය බිඳ වැට්ටවීමේ ක්‍රියාවලිය, ඒ වාගේම පවුල, පුද්ගලයා බිඳ වැට්ටවීමේ ක්‍රියාවලිය නතර කිරීමට අවශ්‍ය පියවර ගන්න කියලා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට නියමිත කාලය තවත් විනාඩි තුනකින් දීර්ඝ කර තිබෙනවා.

**ගරු ජයන්ත සමරවීර මහතා**
(மாண்புமிகு ஜயந்த சமரவீர)
(The Hon. Jayantha Samaraweera)
ස්තුතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි.

එහෙම නොකළොත් මොකද වෙන්නේ? ඔබතුමිය දන්නවා, අපි මහා විහාරයීය ථෙරවාද භික්ෂු සම්ප්‍රදායය විසින් රැකගත් බෞද්ධ දේශනාව මත පදනම් වුණු සභ්‍යත්වයකට හිමිකම් කියන ජාතියක් බව; අපි ලොව අද්විතීය සභ්‍යත්වයකට උරුමකම් කියන ජාතියක් බව. අද මේ ආර්ථික වියවුල ඇතුළේ, මේ විෂමතාව ඇතුළේ ප්‍රහාරය එල්ල වන්නේ ඒකටයි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි. සභ්‍යත්වයෙන් අපට දෙවැනි වෙනවා නම් දෙවැනි වෙන්නේ චීනය විතරයි. අද වන විට චීනය එක්සත් ජාතීන්ගේ සංවිධානයෙන් ඉල්ලීමක් කර තිබෙනවා, ජාත්‍යන්තර සභ්‍යත්ව දිනයක් ප්‍රකාශයට පත් කරන්න කියලා.

සැමුවෙල් පී. හන්ටින්ටන් කියා තිබෙනවා, අනාගත ලෝකය සකස් වෙන්නේ සභ්‍යත්වය මතයි කියලා. සැමුවෙල් පී. හන්ටින්ටන් විසින් ලියන ලද "The Clash of Civilizations and the Remaking of World Order" කියන කෘතියෙන් සභ්‍යත්ව අතර ගැටුම සම්බන්ධ කරුණු උපුටා දක්වනවා, සාහිත්‍යශූරි ආචාර්ය ගුණදාස අමරසේකර මැතිතුමා විසින්. මේ රට පිළිබඳ පුරෝකථන සිදු කර තිබෙන එතුමාගේ කෘති ගණනාවක සැමුවෙල් පී. හන්ටින්ටන්ගේ කෘති උපුටා දක්වා කියා තිබෙනවා, ලෝකයේ අනාගත සැකැස්ම රඳා පවතින්නේ අන් කිසිවක් මත නොව, සභ්‍යත්වය මතයි කියලා. එවැනි වෙලාවක තමයි අපි අපේ සභ්‍යත්වය නැති කර ගනිමින් සිටින්නේ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි.

වර්ෂ 1911-1913 කාලයේ මේ රටේ ආණ්ඩුකාරයා හැටියට හිටපු රොබට් චාමර්ස් සාමිවරයා යටත් විජිත ලේකම්වරයාට කියා තිබෙනවා, "මේ රටේ ඉන්නවා කහ රෙදි ඇඳගත්තු, හිස මුඩු කරගත්තු හමුදාවක්. ඒ අය ශ්‍රී ලංකාවේ ජනතාවගේ උපතේ සිට මරණය දක්වා ජීවිතයේ සෑම අත්‍යවශ්‍ය මොහොතකම සම්බන්ධ වෙනවා. එසේ සම්බන්ධ වීම වළක්වන තාක්කල් මේ රට අත්පත් කරගෙන පවත්වා ගෙන යන්න බැහැ, යටත් කරගෙන පවත්වා ගෙන යන්න බැහැ" කියලා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔබතුමාට නියමිත කාලය අවසන් වනවා, ගරු මන්ත්‍රීතුමා.

**ගරු ජයන්ත සමරවීර මහතා**
(மாண்புமிகு ஜயந்த சமரவீர)
(The Hon. Jayantha Samaraweera)
ගෞරවනීය ස්වාමීන් වහන්සේලා අපේ ජීවිතයට, අපේ පවුලට, අපේ සමාජයට මැදිහත්වීම වළක්වන තාක්කල් මේ රට අත්පත් කරගෙන පවත්වා ගෙන යන්න බැහැ, යටත් කරගෙන පවත්වා ගෙන යන්න බැහැ කියන එකයි ඔහු කියා තිබෙන්නේ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, ඒ නිසා තමයි මේ සමාජය බිඳ වැට්ටවීමේ ප්‍රහාරය එල්ල වන්නේ, ඒ නිසා තමයි සම්බුද්ධ ශාසනයට මේ ප්‍රහාරය එල්ල වන්නේ, ඒ නිසා තමයි ඉතිහාසයට මේ ප්‍රහාරය එල්ල වන්නේ. ඒ නිසායි අපි මේ පාර්ලිමේන්තුවේ අවධානය යොමු කරවන්නේ, මේ කටයුත්ත නවත්වන්න ඕනෑ කියන කාරණයට.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
කථාව දැන් අවසන් කරන්න, ගරු මන්ත්‍රීතුමා. ඔබතුමා විනාඩි දෙකක් වැඩිපුර අරගෙන තිබෙනවා.

**ගරු ජයන්ත සමරවීර මහතා**
(மாண்புமிகு ஜயந்த சமரவீர)
(The Hon. Jayantha Samaraweera)
ජාතික උරුමයන් සුරැකීම උදෙසා ක්‍රියාත්මක වීම පිණිස වන පාර්ලිමේන්තු මන්ත්‍රී සංසදය පිහිටුවා මෙම වාර්තාව සකස් කිරීම සඳහා අපට සහයෝගය දැක්වූ කථානායක ගරු මහින්ද යාපා අබේවර්ධන මැතිතුමාටත්, පාර්ලිමේන්තුවේ මහ ලේකම් කුෂානි රෝහණදීර මැතිතුමියටත්, කාරක සභා කාර්යාංශයේ සියලු නිලධාරින්ටත් අපේ කෘතවේදිත්වය පළ කරමින්, එකී මන්ත්‍රී සංසදය සකස් කළ මෙම වාර්තාව ක්‍රියාවට නඟන්න කියා ඉතා ඕනෑකමින් ඉල්ලා සිටිමින්, මගේ කථාව අවසන් කරනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු වී. රාධාක්‍රිෂ්ණන් මැතිතුමා. ඔබතුමාට විනාඩි 9ක කාලයක් තිබෙනවා.

---
** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

[பி.ப. 3.36]

**ගරු (ආචාර්ය) වී. රාධාක්‍රිෂ්ණන් මහතා**
(மாண்புமிகு (கலாநிதி) வீ. இராதாகிருஷ்ணன்)
(The Hon. (Dr.) V. Radhakrishnan)

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இலங்கையிலே வேலையாளர்களின் ஆகக்குறைந்த வேதனம் பற்றித் தீர்மானிக்கின்ற திருத்தச் சட்டமூலம் இங்கு விவாதத் துக்காக முன்வைக்கப்பட்டிருக்கின்றது. கடந்த காலங்களிலே ஆகக்குறைந்த மாதாந்தச் சம்பளமாக இருந்த 12,500 ரூபாய் இதன்மூலம் 17,500 ரூபாயாக உயர்த்தப்படவிருக்கின்றது. அதன்படி ஒரு நாளுக்கு 500 ரூபாய் என்றிருந்தது இப்பொழுது 700 ரூபாயாக மாற்றப்பட்டிருக்கின்றது. இந்தச் சொச்ச சம்பளத்தின் மூலமாக இன்று வாழ முடியாது என்று நாங்கள் தெரிந்துகொண்டாலும் அரசாங்கத்தின் ஆகக்குறைந்த சம்பளம் என்ற அடிப்படையிலே இது முன்மொழியப்பட்டிருக்கின்றது.

அதேநேரத்தில், பெருந்தோட்டத் தொழிலாளர்களின் சம்பளப் பிரச்சினை இன்று பூதாகரமானதாக மாறியிருக்கின் றது. பெருந்தோட்ட மக்களுடைய நாட் சம்பளம் 1,700 ரூபாய் என்று சொல்லப்பட்டது. பிறகு 1,300 ரூபாய் என்று சொல்லப்பட்டது. ஆனால், இந்த 1,300 ரூபாயும் கிடைக்காத நிலையில் பிறகு மீண்டும் 1,700 ரூபாய் என்று சொல்லப்படு கின்றது. எதுவுமே ஒரு கேள்விக்குறியான நிலையில்தான் காணப்படுகின்றது. அந்த வகையிலே, கடந்த 2 நாட்களுக்கு முன்பு இங்கிருக்கின்ற எங்களுடைய பாராளுமன்ற உறுப்பினர் எஸ்.பி. திசாநாயக்க அவர்களும், இப்பொழுது புதிதாக நியமிக்கப்பட்ட இராஜாங்க அமைச்சர் வடிவேல் சுரேஷ் அவர் களும் பேசிக்கொண்ட ஒரு சம்பாஷணையின் அடிப்படை யிலான அவர்களுடைய கருத்துகள் சமூக ஊடகங்களில் பரவலாக வெளியிடப்பட்டுள்ளன. அதிலே "1,300 ரூபாய் சம்பளத்தை எதிர்வரும் 21ஆம் திகதிக்கு முன்னர் கொடுக்க முடியுமா? அதற்காக ஏன் முயற்சி செய்யக்கூடாது?" என்றெல்லாம் அவர்களால் பேசப்பட்டிருக்கின்றது. அந்த உரையாடலின் இறுதியிலே, எஸ்.பி. திசாநாயக்க அவர்கள் சொல்லுகின்றார், "அவர்கள் இந்தச் சம்பளத்தைக் கொடுக்கா விட்டால் அவர்களின் வீடுகளுக்கு நெருப்பு வையுங்கள்!" என்று. இது எவ்வளவு மோசமான வார்த்தைப் பிரயோகம் என்பதை நீங்கள் தெரிந்துகொள்ள வேண்டும். சம்பளம் கொடுக்காவிட்டால் அவர்களுடைய வீடுகளைத் தீக்கிரை யாக்க வேண்டுமென்று இப்படியான ஒரு நபர் சொல்லுவது மிகவும் மோசமான, கண்டிக்கத்தக்க, அவமானமான ஒரு செயல் என்பதை நான் இந்த நேரத்திலே சுட்டிக்காட்ட விரும்புகின்றேன்.

அதேபோல பெருந்தோட்ட மக்களுடைய பிரச்சினைக்காக முதலைக் கண்ணீர் வடித்து அதனைத் தீர்ப்பதாகச் சொன்ன ஜனாதிபதி அவர்களும் இன்று அதைப்பற்றி அசட்டையாக அல்லது அக்கறையில்லாமல் இருக்கின்றார். ஆகவே, அவர் களுடைய அதிகரிக்கப்பட்ட சம்பளம் எதிர்வருகின்ற மாதத் திலே கிடைக்காது என்பது இப்பொழுது உறுதியாகியிருக் கின்றது. ஆனால், எதிர்வரும் காலங்களிலாவது அது அவர் களுக்குக் கிடைப்பதற்கான வழிகளைச் சம்பந்தப்பட்டவர்கள் செய்ய வேண்டும் என்பதை இந்த சபையிலே கேட்டுக்கொள்ள விரும்புகின்றேன்.

அதுமட்டுமல்லாமல், இப்பொழுது சம்பள அதிகரிப்பு இல்லையென்று சொல்லுகின்ற அதேவேளையிலே, தோட்டப் பகுதிகளிலே அதிகமான bars திறக்கப்படுவதை நாங்கள் அவதானிக்கக்கூடியதாக இருக்கின்றது. நேற்று முன்தினம் கூட ஹட்டன் பிரதேசத்தில் உள்ள குயில்வத்தை என்ற பகுதியில் bar ஒன்றைத் திறப்பதற்கான நடவடிக்கை எடுக்கப் பட்டது; நாங்கள் போய் போராட்டம் செய்து அதை நிறுத்தியிருக்கின்றோம். இன்று மக்கள் வாழ்வாதாரம் இல்லாமல், சம்பளம் இல்லாமல் கஷ்டமான நிலையிலே இருக்கின்றபோது, அவர்களிடம் இருக்கின்ற பணத்தையும் குடிக்காகச் செலவழிக்கச் செய்ய வேண்டுமென்று செயற்படு கிறார்கள். அண்மையிலே நான் ஒரு வீடியோ பார்த்தேன். அதில் ஜனாதிபதி அவர்கள் சொல்லுகின்றார், "bar திறந்தால் என்ன தப்பு? அது இந்த நாட்டின் வர்த்தகத்தை அதிகரிக்கும்" என்று. இப்படியெல்லாம் bars திறந்து வர்த்தகத்தை அதிகரித்து, மக்களைத் துன்பங்களுக்குள்ளாக்கித் தாங்கள் இந்த நாட்டினுடைய ஜனாதிபதியாக வரவேண்டும் என்ற எண்ணம் அவர்களுக்கு இருந்தால் அதை மாற்றிக்கொள்ள வேண்டும் என்பதை நான் இங்கு சொல்லிக்கொள்ள விரும்புகின்றேன்.

அதைவிட, இப்பொழுது பேசப்படுகின்ற ஒரு மிக முக்கியமான விடயமாக இருப்பது மாகாண சபைகள் பற்றியதாகும். அரசியலமைப்பின் 13ஆவது திருத்தத்தின் அடிப்படையிலே மாகாண சபைகள் உருவாக்கப்பட வேண்டும். வடக்கு, கிழக்கிற்கு மட்டும் அல்ல, இலங்கையில் இருக்கின்ற சகல பகுதிகளுக்கும் மாகாண சபைகள் தேவை என்பதை நாங்கள் அறிந்திருக்கின்றோம். அந்த அடிப்படை யில், மாகாண சபைத் தேர்தல் பற்றிய திருத்தச் சட்டமூல மொன்றை கௌரவ சுமந்திரன் அவர்கள் ஒரு தனியார் சட்டமூலமாகக் கொண்டுவந்திருந்தார். அதன் முதலாம், இரண்டாம் வாசிப்பு முடிவடைந்து இன்று அது மூன்றாம் வாசிப்புக்கு எடுக்கப்படவிருந்த நிலையில், அதை எடுக்க விடாது மறுத்திருக்கின்றார்கள். இதற்குக் காரணம், நேற்றுமுன் தினம் இலங்கை தமிழரசுக் கட்சி - ITAK - ஜனாதிபதி வேட்பாளர் சஜித் பிரேமதாஸ அவர்களை ஆதரிப்பதாகச் சொன்னமையே ஆகும். அதன் காரணமாகத்தான் தமிழ் மக்க ளுக்கு மாகாண சபைக்கான உரிமையைக் கொடுக்கக்கூடாது, அதனை இல்லாமல் ஆக்கவேண்டுமென்ற அடிப்படையிலே இந்தச் சட்டமூலம் தட்டிக்கழிக்கப்பட்டிருப்பதாக நாங்கள் காண்கின்றோம். இனத் துவேசத்தை இங்கு கொண்டுவந்து மாகாண சபை முறைமையை இல்லாமல் செய்வது தமிழர்களுக்கு மட்டுமல்ல, இந்த நாட்டில் வாழுகின்ற முஸ்லிம் மக்களுக்கும் சிங்கள மக்களுக்கும் பாதிப்பை ஏற்படுத்தும். ஏனென்றால், மாகாண சபை முறைமை என்பது வடக்கு, கிழக்குக்கு மட்டும் உரித்தானதல்ல. ஒன்பது மாகாணங் களுக்கும் இந்தச் சபை மூலமாக வேலைகள் மேற்கொள்ள வேண்டிய கட்டாயம் இருக்கின்றது. இந்தச் சட்டமூலத்தை தமிழரான கௌரவ சுமந்திரன் அவர்கள் கொண்டுவந்தார் என்பதற்காகத் தடுத்தார்களா? என்ற சந்தேகம்கூட இப் பொழுது எங்களுக்கு எழுகின்றது. இந்த நிலை மாற்றமடைய வேண்டுமென்று நாங்கள் சொல்லிக்கொள்கின்றோம்.

இப்பொழுது ஜனாதிபதி தேர்தல் பிரசாரங்கள் இடம் பெற்றுக் கொண்டு இருக்கின்றன. 2015இலே ஜனாதிபதித் தேர்தலின்போது "රට අනතුරේ" என்று பிரசாரம் செய்தார்கள்; 2019இலே "ජාතිය අනතුරේ" என்று பிரசாரம் செய்தார்கள். இப்பொழுது 2024இலே "ගෑස් අනතුරු" என்று பிரசாரம் செய்கிறார்கள். ஒவ்வொரு ஜனாதிபதித் தேர்தலின்போதும் இவ்வாறான 'අනතුරු' வந்துகொண்டுதான் இருக்கின்றது. தேர்தல்கள் வரும்போது இவ்வாறான விடயங்களைச் சொல்லி மக்களைக் குழப்பி, வாக்குகளைப் பெற்றுக்கொள்ளும் நடவடிக்கையின் நோக்கம், நாடு எப்படிப் போனாலும் பரவாயில்லை. எப்படியாவது தங்களிடம் அதிகாரம் வரவேண்டுமென்பதே ஆகும். இப்பொழுது புதிய கதை

[ගරු (ආචාර්ය) වී. රාධාකිෂ්ණන් මහතා]

யொன்று கேள்விப்படுகிறோம். அதாவது, யார் ஜனாதிபதி யாக வந்தாலும், ஆறு மாதங்களின் பின்னர் திரும்பவும் மாண்புமிகு ரணில் விக்கிரமசிங்ஹ அவர்கள்தான் நாட்டின் ஜனாதிபதியாக வரப்போகின்றாரென்று. இது எப்படி உறுதியாகும்? நான் சொல்கின்றேன், இந்த ஜனாதிபதி நூறு வருடங்கள் வாழ வேண்டும்; அதில் எந்தவிதமான ஆட்சேப னையும் கிடையாது. ஆனால், இந்த ஜனாதிபதிக்கு ஏதாவது ஏற்பட்டால், இந்த நாட்டை விற்கப்போகிறீர்களா அல்லது வெளிநாட்டிலிருந்து ஒருவரைக் கொண்டுவந்து இங்கு ஜனாதிபதி ஆக்கப்போகிறீர்களா?

මේ ජනාධිපතිතුමා අවුරුදු 100ක්, 200ක් මේ රටේ ඉන්න ඕනෑ. මට දැනගන්න ඕනෑ, යම්කිසි අනතුරකින් එතුමා නැති වුණොත් අපි මේ රට විකුණනවාද, නැත්නම් ජනාධිපති කෙනෙක් පිටින් ගේනවාද කියන එක. ඒකට උත්තර දෙන්න. එහෙම නැත්නම් මේ රටේ මිනිස්සු කැමති කෙනෙක් ජනාධිපති වෙන්න ඕනෑ. ඒකට තමයි ඡන්දේ තිබෙන්නේ. මිනිස්සු එතුමාට කැමති නම් ඒ ඡන්දෙදි මිනිස්සු එතුමාට ඡන්දේ දැම්මොත් එතුමාට ජනාධිපති වෙන්න ඉඩ දෙන්න. ඒ ගොල්ලන් කියනවා, මාස 6කින් තව ජනාධිපති කෙනෙක් එනවා කියලා. වාමර සම්පත් රාජ්‍ය ඇමතිතුමා ජනාධිපතිතුමාට කියලා තිබෙනවා ලු, "එහෙම අවස්ථාවක් ආවොත් භාර ගන්න එපා" කියලා. එතුමාට ජනාධිපතිකම දෙයි කියලා හිතාගෙන ඉන්නවාද? විහිළු කරනවාද?

ஆகவே, முதலைக் கண்ணீர் வடிக்கத் தேவையில்லை. எனக்கு ஒதுக்கப்பட்ட நேரம் முடிவடைந்தமையால் நான் அதிகம் பேச விரும்பவில்லை. இந்த நாட்டினுடைய நலனை நோக்கி, மக்கள் செல்வாக்குள்ள சஜித் பிரேமதாஸ அவர்கள் இந்த நாட்டினுடைய ஜனாதிபதியாக வரவேண்டுமென்ற எதிர்பார்ப்பு எங்களுக்கு இருக்கின்றது என்று கூறி, நிறைவு செய்கின்றேன். நன்றி.

**ගරු ජනාධිපති නීතිඥ එම්.යූ.එම්. අලි සබ්රි මහතා**
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி எம்.யூ.எம். அலி சப்ரி)
(The Hon. M.U.M. Ali Sabry, PC)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි,-

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු අලි සබ්රි අමාත්‍යතුමා.

**ගරු ජනාධිපති නීතිඥ එම්.යූ.එම්. අලි සබ්රි මහතා**
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி எம்.யூ.எம். அலி சப்ரி)
(The Hon. M.U.M. Ali Sabry, PC)
கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, தற்போது உரையாற்றிய முன்னாள் இராஜாங்க அமைச்சரும், இதற்கு முதலில் தமிழில் உரையாற்றிய MPs உம் மாகாண சபைத் தேர்தலை நாங்கள் நிறுத்தியதுபோல சொன்னார்கள். 2018இல் உங்களுடைய Government இல் நீங்களும் TNAஉம் சேர்ந்து புதிய law ஒன்றைக் கொண்டு வந்தீர்கள். அந்த lawஐ overnightஇல் எதற்கு அந்த timeஇல் கொண்டு வந்தீர்கள்? 2018இல் மாகாண சபைத் தேர்தலை வைத்திருந்தால் Opposition வேறொன்று சொல்லியிருக்கும். அந்த law காரணமாகத்தான் இன்றைக்கும் மாகாணசபைத் தேர்தலை நடாத்த முடியாமல் இருக்கின்றது.

Presidential Electionக்கு இன்னும் சில நாட்கள்தான் இருக்கின்றன. இன்றைக்கு திரும்பவும் இந்தச் சட்டமூலத்தைக் கொண்டுவந்து தேர்தலைக் குழப்பிக்கொள்ளலாமா? நீங்கள் சட்டமூலத்தைச் சமர்ப்பித்திருக்கிறீர்கள். அதை decide பண்ணுவது President அல்ல. Presidentஆல் Parliamentஐ electronic மூலம் control பண்ண இயலாதே! அதை decide பண்ணுவது Committee on Parliamentary Businessஇல். Committee on Parliamentary Business நேற்று meet பண்ணியது. அதிலே ஒரு decision எடுக்கப்பட்டிருக்கின்றது. நீங்கள் இதனை வேறுவிதமாக interpret பண்ணி தமிழ் மக்களின் மனதில் President இற்கு விரோதமான எண்ணத்தை உண்டாக்குவதற்குத்தான் try பண்ணுகிறீர்கள். ஆனால், அவர் 13ஆவது திருத்தத்தை நடைமுறைப்படுத்துவதாகவும், police power பற்றிய விடயத்தை Parliamentஇல் discuss பண்ணுவதாகவும் பயமில்லாமல் சொல்கிறார். தமிழ் மக்களின் நலனுக்காக Jaffnaவிற்கும் Eastஇற்கும் திரும்பத் திரும்பச் செல்கின்றார். Commission for Truth, Unity and Reconciliation in Sri Lanka Billஐ அவர் gazette பண்ணி யிருக்கிறார். யார் இவ்வாறு செய்வார்கள்? உங்களுக்கு வேறு யாருக்கும் vote பண்ணவேண்டுமென்றால் அதனைச் செய்யுங்கள்! ஆனால், இந்த நாட்டில் மதங்களுக்கும் இனங் களுக்குமிடையில் ஒற்றுமைக்காக மிகப் பாடுபட்டவர் மாண்புமிகு ரணில் விக்கிரமசிங்ஹ அவர்கள் என்பது தமிழ் மக்களுக்குத் தெரியும். அதனால்தான் நீங்கள் அவருக்கு விரோதமாக தேவையில்லாத கதைகளைச் சொல்கிறீர்கள்.

**ගරු (ආචාර්ය) වී. රාධාකිෂ්ණන් මහතා**
(மாண்புமிகு (கலாநிதி) வீ. இராதாகிருஷ்ணன்)
(The Hon. (Dr.) V. Radhakrishnan)
கடந்த காலத்தில் மாகாண சபைத் தேர்தல் பிற்போடப் பட்டிருந்தாலும், அப்போதும் ஜனாதிபதி ரணில் விக்கிரமசிங்ஹ அவர்கள்தான் இந்த நாட்டை ஆட்சி செய்தார். ஆகவே, அவருடைய அந்த periodஇல் அதை நடாத்தி யிருக்கலாம்! ஏன், அதனைச் செய்ய முடியவில்லை?

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
මීළඟට, ගරු රෝහිණී කුමාරි විජේරත්න මන්ත්‍රීතුමිය. ඔබතුමියට විනාඩි 9ක කාලයක් තිබෙනවා.

[අ.භා. 3.44]

**ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය**
(மாண்புமிகு (திருமதி) ரோஹினி குமாரி விஜேரத்ன)
(The Hon. (Mrs.) Rohini Kumari Wijerathna)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, අධිකරණ අමාත්‍යාංශයට අදාළ පනත් කෙටුම්පත් දෙකක් සහ කම්කරු හා විදේශ රැකියා අමාත්‍යාංශයට අදාළ පනත් කෙටුම්පතක් පිළිබඳ කථා කරන මේ වෙලාවේ මම මුලින්ම මේ කාරණය මතක් කරන්න ඕනෑ. ගරු ඇමතිතුමනි, බලය අවභාවිත කිරීමත්, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව උල්ලංඝනය කිරීමත්, අසත්‍ය සමාජගත කිරීමත්, සමාජය මුළා කිරීමත් වරදක්. එහෙමනම් ඒවාට නීති සම්පාදනය විය යුතුයි, නීති ක්‍රියාත්මක විය යුතුයි.

අද ජනාධිපතිතුමාගේ මාධ්‍ය ඒකකය ප්‍රවෘත්ති නිවේදනයක් නිකුත් කර තිබෙනවා, වැටුප් වැඩි කරනවාය කියලා. හෙට තැපැල් ඡන්දය තියෙද්දී වැටුප් වැඩි කරනවාය කියලා ජනාධිපතිතුමාගේ මාධ්‍ය ඒකකය අද ප්‍රවෘත්ති නිවේදනයක් නිකුත් කරන එක කොයිතරම් නම් අල්ලසක් ලබාදීමක් ද කියලා මම අහනවා. ඒ වාගේම, ඒක මැතිවරණ නීතිය උල්ලංඝනය කිරීමක් කියලාත් මම මේ වෙලාවේ කියනවා. මොකද, මේ වෙලාවේ අපේ පක්ෂයේ ප්‍රතිපත්ති ප්‍රකාශනයේ පැහැදිලිව කියා තිබෙනවා, මූලික වැටුප

සියයට 25කින් ඉහළ දමනවා, ජීවන වියදම රුපියල් 25,000 දක්වා වැඩි කරනවා, දීමනා සමඟ අවම වැටුප රුපියල් 50,000 කරනවා කියලා. මේක දැකලා බය වෙලා ජනාධිපතිතුමාගේ මාධ්‍ය ඒකකය මේ වෙනකොට ඒ ප්‍රවෘත්ති නිවේදනය නිකුත් කර තිබෙනවා. සාමාන්‍යයෙන් වැටුප් වැඩි කරනවා කියන එක පාර්ලිමේන්තුවේ අය වැයෙන් කෙරෙන්න ඕනෑ දෙයක්. එහෙම නැත්නම් රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයෙන් ඒ සඳහා චක්‍රලේඛයක් නිකුත් කරන්න ඕනෑ. නමුත් එහෙම කිසිම දෙයක් නැතුව අද මේ ප්‍රකාශය නිකුත් කරලා තිබෙන්නේ තනිකරම හෙට ආරම්භ වන තැපැල් ඡන්දවලට අල්ලසක් හැටියට කියලා මම මේ වෙලාවේ කියනවා. සමගි ජන බලවේගය හැටියට අපි මේ පිළිබඳව මැතිවරණ කොමිසමට පැමිණිලි කරන්නත් කටයුතු කර තිබෙනවා. මෙතැනදී

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]*
*[Expunged on the order of the Chair.]*

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව උල්ලංඝනය කරනවා. ජනාධිපති මාධ්‍ය ඒකකය මැතිවරණ නීතිය උල්ලංඝනය කරනවා. මෙහෙම තත්ත්වයක් තියාගෙන තමයි අපි මැතිවරණයකට යන්නේ. මීට කලින් කථා කරපු දොලවත්ත මන්ත්‍රීතුමා කිව්වා, "පිරුණු කළේ දිය නොසැලේ" කියලා. අපිට කියන්න තිබෙන්නේ "පිළුණු බතේ රස නොබැලේ" කියලායි. මම අර මුලින් කිව්වා වාගේ විශේෂයෙන්ම කියන්න ඕනෑ, මැතිවරණ ප්‍රකාශ තුළින් මේ වෙලාවේ අසත්‍ය සමාජගත කිරීම, සමාජය මුළා කිරීම කියන එක සිද්ධ වෙන බව.

තව එක කාරණයක් මේ වෙලාවේ මම කියන්න ඕනෑ. මම අද උදේත් මේ ගැන කථා කළා. ජනතා විමුක්ති පෙරමුණේ ප්‍රතිපත්ති ප්‍රකාශනය බලාගෙන යනකොට උපාධිධාරින්ට ගුරු පත්වීම් 20,000ක් දෙනවා කියලා එහි සඳහන් වෙනවා මම දැක්කා. හැබැයි විෂයභාර ඇමතිතුමාම කියනවා, රටේ තිබෙන්නේ ගුරු පුරප්පාඩු 12,000ක් කියලා. එතකොට පැහැදිලිවම මෙතැන මේ සිද්ධ වෙන්නේ සමාජය මුළා කිරීමක්, එහෙම නැත්නම් අසත්‍ය සමාජගත කරලා උපාධිධාරීන්ගේ ඡන්දය ලබා ගැනීමට ඇමක් දැමීමක් කියන එක මම කියන්න ඕනෑ. කිලෝමීටර දෙකෙන් දෙකට පෙර පාසල් හදනවා කියලාත් එහි සඳහන් වෙනවා. ඒ වාගේම, කිලෝමීටර තුනෙන් තුනට පාසල් හදනවා කියලාත් එහි තිබෙනවා. 10,126ක්ව තිබුණු පාසල් ප්‍රමාණයත් දැන් 10,096ට අඩු වෙලා තිබෙනවා. රටේ ජනගහනය අඩු වෙලා තිබෙනවා. මේවා කරන්නම ඩොලර් බිලියන 3ක් විතර ඕනෑ. ගරු ඇමතිතුමනි, රටේ තිබෙන්නේම ඩොලර් බිලියන 5.4යි.

එතකොට, මේ සමාජගත කිරීම කොයිතරම් වැරැදිද කියලා මම අහනවා. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව වෙනස් කරනවා කියලාත් කියනවා. ඒක හොඳයි. මොකද, දැන් අණ්ඩ දාපු ව්‍යවස්ථාවක් නේ අපට තිබෙන්නේ. ඒවා වෙනස් වෙනවා නම් හොඳයි. යහ පාලන ආණ්ඩුව කාලයේත් ව්‍යවස්ථාව වෙනස් කරන්න කටයුතු ආරම්භ කළා. ඒක ඉදිරියට යන එක හොඳයි.

හරිනි අමරසූරිය මැතිනිය ප්‍රකාශයක් කරලා තිබුණා, සැප්තැම්බර් 22වැනි දා ආණ්ඩුව විසුරුවනවා කියලා. 22වැනි දා ආණ්ඩුව විසුරුවනවා කියලා එතුමිය කියන්නේ, ඒගොල්ලන් දිනයි කියන බලාපොරොත්තුවෙන්. රටේ කරුමෙටවත් අනුර කුමාර දිසානායක මහත්මයා දිනුවොත්, එතුමන්ලා 22වැනි දා ආණ්ඩුව විසුරුවනවා. හැබැයි අපි දන්නවා, අනුර කුමාර දිසානායක මේ රටේ නායකයාවත්, සේනාධිනායකයාවත් වෙන්නේ නැහැ කියලා. නමුත් හරිනි අමරසූරිය මැතිනියගේ හීනය හැබෑ වුණොත්, 22වැනි දා වෙනකොට කැබිනට් මණ්ඩලය පත් කරගන්නේ කොහොමද කියලා ප්‍රශ්නයක් තිබෙනවා. ඉන්නේ තුන්දෙනයි. ජනාධිපති හැටියට අනුර කුමාර දිසානායක, විජිත හේරත්, හරිනි අමරසූරිය. අඩුම තරමින් ලක්ෂ්මන් නිපුණආරච්චිට මන්ත්‍රීවරයකු හැටියට දිවුරුම් දෙන්නවත් අවස්ථාවක් ලැබෙන්නේ නැහැ. මේගොල්ලන් කියන හැටියට 22වැනි දා ආණ්ඩුව විසිරෙව්වොත් 2024 දෙසැම්බර් මාසයේ මුල සතියේ මහ මැතිවරණයක් පවත්වන්න වෙනවා. එතැන් සිට සිද්ධ වෙන්න පුළුවන් දේවල් මම පියවරෙන් පියවරට බොහොම සහසුද්දෙන් කියලා දෙන්න කැමැතියි.

2024 සැප්තැම්බර් 22වන දා ඉඳලා දවස් 65ක්, 70ක් යනවා, පාර්ලිමේන්තු මැතිවරණය පවත්වන්න. ඒගොල්ලන් සැප්තැම්බර් 21වැනි දා දිනුවොත් ගමට අධිකරණ බලයත් දෙන්න යනවා නේ. ගරු ඇමතිතුමනි, 2022 මැයි 09වැනි දා පැය 6ක් තුළ මේ රටේ ගෙවල් කීයක් ගිනි තිබ්බාද? වාහන කීයක් ගිනි තිබ්බාද? ජීවිත 8ක් බිලිගත්තා, අතුකෝරළ මන්ත්‍රීතුමාත් එක්කම. මේවා ඉතිහාසයේත් අපට දකින්න තිබෙනවා. 1988 පැවැති ජනාධිපතිවරණයේ දී එක්සත් ජාතික පක්ෂයේ, ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ, කොමියුනිස්ට් පක්ෂයේ, ශ්‍රී ලංකා මහජන පක්ෂයේ 681දෙනෙක් ජනතා විමුක්ති පෙරමුණ විසින් ඝාතනය කළා. එදා - මැතිවරණ දිනයේ දී- ඡන්දය දීපු සහ රාජකාරි කළ නිලධාරීන් 63දෙනෙක් ඝාතනය කළා. ඉන්පසුව දින 70කදී -මහ මැතිවරණය තෙක්- ඒ කියන්නේ, 1989 පෙබරවාරි 15වැනි දා මැතිවරණ දිනයේ සහ ඊට දින 2කට කලින් 433දෙනෙක් මැරුවා. මැතිවරණ දිනයේ 84දෙනෙක් ඝාතනය කළා. ඡන්ද මධ්‍යස්ථාන 121කට බෝම්බ ගැහුවා. එවැනි දින 70ක් අපට නැවත වතාවක් පහුකරන්නට නොලැබේවා කියලා මම ප්‍රාර්ථනා කරනවා. ජනාධිපතිවරණයේ දීත්, ඊට පසුව දින 70කදී එළැඹෙන මහ මැතිවරණයේ දීත්, ඊට පසුවත් එවැනි භීෂණයක් ඇති නොවේවා කියලා මම ප්‍රාර්ථනා කරනවා. මොකද, ඊයේ දඹුල්ල ප්‍රදේශයේ සමගි ජන බලවේගයේ මැතිවරණ කාර්යාලයකට ගිනි තබා තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, 2024දී 2025ට ඕනෑ කරන අය වැය හදන්න ඕනෑ. ඉතින්, කැබිනට් මණ්ඩලයක් නැතුව, පාර්ලිමේන්තුවක් නැතුව ඒගොල්ලන් අය වැයක් හදන්නේ කොහොමද? ඒගොල්ලන් දෙසැම්බර් මාසයේ මහ මැතිවරණයක් තියලා ලබාගන්න පාර්ලිමේන්තුවෙන් අය වැය හදන්න නම්, ප්‍රතිපත්ති හදලා ඉන්න ඕනෑ. එතකොට ප්‍රතිපත්ති හදාගෙන අය වැය හදනකොට මේ රටට මොකක්ද වෙන්න පුළුවන් කියන එක මේ රටේ සබුද්ධික ජනතාව තේරුම් ගන්නවා ඇති කියලා අපි හිතනවා. ඒගොල්ලන් කියන හැටියට අය වැය හදාගන්න කල් හිටියොත්, අර උදය ආර්. සෙනෙවිරත්න කමිටු යෝජනාව, ඒ වාගේම සජිත් ප්‍රේමදාස මහත්තයා ගෙනැල්ලා තිබෙන යෝජනා, සේවකයන්ගේ ජාතික අවම වේතනය සංශෝධනය ගැන අද මේ ගෙනාපු යෝජනා කිසිවකින් රජයේ සේවකයන්ට යමක් ලැබෙන්න විධියක් නැහැ. මම හිතන විධියට උදය ආර්. සෙනෙවිරත්න කමිටු වාර්තාව ඊයේ කැබිනට් මණ්ඩලයට ඉදිරිපත් වුණෙත් නැහැ. මේගොල්ලන්ගේ ආණ්ඩුවක් ආවාම කොහොමටවත් මේක වෙන්නේ නැහැ. ඔවුන්ගේ ප්‍රතිපත්ති ප්‍රකාශනයේ තිබෙන මුදල් අච්චු ගැහීම හැරුණුකොට වෙන කිසිම දෙයක් කරන්න වෙන්නේ නැහැ. ඒක හරියට පසුගිය කාලයේ "*Kaputas* go have hit the plane" වාගේ තමයි.

ඒ වාගේම මහ බැංකුව ස්වාධීන කරන්න අකැමැති වීම, ආණ්ඩුව පොලිය තීරණය කරන්න තීරණය කිරීම ආදිය රටට

[ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය]

කොහොම බලපායිද කියන එක ආර්ථිකය ගැන දන්න විශේෂඥයෝ දන්නවා. මට ආසයි මහ බැංකු අධිපති නන්දලාල් වීරසිංහ මැතිතුමාගෙන් අහන්න, මේ අයට ආණ්ඩුවක් ආවොත් එතුමා පැය කීයක් තනතුරේ ඉඳීද කියලා. ඊළඟට ඒගොල්ලන් කියනවා, IMF ගිවිසුම වීසි කරනවා කියලා. එහෙම කළොත් දෙසැම්බර් මාසයේ ලැබෙන්න තිබෙන ඩොලර් මිලියන 700 ලැබෙයිද? එහෙම නොවුණොත් මොකක්ද වෙන්නේ? එදා මැදමුලනේ ගෝඨාභය රාජපක්ෂ මහත්තයා ඇවිල්ලා යහ පාලන ආණ්ඩුව පවත්වා ගෙන ගිය IMF වැඩසටහන වීසි කළාට පස්සේ මොකද වුණේ කියන එක මේ රටේ ජනතාවට මතක තිබෙනවා. ඒ වාගේම නැවතත් ඩොලර් අර්බුදයක් ඇති කරගන්න හදනවා. ඒ තුළින් මේ රටේ ජනතාවගේ ජීවිතය සහමුලින්ම කඩා වැටෙනවා.

2024 ඔක්තෝබර් මාසයේ ඉඳලා 2025 අප්‍රේල් මාසය වෙනතෙක් අපට බහුපාර්ශ්වීය ණය ගෙවන්න තිබෙනවා. ලෝක බැංකුවට, ආසියානු සංවර්ධන බැංකුවට අපි ණය ගෙවන්න ඕනෑ. එහෙම නම් මේවා කරන්නේ කොහොමද කියන එකත් ජනතා විමුක්ති පෙරමුණ පැහැදිලි කරන්න ඕනෑ. දැනට තිබෙන අතිරික්තයෙන් ඕනෑ නම් මාස තුනකට ගෑස්, තෙල්, විදුලිය, ඖෂධ වාගේ දේවල් ගන්න පුළුවන් වෙයි. එතකොට ඉතිරි වැඩ කර ගන්නේ කොහොමද කියලා අපට අහන්න වෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, ඒ ගොල්ලන්ගේ ප්‍රතිපත්ති ප්‍රකාශනයේ තිබෙනවා, අතිරික්ත ධනය වෙනත් රටවල ආයෝජනය කරනවා කියලා. ණය වාරිකය ගෙවා ගන්න බැරිව ඉන්න අපි, මිනිසුන්ට මේ තරම් බොරු සීනි බෝල දෙන්නේ ඇයි? මන්දපෝෂණ තත්ත්වය පිළිබඳ වාර්තාව හෙට මේ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරනවා. එතකොට බලා ගන්න පුළුවන්, මේ රටේ දරුවන්ට සිදුවෙලා තිබෙන දේ. මේ වාගේ පොරොන්දු පත්‍රයක් එක්ක අනුර කුමාර දිසානායකට ඡන්දය දීලා ජනාධිපති කරගන්න මේ රටේ ජනතාව තීරණය කළොත්, මේ මිනිස්සුන්ට ප්‍රතිපත්ති ප්‍රකාශනය තමයි කන්න වෙන්නේ.

ඊළඟට ඒගොල්ලන් කියනවා මම දැක්කා, කොටස් වෙළෙඳ පොළ සුදුවක් ලු. මම ආචාර්ය හරිනි අමරසූරිය මැතිනියට කියන්න ඕනෑ, මිනිස්සුන්ගේ හිත්වලට භීතිය ගෙනෙන්න එපා කියලා. කොටස් සමාගම්වල කොටස් මිල පහත වැටෙනවා, දහස් ගණන් රැකියා නැතිවෙනවා, කොටස් වෙළඳ පොළ කඩා වැටෙනවා, ජනතාව පාරට වැටෙනවා කියනවා. මේවා තේරුම් ගන්න ඕනෑ. මේ දේම තමයි ගෝඨාභය රාජපක්ෂ මහත්මයාත් කළේ.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමියනි, ඔබතුමියට වෙන් වූ කාලය අවසානයි.

**ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය**
(மாண்புமிகு (திருமதி) ரோஹினி குமாரி விஜேரத்ன)
(The Hon. (Mrs.) Rohini Kumari Wijerathna)
මම අවසන් කරනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි.

මැදමුලන ගෝඨාභය රාජපක්ෂ මහත්මයා කරපු දේ තමයි "තඹුත්තේගම ගෝඨාභය" විසිනුත් කරන්න යන්නේ. මේ දේවල් රටේ ජනතාවට තේරෙනවා. ඒ නිසා මම හිතනවා, කවදාවත් නොවෙන කතන්දරයක් ගැන මේ රටේ ජනතාවට හීන පෙන්වන්න ඕනේ නැහැ කියලා. මම අවසාන වශයෙන් කියන්න ඕනෑ, "තඹුත්තේගම ගෝඨාභය" මේ රටේ ජනාධිපති වෙයි කියලා පුංචි හරි සැකයක් තිබෙනවා නම්, රනිල් වික්‍රමසිංහ මහත්මයාට ඡන්දය දෙන,-

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Order, please! මේ අවස්ථාවේ දී ගරු නියෝජ්‍ය කථානායකතුමා මූලාසනයට පැමිණෙනවා ඇති.

***අනතුරුව ගරු මංජුලා දිසානායක මහත්මිය මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු නියෝජ්‍ය කථානායකතුමා මූලාසනාරූඪ විය.***
*அதன்பிறகு, மாண்புமிகு (திருமதி) மஞ்சுலா திசாநாயக்க அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள் தலைமை வகித்தார்கள்.*
*Whereupon THE HON. (MRS.) MANJULA DISSANAYAKE left the Chair, and DEPUTY SPEAKER took the Chair.*

**ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය**
(மாண்புமிகு (திருமதி) ரோஹினி குமாரி விஜேரத்ன)
(The Hon. (Mrs.) Rohini Kumari Wijerathna)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම ඉක්මනින් අවසන් කරනවා.

"තඹුත්තේගම ගෝඨාභය" මේ රටේ ජනාධිපති වෙයි කියලා කාටහරි පුංචි හරි සැකයක් තිබෙනවා නම්, රනිල් වික්‍රමසිංහ මහත්මයාට ඡන්දය දෙන අයට මම කියනවා, දෙවැනි මනාපය සජිත් ප්‍රේමදාස මහත්මයාගේ දුරකථනය ලකුණ ඉස්සරහ සලකුණු කරන්න කියලා. ඒ වාගේම නාමල් රාජපක්ෂ මහත්මයාට ඡන්දය දෙන්න මේ රටේ කවුරුහරි හිතාගෙන ඉන්නවා නම්, ඒගොල්ලන්ගේ දෙවැනි මනාපයත් සජිත් ප්‍රේමදාස මහත්මයාගේ දුරකථනය ලකුණ ඉස්සරහා සලකුණු කරන්න. එහෙම නැත්නම් මේ ගොල්ලන් කියන හැටියට - රටේ කරුමයට හරි - මේගොල්ලන් ජයග්‍රහණය කළොත්, නැවත මේ රටේ ඇතිවෙන ලේ වැගිරීම වළක්වන්න බැහැ. මේ රට ගොඩ දමන්න පුළුවන්, මේ රට බේරාගන්න පුළුවන් එකම නායකයා සජිත් ප්‍රේමදාස පමණයි කියන එක ප්‍රකාශ කරමින් මම නතර වෙනවා, ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු බන්දුල ලාල් බණ්ඩාරිගොඩ මන්ත්‍රීතුමා. ඔබතුමාට මිනිත්තු 9ක කාලයක් තිබෙනවා.

[අ.භා. 3.57]

**ගරු බන්දුල ලාල් බණ්ඩාරිගොඩ මහතා**
(மாண்புமிகு பந்துல லால் பண்டாரிகொட)
(The Hon. Bandula Lal Bandarigoda)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඉතාම වැදගත් පනත් කෙටුම්පත් තුනක් පිළිබඳ විවාදය පැවැත්වෙන මේ අවස්ථාවේ මට වැදගත් කාරණා කිහිපයක් ඉදිරිපත් කරන්න තිබෙනවා. මෙතැනදී බොහෝ දේවල් කියැවුණා. සේවකයන්ගේ ජාතික අවම වේතනය ගැන, විදේශ නඩු තීන්දු අන්‍යෝන්‍යව පිළිගැනීම ගැන සහ අපරාධ නඩු විධාන සංග්‍රහය (සංශෝධන) පනත් කෙටුම්පත ගැන කථා කරද්දී බොහෝ දේවල් ප්‍රකාශ වුණා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපේ රටට විදේශ විනිමය විශාල ප්‍රමාණයක් ලැබෙන මාර්ගයක් තමයි විදේශ ප්‍රේෂණ. අපේ මව්වරු, අපේ සහෝදර සහෝදරියන් විදේශ රටවල - විශේෂයෙන්ම මැද පෙරදිග රටවල- සේවය කරලා එවන විදේශ ප්‍රේෂණ තුළින් අපට විශාල විදේශ විනිමය ප්‍රමාණයක් ලැබුණා. විශේෂයෙන්ම 2023 වසරේදී විතරක් 123,000ක් මැද පෙරදිග රටවල සේවයට යවලා තිබෙනවා. ගරු නියෝජ්‍ය

කථානායකතුමනි, ඔබතුමාට මතක ඇති රිසානාගේ සිද්ධිය. ඒ අවාසනාවන්ත සිදුවීමෙන් පස්සේ අපේ රට තීන්දුවක් ගත්තා, ගෘහ සේවයට යවන කාන්තාවන් විධිමත් ලෙස පුහුණු කරලා යැවිය යුතුයි කියලා; අඩුම තරමේ දවස් 25-35 අතර කාලයක් පුහුණු කරලා විදේශ රටවලට යැවිය යුතුයි කියලා තීන්දුවක් ගත්තා. ඒක ඉතාම වැදගත් තීන්දුවක්.

ඒ අනුව ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය රුපියල් 22,995ක මුදලක් අය කරලා පුහුණුවක් ලබා දුන්නා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, නමුත් පසුගිය කාලයේ අපේ Sri Lanka Bureau of Foreign Employment මේ පුහුණුවෙන් ඈත් වෙලා, එක්තරා පෞද්ගලික ගිණුමකට -මහජන බැංකුවේ බත්තරමුල්ල ශාඛාවේ අංක 20820028008650 දරන එම්.එම්. මොහොමඩ් කියන පුද්ගලයාගේ පෞද්ගලික ගිණුමට- රුපියල් 75,000 ගණනේ ගෘහ සේවයට යන කාන්තාවන් 26,000කගෙන් මුදල් බැර කරගන්න කටයුතු කරලා තිබෙනවා. ඇත්තටම මේ මුදල Sri Lanka Bureau of Foreign Employment වෙත ලැබිය යුතු මුදලක්. මේකෙන් අපේ විදේශ සේවා නියුක්ති කාර්යාංශයට 2023 අවුරුද්දේ විතරක් පාඩු වෙලා තිබෙනවා, රුපියල් මිලියන 597ක්. ඒ වාගේම බැලූ බැල්මට පෙනෙන්න තිබෙනවා, මෙතැන රුපියල් බිලියන 2.5ක වංචාවක් සිද්ධ වෙලා තිබෙන බව. ඒකට හේතුව මේකයි. විදේශ රැකියා ඇමතිතුමා විසින් කමිටුවක් පත් කරලා, ඒ කමිටුව විසින් නිර්දේශ කරන මේ පෞද්ගලික account එකට මුදල් දමන අයට අර පුහුණුව ලැබුවා හා සමාන සහතිකයක් නිකුත් කරලා තිබෙනවා. ඒ අනුව පුහුණුව ලැබුවා කියන නිර්දේශය ඇතිව මේ කාන්තාවන් පිට රට යවලා තිබෙනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ එක සිදුවීමක් විතරයි. තවත් මෙවැනි සිදුවීම් රාශියක් මේ රටේ වෙලා තිබෙනවා. මේක බරපතළ වංචාවක්. එක පැත්තකින්, ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයට විශාල පාඩුවකුත් මේ හරහා සිද්ධ කරලා තිබෙනවා. අනික් පැත්තෙන්, අපේ කාන්තාවන් නිසි පුහුණුවක් නැතිව රට යැවීම තුළින් ඒ අයගේ ජීවිත අනතුරට ඇද දමා තිබෙනවා. ඒ වාගේම රටට මහා අපකීර්තියක් ඇති වන මාර්ගයක් තමයි මේ හදලා තිබෙන්නේ.

මම අහගෙන හිටියා, අපේ ජනාධිපතිතුමා දැන් වැල් පාලමෙන් මේ පිරිස එගොඩ කරගෙන යනවා කියලා මෙතැනදී කථා වුණා. මම හිතන විධියට, වැල් පාලම වෙනුවට සමහර හිටපු ඇමතිවරුන්ට දැන් කොන්ක්‍රීට් පාලම් ගහගන්න පුළුවන් වෙලා තිබෙනවා. රුපියල් බිලියන 2.5ක විතර වංචාවක් මේ සිද්ධියෙන්ම එළියට එනවා. ඒ ගොල්ලන්ට කොන්ක්‍රීට් පාලමක් ගහගන්න හැකි වෙලා තිබෙනවා. මම හිතනවා, විදේශ සේවා නියුක්ති කාර්යාංශයට මේ තුළින් විශාල පාඩුවක් වුණා වාගේම මෙයින් වක්‍රව රටට සිද්ධ වෙන හානියත් බරපතළයි කියලා. මේ, එක වංචාවක් විතරයි.

ඒ වාගේම තමයි, ඊශ්‍රායලයට යවන හැම තරුණයෙකුගෙන්ම මුදල් අය කරලා තිබෙනවා. අද වැලිවිටිය-දිවිතුර ප්‍රාදේශීය සභාවේ අපේක්ෂිකාවක් බන්ධනාගාරගත වෙලා ඉන්නවා, රුපියල් ලක්ෂ 50කට ආසන්න මුදලක් ඇයගේ බැංකු ගිණුම්වල තබාගෙන ඉඳලා. ඇය එක්සත් ජාතික පක්ෂ අපේක්ෂිකාවක්. ඇය මේ මුදල් එකතු කරලා තිබෙන්නේ හිටපු විදේශ රැකියා ඇමතිතුමාගේ සම්බන්ධීකරණ ලේකම්වරියක් කියාගෙනයි. මේ මුදල් එකතු කරලා ඇය පෞද්ගලික ගිණුමක දමාගෙන ඉඳලා දැන් බන්ධනාගාරගත වෙලා ඉන්නවා. ඊශ්‍රායලයට යවපු හුඟක් තරුණයන් අද අනන්ත දුක් විඳිනවා, කටුක ජීවිතයක් ගෙවනවා. Manpower companies හරහා තමයි මේ තරුණයන් යවලා තිබෙන්නේ. Manpower companiesවලින් ගිය මේ සමහර තරුණයන් මේ වන විට තුන්වැනි වරටත් විකිණිලා තිබෙනවා. එක තැනකින් අරගෙන ගිහින් තව කෙනෙකුට දීලා, එතැනින් තව කෙනෙකුට දීලා, තුන්වැනි පුද්ගලයා ළඟ තමයි අද සමහර තරුණයන් ඊශ්‍රායලයේ රැකියා කරන්නේ. සමහර තරුණයන් මේ ස්ථානවලින් පැනලා ගිහින් අද වෙනම රැකියා හොයාගෙන කටයුතු කරනවා. මේ තරුණයන් අනන්ත දුක් විඳිද්දී මේ අයගේ මාසික වේතනයෙනුත් සැලකිය යුතු මුදලක් මේ රටේ ඉන්න දේශපාලනඥයන්ගේ, හිටපු දේශපාලනඥයන්ගේ, ඇමතිවරුන්ගේ සාක්කුවලට එනවා කියලා අපට නිල නොවන ආරංචි ලැබෙනවා. මේ පිළිබඳව වහාම පරීක්ෂණයක් අවශ්‍යයි. පරීක්ෂණයක් විතරක් නොවෙයි, අද මේ පනත් කෙටුම්පතින් ඉදිරිපත් කරන කාරණා වාගේම, මේවාට දඬුවම් කළ හැකි විධිවිධාන, නීති-රීති අවශ්‍යයි. මොකද, මේ තරුණ තරුණියන්, ගෘහ සේවයට යන අපේ අම්මාවරු අනන්ත දුකක් විඳින, අහිංසකම මිනිස්සු කොට්ඨාසයක්. ඒ වාගේම බොහෝ බලාපොරොත්තු තබාගෙන, දෙමව්පියන්ගේ, තමන්ගේ පවුල්වල සාමාජිකයන්ගේ අරමුණු ඉටු කරගන්න විශාල දුකක් විඳින පිරිසක්. සමහර අය පෞද්ගලික දේපළ උකස් කරලා, පැද පැද හිටපු මෝටර් බයිසිකලය උකස් කරලා, කනේ කරේ තිබෙන දේවල් උකස් කරලායි විදේශගත වෙලා තිබෙන්නේ. එහෙම විදේශගත වෙච්ච පිරිසකගෙන් මේ විධියට මුදල් අය කරගෙන වංචා කරන එක අපේ ජනාධිපතිතුමාගේ ප්‍රතිපත්තිවලට ගැළපෙනවාද කියන එක තමයි මට අහන්න තිබෙන්නේ. මම හිතනවා, එහෙම නැහැ කියලා. මොකද, අද මේ කථා කරන සුපිරිසිදු පාලනය නම් මේ විධියට හදන්න බැහැ.

මම අහගෙන හිටියා, අද මේ සභාවේදී අපේ බන්දුල ගුණවර්ධන ඇමතිතුමාගෙන් බොහෝ කාරණා කියවුණා.

ඒ කාරණාවලින් කියවුණා, හොරකම්, වංචා, දූෂණ නවත්වන විධිය, වැරදිකාරයන්ට දඬුවම් කරන විධිය, වැල් පාලමෙන් ජනතාව එගොඩ කරන විධිය. ඒ විධියට බොහෝ කතන්දර ඒ කථාවෙන් කියවුණා. ඒ ගැන මට පුදුම හිතුණා. බන්දුල ගුණවර්ධන මැතිතුමා මේ රටේ මුදල් ඇමති, අධ්‍යාපන ඇමති වැනි වග කිව යුතු අමාත්‍ය ධුර ගණනාවක් දැරුවා. අමාත්‍ය ධුර ගණනාවක් දරලා රට මෙතැනට වට්ටන්න දායක වෙච්ච මිනිස්සු දැන් ඇවිල්ලා විපක්ෂය පැත්තට හැරිලා අපට බණ දේශනා කරනවා, මේ දේවල් කොහොමද ඉටු කරන්නේ, ප්‍රතිපත්ති ප්‍රකාශනයේ තිබෙන මේ දේවල් කොහොමද ඉටු කරන්නේ කියලා. මම කියනවා, අනුන්ගේ අඩුපාඩු හොයන්න කලින් කරුණාකරලා මෙන්න මේ වංචාව ගැන, මෙන්න මේ දූෂණය ගැන පරීක්ෂණයක් කරන්න කියලා. පරීක්ෂණයක් කරලා, ගෘහ සේවයට ගිය 26,000ක් විතර වන කාන්තාවන්ට විතරක් නොවෙයි, මේ රටටත් සාධාරණයක් ඉටු කරන්න. අන්න එහෙම කළොත් අපට හිතන්න පුළුවන්, යම් කිසි විධියක සාධාරණ ගමනක් තමයි මේ අය යන්නේ කියලා. නමුත් මේ සිදුවීම්වලින් පෙනෙන්නේ වැල් පාලමෙන් ජනතාව එගොඩ කරවනවා නොවෙයි, ජනතාවගේ බෙල්ලට වැලක් දමලා වැල් පාලමේ එල්ලා තිබෙන බවයි. මොකද පසුගිය කාලයේ අපි දැක්කා, ගෘහ සේවයට ගිය කාන්තාවන් ආපහු ආවේ ඇඟේ ඇණ, කටු, උල් එක්ක නොයෙකුත් විධියේ හිංසාවලට ලක් වෙලා බව. ඔවුන් විධිමත් පුහුණුවක් නොමැතිව ගිය නිසායි එවැනි ප්‍රශ්නවලට මුහුණ දුන්නේ. ඒ පුහුණුව ලැබුවා කියලා ව්‍යාජ සහතික නිකුත් කරලා අත යටින් ඒ අයගෙන් පෞද්ගලික ගිණුම්වලට සල්ලි දමාගෙන මේ කරන අපරාධය මේ ජාතියට කළ මහා ද්‍රෝහිකමක්. ඒ නිසා මේ පිළිබඳව ඉදිරිපත් වෙලා කටයුතු කරන එක සෑම දේශපාලන නායකයෙකුගේම, වගකිව යුත්තෙකුගේම යුතුකමක් බව මම මේ වෙලාවේ මතක් කරන්න කැමැතියි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම ඉක්මනින් කථාව අවසන් කරනවා. දකුණු පළාත් සභාවේදී තිබුණු පරණ යහළුකමට හෝ මට තව පොඩි වෙලාවක් දෙන්න. මේ, මම පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු හැටියට මෙවර පත් වෙලා කරන දෙවැනි කථාව. මට තවත් වරක් කථා කරන්න ලැබෙයිද දන්නේත් නැහැ.

[ගරු බන්දුල ලාල් බණ්ඩාරිගොඩ මහතා]

මේ පාර්ලිමේන්තුවෙන් පිටතදී මම දැකපු කාරණා කිහිපයක් ඔබතුමාට කියන්න කැමැතියි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. මම මේ කියපු කාරණා නිසා තමයි පාර්ලිමේන්තුවට එරෙහිව, මන්ත්‍රීවරුන්ට එරෙහිව සමහර චෝදනා එල්ල වුණේ. ඒ නිසා එළියෙන් එල්ල වන චෝදනාවලට දොස් කිය කියා ඉන්නවා වෙනුවට, අපට විරුද්ධව, මේ පාර්ලිමේන්තුවට විරුද්ධව ආපු කැරලිවලට දොස් කියනවා වෙනුවට, එවැනි කැරලිවලට හේතු වුණු කාරණාවලට පිළියම් හොයන එකයි මහජන නියෝජිතයන්ගේ යුතුකම. ඒ බව ප්‍රකාශ කරමින් මාගේ කථාව අවසන් කරනවා.

**ගරු නීතිඥ ප්‍රේම්නාත් සී. දොලවත්ත මහතා**
(மாண்புமிகு சட்டத்தரணி பிரேம்நாத் சி. தொலவத்த)
(The Hon. Premnath C. Dolawatte, Attorney-at-Law)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු දොලවත්ත මැතිතුමා.

**ගරු නීතිඥ ප්‍රේම්නාත් සී. දොලවත්ත මහතා**
(மாண்புமிகு சட்டத்தரணி பிரேம்நாத் சி. தொலவத்த)
(The Hon. Premnath C. Dolawatte, Attorney-at-Law)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපි දන්නා තරුණයන් කිහිපදෙනෙකුත් ඊශ්‍රායලයට ගිහිල්ලා තිබෙනවා. ඒ අය ඒ කටයුතු කරගෙන යනවා. මොන රටට ගියත් එවැනි ප්‍රශ්න ඇති වෙනවා. හැබැයි, අමාත්‍යතුමාගේ නම විකුණපු අය අද අධිකරණ ක්‍රියාවලිය යටතේ රිමාන්ඩ් බන්ධනාගාරයේ ඉන්නේ. ඒක කවුරු හරි කෙනෙක් කළ වංචනික ක්‍රියාවක්. එම නිසා ඒ සම්බන්ධයෙන් හිටපු අමාත්‍යතුමා විශේෂයෙන් නම් කරන්න බැහැ.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු වීරසුමන වීරසිංහ මැතිතුමා. ඔබතුමාට මිනිත්තු 7ක කාලයක් තිබෙනවා.

[අ.භා. 4.07]

**ගරු වීරසුමන වීරසිංහ මහතා**
(மாண்புமிகு வீரசுமன வீரசிங்ஹ)
(The Hon. Weerasumana Weerasinghe)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ජනාධිපතිවරණයට තව තිබෙන්නේ දවස් 18ක් වාගේ කාලයක්. සමහර විට මේක මේ පාර්ලිමේන්තුවේ අවසාන පාර්ලිමේන්තු සතිය වෙන්නත් ඉඩ තිබෙනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපේ රටේ දේශපාලන ඉතිහාසයේ, ජනාධිපතිවරණ ඉතිහාසයේ, මැතිවරණ ඉතිහාසයේ විපරීතම මැතිවරණයක් පැවැත්වෙන කාල පරිච්ඡේදයක, විපරීතම දේශපාලන කාල පරිච්ඡේදයක තමයි අපි කාටත් ඉන්න සිද්ධ වෙලා තිබෙන්නේ. මේ පාර්ලිමේන්තුව තුළ අද සැබෑ ජන මතය නියෝජනය වෙන්නේ නැහැ. මේ රටේ විධායකය -ජනාධිපතිවරයා- සැබෑ ජන මතය නියෝජනය කරන්නේ නැහැ. ලබන 21වැනි දා ජනතා පරමාධිපත්‍යය සටහන් වෙනවා. ඒ ජනතා පරමාධිපත්‍යය සබුද්ධික මනසකින් සටහන් වන ජනාධිපතිවරණයක් බවට මේ ජනාධිපතිවරණය පත් වෙන්න ඕනෑ. සබුද්ධික මනසකින් ඒ දේ සිදු වෙන්න ඕනෑ. මිනිසුන්ගේ වෛරය, වේදනාව, වෙනත් මොනවා හරි ලාභ ප්‍රයෝජන, එහෙම නැත්නම් වෙනත් කාරණා මත මේ රටේ දේශපාලන තීන්දුව ගත්තොත්, අපි වැටිච්ච මේ නරා වළෙන් තව තවත් යටට යනවා මිසක් ගොඩ ඒමක් නැහැ. අවුරුදු 46ක් තිස්සේ අපි නිදහස් වෙළෙඳ පොළ ආර්ථිකය, එහෙම නැත්නම් විවෘත ආර්ථිකය කර තියාගෙන ඇවිල්ලා විඳපු වේදනාව, අපේ රට බංකොලොත් රාජ්‍යයක් බවට පත් වෙලා අවසන් වෙලා තිබෙනවා. මේ බංකොලොත් රාජ්‍යය ගොඩ ගන්න උත්තර හොයනවා වෙනුවට මේ බංකොලොත් රාජ්‍යය කර තියාගෙන යන්න තව තවත් උත්සාහ කරන ක්‍රමයක් තමයි පසුගිය කාලයේ මැතිවරණ වේදිකාවල අපි දැක්කේ. අපි අමාරුවේ වැටුණේ මොකක් නිසාද? අපේ වැරදි ආර්ථික ගමන් මඟ නිසා; වැරදි දේශපාලන ගමන් මඟ නිසා. නමුත් දේශපාලන ප්‍රතිසංස්කරණයක්, ආර්ථික ප්‍රතිසංස්කරණයක් ඕනෑ වෙලාවක අද දේශපාලන වේදිකාවල නැවත වතාවක් ප්‍රධාන සටන් පාඨ බවට පත් වෙලා තිබෙන්නේ, යැදුම් මානසිකත්වය සහ සහනාධාර මානසිකත්වය, එහෙම නැත්නම් සාම්ප්‍රදායික පොරොන්දු දේශපාලනය.

ඒ නිසා මැතිවරණ වේදිකා, පව, ටොන් පව, ගජබින්නාලංකාරවලින් පිරුණු මැතිවරණ වේදිකා බවට පත් වෙලා තිබෙනවා. ගිලෙන්න යන මනුස්සයා පිදුරු ගහෙත් එල්ලෙනවා වාගේ පීඩාවට පත් වෙලා ඉන්න මිනිස්සු වෛරය නිසා, ක්‍රෝධය නිසා හෝ අසරණ බව නිසා වැරදි දේශපාලන තීන්දුවක් ගත්තොත් නිසැක වශයෙන්ම ඉදිරි අවුරුදු පහ තුළ අවම ලෙස මැතිවරණ හතරකින්, පහකින් තමයි ඒ ප්‍රශ්නය විසඳන්න පුළුවන්කම ලැබෙන්නේ. මේ අර්බුදයට මේ පාර්ලිමේන්තුවේ ඉන්න 225දෙනාම වග කියන්න ඕනෑ. මොකද, මේ හැම කෙනෙකුම අඩු වැඩි වශයෙන් ගත වෙච්ච කාල පරිච්ඡේදය තුළ මේ රටේ බිහි වුණු හැම ආණ්ඩුවකම කොටස්කාරයන් බවට පත් වුණු නිසා. ඒ නිසා මේ සභාවේ කාටවත් සුද්දවන්තයෝ වෙන්න බැහැ. සමහර අය කියනවා, 222ක් වග කියන්න ඕනෑ කියලා, 3දෙනෙක් බේරලා. ඒ 3දෙනාත් මේකට වග කියන්න ඕනෑ. පසුගිය හැම ආණ්ඩුවක්ම ගේන්න මැදිහත් වුණු අය වාගේම මේ 225දෙනාත් මේ අර්බුදයට වග කියන්න ඕනෑ. අපට ඉතිහාසය තුළ ස්වර්ණමය අවස්ථා දෙකක් හම්බ වුණා, යම් සාධනීය මැදිහත්වීමක් වෙන්න. එක ස්වර්ණමය අවස්ථාවක් ලැබුණේ, 2009 යුද්ධය ඉවර වුණාට පසුව. ඒ ස්වර්ණමය අවස්ථාව තුළ අපට ඒ තත්ත්වය යම් ප්‍රමාණයකට පාලනය කර ගන්න පුළුවන්කම ලැබුණා වුණත්, ජාතික සමගිය ස්ථාපිත කිරීමේ කාරණාවේදී එය ජයග්‍රහණයක් බවට පත් කර ගන්න අපි අසමත් වුණා. 2022 ආර්ථික අර්බුදය දේශපාලන අර්බුදයක් වෙලා රට අරාජිකත්වයට යන මොහොතේදී සැමදෙනාම ඉල්ලුවේ කවුරුත් එකතු වුණු සර්ව පාක්ෂික අන්තර් කාලීන ආණ්ඩුවක්. එදා හරියට ඇහුම්කන් දීලා ඒ දේ කළා නම් සමහරවිට අද තවමත් ගෝඨාභය රාජපක්ෂ මහත්තයා ජනාධිපති පුටුවේ ඉන්නවා. ඒ දේ හරියට අහලා කළා නම්, ඒ දේට ඇහුම්කන් දුන්නා නම් මෙවර ජනාධිපතිවරණයේදී පොදු අපේක්ෂකයා බවට පත් වෙන්න තිබුණා, ගෝඨාභය රාජපක්ෂ මහත්තයාට. උද්ධච්ච කණ්ඩායම් විසින් එතුමා වෙනත් තැනකට ගෙනිහිල්ලා කොහේවත් හිටපු රනිල් වික්‍රමසිංහ මහත්තයාව පුටුවේ වාඩි කළ නිසා අද "කැවෝ කැවෝ" කියලා එතුමන්ලාටම කියන්න සිද්ධ වෙලා තිබෙනවා. දේශපාලන විපරීතයක් වෙච්ච මේ වෙලාවේ සබුද්ධික මනසකින් මේ අර්බුදයට උත්තර සොයන්න මැදිහත් වෙන්න ඕනෑය කියන එක පළමුව මම සඳහන් කරන්න ඕනෑ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද පාර්ලිමේන්තුවට ඉතා වැදගත් පනත් කෙටුම්පත් තුනක් ඉදිරිපත් වෙනවා. මේ ගරු සභාවේ ඉන්නවා, වර්තමාන අධිකරණ ඇමතිතුමා. හිටපු අධිකරණ ඇමතිතුමා අද ජනාධිපති අපේක්ෂකයෙක්. ඒ අධිකරණ ඇමතිතුමන්ලා දෙපළම පසුගිය කාල පරිච්ඡේදයේ මේ

පාර්ලිමේන්තුවට සාධාරණ, සාධනීය පනත් රාශියක් ගෙනාවා. ඒ සම්බන්ධයෙන් එතුමන්ලා දෙපළට අපේ ගෞරවය පළ කරනවා. නමුත්, ඒ අධිකරණ ඇමතිවරුන්ට සිද්ධ වුණා, සමහර වෙලාවට ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ කොන්දේසි, එහෙමත් නැත්නම් වෙනත් බටහිර රටවල කොන්දේසි මත යම් පනත් ප්‍රමාණයක් ගේන්න වාගේම, ඒ ආර්ථික ප්‍රතිසංස්කරණවලට පාර කපන පනත් ප්‍රමාණයක් ගේන්න. ඒ අනුව හොඳ පනත් අතර තක්කඩි පනත් කිහිපයකුත් සම්මත කර ගන්න කටයුතු කළා. ඒ අතර අවසාන මොහොතේදී හෝ මේ පනත් කෙටුම්පත් තුන ගෙන ඒමට මැදිහත්වීම පිළිබඳව අපේ ගෞරවය සහ ස්තුතිය පළ කරනවා.

විදේශ නඩු තීන්දු අන්‍යෝන්‍යාව පිළිගැනීම, ලියාපදිංචි කිරීම සහ බලාත්මක කිරීම පිළිබඳ පනත් කෙටුම්පත ඉතාම කාලෝචිතයි. මොකද, අපට ජාත්‍යන්තර නීතියෙන් ගැලවෙන්න බැහැ. එදා තිබුණු නීති නොවෙයි අද තිබෙන්නේ. ඒ නීති අද වෙනකොට වෙනස් වෙලා තිබෙනවා. එදා තිබුණු ප්‍රශ්න නොවෙයි අද තිබෙන්නේ. ඒවා අද වෙනකොට වෙනස් ප්‍රශ්න බවට පත් වෙලා තිබෙනවා. ඒ නිසා මේ පනත් කෙටුම්පත ඉතා වැදගත්. ඒ වාගේම අපරාධ නඩු විධාන සංග්‍රහය (සංශෝධන) පනත් කෙටුම්පතට අලුත් සංශෝධනයක් ඉදිරිපත් වෙලා තිබෙනවා. ඒක ඉතා වැදගත්. නමුත් මූලික වශයෙන් මගේ අවධානය යොමු කරන්නේ සේවකයන්ගේ ජාතික අවම වේතනය (සංශෝධන) පනත් කෙටුම්පත පිළිබඳවයි. මේ සංශෝධනය අවුරුදු දෙකක් තිස්සේ පසුපසට ගිහිල්ලා තමයි අද දවසේ ඉදිරිපත් වෙන්නේ.

මේ රටේ ආර්ථිකයේ ජීවනාලිය වෙන්නේ කඳුළු, ලේ, දහඩිය වගුරුවන කම්කරුවා. නමුත් කම්කරුවා ගැන කිසිදු සාධනීය මැදිහත්වීමක් ඉතිහාසය පුරා සිද්ධ වෙලා නැහැ. අපි නියෝජනය කරන දේශපාලන ධාරාවේ අපේ පක්ෂ එදා ඉඳලාම කම්කරු අයිතීන් වෙනුවෙන්, වරප්‍රසාද වෙනුවෙන් මැදිහත් වුණා. එවැනි දේශපාලන ධාරාවක් නියෝජනය කරන පක්ෂයක සාමාජිකයකු විධියට මම දකිනවා, මේ පනත් කෙටුම්පත තුළ යම් ප්‍රමාණයකට සාධනීය මැදිහත්වීමක් වෙලා තිබෙන බව, කම්කරුවන්ගේ අවම මාසික වැටුප රුපියල් 12,500 ඉඳලා රුපියල් 17,500 දක්වා වැඩි කරන්න.

මොකද, අපි මේ කාරණා අවුරුදු දෙකකට කලින් කථා කරනකොට ජාතික කම්කරු උපදේශක සභාවේ subcommittee එකක් පත් කරලා මේ ගැන යම් මහපෙන්වීමක් කළා, අවම මාසික වැටුප රුපියල් 21,000ක් වෙන්න ඕනෑ කියලා. එදා එතැන සිටි හැමදෙනාම ඒකට එකඟ වුණා. නමුත් එය රුපියල් 21,000 කරන්න මැදිහත් වුණේ නැහැ. ඒ සඳහා ඍජු දායකත්වයක් කම්කරු අමාත්‍යාංශය කළේ නැහැ. හිටපු කම්කරු ඇමතිවරුන්ට වෙන වැඩ තිබුණා. බන්දුල ලාල් බණ්ඩාරිගොඩ මන්ත්‍රීතුමාත් ඒ කාරණයම තමයි කිව්වේ. කම්කරු අමාත්‍යාංශය සිල්ලර අමාත්‍යාංශයක් විධියට දාලා තමයි පසුගිය කාලයේ කටයුතු කළේ. කම්කරුවා රවට්ටන දේවල් හැරෙන්න කම්කරුවා වෙනුවෙන් සාධනීය මැදිහත්වීමක් වුණේ නැහැ. මට මතකයි, පසුගිය මැයි 01වන දා වර්තමාන ජනාධිපතිතුමා වතු කම්කරුවාගේ පඩිය රුපියල් 1,700 දක්වා වැඩි කළා කියලා මහා ගෝරනාඩු දැම්මා. ඊට සතියකට පස්සේ මම මේ පාර්ලිමේන්තුවේදීම කිව්වා, ඒක කෙරෙන වැඩක් නොවෙයි, කෙරෙන විධියට නොවෙයි කළේ කියලා. ඒ කිව්වා වාගේම අද වනකොට ඒක හකුළා ගන්න සිද්ධ වෙලා තිබෙනවා. ඒක හකුළාගෙන අද අධිකරණයට කියන්න සිද්ධ වෙලා තිබෙනවා, ඒ ගැසට් එක අයින් කරගෙන වෙනත් ගැසට් එකක් ගේනවා කියලා. ඒ විධියට කම්කරුවන් රවටන්න කටයුතු කිරීම ඉතිහාසයේ ඉඳලා සිද්ධ වුණා. කම්කරුවාගේ දෛනික වැටුප රුපියල් 1,000ක් කරන්න කියලා එදා පාර්ලිමේන්තුවේදී ගිනි තියා ගන්න හදපු මන්ත්‍රීවරයා දෛවයේ සරදමකට අද ඒ රාජ්‍ය ඇමතිවරයා බවට පත් වෙලා. අපි බලාපොරොත්තු වෙනවා, වතුකරයෙන් බිහි වුණු ඒ රාජ්‍ය ඇමතිවරයාවත් ඉදිරි දින කිහිපය තුළදී මේ සංශෝධන සාධනීය විධියට ක්‍රියාත්මක කරන්න මැදිහත් වෙයි කියලා.

කම්කරුවන්ගේ දෛනික වැටුප වැඩි කරනවා වාගේම, මාසික වැටුපත් වැඩි කිරීම සඳහාත් වැඩි මැදිහත්වීමක් වෙන්න ඕනෑ කියන කාරණාව මම සිහිපත් කරනවා. "කම්කරුවා" කියන වචනය වෙනස් කරන්න. "කම්කරුවා" කියන වචනයම සාපයක්. මේ රට ගොඩ ගත්තේ ඔවුන්. ඔවුන් "කම්කරුවා" කියන මානසිකත්වයෙන් ගලවා මේ රටේ ආර්ථිකයේ සහකරුවන් බවට පත් කරන්න පුළුවන් නම්, ඔවුන් තුළ "සහකරුවා" කියන මානසිකත්වය හදන්න පුළුවන් නම්, ඔවුන් මේ රටට කරපු ඒ අපරිමිත මෙහෙවරට යම් සාධාරණයක් ඉෂ්ට කළා වේවි. සෑම ක්ෂේත්‍රයකම සිටින කම්කරුවන්ට - වතුකරයේ කම්කරුවාගේ ඉඳලා කොළඹ නාට්ටාමි ජොබ් එක කරන හැම කෙනා දක්වාම - සාධාරණයක් ඉෂ්ට කරන්න මැදිහත් වෙන්න කියන කාරණාව මා සිහිපත් කරනවා.

එළඹෙන ජනාධිපතිවරණය පෞද්ගලික කෝන්තර පිරිමහන ජනාධිපතිවරණයක්වත්, කාගෙන්වත් පළිගන්න ජනාධිපතිවරණයක්වත්, එහෙම නැත්නම් වෛරය මුසු කර ගන්න ජනාධිපතිවරණයක්වත් නොවෙයි. ඒක මේ අර්බුදය විසඳා ගන්න පුළුවන් කණ්ඩායම් සමඟ එකතු වෙන මැතිවරණයක් බවට පත් කරන්න කියලා මා ඉල්ලා සිටිනවා. අපි නියෝජනය කරන දේශපාලන කණ්ඩායම වන "සර්වජන බලය" විධියට ඒ වෙනුවෙන් අපේ වැඩ පිළිවෙළක් ඉදිරිපත් කර තිබෙනවා. අපි මේ ජනාධිපතිවරණය ජයග්‍රහණය කළොත් මේ වැඩ පිළිවෙළ අනිවාර්යයෙන්ම ක්‍රියාත්මක කරනවා. එහෙම නැතිව වෙන කවුරු හරි ජයග්‍රහණය කළොත් ඒ වැඩ පිළිවෙළ අධ්‍යයනය කරන්න කියන කාරණාවත් සිහිපත් කරමින් මා නිහඬ වෙනවා.

බොහොම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු කරුණාරත්න පරණවිතානගේ මන්ත්‍රීතුමා.

[අ.භා. 4.15]

**ගරු කරුණාරත්න පරණවිතානගේ මහතා**
(மாண்புமிகு கருணாரத்ன பரணவிதானகே)
(The Hon. Karunarathna Paranawithanage)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම අද උදෑසන තමයි මන්ත්‍රීවරයකු හැටියට දිවුරුම් දුන්නේ. ඒ අනුව මම මේ පාර්ලිමේන්තුවේදී පවත්වන ප්‍රථම කථාව මේකයි. ගරු තලතා අතුකෝරල මහත්මිය ඉල්ලා අස්වීම නිසා ඇති වූ පුරප්පාඩුවට මා පත් වුණා. මට මුලින්ම මේ සම්බන්ධයෙන් යුතුකමක් ඉෂ්ට කරන්න තිබෙනවා. මගේ ප්‍රධාන කථාවට පැමිණෙන්න පෙර ඒ සඳහා අවසර දෙන්න කියලා මම ඉල්ලා සිටිනවා. මට අද මන්ත්‍රීවරයකු හැටියට දිවුරුම් දෙන්න හැකියාවක් ලැබුණේ පසුගිය මහ මැතිවරණයේදී රත්නපුර දිස්ත්‍රික්කයේ ජනතාව මට විශාල වශයෙන් ඡන්දය දීලා, මනාප ලැයිස්තුවේ ඉහළට මා ඔසවා තැබූ නිසායි. ඒ වාගේම මම කියන්න ඕනෑ, පාර්ලිමේන්තුවේ නොහිටියත් අපි ඒ ජන වරමට ගරු කරමින්, එය ආරක්ෂා කරමින් හැමදාම කටයුතු කළ බව. අපි ඒ ජන වරම පාවා දුන්නේත් නැහැ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපි රත්නපුරයටත්, රටටත් වැදගත් තේමාවක් හඳුන්වා දුන්නා. ඒ තමයි, "ගරු සරු

[ගරු කරුණාරත්න පරණවිතානගේ මහතා]

දේශපාලනයක් උදෙසා" කියන එක. මම යහ පාලන ආණ්ඩු කාලයේ හිටපු මන්ත්‍රීවරයකු හැටියටත්, නියෝජ්‍ය අමාත්‍යවරයකු හැටියටත්, රත්නපුර දිස්ත්‍රික්කයේ මන්ත්‍රීවරයකු හැටියටත් ඒ ප්‍රදේශයේත්, මේ පාර්ලිමේන්තුවේත්, අමාත්‍යාංශවලත්, විදේශ රටවල කරපු මෙහෙවරවලදීත් ගරු සරුභාවය ආරක්ෂා කරමින් වැඩ කළා. මගේ දේශපාලනය ඉදිරියටත් ක්‍රියාත්මක වෙන්නේ ඒ පදනමේ ඉඳගෙනයි කියන එක මම මතක් කරන්න කැමැතියි.

ඊළඟට, අද ඉදිරිපත් කර තිබෙන පනත් කෙටුම්පත් අතරින් එක පනත් කෙටුම්පතක් ගැන පමණක් කථා කරන්න මම කැමැතියි. ඒ තමයි, සේවකයන්ගේ ජාතික අවම වේතනය (සංශෝධන) පනත් කෙටුම්පත. ඇත්තෙන්ම කියනවා නම් මේ පනත් කෙටුම්පත ඉතාම හොඳ පනත් කෙටුම්පතක්. ඒ සඳහා අපේ සහයෝගය ලබා දෙනවා. ඒ වාගේම මම කියන්න ඕනෑ, අද රට ආර්ථික වශයෙන් බංකොලොත් වෙලා තිබෙන වෙලාවක, ලක්ෂ 70කට අධික ප්‍රමාණයක් දරිද්‍රතා රේඛාවෙන් පහළට වැටී තිබෙන වෙලාවක, මිනිස්සු බඩු බරින්, ණය බරින්, ජීවන බරින් හෙම්බත් වෙලා තිබෙන වෙලාවක මේ වාගේ නීති රීතිවලින් සමාජ සාධාරණත්වය සුරක්ෂිත කිරීම ඉතාම වැදගත් පියවරක් බව. නමුත් ඒක ප්‍රමාණවත් නැහැ. ඒ වාගේම මේ පනත් කෙටුම්පතෙන් කථා කරන දේ අද වනවිට අපට දකින්නට ලැබෙන ජනාධිපතිවරණ ප්‍රචාරක ව්‍යාපාරයටත් බෙහෙවින්ම අදාළයි.

අද වනකොට ජනාධිපතිවරණයට අපේක්ෂකයන් ගණනාවක් තරග කළාට ඒ තරගය අපේක්ෂකයන් දෙදෙනෙකුට සීමා වෙලා තිබෙනවා. සමගි ජන බලවේගයේ නායක සජිත් ප්‍රේමදාස මැතිතුමා සහ ජනතා විමුක්ති පෙරමුණේ නායක අනුර දිසානායක මැතිතුමා අතර තරගයක් බවට එය පත් වෙලා තිබෙනවා. අවම වැටුප් වැඩි කරමින්, වැටුප් වර්ධක වැඩි කරමින් ආණ්ඩුවට ඉස්සරහට කටයුතු කරන්න වෙනවා. එහෙම නම් මේ සඳහා ධනයක් අවශ්‍යයි. නිකම් පොරොන්දු දීලා හරියන්නේ නැහැ. මේ රට නැවත වතාවක් ධනෝපායන රටක් බවට පත් කළ යුතුව තිබෙනවා. එහෙම නැත්නම් මේ නීති රීති මහා පුස්සක් බවට පත් වෙනවා. ඒ හැකියාව තිබෙන්නේ කාටද? අපි අන්න ඒ කාරණය දිහා බලන්නට ඕනෑ. රටේ ආර්ථිකය දියුණු කිරීම සඳහා අපට වෙළෙඳ පොළ ක්‍රමයත් එක්ක යන්න සිදු වෙලා තිබෙනවා. ඒ වාගේම රටේ සමාජ සාධාරණත්වය තහවුරු කරන්නත් සිදු වෙලා තිබෙනවා.

ඒ වාගේම ජාතික සංහිඳියාව ආරක්ෂා කරන්න වෙලා තිබෙනවා. ඒ ක්‍රියාමාර්ගයේදී දේශපාලන ප්‍රතිපත්තියක් ගැන කියනවා නම් අපට යන්න තිබෙන එකම විකල්පය තමයි, සමාජ ප්‍රජාතන්ත්‍රවාදී ක්‍රමයක් ඔස්සේ ඉස්සරහට යන එක. සජිත් ප්‍රේමදාස මැතිතුමා පමණයි ඉතා නිශ්චිතව කියලා තිබෙන්නේ අපි යන ගමන මේකයි කියලා. මෙච්චර කාලයක් සමාජවාදය ගැන කථා කරපු අය ඒ ගැන මොකක්වත් කියලා නැහැ, මොකක්ද ඒ අයගේ ප්‍රතිපත්තිය කියලා. ජනතා විමුක්ති පෙරමුණ අද රටේ කරමින් සිටින්නේ, අපි දුක්විඳින ප්‍රශ්නය ආලවට්ටම් දාලා, කැටයම් දාලා අපටම ආපහු කියන එක. ඒක අලුතින් කියන්න දෙයක් නැහැ. දිරාපත් වුණු යට ඇඳුම් ගැන ආලවට්ටම් දාලා කථා කරන ඒ අය ඉදිරිපත් කරන්නේ ගරු නියෝජ්‍ය කථානායකතුමනි, හොඳටම දිරාපත් වෙච්ච විසඳුම්. ඒ විසඳුම්වලින් රටේ ආර්ථිකය ගොඩනඟන්න බැහැ. සමගි ජන බලවේගයේ ප්‍රතිපත්ති ප්‍රකාශනය අරගෙන බලන්න. ආර්ථිකය දියුණු කිරීමටත්, සමාජ සාධාරණත්වය තහවුරු කිරීමටත් ඉතා විද්වත්, සබුද්ධික, ප්‍රායෝගික යෝජනා මාලාවක් සමගි ජන බලවේගයේ ප්‍රතිපත්ති ප්‍රකාශනයෙන් ඉදිරිපත් කරලා තිබෙනවා. ඒවා ක්‍රියාත්මක කරන්න පුළුවන් හොඳ කණ්ඩායමක් සජිත් ප්‍රේමදාස මැතිතුමා වටා ඒක රාශි වෙලා සිටිනවා.

තව කාරණයක් මම මතක් කරන්න කැමැතියි, ගරු මන්ත්‍රීවරුනි. ඒ ආලවට්ටම් දැමීම ගැන පමණක් නොවෙයි, ඒ කැටයම් කථා පමණක් නොවෙයි, ඒ දිරාපත් වෙච්ච විසඳුම්වලට දමන උජාරු කථා පමණක් නොවෙයි, තව ඉතා භයානක දෙයක් මේ රටේ සිදු වෙමින් තිබෙනවා. ඒ භයානක දේ ගැන මේ පාර්ලිමේන්තුවේ මම අද කථා කරනවා වාගේම, මේ රටේ ජනතාව ඒ ගැන හිතන්න ඕනෑ කියන කාරණයත් මම මේ වෙලාවේ මතක් කරනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගාමිණී දිසානායක මැතිතුමා ඇති කරපු මහවැලි සංවර්ධන යෝජනා ක්‍රමයේ ගොවි ජනපදයේ ඉපදිලා, ජේ.ආර්. ජයවර්ධන මැතිතුමා නොමිලේ ලබා දීපු පොත් ටිකෙන් ඉස්කෝලේ ගිහිල්ලා, ලලිත් ඇතුලත්මුදලි මැතිතුමා ලබා දීපු මහපොළ ශිෂ්‍යත්වයෙන් විශ්වවිද්‍යාල වියහියදම් පිරිමහගෙන, උපාධිධාරින් වෙලා, උගත්තු වෙලා දේශපාලනයට ආපු අය අද මේ රටේ හැම තැනම කියාගෙන යනවා, මේ රටේ 77 වසරක සාපයක් තිබුණා, මහා දූෂ්ට හැතිකරයක් මේ රට විනාශ කළා කියලා. මම කල්පනා කරලා බැලුවා, ඇයි මේ ගොල්ලන් ඒ වාගේ කථාවක් කියන්නේ, තමන්ගේම ඉතිහාසයට ඇයි ගරහන්නේ, තමන්ගේ පදනමට ගරහමින් ඇයි මේ කථාව දිගින් දිගටම කියාගෙන යන්නේ කියලා. ඒ කථාව නිකම්ම කථාවක් නොවෙයි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. මේ හදන්නේ විශාල සමාජ බෙදුම්වාදයක් ඇති කරන්නයි. ඒ සමාජ බෙදුම්වාදය මොකක්ද? ඒක තමයි "උන් සහ අපි" කියන එක. මේක හිට්ලර් ජර්මනියේ කළා. "අපේ දේශපාලනය පාරිශුද්ධ දේශපාලනයක්. තොපේ දේශපාලනය දූෂ්ට දේශපාලනයක්" කියලා සමාජ මතවාදයක් හැම මිනිසුන්ගේම ඔළුවේ තහවුරු කරලා බලය ලබා ගත්තාට පසුව, ආයේ ප්‍රජාතන්ත්‍රවාදයක් නැහැ, ඕනෑ මිනිහෙක්, ඕනෑ දේශපාලන පක්ෂයක් තහනම් කරන්න, ඕනෑම විපක්ෂ නායකයෙක්, විරුද්ධවාදියෙක් අත්අඩංගුවට ගන්න, ඕනෑ නම් මරලා දාන්න, රටින් එළවන්න කරන මතවාදය සමාජයීය වශයෙන් තහවුරු කිරීම තමයි මේ කරන්නේ. අන්න ඒ භයානක සමාජ බෙදුම්වාදය දීර්ඝ කාලීන කල් අල්ලන මතවාදයක්. ඒ ගොල්ලන්ටත් ඒක control කර ගන්න බැරි වෙනවා. එම නිසා මෙන්න මේක ගැන ආර්ථික කාරණයටත් වඩා අපි උනන්දු විය යුතුයි කියලා මම මතක් කරනවා. අද මේ රටට අවශ්‍ය වෙලා තිබෙන්නේ ඒ වාගේ භයානක, ප්‍රචණ්ඩත්වයට අත වනන, ප්‍රායෝගිකත්වයට කිසි ඉඩක් නැති දේශපාලනයක් නොවෙයි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ ජනාධිපතිවරණයෙන් මේ රටේ ජනතාවට ඉස්පාසුවක් අවශ්‍ය වෙලා තිබෙනවා. මේ රටට හුස්ම ගන්න අවකාශයක් අවශ්‍ය වෙලා තිබෙනවා. රට කියන්නේ මිනිස්සු කියලා හිතන නායකයෙකු යටතේ මෙහෙයවන ප්‍රජාතන්ත්‍රවාදී රාජ්‍යයක් අවශ්‍ය වෙලා තිබෙනවා. අන්න ඒක නිසා ඔය සමාජ මාධ්‍ය අවකාශයේ, මාධ්‍ය අවකාශයේ, සාහිත්‍ය මහාචාර්යවරු කියන කවි නොවෙයි, මේ ගැන ඇහට දැනෙන මිනිස්සු දසදහස් ගණනක් අද වන විට සමගි ජන බලවේගය වටා ඒක රාශි වෙමින් සිටිනවා. එම නිසා අපේ රටේ අනාගතය අඳුරු නැහැ කියන එකයි මම කියන්නේ. රට අඳුරට ගෙන යන්න මොන අය උත්සාහ ගත්තත් මේ රට ඉදිරියේ ලොකු ආලෝකයක් මතුවෙමින් තිබෙනවාය කියන එක මතක් කරමින් මේ පාර්ලිමේන්තුවේ මගේ ප්‍රථම කථාව මෙතෙකින් අවසන් කරනවා.

බොහොම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ඔබතුමාට සුබ පතනවා.

මීළඟට, ගරු සෙල්වරාජා කජේන්ද්‍රන් මැතිතුමා. ඔබතුමාට මිනිත්තු නවයක කාලයක් තිබෙනවා.

[பி.ப. 4.24]

**ගරු සෙල්වරාජා කජේන්ද්‍රන් මහතා**
(மாண்புமிகு செல்வராசா கஜேந்திரன்)
(The Hon. Selvarajah Kajendren)
கௌரவ பிரதிச் சபாநாயகர் அவர்களே, ஜனாதிபதித் தேர்தல் நடைபெறுவதற்கு இன்னும் 18 நாட்கள் இருக்கின்ற நிலையில் நாங்கள் இன்றைய அமர்விலே கூடியிருக் கின்றோம். ஒருவேளை இது இந்தப் பாராளுமன்றத்தின் கடைசி அமர்வாகவும் இருக்கலாம். நாளைய தினம் இந்தத் தேர்தலுக்கான தபால்மூல வாக்களிப்பு நடைபெற விருக்கின்றது. தமிழ் மக்களுடைய வாக்குகளைக் குறிவைத்து ஜனாதிபதி வேட்பாளர்கள் மிகத் தீவிரமான பிரசாரங்களில் ஈடுபட்டுக்கொண்டிருக்கின்ற இந்த நேரத்திலே, கௌரவ கஜேந்திரகுமார் பொன்னம்பலம் அவர்களின் தலைமையிலான தமிழ்த் தேசிய மக்கள் முன்னணியினுடைய நிலைப்பாட்டை நான் இந்த இடத்தில் பதிவுசெய்துகொள்ள விரும்புகிறேன்.

2020ஆம் ஆண்டு ஓகஸ்ட் மாதம் இந்த நாடாளுமன்றம் கூடியபோது, கௌரவ கஜேந்திரகுமார் பொன்னம்பலம் அவர்களுடைய தலைமையிலான கட்சியில் தெரிவான நானும் இந்த நாடாளுமன்றத்தில் உறுப்பினராகச் சத்தியப் பிரமாணம் செய்துகொண்டேன். அன்றிலிருந்து நாங்கள் தொடர்ச்சியாக வலியுறுத்தி வருகின்ற விடயம், கடந்த எழுபத்தைந்து வருடங்களாகப் புரையோடிப்போயிருக்கின்ற இனப் பிரச் சினையைத் தீர்ப்பதற்கு ஆக்கபூர்வமான நடவடிக்கைகளை இந்த அவையிலே இருக்கின்ற மூத்த அமைச்சர்கள், உறுப்பினர்கள் மற்றும் இந்த நாட்டினுடைய அரசியல் தலைவர்கள் எடுக்கவேண்டுமென்பதே. ஆனாலும், அதை யாரும் கருத்திலெடுத்ததாக இல்லை. 2022ஆம் ஆண்டில் நாட்டில் ஏற்பட்ட பொருளாதார நெருக்கடி காரணமாக இந்த நாட்டு மக்கள் வீதியிலே இறங்கி, ஆட்சியில் இருந்த ஜனாதிபதி கோட்டாபய ராஜபக்ஷ அவர்களுக்கு எதிராகவும் அவருடைய அரசாங்கத்துக்கு எதிராகவும் போராடினார்கள். அதனுடைய விளைவாக அவர் அந்தப் பதவியை இராஜினாமா செய்தார். அதற்குப் பிற்பாடு மாண்புமிகு ரணில் விக்கிரம சிங்ஹ அவர்கள் ஜனாதிபதியாகப் பொறுப்பேற்றுக் கொண்டார். அதன்பின் அவர் இந்த நாடாளுமன்றத்திலே உரையாற்றும்போது தமிழ், முஸ்லிம் சமூகங்களை நோக்கி, தான் இனப் பிரச்சினையைத் தீர்க்கப் போவதாகவும் அதற்கு ஒத்துழைக்க வேண்டும் என்றும் கேட்டிருந்தார். குறிப்பாக, எங்களுடைய கட்சித் தலைவர் கஜேந்திரகுமார் பொன்னம்பலம் அவர்களின் பெயரைக் குறிப்பிட்டு, தான் இனப் பிரச்சினையைத் தீர்க்கப்போவதாகவும் அதற்கு நாங்கள் அரைவாசி ஒத்துழைத்தால்கூட தான் இந்தப் பிரச்சினையைத் தீர்த்துவிடுவதாகவும் தெரிவித்திருந்தார். அந்த இடத்திலே எங்களுடைய தலைவர் அவருடைய முயற்சியை வரவேற்று அதற்கு ஒத்துழைப்பு வழங்கத் தயாராக இருப்பதாகச் சொல்லியிருந்தார்.

இந்த நாட்டினுடைய இனப் பிரச்சினை தீர்க்கப்பட வேண்டுமாகவிருந்தால், எழுபத்தைந்து வருடங்களாக இந்த நாட்டிலே இனங்களுக்கிடையில், குறிப்பாகத் தமிழ் - சிங்கள மக்களுக்கிடையே பகைமையை வளர்த்து, ஓர் இன அழிப்புப் போருக்கு வித்திட்ட, இந்த நாட்டினுடைய ஊழலுக்குக் காரணமாயிருந்த, போர் முடிந்து 13 வருடங்கள் கடந்த பின்னரும் இந்த நாட்டினுடைய பொருளாதாரம் பாதாளத்தில் வீழ்வதற்குக் காரணமாயிருந்த, தோல்வியடைந்த இந்த ஒற்றையாட்சி அரசியலமைப்பு நீக்கப்பட்டு, தமிழர்களுடைய தேசத்தையும் அங்கீகரிக்கின்ற வகையிலே, இனங்களைச் சமத்துவமாக வழிநடத்தக்கூடிய சமஷ்டி அடிப்படையிலான ஓர் அரசியலமைப்பைக் கொண்டுவருவதன்மூலம் மட்டுந்தான் இனங்களுக்கிடையில் சமத்துவத்தையும் வீழ்ந்திருக்கின்ற பொருளாதாரத்தையும் கட்டியெழுப்புவதற்கான முதலடியை எடுத்துவைக்க முடியும் என்கின்ற உண்மையை மக்களுக்கு எடுத்துச் சொல்லுங்கள்! அதைச் சொல்லி, அந்த இடத்தி லிருந்து ஒரு சமஷ்டி அரசியலமைப்பின் அடிப்படையில் இனப் பிரச்சினையைத் தீர்த்து, நாட்டின் பொருளாதாரத்தைக் கட்டியெழுப்புவதற்கு நீங்கள் முன்னெடுக்கின்ற முயற்சிகளுக்கு நாங்கள் எப்பொழுதும் ஒத்துழைப்பு வழங்கத் தயாராக இருக்கின்றோம் என்கின்ற ஒரு தெளிவான செய்தியை எங்களுடைய தலைவர் முன்வைத்திருந்தார்.

ஆனால், அதற்குப் பிற்பாடு சனாதிபதி அவர்கள் 'இனப் பிரச்சினைத் தீர்வு' என்ற பெயரிலே பேச்சுவார்த்தைகளை நடத்துவதாகக் கூறி, தமிழ்க் கட்சிகளையும் முஸ்லிம் கட்சிகளையும் அழைத்துப் பல கூட்டங்களை நடத்தி, அதன்மூலமாக தான் எல்லா இனங்களையும் அரவணைத்துச் செல்லக்கூடிய ஒரு தலைவர் என்ற ஒரு தோற்றப்பாட்டை ஏற்படுத்தி, சர்வதேச சமூகத்திடமிருந்து, குறிப்பாக IMF இடமிருந்து நிதி உதவிகளைப் பெற்றுக்கொள்வதற்கான முயற்சிகளில் மாத்திரம்தான் ஈடுபட்டிருந்தாரே தவிர, எந்த ஒரு விதத்திலும் இனப் பிரச்சினையைத் தீர்ப்பதற்கான ஆக்கபூர்வமான நடவடிக்கைகளை எடுப்பதற்கு அவர் தயாராக இருக்கவில்லை. அதுமட்டுமல்லாமல், வடக்கு, கிழக்கிலே சிங்கள மயமாக்கலையும் பௌத்த மயமாக்கலையும் தீவிரப்படுத்துகின்ற செயற்பாடுகளிலும் அரசாங்கம் ஈடுபட்டிருந்தது.

அந்த அடிப்படையிலே, நாங்கள் அன்று நாடாளு மன்றத்திற்குள் ஜனாதிபதித் தெரிவு நடைபெற இருந்த சந்தர்ப்பத்திலே அவரிடம் மட்டுமல்லாமல் இன்று ஜனாதிபதி வேட்பாளராக இருக்கக்கூடிய சஜித் பிரேமதாஸவாக இருக்கலாம் அல்லது அநுரகுமார திஸாநாயக்கவாக இருக்கலாம், அவர்களிடமும் எங்களுடைய நிலைப்பாடுகளைத் தெளிவாக முன்வைத்திருந்தோம். தற்போதிருக்கின்ற ஒற்றை யாட்சி முறைமை ஒழிக்கப்பட்டு, சமஷ்டி அடிப்படையிலான ஓர் அரசியலமைப்பு கொண்டுவரப்பட வேண்டும் என்ற எமது நிலைப்பாட்டைக் கடந்த இரண்டு வருடங்களாக இந்த நாடாளுமன்றத்திலே நாங்கள் வலியுறுத்தி வந்திருக்கின்றோம். தேசிய மக்கள் சக்தியிடமும் ஐக்கிய மக்கள் சக்தியிடமும் அந்தக் கோரிக்கை வலியுறுத்தப்பட்டிருக்கின்றது. ஆனால், அவர்கள் யாரும் எங்களுடைய கருத்துகளை உள்வாங்கியதாக இல்லை. அந்தக் கோரிக்கையைச் செவிமடுத்ததாகத் தெரியவில்லை. இந்த ஜனாதிபதித் தேர்தல் அறிவிப்பு வெளியிடப்படுவதற்கு முன்னரே கௌரவ கஜேந்திரகுமார் பொன்னம்பலம் அவர்களின் தலைமையிலான எங்களுடைய அரசியல் இயக்கம் ஒரு தெளிவான முடிவை எடுத்திருந்தது.

அதாவது, "இந்த நாட்டினுடைய ஒற்றையாட்சி அரசியலமைப்பு நீக்கப்பட்டு, சமஷ்டி அரசியலமைப்பு கொண்டுவரப்படும்" எனும் ஓர் உத்தரவாதம் வெளிப்படுத்தப்

[ගරු සෙල්වරාජා කජේන්ද්‍රන් මහතා]

பட்டால் மாத்திரமே அந்த ஜனாதிபதி வேட்பாளருக்கு ஆதரவளிப்பதாகவும் இல்லையென்றால், எங்கள்மீது மேற்கொள்ளப்பட்ட இன அழிப்புக்குக் காரணமாக இருந்த, தொடர்ந்தும் ஒரு கட்டமைப்புசார் இன அழிப்பை முன்னெடுக்க இடமளிக்கின்ற இந்த ஒற்றையாட்சி அரசியல மைப்பை நிராகரிக்கின்ற விதமாக இந்த ஜனாதிபதித் தேர்தலைத் தமிழ் மக்கள் புறக்கணிக்க வேண்டுமென்று கோருவதென்ற முடிவை நாங்கள் எடுத்திருந்தோம். நாங்கள் முன்கூட்டியே அவ்வாறான முடிவை எடுத்திருந்ததன்மூலம் ஜனாதிபதி வேட்பாளர்களுக்கு ஒரு சந்தர்ப்பத்தை வழங்கியிருந்தோம். அதாவது, ஜனாதிபதி வேட்பாளர்கள் தங்களது தேர்தல் விஞ்ஞாபனத்தில், "ஒற்றையாட்சி அரசியல மைப்பை நீக்கி, ஒரு சமஷ்டி அரசியலமைப்பைக் கொண்டு வருவோம்" என்ற அறிவித்தலை வெளியிடவேண்டுமென்று எதிர்பார்த்திருந்தோம்; அதற்கான அழுத்தங்களையும் நாங்கள் கொடுத்துக்கொண்டிருந்தோம். அது தொடர்பில் மக்கள் மத்தியில் துண்டுப் பிரசுரங்களை வெளியிடுகின்ற செயற்பாடு களையும் தீவிரமாக முன்னெடுத்திருந்தோம்.

ஆனால், கடந்த 29ஆம் திகதி இந்த வேட்பாளர்களால் தேர்தல் விஞ்ஞாபனங்கள் வெளியிடப்பட்டிருந்தன. 'புதிய மந்தையிலே பழைய கள்' என்பதுபோல, 75 வருடங்களாக இந்த நாட்டினுடைய தோல்விக்குக் காரணமான அதே ஒற்றையாட்சி அரசியலமைப்பையும், பௌத்தம் அரச மதம் என்ற நிலைப்பாட்டையும் பேணிப் பாதுகாக்கும் வகையில்தான் அவை வெளியிடப்பட்டிருந்தது. அதன் காரணமாக நாங்கள் இந்தத் தேர்தலைப் புறக்கணிப்பதென்ற முடிவில் உறுதியோடு தொடர்ச்சியாக மக்கள் மத்தியில் கருத்துருவாக்கங்களைச் செய்துகொண்டிருக்கின்றோம். இந்தத் தேர்தலுக்காக நாளை நடைபெறவிருக்கின்ற தபால்மூல வாக்களிப்பை ஒட்டுமொத்த தமிழ்த் தேச அரச உத்தியோகத் தர்களும் புறக்கணிக்க வேண்டும்; இந்தத் தேர்தலிலே வாக்களிக்கக்கூடாது என்ற கோரிக்கையை தமிழ்த் தேசிய மக்கள் முன்னணி சார்பாகவும் அகில இலங்கை தமிழ் காங்கிரஸ் சார்பாகவும் கஜேந்திரகுமார் பொன்னம்பலம் தலைமையிலான அரசியல் இயக்கம் விடுக்கின்றது. இது வெறுமனே தமிழர்களின் நலன்களுக்கானது மட்டுமல்ல. மாறாக, நாட்டினுடைய ஒட்டுமொத்த சிங்கள, முஸ்லிம், மலையக மக்களுடைய நலன்களுக்கானது என்பதை நான் இந்த இடத்திலே பதிவுசெய்துகொள்ள விரும்புகிறேன். இந்தத் தேர்தலைப் புறக்கணிப்பதன்மூலமாக ஒற்றையாட்சி முறைமையை ஒழிப்பதற்கான ஓர் அழுத்தத்தை ஏற்படுத்த முடியுமென்பதில் நாங்கள் நம்பிக்கையாக இருக்கின்றோம்.

அடுத்ததாக, இன்றைய தினம் 'இலங்கையில் உண்மை, ஒற்றுமை மற்றும் நல்லிணக்கத்துக்கான ஆணைக்குழு' சட்டமூலம் இங்கே சமர்ப்பிக்கப்பட்டிருக்கின்றது. 1945ஆம் ஆண்டு இரண்டாம் உலக யுத்தம் முடிவடைந்ததன் பிற்பாடு, எதிர்காலத்தில் அவ்வாறு மோதல்கள் ஏற்படக்கூடாது என்பதற்காக ஐரோப்பிய நாடுகள் ரோம் சாசனத்தை உருவாக்கியிருந்தன. அதனூடாக அவர்கள் போர்க் குற்றவாளிகள், இனப் படுகொலையாளர்களைத் தண்டித் திருந்தார்கள். அதன்மூலமாக ஐரோப்பாவில் ஐக்கியத்தை, சமத்துவத்தை ஏற்படுத்தியிருக்கிறார்கள். அதன் காரணமாக, இலங்கை போன்ற ஒடுக்குமுறைக்கு உட்படுகின்ற நாடுகளிலிருந்து தப்பியோடுகின்ற மக்கள் - அந்த நாடுகளோடு எந்தச் சம்பந்தமும் இல்லாதவர்கள் - அந்த நாட்டிலே முழுமை யான பாதுகாப்போடும் உரிமையோடும் வாழ்ந்துகொண்டு, இந்த நாட்டில் வாழுகின்ற தங்களுடைய உறவுகளுக்கும் பொருளாதார உதவிகளை அனுப்பக்கூடிய சூழல் உருவாகி யிருக்கிறது. இவற்றையெல்லாம் முன்னுதாரணமாகப் பார்த்துக்கொண்டும்கூட, ஐரோப்பிய போர் முடிந்து 75 ஆண்டுகளுக்குப் பிறகு இன்று இந்தச் சட்டமூலம் இங்கு கொண்டுவரப்படுகின்றதென்றால், இனப் படுகொலையாளி களைப் பாதுகாப்பதற்காக, சிறுபான்மைச் சமூகத்தைச் சேர்ந்த ஒருவரினூடாக இங்கே அதன் சமர்ப்பணத்துக்கு விளக்கமளிக் கப்படுகிறதென்றால், அது இந்த நாட்டினுடைய சாபக்கேடாகும். இன்னும் 75 வருடங்கள் சென்றாலும் இந்த நாட்டிலே வாழ்கின்ற தமிழ், முஸ்லிம் மக்கள் அரவணைக் கப்பட்டு, அவர்களுடைய பாதுகாப்பு உறுதிப்படுத்தப்பட்டு இந்த நாடு முன்கொண்டு செல்லப்படப்போவதில்லை என்பதைத்தான் இது எடுத்துக் காட்டுகின்றது.

அந்த வகையில், இந்த இனப் படுகொலையாளிகளை, போர்க் குற்றவாளிகளை, மனித குலத்திற்கு எதிரான குற்றங்களை இழைத்த இராணுவ, ஆயுதப் படைகளைச் சேர்ந்தவர்களை மற்றும் அரசாங்கத்தில் இருந்த ஜனாதிபதி களை, அமைச்சரவையில் இருந்தவர்களைப் பாதுகாக்கின்ற நோக்கத்தோடு கொண்டுவரப்படுகின்ற இந்த 'இலங்கையில் உண்மை, ஒற்றுமை மற்றும் நல்லிணக்கத்துக்கான ஆணைக் குழு' சட்டமூலத்தை நாங்கள் முற்றாக நிராகரிக்கிறோம். எங்களைப்பொறுத்தவரை போர்க் குற்றம் தொடர்பில் முழுமையான சர்வதேச குற்றவியல் விசாரணையொன்று நடத்தப்பட வேண்டுமென்பதிலே நாங்கள் உறுதியாக இருக்கிறோம். நீங்கள் ரோம் சாசனத்தில் கையொப்பமிடாது, தொடர்ந்தும் இந்த யுத்தக் குற்றவாளிகளைப் பாதுகாக்கின்ற விதமாகக் கொண்டுவருகின்ற இவ்வாறான சட்டமூலம் ஒருபோதும் இந்த நாட்டை முன்னோக்கிக்கொண்டு செல்வதற்கு உதவப்போவதில்லை என்பதை நான் மிகவும் பொறுப்புணர்வோடு இங்கே பதிவுசெய்துகொள்ள விரும்பு கிறேன். ஏனென்றால், இது இந்தப் பாராளுமன்றத்தில் எனது கடைசி உரையாகவும் இருக்கலாம். எனது நண்பரான கௌரவ பிரதிச் சபாநாயகர் அவர்களிடம் இதனை ஒரு வேண்டுகோளாக விடுக்கிறேன்.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට නියමිත කාලය අවසානයි.

**ගරු සෙල්වරාජා කජේන්ද්‍රන් මහතා**
(மாண்புமிகு செல்வராசா கஜேந்திரன்)
(The Hon. Selvarajah Kajendren)
நான் முடிக்கிறேன்; எனக்கு ஒரு நிமிடம் தாருங்கள்!

அடுத்து, இந்த இடத்தில் இன்னுமொரு விடயத்தைப் பதிவுசெய்துகொள்ள விரும்புகிறேன். அதாவது, கடந்த சில மாதங்களுக்கு முன்பு கிளிநொச்சி, கோணாவில் பாடசாலை யில் இல்ல விளையாட்டுப் போட்டிகள் நடைபெற்றது. அதில் இல்ல அலங்காரம் மற்றும் வினோத உடை போன்ற போட்டிகள் இடம்பெற்றன. அந்தப் போட்டிகளை மையப் படுத்தி, 'பயங்கரவாதத்தை மீள உருவாக்குதல்' என்ற போலிக் குற்றச்சாட்டை முன்வைத்து, பயங்கரவாத விசாரணைப் பிரிவினரால் பாடசாலையின் அதிபர், ஆசிரியர்கள் விசாரணைக்காகத் தனித் தனியாக அழைக்கப்பட்டு, உள ரீதியாக அச்சுறுத்தப்படுகின்ற செயற்பாடுகள் முன்னெடுக் கப்படுகின்றது. நீங்கள் பயங்கரவாதத் தடைச் சட்டத்தை நடைமுறையில் வைத்துக்கொண்டு மிகக் கொடூரமான

ஒடுக்குமுறைச் செயற்பாடுகளைத் தொடர்ந்தும் எங்களுடைய தேசத்தின்மீது முன்னெடுப்பதை எங்களால் ஏற்றுக்கொள்ள முடியாது. இலங்கையில் நடைமுறையிலுள்ள இந்தப் பயங்கரவாதத் தடைச் சட்டத்தை முற்றாக நீக்குவதற்கு அழுத்தங்களைப் பிரயோகிக்க வேண்டும் என ஐக்கிய நாடுகள் மனித உரிமைகள் பேரவையிடம் நாங்கள் வலியுறுத்திக் கேட்டுக்கொள்கின்றோம். ஏனென்று சொன்னால், தொடர்ந்தும் பயங்கரவாதத் தடைச் சட்டம் எங்களது மக்கள் மீதான ஒடுக்குமுறைகளுக்கு மிக மோசமான காரணமாக இருந்துகொண்டிருக்கின்றது என்பதை இந்த இடத்திலே பதிவுசெய்து கொள்கின்றேன்.

அடுத்ததாக, வவுனியா மாவட்டத்தின் ஆசிகுளம் கிராமத்திலே கற்குவாரிகள் இயங்குகின்றன. அதன் காரண மாக அந்தப் பிரதேசத்தில் இருக்கின்ற மக்களுடைய பாதுகாப்பு பெரும் கேள்விக்குறியாக இருக்கின்றது. கடந்த வாரம் அங்கு வெடிவைத்துத் தகர்க்கப்பட்ட கல் அங்குள்ள ஒரு வீட்டின்மீது விழுந்தது. அங்கு வசித்துவருகின்ற 2 வயதுக் குழந்தைக்கு அருகாமையிலே அது வீழ்ந்ததனால் அந்தக் குழந்தை மயிரிழையிலே உயிர் தப்பியிருக்கின்றது.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
දැන් කථාව අවසන් කරන්න, ගරු මන්ත්‍රීතුමා.

**ගරු සෙල්වරාජා කජේන්ද්‍රන් මහතා**
(மாண்புமிகு செல்வராசா கஜேந்திரன்)
(The Hon. Selvarajah Kajendren)
நான் முடிக்கின்றேன்.

பல வருடங்களாக இந்தக் கற்குவாரிகள் சட்டவிரோதமாக இயங்குகின்ற காரணத்தினால், அங்கே சுற்றுச்சூழல் பாதுகாப் பின்மை, சிறுநீரகப் பாதிப்புகள் மற்றும் சுவாச நோய்கள் எனப் பெருமளவு பாதிப்புகள் ஏற்பட்டிருக்கின்றன. மாவட்ட அரசாங்க அதிபர் இதனைக் கண்டுகொள்ளாமல் இருப்பது கவலைக்குரிய விடயம். ஆகவே, இது தொடர்பிலே பாராளு மன்றம் உரிய கவனத்தைச் செலுத்தவேண்டுமென்று கேட்டு, என்னுடைய கருத்துகளை நிறைவுசெய்கின்றேன்.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
න්‍යාය පත්‍රයේ විෂය අංක 1 - විදේශ නඩු තීන්දු අන්‍යෝන්‍යව පිළිගැනීම, ලියාපදිංචි කිරීම සහ බලාත්මක කිරීම පිළිබඳ පනත් කෙටුම්පත, දෙවන වර කියවීම. සභාව එකඟද?

**ගරු ජනාධිපති නීතිඥ එම්.යූ.එම්. අලි සබ්රි මහතා**
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி எம்.யூ.எம். அலி சப்ரி)
(The Hon. M.U.M. Ali Sabry, PC)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඊට ඉස්සෙල්ලා මට පොඩි කාලයක් දෙන්න. මොකද, කරුණු කිහිපයක් සම්බන්ධයෙන් පිළිතුරු ලබා දෙන්න ඕනෑ.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
හොඳයි, ගරු ඇමතිතුමා.

[අ.භා. 4.35]

**ගරු ජනාධිපති නීතිඥ එම්.යූ.එම්. අලි සබ්රි මහතා**
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி எம்.யூ.எம். அலி சப்ரி)
(The Hon. M.U.M. Ali Sabry, PC)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, හුඟක් අය කථා කරද්දි මාතෘකාවෙන් බාහිරව කථා කළා. ඒ අය බොහෝ වෙලාවට කථා කළේ රජයේ සේවකයන්ගේ වැටුප් පිළිබඳවයි; වැටුප් වැඩි කිරීම සහ අවම වැටුප පිළිබඳවයි. නමුත්, අවම වැටුප වැඩි කරන්නට අපට හැකියාව ලැබුණේ කොහොමද කියන එක පිළිබඳව කවුරුවත් කථා කළේ නැහැ. හැම දෙනාම වාගේ කථා කළේ, ඒ ගොල්ලන්ගේ ප්‍රතිපත්ති ප්‍රකාශනවල සඳහන් කර තිබෙන යම් යම් දේවල්. ප්‍රතිපත්ති ප්‍රකාශනවල ඕනෑම දෙයක් ලියන්න පුළුවන්. නමුත්, ජනාධිපති ගරු රනිල් වික්‍රමසිංහ මැතිතුමා ආදායම වැඩි කරගෙන ඒ දේවල් ප්‍රායෝගිකව කරලා පෙන්වා තිබෙනවා. ඒ නිසා තමයි වැටුප වැඩි කරන්නත් පුළුවන් වෙලා තිබෙන්නේ; අවම වැටුප වැඩි කරන්න පුළුවන් වෙලා තිබෙන්නේ. ඊට අදාළ සංඛ්‍යා දත්ත කිහිපයක් කෙරෙහි මා දැන් ඔබතුමන්ලාගේ අවධානය යොමු කරවන්නට ඕනෑ.

2022 අවුරුද්දේ ශ්‍රී ලංකාවේ සමස්ත රාජ්‍ය ආදායම රුපියල් බිලියන 1,298යි. රාජ්‍ය සේවක වැටුප් වියදම එහි ප්‍රතිශතයක් හැටියට 65යි. ඒ වසරේ වැටුප් ලබා දීමට වැය වුණා රුපියල් බිලියන 845ක්. 2023දී අපි ආදායම රුපියල් බිලියන 1,751ක් දක්වා වැඩි කර ගත්තා. රාජ්‍ය සේවක වැටුප් වියදම රුපියල් බිලියන 956යි. එය රාජ්‍ය ආදායමේ ප්‍රතිශතයක් හැටියට 54යි. 2024 ජූලි වනවිට -මේ වනවිට- බදු ආදායම වැඩි කරගෙන තිබෙනවා, ට්‍රිලියන දෙකක් දක්වා. රජයේ සේවකයන්ගේ වැටුප්වලට වැය වෙලා තිබෙන්නේ රුපියල් බිලියන 567යි. ප්‍රතිශතයක් හැටියට 29ක් දක්වා අඩු කරගෙන තිබෙනවා. අපි ලබන අවුරුද්දේ -2025 වර්ෂයේ- බලාපොරොත්තු වෙනවා රාජ්‍ය ආදායම රුපියල් බිලියන 4,725කට වැඩි කර ගන්න. අපි කියා තිබෙන විධියට රාජ්‍ය සේවකයන්ට රුපියල් 55,000ක අවම වැටුපක් ලබා දීම, සියයට 24ක වැටුප් වැඩිවීමක් ලබා දීම, cost of living allowance එක රුපියල් 25,000 දක්වා ලබා දීම කියන ඔක්කෝම කළත් ඒ සඳහා රාජ්‍ය ආදායමින් වැය වන්නේ සියයට 27යි. ඒකෙන් පෙන්වන්නේ, අනෙක් අය පොත්වල ලියා තිබුණාට අපි ඒක කරලාම පෙන්වා තිබෙන බවයි. අද රජයේ ආදායම තුන්ගුණයකින් වැඩි කරපු නිසා තමයි අස්වැසුම තුන් ගුණයකින් වැඩි කරන්න පුළුවන් වෙලා තිබෙන්නේ; පොහොර සහනාධාරය දෙන්න පුළුවන් වෙලා තිබෙන්නේ; පඩි වැඩි කරන්න පුළුවන් වෙලා තිබෙන්නේ. මේ බොහෝ ප්‍රතිපත්ති ප්‍රකාශ එන්න ඉස්සෙල්ලා -මැයි මාසයේ 17 වැනි දා- හිටපු ජනාධිපති ලේකම් උදය ආර්. සෙනෙවිරත්න මැතිතුමා යටතේ private sector සහ public sector කියන දෙකෙන්ම Committee එකක් පත් කළා. ඒ Committee එකේ නිර්දේශ අනුව තමයි මේ පඩි වැඩි කරන්නේ. එම නිසා අපි මේ වෙලාවේ කියනවා, මේ කාරණය දේශපාලනීකරණය කරන්න උත්සාහ කරන්න එපා කියලා. අපි ගරු ජනාධිපතිතුමා යටතේ ආර්ථිකය ඉතාම හොඳින් කළමනාකරණය කරගෙන රාජ්‍ය ආදායම තුන්ගුණයක් කරලා තිබෙනවා. ඒකේ ප්‍රතිලාභ තමයි දැන් රාජ්‍ය සේවකයන්ට ලබා දෙන්නේ. මෙතැනදී බලන්න ඕනෑ, වැඩේ කරපු මනුස්සයා විශ්වාස කරනවා ද, කරනවා කියලා පුරසාරම් දොඩවන, අමාරු අවස්ථාවේ දී මේ වගකීම භාර ගන්න බැහැ කියලා කර ඇරපු අයගේ ප්‍රතිපත්ති ප්‍රකාශන පිළිගන්නවාද කියන එකයි. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ අනුව, දීර්ඝ කාලයක් තිස්සේ අප පවත්වා ගෙන ආපු මේ ක්‍රමයේ ප්‍රතිලාභයක් හැටියට තමයි අපි අවම වැටුපත් වැඩි කරලා දුන්නේ.

බොහොම ස්තුතියි.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*පනත් කෙටුම්පත ඊට අනුකූලව දෙවන වර කියවන ලදී.*

*வினா விடுக்கப்பட்டு, ஏற்றுக்கொள்ளப்பட்டது.*
*அதன்படி, சட்டமூலம் இரண்டாம் முறையாக மதிப்பிடப்பட்டது.*

*Question put, and agreed to.*
*Bill accordingly read a Second time.*

*මතු පළවන යෝජනාව සභා සම්මත විය.:*
*''පනත් කෙටුම්පත පූර්ණ පාර්ලිමේන්තු කාරක සභාවකට පැවරිය යුතු ය.'' - [ගරු එම්.යූ.එම්. අලි සබ්රි මහතා]*

*தீர்மானிக்கப்பட்டது:*
*"சட்டமூலம் முழுப் பாராளுமன்றக் குழுவுக்குச் சாட்டப்படுமாக." - [மாண்புமிகு எம்.யூ.எம். அலி சப்ரி]*

*Resolved:*
*"That the Bill be referred to a Committee of the whole Parliament." - [The Hon. M.U.M. Ali Sabry.]*

*කාරක සභාවෙහිදී සලකා බලන ලදී.*
*[ගරු නියෝජ්‍ය කථානායකතුමා මූලාසනාරූඪ විය.]*

*குழுவில் ஆராயப்பட்டது.*
*[மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள் தலைமை வகித்தார்கள்.]*

*Considered in Committee.*
*[THE HON. DEPUTY SPEAKER in the Chair.]*

***1 වන වගන්තිය පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.***
*1ஆம் வாசகம் சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*
*Clause 1 ordered to stand part of the Bill.*

## 2 වන වගන්තිය.- (පනත අදාළ වීම)
### வாசகம் 2.- (சட்டத்தின் ஏற்புடைமை)
CLAUSE 2.- *(Application of the Act)*

**ගරු ජනාධිපති නීතිඥ එම්.යූ.එම්. අලි සබ්රි මහතා**
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி எம்.யூ.எம். அலி சப்ரி)
(The Hon. M.U.M. Ali Sabry, PC)

ගරු සභාපතිතුමනි, මා පහත සඳහන් සංශෝධන ඉදිරිපත් කරනවා:

(1) "1 වන පිටුවේ, 19 වන පේළිය ඉවත්කොට ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ඇතුළත් කරන්න:

'ගිවිසුමකට ඇතුළත් වන අවස්ථාවක දී; හෝ' "

(2) "2 වන පිටුවේ, 23 වන පේළිය ඉවත්කොට, ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:

'(අ) ඡේදයේ සඳහන් ගිවිසුම හෝ ලිඛිත නීතිය' "

***සංශෝධන පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*திருத்தங்கள் விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Amendments put, and agreed to.*

***2 වන වගන්තිය, සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.***
*2ஆம் வாசகம் திருத்தப்பட்டவாறு சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*
*Clause 2, as amended, ordered to stand part of the Bill.*

***3 සිට 16 තෙක් වගන්ති පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතු යයි නියෝග කරන ලදී.***
*3ஆம் வாசகத்திலிருந்து 16ஆம் வாசகம் வரை சட்டமூலத்தின் பகுதியாக இருக்கவேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*
*Clauses 3 to 16 ordered to stand part of the Bill.*

## 17 වන වගන්තිය.- (අධිකරණයට ඉදිරිපත් කරනු ලබන ලේඛනවල භාෂාව)
### வாசகம் 17.- (நீதிமன்றத்தில் முன்வைக்கப்பட வேண்டிய ஆவணங்களின் மொழி)
CLAUSE 17.- *(Language of the documents produced to the court)*

**ගරු ජනාධිපති නීතිඥ එම්.යූ.එම්. අලි සබ්රි මහතා**
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி எம்.யூ.எம். அலி சப்ரி)
(The Hon. M.U.M. Ali Sabry, PC)

ගරු සභාපතිතුමනි, මා පහත සඳහන් සංශෝධනය ඉදිරිපත් කරනවා:

"11 වන පිටුවේ, 18 වන පේළියේ සිට 27 වන පේළිය දක්වා වන පේළි (ඒ පේළි දෙක ද ඇතුළුව) ඉවත්කොට ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:

'අධිකරණයට ඉදිරිපත් කරනු ලබන ලේඛනවල භාෂාව

17. (1) 2 වන වගන්තිය යටතේ සාදනු ලබන නියෝගයක නිශ්චිතව දක්වා ඇති විදේශීය රටක අධිකරණයක නඩු තීන්දුවක් ඉංග්‍රීසි භාෂාව හැර වෙනත් භාෂාවකින් වන අවස්ථාවක දී, ඒ නඩු තීන්දුව සමඟ ශ්‍රේෂ්ඨාධිකරණයේ, අභියාචනාධිකරණයේ හෝ මහාධිකරණයේ කථා පරිවර්තකයකු හෝ යම් දිසා අධිකරණයක, පවුල් අධිකරණයක, මහෙස්ත්‍රාත් අධිකරණයක හෝ ප්‍රාථමික අධිකරණයක දිවුරුම් දුන් භාෂා පරිවර්තකයකු හෝ කථා පරිවර්තකයකු හෝ දිවුරුම් දුන් භාෂා පරිවර්තකයකු විසින් පිළියෙල කර අත්සන් කරන ලද, ලියාපදිංචි කිරීමේ අධිකරණය විසින්, එම අධිකරණයේ භාවිත කරනු ලබන භාෂාවෙන් වූ පරිවර්තනයක් ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.' "

***සංශෝධනය පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*திருத்தம் விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Amendment put, and agreed to.*

***17 වන වගන්තිය, සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.***
*17ஆம் வாசகம் திருத்தப்பட்டவாறு சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*
*Clause 17, as amended, ordered to stand part of the Bill.*

***18 සිට 22 තෙක් වගන්ති පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතු යයි නියෝග කරන ලදී.***
*18ஆம் வாசகத்திலிருந்து 22ஆம் வாசகம் வரை சட்டமூலத்தின் பகுதியாக இருக்கவேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*
*Clauses 18 to 22 ordered to stand part of the Bill.*

## 23 වන වගන්තිය.- (අර්ථ නිරූපණය)
### வாசகம் 23.- (பொருள் கோடல்)
CLAUSE 23.- *(Interpretation)*

**ගරු ජනාධිපති නීතිඥ එම්.යූ.එම්. අලි සබ්රි මහතා**
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி எம்.யூ.எம். அலி சப்ரி)
(The Hon. M.U.M. Ali Sabry, PC)

ගරු සභාපතිතුමනි, මා පහත සඳහන් සංශෝධනය ඉදිරිපත් කරනවා:

"15 වන පිටුවේ, 8 වන පේළිය ඉවත්කොට ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ඇතුළත් කරන්න:

'(අ) 2 වන වගන්තිය යටතේ සාදනු ලබන නියමයේ නිශ්චිතව දක්වා ඇති යම් විදේශීය රටකට එරෙහිව' "

***සංශෝධනය පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*திருத்தம் விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Amendment put, and agreed to.*

***23 වන වගන්තිය, සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.***

*23ஆம் வாசகம் திருத்தப்பட்டவாறு சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*

*Clause 23, as amended, ordered to stand part of the Bill.*

***24 වන වගන්තිය පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.***

*24ஆம் வாசகம் சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*

*Clause 24 ordered to stand part of the Bill.*

***ප්‍රඥප්ති වගන්තිය, දීර්ඝ නාමය සහ නාමය පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.***

***පනත් කෙටුම්පත, සංශෝධන සහිතව වාර්තා කරන ලදී.***

*சட்டமாகு வாசகமும் விரிவுப் பெயரும் தலைப்பும் சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*

*சட்டமூலம் திருத்தங்களுடன் அறிக்கை செய்யப்பட்டது.*

*Enacting Clause, Long Title and Title ordered to stand part of the Bill.*

*Bill reported with Amendments.*

**ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, "පනත් කෙටුම්පත සංශෝධිතාකාරයෙන් දැන් තුන්වන වර කියවිය යුතුය" යි මා යෝජනා කරනවා.

තවද, පනත් කෙටුම්පතෙහි සෝදුපත්වල භාෂා දෝෂ, මුද්‍රණ දෝෂ, ව්‍යාකරණ දෝෂ හා අංක දෝෂ නිවැරදි කර ගැනීම සහ ආනුෂංගික සංශෝධන සඳහා අවසර දෙන ලෙසද ඉල්ලා සිටිනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***

***පනත් කෙටුම්පත ඊට අනුකූලව සංශෝධිතාකාරයෙන්, තුන්වන වර කියවා සම්මත කරන ලදී.***

*வினா விடுக்கப்பட்டு, ஏற்றுக்கொள்ளப்பட்டது.*

*அதன்படி, சட்டமூலம் திருத்தப்பட்டவாறு மூன்றாம்முறை மதிப்பிடப்பட்டு நிறைவேற்றப்பட்டது.*

*Question put, and agreed to.*

*Bill, as amended, accordingly read the Third time, and passed.*

## අපරාධ නඩු විධාන සංග්‍රහය (සංශෝධන) පනත් කෙටුම්පත

## குற்றவியல் நடவடிக்கைமுறைச் சட்டக்கோவை (திருத்தம்) சட்டமூலம்

## CODE OF CRIMINAL PROCEDURE (AMENDMENT) BILL

*දෙවන වර කියවීමේ නියෝගය කියවන ලදී.*

*இரண்டாம் மதிப்பிற்கான கட்டளை வாசிக்கப்பட்டது.*

*Order for Second Reading read.*

**ගරු ජනාධිපති නීතිඥ එම්.යූ.එම්. අලි සබ්රි මහතා**
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி எம்.யூ.எம். அலி சப்ரி)
(The Hon. M.U.M. Ali Sabry, PC)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, "පනත් කෙටුම්පත දැන් දෙවන වර කියවිය යුතුය" යි මා යෝජනා කරනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***

***පනත් කෙටුම්පත ඊට අනුකූලව දෙවන වර කියවන ලදී.***

*வினா விடுக்கப்பட்டு, ஏற்றுக்கொள்ளப்பட்டது.*

*அதன்படி, சட்டமூலம் இரண்டாம் முறை மதிப்பிடப்பட்டது.*

*Question put, and agreed to.*

*Bill accordingly read a Second time.*

***මතු පළවන යෝජනාව සභා සම්මත විය. :***

***"පනත් කෙටුම්පත පූර්ණ පාර්ලිමේන්තු කාරක සභාවකට පැවරිය යුතු ය." - [ගරු එම්.යූ.එම්. අලි සබ්රි මහතා]***

*தீர்மானிக்கப்பட்டது:*

*"சட்டமூலம் முழுப் பாராளுமன்றக் குழுவுக்குச் சாட்டப்படுமாக." - [மாண்புமிகு எம்.யூ.எம். அலி சப்ரி]*

*Resolved:*

*"That the Bill be referred to a Committee of the whole Parliament." - [The Hon. M.U.M. Ali Sabry]*

***කාරක සභාවෙහිදී සලකා බලන ලදී.***
***[ගරු නියෝජ්‍ය කථානායකතුමා මූලාසනාරූඪ විය.]***

*குழுவில் ஆராயப்பட்டது.*
*[மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள் தலைமை வகித்தார்கள்.]*

*Considered in Committee.*
*[THE HON. DEPUTY SPEAKER in the Chair.]*

***1 සහ 2 වගන්ති පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතු යයි නියෝග කරන ලදී.***

*1ஆம், 2ஆம் வாசகங்கள் சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*

*Clauses 1 and 2 ordered to stand part of the Bill.*

## 3 වන වගන්තිය.- (ප්‍රධාන ප්‍රඥප්තියේ 183අ වන අලුත් වගන්තිය ඇතුළත් කිරීම)

වாசகம் 3.- (முதன்மைச் சட்டவாக்கத்தில் 183அ என்னும் புதிய பிரிவினை உட்புகுத்தல்)

CLAUSE 3.- (*Insertion of new section 183A in the principal enactment*)

**ගරු ජනාධිපති නීතිඥ එම්.යූ.එම්. අලි සබ්රි මහතා**
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி எம்.யூ.எம். அலி சப்ரி)
(The Hon. M.U.M. Ali Sabry, PC)

ගරු සභාපතිතුමනි, මා පහත සඳහන් සංශෝධනය ඉදිරිපත් කරනවා.

> "4 වන පිටුවේ, 21 වන පේළියේ සිට 23 වන පේළිය දක්වා වූ පේළි (ඒ පේළි දෙක ද ඇතුළත්ව) ඉවත් කර පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:
>
> '(ආ) පාර්ශ්වයන්ගේ නිර්දේශවල කුමක් සඳහන් වුව ද, දණ්ඩනය නියම කිරීමේ පරම අභිමතය සහ නියම කරනු ලැබිය හැකි දණ්ඩනය පිළිබඳ හැහවීමක් කිරීමේ අභිමතය අධිකරණය සතු විය යුතු ය.' "

***සංශෝධනය පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***

*திருத்தம் விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*

*Amendment put, and agreed to.*

***3 වන වගන්තිය, සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.***

*3ஆம் வாசகம் திருத்தப்பட்டவாறு சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*

*Clause 3, as amended, ordered to stand part of the Bill.*

***4 සහ 5 වගන්ති පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතු යයි නියෝග කරන ලදී.***

*4ஆம், 5ஆம் வாசகங்கள் சட்டமூலத்தின் பகுதியாக இருக்கவேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*

*Clauses 4 and 5 ordered to stand part of the Bill.*

## 6 වන වගන්තිය.- (ප්‍රධාන ප්‍රඥප්තියේ 197අ වන අලුත් වගන්තිය ඇතුළත් කිරීම)
## வாசகம் 6.- (முதன்மைச் சட்டவாக்கத்தில் 197அ என்னும் புதிய பிரிவினை உட்புகுத்துதல்)
CLAUSE 6.- (*Insertion of new section 197A in the principal enactment*)

**ගරු ජනාධිපති නීතිඥ එම්.යූ.එම්. අලි සබ්රි මහතා**
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி எம்.யூ.எம். அலி சப்ரி)
(The Hon. M.U.M. Ali Sabry, PC)
ගරු සභාපතිතුමනි, මා පහත සඳහන් සංශෝධනය ඉදිරිපත් කරනවා.

"11 වන පිටුවේ, 18 වන පේළියේ සිට 20 වන පේළිය දක්වා වූ පේළි (ඒ පේළි දෙක ද ඇතුළත්ව) ඉවත් කර පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:

(ආ) පාර්ශ්වයන්ගේ නිර්දේශවල කුමක් සඳහන් වුව ද, දණ්ඩනය නියම කිරීමේ පරම අභිමතය සහ නියම කරනු ලැබිය හැකි දණ්ඩනය පිළිබඳ හැඟවීමක් කිරීමේ අභිමතය අධිකරණය සතු විය යුතු ය.' "

***සංශෝධනය පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***

*திருத்தம் விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*

*Amendment put, and agreed to.*

***6 වන වගන්තිය, සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.***

*6ஆம் வாசகம் திருத்தப்பட்டவாறு சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*

*Clause 6, as amended, ordered to stand part of the Bill.*

***7 සහ 8 වගන්ති පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතු යයි නියෝග කරන ලදී.***

*7ஆம், 8ஆம் வாசகங்கள் சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*

*Clauses 7 and 8 ordered to stand part of the Bill.*

***ප්‍රඥප්ති වගන්තිය, දීර්ඝ නාමය සහ නාමය පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.***
***පනත් කෙටුම්පත, සංශෝධන සහිතව වාර්තා කරන ලදී.***

*சட்டமாகு வாசகமும் விரிவுப் பெயரும் தலைப்பும் சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*
*சட்டமூலம் திருத்தங்களுடன் அறிக்கை செய்யப்பட்டது.*

*Enacting Clause, Long Title and Title ordered to stand part of the Bill.*
*Bill reported with Amendments.*

**ගරු ජනාධිපති නීතිඥ එම්.යූ.එම්. අලි සබ්රි මහතා**
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி எம்.யூ.எம். அலி சப்ரி)
(The Hon. M.U.M. Ali Sabry, PC)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, "පනත් කෙටුම්පත සංශෝධිතාකාරයෙන් දැන් තුන්වන වර කියවිය යුතුය" යි මා යෝජනා කරනවා.

තවද, පනත් කෙටුම්පතෙහි සෝදුපත්වල භාෂා දෝෂ, මුද්‍රණ දෝෂ, ව්‍යාකරණ දෝෂ හා අංක දෝෂ නිවැරදි කරගැනීම සහ ආනුෂංගික සංශෝධන සඳහා අවසර දෙන ලෙස ද ඉල්ලා සිටිමි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
***පනත් කෙටුම්පත ඊට අනුකූලව සංශෝධිතාකාරයෙන්, තුන්වන වර කියවා සම්මත කරන ලදී.***

*வினா விடுக்கப்பட்டு, ஏற்றுக்கொள்ளப்பட்டது.*
*அதன்படி, சட்டமூலம் திருத்தப்பட்டவாறு மூன்றாம்முறை மதிப்பிடப்பட்டு நிறைவேற்றப்பட்டது.*

*Question put, and agreed to.*
*Bill, as amended, accordingly read the Third time, and passed.*

## සේවකයන්ගේ ජාතික අවම වේතනය (සංශෝධන) පනත් කෙටුම්පත
## வேலையாளர்களின் தேசிய குறைந்தபட்ச வேதனம் (திருத்தம்) சட்டமூலம்
## NATIONAL MINIMUM WAGE OF WORKERS (AMENDMENT) BILL

***දෙවන වර කියවීමේ නියෝගය කියවන ලදී.***
*இரண்டாம் மதிப்பிற்கான கட்டளை வாசிக்கப்பட்டது.*
*Order for Second Reading read.*

**ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, කම්කරු හා විදේශ රැකියා අමාත්‍යතුමා වෙනුවෙන්, "පනත් කෙටුම්පත දැන් දෙවන වර කියවිය යුතුය" යි මා යෝජනා කරනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
***පනත් කෙටුම්පත ඊට අනුකූලව දෙවන වර කියවන ලදී.***

*வினா விடுக்கப்பட்டு, ஏற்றுக்கொள்ளப்பட்டது.*
*அதன்படி, சட்டமூலம் இரண்டாம் முறை மதிப்பிடப்பட்டது.*

*Question put, and agreed to.*
*Bill accordingly read a Second time.*

***මතු පළවන යෝජනාව සභා සම්මත විය.:***
***"පනත් කෙටුම්පත පූර්ණ පාර්ලිමේන්තු කාරක සභාවකට පැවරිය යුතු ය." - [ගරු (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා]***

*தீர்மானிக்கப்பட்டது:*
*"சட்டமூலம் முழுப் பாராளுமன்றக் குழுவுக்குச் சாட்டப்படுமாக." - [மாண்புமிகு (கலாநிதி) சுசில் பிரேமஜயந்த]*
*Resolved:*

*"That the Bill be referred to a Committee of the whole Parliament." - [The Hon. (Dr.) Susil Premajayantha.]*

***කාරක සභාවෙහිදී සලකා බලන ලදී.***
***[ගරු නියෝජ්‍ය කථානායකතුමා මූලාසනාරූඪ විය.]***
*குழுவில் ஆராயப்பட்டது.*
*[மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள் தலைமை வகித்தார்கள்.]*
*Considered in Committee.*
*[THE HON. DEPUTY SPEAKER in the Chair.]*

***1 සිට 3 තෙක් වගන්ති පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතු යයි නියෝග කරන ලදී.***
*1ஆம் வாசகத்திலிருந்து 3ஆம் வாசகம் வரை சட்டமூலத்தின் பகுதியாக இருக்கவேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*
*Clauses 1 to 3 ordered to stand part of the Bill.*

*ප්‍රඥප්ති වගන්තිය, දීර්ඝ නාමය සහ නාමය පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.*

*පනත් කෙටුම්පත, සංශෝධන රහිතව වාර්තා කරන ලදී.*

*சட்டமாகு வாசகமும் விரிவுப் பெயரும் தலைப்பும் சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*

*சட்டமூலம் திருத்தங்களுடன் அறிக்கை செய்யப்பட்டது.*

*Enacting Clause, Long Title and Title ordered to stand part of the Bill.*

*Bill reported without Amendments.*

**ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, "පනත් කෙටුම්පත දැන් තුන්වන වර කියවිය යුතුය" යි මා යෝජනා කරනවා.

තවද, පනත් කෙටුම්පතෙහි සෝදුපත්වල භාෂා දෝෂ, මුද්‍රණ දෝෂ, ව්‍යාකරණ දෝෂ හා අංක දෝෂ නිවැරදි කර ගැනීම සහ ආනුෂංගික සංශෝධන සඳහා අවසර ලබා දෙන ලෙස ද ඉල්ලා සිටිනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*පනත් කෙටුම්පත ඊට අනුකූලව තුන්වර වර කියවා සම්මත කරන ලදී.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*அதன்படி, சட்டமூலம் மூன்றாம் முறை மதிப்பிடப்பட்டு நிறைவேற்றப்பட்டது.*
*Question put, and agreed to.*
*Bill accordingly read the Third time, and passed.*

## කල්තැබීම
## ஒத்திவைப்பு
## ADJOURNMENT

**ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, "පාර්ලිමේන්තුව දැන් කල් තැබිය යුතුය" යි මා යෝජනා කරනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***පාර්ලිමේන්තුව ඊට අනුකූලව අ.භා. 4.50ට, 2024 සැප්තැම්බර් 04වන බදාදා පූ.භා. 9.30 වන තෙක් කල් ගියේය.***
*அதன்படி பி. ப. 4.50 மணிக்கு பாராளுமன்றம், 2024 செப்ரெம்பர் 04, புதன்கிழமை மு.ப. 9.30 மணிவரை ஒத்திவைக்கப்பட்டது.*
*Parliament adjourned accordingly at 4.50 p.m. until 9.30 a.m. on Wednesday, 04th September, 2024.*

**සැ.යු.**

මෙම වාර්තාවේ අවසාන මුද්‍රණය සඳහා ස්වකීය නිවැරදි කළ යුතු තැන් දක්වනු රිසි මන්ත්‍රීන් මින් පිටපතක් ගෙන නිවැරදි කළ යුතු ආකාරය එහි පැහැදිලිව ලකුණු කොට, පිටපත ලැබී දෙසතියක් නොඉක්මවා **හැන්සාඩ්** සංස්කාරක වෙත ලැබෙන සේ එවිය යුතුය.

**குறிப்பு**

உறுப்பினர் இறுதிப் பதிப்பிற் செய்யவிரும்பும் பிழை திருத்தங்களைத் தமது பிரதியில் தெளிவாகக் குறித்து அதனைப் பிழை திருத்தப்படாத பிரதி கிடைத்த இரு வாரங்களுள் **ஹன்சாட்** பதிப்பாசிரியருக்கு அனுப்புதல் வேண்டும்.

**NOTE**

Corrections which Members suggest for the Final Print should be clearly marked in their copy and sent to the Editor of HANSARD within two weeks of receipt of the uncorrected copy.

---

**Contents of Proceedings :**

**Final set of manuscripts**
**Received from Parliament :**

**Printed copies dispatched :**

**හැන්සාඩ් වාර්තා**
**කොළඹ 5, පොල්හේන්ගොඩ, කිරුළපන පාර, අංක 163 දරන ස්ථානයෙහි පිහිටි**
**රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන්**
**මිල දී ගත හැක.**

**මෙම හැන්සාඩ් වාර්තාව www.parliament.lk වෙබ් අඩවියෙන්**
**බාගත හැක.**

ஹன்சாட் அறிக்கையின் பிரதிகளை
இல. 163, கிருலப்பனை வீதி, பொல்ஹேன்கொட, கொழும்பு 5இல் அமைந்துள்ள
அரசாங்க தகவல் திணைக்களத்தின் அரசாங்க வெளியீடுகள் அலுவலகத்தில்
பணம் செலுத்திப் பெற்றுக்கொள்ளலாம்.

இந்த ஹன்சாட் அறிக்கையை www.parliament.lk எனும் இணையத்தளத்திலிருந்து
பதிவிறக்கம் செய்ய முடியும்.

Hansard Reports can be purchased from the Government Publications Bureau
at the Department of Government Information,
No. 163, Kirulapone Avenue, Polhengoda, Colombo 5.

This Hansard Report can be downloaded from
www.parliament.lk

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.